# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2018 දෙසැම්බර් 05 වන බදාදා**
2018மார்கழி 05 புதன் கிழமை
Wednesday 05th December 2018

**බත්තරමුල්ල , ශ්‍රී ජයවර්ධනපුර , ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204 (12 වන මහල) හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல ,ஸ்ரீ ஜயவர்த்தனபுர ,டென்சில் கொப்பேகடுவ மாவத்தை இலக்கம் 204(12ஆம் மாடி) இல் அமைந்துள்ள மேல் மாகாண மாகாண சபையின் கட்டடத் தொகுதியின் கூட்ட மண்டபத்தில் நடைபெற்ற சபைக் கூட்டம்.

Council meeting was to be held at the Council Hall located in the 12th floor of Western Province Provincial Council at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.26 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.26 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.26 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදනය
## ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද ප්‍රධාන වශයෙන් තිබෙන්නේ, ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය. ඒ එක්කම නිවේදන කිහිපයක් තිබෙනවා.

*i*

*"විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ ආසන වෙනස් වීමකට ලක් වී තිබෙනවා. එම නිසා තාවකාලිකව පරිගණක තල මුහුණත හා ආසනය අතර වෙනසක් ඇති වී තිබෙන්න පුළුවන්. ඒ සියලු කටයුතු ඉදිරියේදී යථාවත් කිරීමට බලාපොරොත්තු වන බව කාරුණිකව ගරු සභාවට දැනුම් දෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත යම් අපහසුතාවයක් සිදු වුවහොත් එහෙම, ඒ ගැන කනගාටුව ප්‍රකාශ කර සිටිනවා."*

ඒ එක්කම විශේෂයෙන්ම අද උදේ දෙරණ මුල් පිටුවේ ඒ හිතවත් මාධ්‍යවේදියා ප්‍රකාශයක් කළා. ඊයේ දවසේ අපි මාධ්‍යයට යන්න ඉඩ දුන්නේ නැහැයි කියලා. මාධ්‍යයට ඇතුළු වීම සහ ඡායාරූප ගැනීම සහ වීඩියෝගත කිරීම අපි තහනම් කළාය කියලා. එහෙම දෙයක් අපි ඇත්ත වශයෙන් සිදු කළේ නැහැ. සිදු වුණෙත් නැහැ. මම ඒක වගකීමෙන් කියනවා. එහෙම දෙයක් වුණේ නැහැ. මම නම් දැක්කේ නැහැ. ඉංග්‍රීසි පත්තරේකත් තිබුණා කියලා දැන් මට ගාමිණී තිලකසිරි ඇමතිතුමාත් කියනවා. තවත් අපේ මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක් මට කිව්වා. අපේ සරත් පතිරණ මන්ත්‍රීතුමාත් මතක් කළා. අද උදේ මුල් පිටුවට ඒ ටික ගියාය කියලා.

ඒ ගැන කථා කරන කොට බස්නාහිර පළාත් සභාවේ 2019 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විවාදය වාර්තා කිරීම සඳහා 2018.12.04, 05, 06 හා 07 යන දිනවල තම ආයතනය නියෝජනය කරමින් මාධ්‍යවේදීන් සහභාගී කරවන ලෙස බස්නාහිර පළාත් සභාවේ ලේකම්තුමා ශ්‍රී ලංකාවේ සියලුම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතනවල ප්‍රවෘත්ති කර්තෘවරුන් හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරුන් වෙත ලිඛිතව ආරාධනා කර තිබෙනවා. ඒ අනුව තම ආයතන හැඳුනුම්පත ඉදිරිපත් කර ඕනෑම මාද්‍යවේදියෙකුට සභා රැස්වීම ඉහත දිනවල වාර්තා කිරීමට අවසර ලබා දීලා තිබෙනවා. අපි කිසිම තහංචියක් දාලා නැහැ. විවෘතව අපි ඒ අයට ආරාධනා කරලා තිබෙන්නේ. එමෙන්ම එලෙස පැමිණෙන සෑම මාධ්‍යවේදියෙකුටම අපි බොහොම ගෞරවාන්විතව මන්ත්‍රී භෝජනාගාරය හා සමාන විධියට අපි ඒ අයට උදේ ආහාරවේල, අමතර තේ ආහාරවේලක්, දිවා භෝජන සංග්‍රහය, ඊළඟට සවස තේ සංග්‍රහය අපි හැම දෙයක්ම සපයනවා. ඒ එක්කම අපි ඒ අයට ප්‍රවාහන පහසුකම්නුත් ලබා දෙනවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, තවම මාධ්‍යවේදීන් කවුරුවත් නැහැ. මම හිතන්නේ, ඔබතුමා ඔය ප්‍රකාශය ඒගොල්ලෝ ආවාට පස්සේ කිව්වා නම් හොඳයි කියලා. ඔක්කෝටම ආපහු මේක නිවැරදි කරලා දෙන්නත් එක්කලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රකාශය නිසා ඒගොල්ලෝ මෙතැනට නොඑනවාද දන්නෙත් නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ඔව්, සමහර විට.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, ඕක අතරමග නවත්වලා ඒ අය ඉන්න වෙලාවටම මන්ත්‍රීවරු ඉදිරියේ කිව්වා ආපහු නම් හොඳයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. මම ඒක පිළිගන්නවා. අපි එහෙම නම් න්‍යාය පත්‍රයට යමු.

**ගරු චන්දන ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Chandana Jayakody - Chief Government Whip

න්‍යාය පත්‍රයට යමු. ඉන්න කොට කියමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

## පූර්ණ කාරක සභාව
COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2019 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදයේ ප්‍රදානයන් පිළිබඳව සලකා බැලීම සඳහා මෙම සභාව පූර්ණ කාරක සභාව බවට පත් කරනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදය ආරම්භ කරන්න තමයි තිබෙන්නේ. අපි සැලසුම් කරලා තිබෙන්නේ පෙ.ව. 9.00 ට පටන් අරන් ප.ව. 3.00 ට අවසන් කරන්න. මහ ඇමතිතුමාගේ වැය ශීර්ෂය. දැනටමත් විනාඩි 33 ක ප්‍රමාදයක් තිබෙනවා. ඒක මගේ ප්‍රමාදයක් නම් නොවෙයි. මම සභා ගර්භයට එන කොට උදේ 8.30 ට මන්ත්‍රීවරු හතර දෙනයි එවෙලේ හිටියේ. ඒ නිසා කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත්, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත් ඒ පිළිබඳව අවධානය යොමු කරලා සාධාරණව මට කථික ලැයිස්තු ඉදිරිපත් කරන්න. නැත්නම් ඊයේ හවස වාගේ ගරු මන්ත්‍රීතුමන්ලාට අසාධාරණයක් සිද්ධ වෙනවා. උදේ ඉඳලා ගරු මන්ත්‍රීතුමන්ලා සභා ගර්භයේ ඉන්නවා. දැන් කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න වෙලාව මදි වුණා. මම කනගාටු වෙනවා. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා හැමදාම උදේ ඉඳන්ම ඉන්නවා. එතුමාට විනාඩි 05 කුත් දෙන්න බැරිව ගියා. ඒ නිසා මම අද කථික ලැයිස්තු කොහොමත් වෙනස් කරන්නේ නැහැ. මම ඊයේ තීරණය කළා. ඒ අනුව ලැයිස්තුව පිළිවෙළට මම නම් කියනවා. එතකොට කථා කරන්න.

**ගරු චන්දන ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Chandana Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, කථික ලැයිස්තුව වෙනස් කරන්න අවශ්‍යතාවයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කොහොමත් වෙනස් කරන්නේ නැහැ. කියනවා නේ ඇවිල්ලා. දැන් ඊයේත් ඔබතුමා උදෙන්ම මට කිව්වා නේ? ජගත් අංගේ ගරු මන්ත්‍රීතුමා නැහැයි කියලා උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට දෙන්න කිව්වා. මම දන්නා නම් මොකද වෙන්නේ? ටික වෙලාවක් යන කොට ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා සභාවට ආවා.

**ගරු චන්දන ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Chandana Jayakody - Chief Government Whip

ඔව්. වෙනස් කරන්නේ නැහැ ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කරන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ඇත්තටම ඒ කථික ලැයිස්තු පිළිබඳව පොඩි වචනයක් කථා කරන්න ඕනෑ. විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකවරයා වශයෙන් මම ඉල්ලීමක් කරනවා. 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ඊයේ කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමාටත්, හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමාටත් මේ ප්‍රශ්නය ඇති වෙලා මාත් එක්ක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇයි? අපේ පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අමනාප වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට තේරුණා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා ඍජු තීන්දුවක් ගත්තා. මම අගය කරනවා. මේ අවස්ථාවේදීත් මගෙන් කිහිප දෙනෙකු ඉල්ලුවා. උදාහරණයක් වශයෙන් රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාව මම දාලා තිබෙන්නේ තුන් වැනියාට. එයාගේ නෝනාව ඉස්පිරිතාලේ ගෙනියන්න තිබෙනවා. පොඩ්ඩක් පස්සට දාලා දෙන්න කියලා. මම කිව්වා, මෙහෙම තීන්දුවක් අරගෙන තිබෙනවා. මම ලැයිස්තුව දීලා ඉවරයි. මම දන්නේ නැහැ. මම මේ වචනය විතරයි ඔබතුමාට කිව්වේ. ඒ අසනීප තත්ත්වය නිසා. ඔබතුමා ගන්න තීන්දුවක්. මම ඒ වචනයත් ප්‍රකාශ කළා. හැන්සාඩ් ගත වෙන්න ඕනෑ. රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාගේ. එතුමාගේ නෝනාව ඉස්පිරිතාලේ ගෙනියන්න තිබෙනවා. පස් වෙනියා වෙන කොට පුළුවන්ද කියලා. මම දන්නේ නැහැ. ඔබතුමාගේ තීන්දුව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි සාධාරණයක් කරමු.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මම නම් ලැයිස්තුවම දීලා තිබෙනවා. මම හත් වැනිදා වෙනකල්ම මගේ කථික ලැයිස්තුව දීලා තිබෙනවා. ඒ නිසා ඒ විධියටම ක්‍රියාත්මක කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා, විපක්ෂ නායකතුමා මොකක් හරි ඉල්ලීමක් කළොත් ඔබතුමා ඒකට එකඟ වෙන්න කියලත් ඉල්ලීමක් කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මගේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ නාම ලේඛනයක් දීලා තිබෙනවා. නමුත් මට දැන් මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා කිව්වා, එයාගේ නම දාලා තිබුණාට එයා මේකට කැමැත්තක් දක්වන්නේ නැහැයි කියලා. ඉතින් මටත් පොඩි වෙනස්කම් කරන්න සිද්ධ වෙනවා. මන්ත්‍රීවරයාගේ නම නීල් සුනේත්‍රලාල්. ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා නම දැම්මාට එතුමා ඒකට කැමැත්තක් නැහැයි කියලා මට ඇවිල්ලා කිව්වා. ඒ වාගේ පොඩි වෙනස් කිරීම් කරන්න වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අපි ඒක වෙනස් කරමු. ප්‍රශ්නයක් නැහැ. මෙතැනත් කාලය පිළිබඳප්‍රශ්නයක් තිබෙනවා. සංවිධායකවරු දෙදෙනාම එවපු ලේඛන දෙකේ කාලය විනාඩි 140 ට තමයි හදලා තිබෙන්නේ. අපි විනාඩි 30 ක් අඩු කරන්න ඕනෑ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නියමිත වෙලාවට හැදුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක balance කරලා මම කථාව දෙන්නම්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

විනාඩිය විනාඩිය අඩු කර ගන්න. දැන් වුණු වෙනස් වීම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රය අනුව තිබෙන්නේ, ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂයන් සම්බන්ධ වැඩ කටයුතු ආරම්භ කිරීමටයි. ඒ සම්බන්ධ සංකේත කපා හැරීමට විපක්ෂයට ආරාධනා කරනවා.

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 104** | **-** | **පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 109** | **-** | **ප්‍රධාන ලේකම් කාර්යාලය** |
| **ශීර්ෂ අංක 110** | **-** | **ඉංජිනේරු කාර්යාංශය** |
| **ශීර්ෂ අංක 111** | **-** | **ආදායම් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 112** | **-** | **පළාත් පාලන දෙපාර්තමේන්තුව** |
| Head No 104 | - | Ministry of Local Government, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs. |
| Head No 109 | - | Chief Secretary's Office |
| Head No 110 | - | Engineering Organization |
| Head No 111 | - | Department of Revenue |
| Head No 112 | - | Department of Local Government |

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ශීර්ෂ අංක 104, 109, 110, 111 හා 112 ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් රු. 10/- ක සංකේත මුදලක් අඩු කළ යුතු යැයි යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[පූ.භා. 09.38]

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, සියලු දෙනාටම සුභ උදෑසනක්. ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ අපි උපදේශක කාරක සභාවේ ඉන්න මහජන නියෝජිතයෙකු හැටියට විවාදය ආරම්භ කරමින් වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. අවස්ථාව ලබා දීම ගැන අපේ විපක්ෂයේ කණ්ඩායමට ස්තුතිවන්ත වෙනවා. පළමුවෙන්ම ගරු සභාපතිතුමනි, අපි ආදරය කරන මහ ඇමතිවරයෙක් ඉන්නේ. පොඩි දක්ෂ මනුස්සයෙක්. ඒ වුණාට අපට මේ පොත් පිංච ලබා දුන්නේ අද උදේ. මේක ඊයේ ලැබුණා නම් පොඩ්ඩක් සන්තෝෂයි. මේ ගැන අපට අධ්‍යයනයක් කරලා එන්න තිබුණා. අපට අද උදේ තමයි මේක ලැබුණේ.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, අපි වේලපහ දුන්නා නම් මේ පොත් අපට දෙගුණයක් විතර දෙන්න වෙනවා. පොත අරගෙන ගෙදර ගිහින් ගේන්නේ නැහැ. නැතිව වෙන එකක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැමෝම එහෙම නැහැ හැබැයි.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඒක තමයි ගරු සභාපතිතුමනි, මම කිව්වේ දක්ෂ සභාපතිවරයෙක් කියලා. අපේ මහ ඇමතිවරයා දක්ෂ හිටපු සභාපතිවරයෙක්. ඉතින් උත්තරයක් තිබෙනවා. කොහොම

වුණත් හරි ඒ ගැන මම කනගාටු වෙනවා. ඇත්තටම ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමා තමයි මේ අමාත්‍යාංශ ටික භාරව කටයුතු කරන්නේ. පළමුවෙන්ම එතුමා බොහොම වාසනාවන්ත පුද්ගලයෙකු හැටියට මම දකිනවා. 1991 ඉඳලා පොඩි තැනින් ඇවිල්ලා, යහපාලන ආණ්ඩුව යටතේ මහ ඇමතිකම ලැබිලා මේ අමාත්‍යාංශ ටික එතුමාට ලැබීම පිළිබඳව. එතැනදී ප්‍රථමයෙන්ම එතුමා මහ ලොකු කාර්යයක් කළා. මහඟු කාර්යයක් කළා. මේ පළාත් පාලන ආයතන ටික විසුරුනාට පස්සේ වසර තුනක් විතර යනකල් යහපාලන ආණ්ඩුව යටතේ පළාත් පාලන ආයතන මහජන නියෝජිතයන්ගෙන් නැතිව වසර දෙකහාමාරක් තුනක් තිබුණා. ඒ කාලය තුළ අපි මහජන නියෝජිතයෝ හැටියට දැක්කා. ඒ වාගේම හිටපු සභාපතිවරයෙක් හැටියට අපි දැක්කා. ප්‍රදේශයේ ජනතාව ගොඩක් අසරණ වුණා. මේකට වගකියන්න ඕනෑ මෛත්‍රීපාල සිරිසේන ද, රනිල් වික්‍රමසිංහ ද කියන එක අද ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අද දෙන්නා දෙපැත්තට බෝලය දානවා. අපි හිතුවා, තටු කැපුවා කියලා ජනාධිපතිතුමාගේ. අද ජනාධිපතිතුමාට තිබෙන බලය අපේ රටේ ජනතාව දකිනවා. මේ සියලු දේවල් පාලනය කර ගෙන ඉන්නේ එතුමා. එහෙම නම් එදා පළාත් පාලන ආයතන ඡන්දය කල් දාන්න ඕනෑ වුණේ එක්සත් ජාතික පක්ෂයටද? මෛත්‍රීපාල සිරිසේනට ද කියන ප්‍රශ්නයත් අපට මතු වෙනවා. පළාත් පාලන අමාත්‍ය ධූරය තිබුණේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට. එහෙම නම් අපි දැක්ක විධියට 2015 දෙසැම්බර් 08 ජනාධිපතිවරණයත් එක්කලා පෙබරවාරි මාසේ, මාර්තු මාසේ මහ මැතිවරණය තියලා. අප්‍රේල් මාසේ, මැයි මාසේ පළාත් පාලන මැතිවරණය තිබුණා නම් මේ රටේ ජනමතය වෙන පැත්තක තිබෙන්නේ. ඡන්දය කල් දාන්න ඕනෑ වුණේ ජනාධිපතිතුමාට කියන එක අපි බොහොම පැහැදිලිව කියනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන පක්ෂය ගොඩ නගලා, ඒ පක්ෂයට ඡන්ද එකතු කර ගන්න බලාගෙන, ඒ ඡන්ද එකතු වුණාට පස්සේ මැතිවරණයක් තියන්න ඕනෑකම නිසා තමයි එදා පළාත් පාලන ආයතනවල ඡන්දය කල් දැම්මේ.

අද රට අගාධයට ගිහිල්ලා තිබෙනවා. රටේ ජනතාව අසරණ වෙලා තිබෙනවා. මහජන නියෝජිතයෝ හැටියට අපට අද ලැජ්ජයි. යන කොට ජනතාව කියන දේවල්. ව්‍යාපාරිකයෙක් කථා කළොත් රටේ ආර්ථිකය කුඩු පට්ටම් වෙලා කියලා කියනවා. මේ තත්ත්වයට අද ඇඳලා දාපු එකට, ඔක්තෝබර් 26 තීන්දුවට වගකියන්න ඕනෑ වෙන කවුරුවත් නොවෙයි. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා කියන එක මම මුලින්ම මතක් කරනවා. එහෙම නම් එදා පළාත් පාලන ආයතන ටික විසිරුණාට පස්සේ මේ පළාත් පාලන ආයතනවලින් සේවයක් ගන්න හිටපු මහජනතාව මහපාරට ඇදලා දැම්මටත් වගකියන්න ඕනෑ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන කියන එක මම මතක් කරනවා. ඇත්තටම මම දැක්කා, මෙරිල් මන්ත්‍රීතුමන්ලාගේ පැත්තේ අපේ ජනතාව යනවා. ගියාම ඒ plan ටික උස්සාගෙන මෙරිල් මන්ත්‍රීතුමා එනවා මහ ඇමතිතුමා ළඟට. මමත් plan 10 ක් 15 ක් එකතු වුණාම අරගෙන එනවා. මම ජීවත් වෙන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ ජා - ඇල ආසනයේ. අද ඒ ප්‍රදේශයේ ගෙයක් හදන කොට පර්චස් 12 ½ ට plan පාස් කර ගන්න විධියක් නැහැ. නමුත් එදා පළාත් පාලන ආයතන ප්‍රධානීන් හිටපු නැති නිසා ප්‍රදේශයේ ජනතාවට COC එකක් ගන්න, plan එකක් පාස් කර ගන්න කෙනෙක් නැතිව ගියා. ලේකම්තුමන්ලා, ලේකම්තුමියන්ලා ඒ අයගේ බලතල සීමාව යටතේ විතරයි කටයුතු කළේ. එහෙම නම් ජනතාව අන්තිම අසරණ වුණා. ඒ අවස්ථාවේදී කොන්ද කෙළින් තියාගෙන මේ මහ ඇමතිතුමා එන හැමෝටම උදව් කළා. එතුමාට තිබෙන බලතල පාවිච්චි කරලා. නැවත නැවත මතක් කරනවා. ඒ තත්ත්වයට වගකියන්න ඕනෑ වෙන කවුරුවත් නොවෙයි. මේ රටේ ජනාධිපතිවරයා කියන එක මතක් කරනවා. ඒ මතක් කරන ගමන් -

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)

Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

වම්පික රණවක.

**ගරු ශිරන්ත අමරසේකර**

Hon. Shirantha Amarasekara

මම මහ ඇමතිතුමාට ස්තූතිවන්ත වෙනවා. ඒ හැම අවස්ථාවකදීම පොදු ජනතාව වෙනුවෙන් පෙනී සිටීම පිළිබඳව මම ඇත්තටම සන්තෝෂ වුණා. එදත් එහෙමයි. අදත් එහෙමයි. හෙටත් එහෙමයි. මේ මහ ඇමතිතුමා විහිළුවක් කරලා, හැමෝටම පුළුවන් දෙයක් කරලා දුන්නා. ඒ කරන වෙලාවල්වලදී ඒ ආපු ජනතාව හැමෝම දිහා එතුමා බැලුවා. බලලා ඒ අයට උදව් කළා.

[ගරු ශිරන්ත අමරසේකර]

ඒ වාගේම මමත් 1991 ජා ඇළ ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක හැටියට පත් වුණා. එදා පළාතේම සභාවල් දිනද්දී මම ඡන්දය ඉල්ලපු නිසාදෝ කොහේද ජා - ඇළ ආසනය පැරදුනා. ඡන්ද 200 කින්. 5996 ක් මනාප අරගෙන මට විපක්ෂයේ ඉන්න වුණා. එදා ඉඳලා මේ පළාත් පාලන ආයතනවල කටයුතු කෙරුණු ආකාරය මම දැක්කා. අපට මහ ඇමතිවරයෙක් දකින්නවත් අවස්ථාවක් තිබුණේ නැහැ. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට. ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකුට මහ ඇමතිවරයෙක් දකින්නවත් අවස්ථාවක් තිබුණේ නැහැ. එහෙම තියෙද්දී මම සන්තෝෂ වෙනවා අපේ ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමා අද පළාත් පාලන ආයතන ප්‍රධානීන්ව, ලේකම්තුමන්ලාව මාසයකට වතාවක් රැස් කරනවා කියලා කිව්වාට, ඒක හැම මාසයකම බැරි වුණත් උපදේශක කාරක සභාවට ඒ අයව කැඳවීම පිළිබඳව මගේ ප්‍රණාමය, මගේ ස්තුතිය, මගේ ගෞරවය ගරු මහ ඇමතිතුමාට පුද කරනවා. අද මහ ඇමතිතුමාත්, පළාත් සභාවත්, ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා අතරින් සම්බන්ධීකරණයක් ඇති වෙලා තිබෙනවා. හරි නම් මේක රටේ ව්‍යවස්ථාවෙන් විය යුතු දෙයක් කියලා මම විශ්වාස කරනවා. ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතන, පළාත් පාලන ආයතන ප්‍රධානීන් පළාත් සභාව එක්ක මාස කිහිපයකට වරක්වත් සම්බන්ධ වෙන්න ඕනෑ. ඒ වාගේම පළාත් සභා පාර්ලිමේන්තුවත් එක්ක, විධායකයත් එක්ක සම්බන්ධ වෙන්න ඕනෑය කියන මතයේ මම ඉන්නේ. එහෙම නම් ඒකට පූර්වාදර්ශයක් දෙමින් අපේ බස්නාහිර පළාත් සභාවේ මහ ඇමතිවරයා කටයුතු කරනවා. අමාරු කටයුත්තක්. උපදේශක කාරක සභාවට පළාත් පාලන ආයතන ප්‍රධානීන් ආපුවාම වැඩි වෙලාවක් ගත කරන්න වෙලා තිබෙන්නේ, ඒ අයගේ ප්‍රශ්නත් එක්කලා. ඒකට මහ ඇමතිතුමා මැදිහත් වෙලා කරලා දෙන එක ගැන මමත් ප්‍රාදේශීය සභාවක හිටපු සභාපතිවරයෙක් හැටියට මගේ අවංක ස්තුතිය, ගෞරවය පුද කරනවා. මේක දිගටම කර ගෙන යන්න කියන ඉල්ලීමත් මම ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමතිතුමනි. ඇත්තටම මහ ඇමතිකම කියන්නේ මගෙන් කවුරුහරි ඇහුවොතින් ඔයා මේ රටේ ගන්න තිබෙන ආසම තනතුර මොකක්ද කියලා. ජනාධිපතිකම හම්බ වෙන්නේ නැත්නම්, අගමැතිකම හම්බ වෙන්නේ නැත්නම් ඊළඟට මම ඉල්ලන ප්‍රධාන තනතුර තමයි මහ ඇමති තනතුර.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

බස්නාහිර -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

බස්නාහිර පළාතේ මහ ඇමති තනතුර. මම ඒකයි කිව්වේ, මෙතුමා හරි වාසනාවන්තයි කියලා. ඒ තනතුර තිබුණා වාගේම, ඒ තනතුර හරහා අපට ආපස්සට, අනික් පැත්තට, ප්‍රතිවිරුද්ධව වගකීම් රාශියකුත් එනවා. තනතුර වාගේම ඔබතුමා හරහා වගකීම් රාශියකුත් එනවා. ගරු සභාපතිතුමනි, අපි පසුගිය කාලයේ, ගිය අවුරුද්දේ මේ පළාත් පාලන මැතිවරණ පනත් සංශෝධනය ගැන මේ සභාවේ දවස් දෙකක් අපි සාකච්ඡා කළා. තිත, කොමාව ගැන අපි සාකච්ඡා කළා මහ ඇමතිතුමනි. හැබැයි, අර නංගිව පෙන්වලා අක්කාව දෙනවා වාගේ අපට දුන්න, අපි මෙතැනින් අනුමත කරලා ඇරපු, අපි එකඟතාවය පළ කරපු පනත නොවෙයි පාර්ලිමේන්තුවෙන් සම්මත වුණේ. මම මේක ඊයේ රෑ ලියාගෙන ආවේ, මේ ගැන කථා කරනවාය කියලා. අද මම එනකොට lift එකේදී අපේ පාලිත අබේවර්ධන නීති නිලධාරීතුමාවත් හම්බ වුණා. ගරු සභාපතිතුමනි, මම මහ ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. ඒ වාගේ අවස්ථාවක අපට වගකීමක් තිබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයට හරි ගිහිල්ලා පළාත් සභාවක් හැටියට අපි අනුමත කරපු, අපේ එකඟතාවය පළ කරපු දේ නොවෙයි පාර්ලිමේන්තුවේ සම්මත වුණේ කියන එක ගැන කියන්න. මම දකින්නේ ඒක අපේ වගකීමක් කියලා.

අද මම විශ්වාස කරන විධියට පළාත් පාලන පනත සංශෝධනය වෙලා විකෘති පැටියෙක් ඇවිල්ලා ඉන්නේ. අද රටේ ජනතාව බලාපොරොත්තු වුණු ප්‍රතිඵලයත් එක්ක බලාපොරොත්තු වුණු දෙයක් නොවෙයි ප්‍රාදේශීය සභාවල, නගර සභාවල මන්ත්‍රීවරු හැටියට අද ඉඳගෙන ඉන්නේ. ඒක විකෘතියක්. අද ජා - ඇළ ප්‍රාදේශීය සභාවේ කොට්ඨාශ 27 ක් තිබුණා. 27 ම මෙරිල් මන්ත්‍රීතුමා පොහොට්ටුවෙන් දින්නා. හැබැයි ඉඳගන්න කොට මෙරිල් මන්ත්‍රීතුමාට වැඩියෙන් ඉන්නේ දෙකයි ද? තුනයි ද? විකෘතියක් ඒක. ඒ වාගේම සියලුම පළාත් පාලන ආයතනවලට - මට මතක විධියට මම මේකේ දැක්කා, අපට, බස්නාහිරට තිබුණේ 886 ක්. දැන් ඉන්නවා මන්ත්‍රීවරු 1668 ක්. පසුව ගැසට් වුණා 1757 ක්. එකට එකක් වැඩි වෙලා තිබෙනවා. මේ විකෘතිය එන කොට අපි නිහඬව බලාගෙන හිටයා.

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව කියන්නේ, මුළු රටේම පළාත් සභාවලට තිබෙන ආදර්ශයක්. එහෙම නම් අපට වගකීමක් තිබෙනවා. අපි එකඟතාවය දුන්න එකට පිටින් දෙයක් නම් සිද්ධ වෙන්නේ ඒකට මැදිහත් වෙන්න. මම අවධානය යොමු කරන්නේ මින් ඉදිරියට බස්නාහිර පළාත තුළ තිබෙන පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු 1668 ක් ඉන්නවා. එහෙම නම් මින් ඉදිරියට ඒ වාගේ අවස්ථාවල රටේ වැදගත් අවස්ථාවක, තීන්දුවක් තීරණයක් ගන්න අවස්ථාවක පළාත් සභාව හැටියට ඒ සඳහා මැදිහත් විය යුතුයි කියන යෝජනාව මම මතක් කරන්නේ.

මම හිතන්නේ, මම පළාත් පාලන අමාත්‍යාංශය යටතේ සංඛ්‍යා ලේඛනාත්මකව විස්තරයක් කථා කරන්න මම හිතුවේ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

1757 ක්.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

1668 ක් කියලා මෙතුමාගේ පොතේ තිබෙන්නේ. ඒ කරුණු ටික මතක් කරමින්, මෙරිල් පෙරේරා මන්ත්‍රීතුමාගේ අවධානය යොමු කරනවා. මම දැක්කා මේ පොතේ තිබෙනවා. පළාත් පාලන ආයතන කිහිපයක තත්ත්වය උත්ශ්‍රේණිගත කරනවාය කියලා. ඒ උත්ශ්‍රේණිගත කිරීමට කරුණු සොයා ගත්තේ කොයි ආකාරයෙන්ද කියන එක ගැන මම දන්නේ නැහැ. මම මේකේදී තමයි දැක්කේ උත්ශ්‍රේණිගත කරනවාය කියලා. මම සාමාන්‍යයෙන් උපදේශක කාරක සභාවේ ඇවිල්ලා ඉඳගෙන ඉන්නවා. එක දවසයිද කොහේද ඇවිල්ලා නැත්තේ. මම එතැනදී දැක්කෙත් නැහැ. ඒ උත්ශ්‍රේණිගත කිරීමේදී හරියාකාරව කරුණු සොයලා බලලා අද මෙරිල් මන්ත්‍රීතුමා තමයි මම හිතන්නේ, පොහොට්ටුව පක්ෂය නියෝජනය කරමින් ජා ඇළ ආසනයට සංවිධායකවරයා හැටියට ඉන්නේ. එතුමා තමයි ඒ පළාත් පාලන ආයතන දෙක මෙහෙය වන්නේ. එහෙම නම් ජා ඇළ නගර සභාවත්, ප්‍රාදේශීය සභාවත් මම හිතන්නේ ලොකු ආදායමක් තිබෙනවා. වපසරිය බොහොම පොඩ්ඩයි. නගර සභාවට තිබෙන්නේ වර්ග කිලෝ මීටර් 12 යි. ප්‍රාදේශීය සභාවට වර්ග කිලෝ මීටර් 69 යි. විශාල ජනගහනයක් ඉන්නවා. හොඳ ආදායම් තත්ත්වයක් තිබෙනවා. එහෙම නම් ඒ උත්ශ්‍රේණිගත කරන වෙලාවේදී ජා - ඇළ ප්‍රාදේශීය සභාවත්, නගර සභාවත් එක්කහු කරලා මහ නගර සභාවක් කරන යෝජනාවට ඒකත් පුළුවන් නම් දා ගන්න කියන ඉල්ලීම කරමින් -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු මන්ත්‍රීතුමා time තියෙනවා. දැන් ඊළඟට නේ election එන්නේ. time තියෙනවා. ඔය මෙරිල් මන්ත්‍රීතුමා subject එක දන්නවා. ඒක නේ ඔය සද්ද නොකර ඉන්නේ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

මම කිව්වේ ඒකයි මම දන්නේ නැහැ කියලා කොහොමද ආවේ කියලා. මම පොඩ්ඩක් මතක් කෙරුවේ. ඒ ටික මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 09.51]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, පළාත් සභාවේ අලුත් සභා ගර්භය තුළ ඉඳගෙන මේ ඉදිරිපත් කරන ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ එනම්, ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ක්‍රියාත්මක වන මොහොතේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයෙන් පසුව මේ පළාත් සභාව ආරම්භ වෙලා 31 වන මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරන මේ මොහොතේ මම හදවතින්ම සන්තෝෂ වෙනවා, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙකු වශයෙන් කටයුතු කරලා ඒකේ දැවැන්ත යුග මෙහෙවරක් කරලා අද පළාත් සභාවට එන්න ජනතාව අපට ශක්තිය ලබා දීම පිළිබඳව. “අලුත් අලුත් දැ නොතකන ජාතියක් ලෙස ලොව නොනැගේ” යන පඬි වදන මතකයට නැගෙන්නේ නිරායාසයෙනි. සංවර්ධනය මිනිසා වෙනුවෙන් නම් එය ප්‍රජාපාදක ලෙස සැලසුම් කිරීමට අපි කටයුතු කළ යුතුය. සියලු දෙනාගේ ප්‍රතිපත්ති හා සැලසුම්වල පදනම වූයේ, සාරධර්මය සංවර්ධනය මිනිසාගේ විනයගරුක බව ඇති කිරීමට හා ආර්ථික සංවර්ධනය ඇති කිරීමටයි. මේ වන කොට මම හිතන්නේ, පළාත් සභාව තුළ

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

ඉතිහාසය ගත්තාට පස්සේ, 2018 වසරේ තමයි මහා දැවැන්ත සංවර්ධනයක් මේ පළාත් සභාව තුළින් ඉටු කරලා තිබෙන්නේ. මම හිතන්නේ ඊට සාපේක්ෂව 2019 වසරේ ඊට වඩා 14% ක වැඩි කිරීමක් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපි හදවතින්ම සන්තෝෂ වෙනවා. දිගින් දිගටම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන මේ ගරු ඇමතිතුමන්ලාගෙන් ලැබුණු සහයෝගය තුළින් අපට පුළුවන්කම ලැබුණා, අපේ ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්න. විදුලිය, ජලය, ඒ වාගේම මං මාවත්, සංචාරක ව්‍යාපාරය තුළට අවශ්‍ය කරන ශක්තිය මම හිතන්නේ නිබඳවම අපට ලැබුණා. ඒ ලැබීම තුළින් මම හිතන්නේ මහා දැවැන්ත සංවර්ධනයක්. අද පළාත් සභා මන්ත්‍රීවරුන් හැටියට අපි කටයුතු කරලා තිබෙනවා. මට විතරක් නොවෙයි. මේ ඉන්න සහෝදර පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සියලු දෙනාටම ප්‍රතිපාදන වෙන් කරමින් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන ගරු මැති ඇමතිවරු මම හිතන්නේ ඒ ශක්තිය ලබා දුන්නා. හැබැයි, සමහර අවස්ථාවලදී අපි දකිනවා. මේ පළාත් පාලන ආයතන පිළිබඳව ඔබතුමාගේ යටතේ තිබුණත් සමහර අවස්ථාවලදී ඒ පළාත් පාලන ආයතනවල මම හිතන්නේ දීර්ඝ කාලයක් සභාපතිවරු නැතිව කටයුතු කළා. ඒ කටයුතු කරන අවස්ථාවලදී අපේ ලේකම්තුමිය, අනෙකුත් නිලධාරීන්ට අවනත නොවී කටයුතු කිරීම පිළිබඳව දිගින් දිගටම මම විතරක් නොවෙයි, මේ සභා ගැබේ ඉන්න සියලුම මන්ත්‍රීවරු කථා කළා. හැබැයි, කථා කළත් ඒ අවශ්‍ය කරන ප්‍රශ්න ඉදිරිපත් කළත්, ඒවාට යොමු කරලා මම charge sheet නවත්වලා ලබා දුන්නත් මම හිතන්නේ අවසානයේ ප්‍රශ්නයක් ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයාට නිකම්වත් දැන ගන්න මේ එක නිලධාරියෙක්වත් කටයුතු කරන්නේ නැති වීම පිළිබඳව අපට පොඩි කනගාටුවක් තිබෙනවා. හැබැයි, අපි දකිනවා. පළාත් පාලන ආයතනයක ප්‍රධානියෙකු වශයෙන් අපි කටයුතු කරද්දී අපි දැවැන්ත මෙහෙවරක් ඉෂ්ට සිද්ධ කළා. ඒ කටයුතු කිරීම තුළදී මේ පළාත් සභාවට ආවා කියලා මම හිතන්නේ අපට ජනතාව දෝෂාරෝපණය කරනවා. ඇයි මෙතැනට ගියේ. ඔබතුමන්ලා හිටියා නම් මේ කටයුතු මේ විධියට සිදු වෙන්නේ නැහැ. හොරකම, දූෂණය, වංචාවට අපි පයින් ගහලා එළවලා දාලා මහා දැවැන්ත සංවර්ධනයක් අපේ ප්‍රදේශය තුළ ඉටු කළා. සමහර අවස්ථාවලදී අපි පළාත් සභාවට ආවේ අලුත් මන්ත්‍රීවරු වශයෙන්. හැබැයි, අපි මේකට ඇවිල්ලා ඉන්න කොට සමහර අය අපව එක එක විධියට හරවන්න, අපව එක එක පැත්තට ගෙනියන්න, අපට ඕනෑ ඕනෑ විධියට දේවල් කියන්න කටයුතු කළත්, අපි කාටවත් නැවෙන, අපි කාටවත් දිග ඇරෙන, අපි කාටවත් හොලවන්න පුළුවන් මන්ත්‍රීවරයෙකු වශයෙන් අපි කටයුතු කළේ නැහැ. අපි හරි දේ හරියට කථා කළා. අසාධාරණය, අයුක්තිය වෙනුවෙන් අපි හරියට කෙළින් කථා කළා. ඒ කෙළින් කථා කරලා මේ සභාව තුළට අවශ්‍ය කරන ශක්තිය මේ ඉන්න සියලුම මැති ඇමතිවරුන්ට ලබා දුන්නා. මේ ඉන්න නිලධාරීන්ට ලබා දුන්නා. නිලධාරියෙකුට කවුරු හරි අනවශ්‍ය විධියට විරුද්ධව කථා කළා නම්, ඒ නිලධාරීන් වෙනුවෙන් අපි කටයුතු කළා. කථා කළා. ඒ අවශ්‍ය කරන ශක්තිය ලබා දුන්නා.

හැබැයි, ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, සමහර අවස්ථාවලදී අපි මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය වෙනුවෙන් හරි සමහර වෙලාවලදී අපි ප්‍රාදේශීය සභාවට එන සභාපතිට, ලේකම්ට කථා කරන්නය කියලා තමුන්නාන්සේට කිව්වත් මොනවා හරි දෙයකට, නමුත් අපේ අගය දන්නේ නැති තරමට සමහර අවස්ථාවලදී කටයුතු කිරීම් තුළින් පුංචි පුංචි දේවල් සිදු වුණා. ඒ සිදු වෙන්නේ මොකද? සමහර විට මම හිතන්නේ, ඒ සඳහා මොන යම් හෝ හේතු තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ. මොකද, අපි පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් මේ සභාවට ඇවිල්ලා මේ අයවැය ක්‍රියාත්මක වන මොහොතේදී මම කියන්න ඕනෑ. කවදාවත් ඔබේ අයවැයට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ඇවිල්ලා මේකට ඡන්දය දෙන්න එන්නේ නැහැ. මේ ඉන්න මන්ත්‍රීවරු තමයි අත් දෙක උස්සලා ඡන්දය දෙන්නේ. එහෙම නම් මම හිතන්නේ, තමුන්නාන්සේ මේ සභාවට ඇවිල්ලා අහපු දවසේ ඉඳන්, ප්‍රධාන ඇමතිවරයා වශයෙන් මහා දැවැන්ත මෙහෙවරක් ඉෂ්ට සිද්ධ කළා. ඒ දැවැන්ත මෙහෙවර තුළ මම හිතන්නේ වෙනදාට වඩා නොතිබුණු දේවල් අපට ලබා දුන්නා. හැබැයි, සමහර අවස්ථාවලදී මම මේ සංචාරක අමාත්‍යාංශය එහෙම නැත්නම් තමුන්නාන්සේගේ තිබෙන උපදේශක කාරක සභාවේ එකක් දෙකක් සඳහා නොවෙයි, හැම එකක් වෙනුවෙන්ම ඉදිරියට එනවා. මේ ඉන්න මැති ඇමතිවරුන්ගේ හැම උත්සවයකටම අපි ආවා. අපි පක්ෂ පාට භේදයකින් තොරව. අපි දෙතැනක හිටියත් අපි ඒ අවශ්‍ය කරන ශක්තිය තමුන්නාන්සේට ලබා දුන්නා. හැබැයි, සමහර අවස්ථාවලදී එක එක්කෙනා අර ඇමතිවරයාව ගෙදර යවන්න විශ්වාසභංග ගෙනාවත්

මේ කථා කරන අපි හෙලවුණේ නැහැ. අපිව එහෙම නවන්න බැහැ. මොකද හේතුව, අපි හොඳට කරිජ්ජ පාගලා, හොඳට ඇවිදලා, වැල්ලේ ඇවිදලා, වැල්ලේ කථා කරලා අපි හොඳට දේවල්වලට පුරුදු වෙලා ඉන්නේ.

මම හිතන්නේ, අපට සමහර අවස්ථාවලදී පොඩි කනගාටුවක් හදවතට දැනෙනවා. මොකද හේතුව, මෙවන් දැවැන්ත සංවර්ධනයක් ක්‍රියාත්මක වෙලා අපි ශක්තිය දෙන කොට අපව මම හිතන්නේ ඒ දේවල්වලට යොමු වෙනවා. මම නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා. මේ වන කොට පළාත් පාලන ආයතනවල අක්‍රමිකතා ඕනෑතරම් සිදු වෙනවා. උදාහරණයක් ගත්තොත් මේ වන කොට බේරුවල ප්‍රාදේශීය සභාව තුළ මාසයට ලක්ෂ පහක පස් දාන කටයුත්තක් සිදු වෙනවා. හැබැයි, එකම කාර්මික නිලධාරියෙකුවත් අත්සන් කරන්නේ නැහැ. එකම කාර්මික නිලධාරියෙකුවත් අත්සන් නොකර ගරු සභාපතිතුමනි, මේ කටයුතු සිදු වන්නේ. මේ ගැන පරීක්ෂා කරන්න ඕනෑ. අත්සන් නොකර තමන්ගේ හිතු මතේට මේවාට සිද්ධ වෙනවා. මහා දූෂණ සිදු වෙනවා. මෙහේ විතරක් නොවෙයි අනිකුත් තැන්වලත් මේවා සිදු වෙනවා. හැබැයි, මේවාට ශක්තිය දෙන්න අපේ ප්‍රධාන ඇමතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායම හා මේ නිලධාරීන් ඒවාට අවශ්‍ය කරන ශක්තිය ලබා නොදෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද, මේවා පිළිබඳව සොයා බලා කටයුතු කරන්න. මම හිතන්නේ, අපේ ප්‍රධාන ඇමතිතුමා හරි ලස්සනයි. මීටියි. හැබැයි, ඔබතුමාට වඩා මම වුට්ටක් උසයි. හැබැයි, අපි දන්නේ නැහැ. මම හිතන්නේ ඔබතුමාගේ පුදුමාකාර වාසනාවකට ඔබතුමා ප්‍රධාන ඇමතිවරයා වුණා. හැබැයි, ප්‍රාදේශීය සභාවේ සභාපති වන කොට මම කිව්වේ, කවදා හරි මෙතැන ඉන්න හැම මන්ත්‍රීවරයෙකුම මේ සභාවේ සභාපති වෙන්න ඕනෑ. ඒ සඳහා කටයුතු කරන්න ඕනෑ. එහෙම නම් මම කියනවා, අද මෙතැන ඉඳගෙන.

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රධාන ඇමතිතුමාට මම කියනවා. කවදා හරි මේ උස් පුටුවල අපිත් ඉඳගන්නවා. අපෙත් ආසාව තිබෙනවා. අපෙත් ඒ බලාපොරොත්තුව සඵල වෙනවා. මතක තියා ගන්න. අන්න එදාට මම හිතන්නේ, අපිත් මේ දේවල් අහලා, බලලා, සොයලා, අහගෙන ඉඳලා, දැකලා පුරුදු වෙලා පරිණත වෙන කොට මම හිතන්නේ, අපෙත් ඒ කාලය එන කොට මම හිතන්නේ අපි අවශ්‍ය කරන තැන්වලට ඇවිල්ලා. ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු හැම වැය ශීර්ෂයකටම අපි හැමදාම මේ සභාවේ පටන් ගන්න වෙලාවේ ඉඳලා අවසාන වෙන තෙක් වාඩි වෙලා ඉන්නවා. අවසානය වනකල් අපි වාඩි වෙලා ඉන්නවා. අපි අදත් එහෙමයි. හෙටත් එහෙමයි. ඉදිරියටත් එහෙමයි. ඒ වාගේම කටයුතු කරනවා. හැම උපදේශක කාරක සභාවටම යනවා. හැම උපදේශක කාරක සභාවකටම ගිහිල්ලා ඒ අවශ්‍ය කරන ශක්තිය දෙනවා.

අපි මේ වැය ශීර්ෂය තුළදී ප්‍රධාන ඇමතිතුමා ඇතුළු සියලුම ඇමතිවරුන්ගේ වැය ශීර්ෂවලට අපි අපේ ශක්තිය ලබා දීලා අපේ අනුමැතිය ලබා දෙනවා. මොකද හේතුව? අපි හැමදාම වැඩ කරනවා. අපි වැඩ කර ගත්තා. සියලු ඇමතිවරු අපට උදව් කළා. හැබැයි, මේ වන කොට මම හිතන්නේ තමුන්නාන්සේලා අපි ඔක්කොම අත්වැල් බැඳගෙන කටයුතු කරද්දී මේ සහෝදර මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය ආරක්ෂා කර ගෙන වැඩ කටයුතු කළා. ඒ වාගේම තමයි අපේ සභා ලේකම්තුමා ප්‍රධාන සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් අපට ලොකු ශක්තියක්. ඒ වාගේම තමයි අපේ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සමස්ථ නිලධාරී මණ්ඩලය මම හිතන්නේ, අපේ හැම අමාත්‍යාංශයකම, හැම ආයතනයකම ඉන්න සියලුම නිලධාරීන් මහා දැඩි ශක්තියක් අපට ලබා දුන්නා. ඒ ලබා දීම පිළිබඳව ප්‍රධාන ඇමතිතුමා, ඒ වාගේම හිටපු කොමසාරිස්තුමිය අද ලේකම්තුමිය වශයෙන් පත් වෙලා ඒ අවශ්‍ය කරන ශක්තිය ලබා දීලා, සහකාර කොමසාරිස්තුමන්ලා ඔක්කොම එකතු වෙලා අපට ලබා දුන්න ඒ නිලධාරීන්ට අපේ හද පිරි ප්‍රණාමය, ගෞරවය, අද මේ නව ගොඩනැගිල්ල තුළ ඉඳන් අපි ලබා දෙනවා. පිරිනමනවා.

ඒ වාගේම තමයි, ඊයේ දවසේ මම කථා කරන්න බලාපොරොත්තුවෙන් හිටියා. හම්බ වුණේ නැහැ. මොකද හේතුව, ඊයේ දවස මගේ සුභ දවසක්. මටත් ආසා හිතුණා. අපේ පළාත් සභාවේ 31 වැනි මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරන කොට ඊයේ දවස ගැන මම කථා කරනවා නම්, මගේ උපන් දිනය තිබුණේ ඊයේ. මට හරි කැමැත්තක් තිබුණා. අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒ වුණත් අද මේ අලුත් සභා ගැබ තුළ අපි ප්‍රාර්ථනා කරනවා. එහෙම නම් ලබන්නා වූ නත්තල මේ සියලු දෙනාටම සුභ නත්තලක් වේවා! ලබන්නා වූ 2019 වසර සුබම සුභ නව වසරක් වේවා! සියලු සිතුම් පැතුම් සියල්ල ඉටු වේවා! ඒ වාගේම තමයි ලබන අවුරුද්ද හැමෝටම සාමය, සතුට පිරි මම හිතන්නේ අපේ රජයක් තුළින්ම අපේ ජනතාවට සේවය කරන්න ශක්තිය,

ධෛර්යය, වාසනාව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොමත් ස්තුතියි. ගරු සභාපතිතුමනි, කොළ ටිකක් තිබෙනවා. සභාගත කරන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

සභාගත කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 10.02]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් යටතේ කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන අපි සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි, අපේ ප්‍රධාන අමාත්‍යතුමා මේ පළාත් සභාවේ මහ ඇමති ධූරය භාර ගත්තායින් පසුව, මේ පළාත් සභාව පළාත් පාලන ආයතනත් එක්ක තිබුණු සම්බන්ධතාවය ඉතාමත්ම කිට්ටු වෙලා, ඒ සම්බන්ධතාවය තුළ පළාතේ ජීවත් වන ජනතාවට විශාල සේවාවක් කරන්න පළාත් පාලන ආයතනවලටත අවස්ථාව එතුමා ලබා දුන්නා. මම හිතන්නේ එතුමා පළාත් පාලන ආයතනවල ඉඳගෙන, මහරගම නගර සභාවේ නායකත්වය අරගෙන ඒ ලබා ගත් අත්දැකීම් තුළින් එතුමා විශාල සේවයක් කරන්න සැලැස්මක් හදා ගත්තා. එතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව විටින් විට රැස් වෙලා, ඒ උපදේශක කාරක සභාවට අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුත් ඉතාමත් සතුටින් සහභාගී වෙලා, ඒ උපදේශක කාරක සභාවේ හිටපු නිලධාරීන් එක්ක කටයුතු කිරීම තුළ ගරු ප්‍රධාන අමාත්‍යතුමා විපක්ෂයේ තිබෙන අදහසුත් සම්බන්ධ කර ගෙන, ආණ්ඩු පක්ෂයේ තිබෙන සම්බන්ධතාවයත් ඇති කර ගෙන දැවැන්ත වැඩ පිළිවෙළක් පළාත් පාලන ආයතන තුළ ක්‍රියාත්මක කරන්න එතුමා වැඩ කටයුතු කළා. පළාත් පාලන ආයතනවලින් ගමේ ජනතාවගේ ජීවන තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා එතුමා ඉතාමත් හොඳ ව්‍යාපෘතියක් ආරම්භ කරලා තිබුණා. දුෂ්කර ගම්වල මං මාවත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය. ඒ ව්‍යාපෘතිය තුළ අපි දැක්කා, පළාත් පාලන ආයතනවලට විශාල ශක්තියක් ලබා දෙන්න එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණාම, ඒ වාගේම බස්නාහිර පළාතේ ජීවත් වුණු ගම්පහ, කළුතර දිස්ත්‍රික්වල ජනතාවට මේ දුෂ්කර මං මාවත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය තුළ විශාල සේවයක් ලබා දෙන්න අපට පුළුවන්කමක් ඇති වුණා. ඒ පුළුවන්කමේ වාසිය අපි දිනා ගන්න කොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලොකු අභියෝගයක් වුණා. මෙවැනි සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරන්න ශක්තිය, මූල්‍ය ප්‍රතිපාදන, සැලැස්ම ක්‍රියාත්මක වීම තුළ පාර්ලිමේන්තුවට වැඩිය වැඩි සේවාවක් අපි ග්‍රාමීය මට්ටමෙන් ලබා දෙන්න අපට පුළුවන්කම ඇති වුණා කියන එක අපි මතක් කරන්න ඕනෑ.

ඊළඟට මම අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. පසුගිය අවුරුදුවල විශාල ගං වතුරක් කළුතර දිස්ත්‍රික්කයට ඇවිත් අසරණ මිනිස්සුන්ට අවශ්‍ය කරන සියලු පහසුකම් ටික ලබා දෙන්න එතුමා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණු අවස්ථාවේදී අපට මතකයි. අපි දුරකථනයෙන් කථා කළාම ඒකට ඇහුම්කන් දීලා, ඒකට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන, උපදෙස්, ඒ වාගේම ඇවිත් නිරීක්ෂණය කරලා බලලා කටයුතු කිරීම තුළ එතුමා මේ පළාතේ පළාත් පාලන ආයතන හරහා ඉතාමත් ලොකු ව්‍යාපෘතියක් අපට ක්‍රියාත්මක කරලා දුන්නා. ගැමි ජනතාවගේ අවශ්‍යතාවයන්. මෙතුමා ඒ ප්‍රදේශයේ වැසිකිළි ව්‍යාපෘතියක් ආරම්භ කළා. මම හිතන්නේ, මේ පළාත් සභාවේ වැඩිම මූල්‍ය ප්‍රතිපාදනයක්. එතුමා ඒ ගංවතුරට අලාභ හානි වුණු වැසිකිළි පද්ධති සංවර්ධනය කිරීමට එක් ලක්ෂ විසි පන්දාහක මූල්‍ය ප්‍රතිපාදනයක් ඒ ජනතාවට ලබා දීලා ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න කටයුතු කිරීම මම හිතන්නේ, ඉතාමත් වටිනා ව්‍යාපෘතියක් හැටියට අපි සඳහන් කරන්න ඕනෑ.

ඊළඟට අපට තව එක ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා යහපාලන ආණ්ඩුවේ හිටපු ජනාධිපතිවරයාගේ නිර්දේශය මත මෙතැනට ඇවිදින් මහ ඇමති ධූරය භාර ගත්තා. හැබැයි, අපේ පළාතේ ආදායම අපට එකතු කර ගන්න තිබුණු BTT මුදල් ප්‍රමාණය, අපේ පළාත් සභා පනතින් අපට අයිති වෙලා තිබුණු දෙයක් අපේ පළාත්

සභාවට අහිමි වුණා. ඒ අහිමි වීම තුළ මම හිතන්නේ, මධ්‍යම ආණ්ඩුවට විශාල ආදායමක් ඒ තුළින් ලබා ගන්න පුළුවන්කම ඇති වුණා. පළාත් ආණ්ඩුවට ඒ ලබා දීපු මූල්‍ය ප්‍රතිපාදනය, එහෙම නැත්නම් ඒ බලතල අනුව අපි දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් පළාතේ ජනතාවට මධ්‍යම ආණ්ඩුවට කථා කර කර, අඬ අඬා ඉන්නේ නැතිව ඒ මූල්‍ය ප්‍රතිපාදනය අපට තිබුණා නම් ඒ තුළින් අපට විශාල ආදායමක් ඇති කර ගෙන මේ ප්‍රදේශයේ පළාත් සභාවේ ආදායමක් හැටියට දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්කම ලැබෙන්න තිබුණා. ඒක අපි ඉතාමත් කනගාටුවෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. පසුගිය රාජ්‍ය පාලනය කාලයේ ඒ බලය අපෙන් අහිමි කර ගෙන ආපහු මධ්‍යම ආණ්ඩුවට ලබා ගැනීම තුළ අපේ පළාත් සභාව දැවැන්ත ශක්තියක් තිබුණු පළාත් සභාවක් හැටියට ගරු ප්‍රධාන අමාත්‍යතුමා මුදල් ඇමතිතුමා හැටියට ආදායම් උත්පාදනය කරන ඒ පනතේ බලය අපට අහිමි කරලා, ඒ මූල්‍ය ප්‍රතිපාදනය මධ්‍යම ආණ්ඩුවට ලබා ගැනීම තුළ අපට ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා.

ඒ වාගේම තවත් කාරණාවක් පසුගිය කාලයේ, යහපාලන ආණ්ඩුව කාලයේම මේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවලට ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක වන ඒවාට - අර අපේ ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ගොඩනැගිලි ඉදි කිරීමේ බලයේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අවස්ථාව පළාත් පාලන ආයතන පනතින් ලබා දීලා තිබුණේ අපට. හැබැයි, පසුගිය දවස්වල අපි දැක්කා. මේක ආපහු අරගත්තා අපේ යහපාලන ආණ්ඩුවෙන්. ආපහු යහපාලන ආණ්ඩුව වෙනස් වුණු ගමන්ම දිවුරුම් දීපු අමාත්‍යතුමා ප්‍රකාශයක් කළා ඒ බලය ආපහු පළාත් පාලන ආයතනවලට ලබා දෙනවාය කියලා. මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ. අන්න ඒ බලය අපට ලබා ගැනීම අත්‍යවශ්‍යයි. ඒ බලතල අපේ පළාත් සභාවේ 13 වන ව්‍යවස්ථාවෙන් ලබා දීලා තිබෙන බලය එන්න එන්න මධ්‍යම ආණ්ඩුව ගන්න එකට අපි විරුද්ධව අධිකරණයකට හරි ගිහිල්ලා ඒ බලය, අපේ අයිතිය ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා නම් මම හිතන්නේ අපට මෙවැනි ගැටලුවලට මුහුණ දෙන්න වෙන්නේ නැහැ. පළාත් පාලන ආයතන බස්නාහිර පළාතේ විශාල ප්‍රමාණයක් තියෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ අරගෙන බැලුවත් කළුතර ගම්පහ දිස්ත්‍රික්කවල ඉදිකිරීම් කටයුතු අඩු වුණත් මේ කොළඹ දිස්ත්‍රික්කයේ පළාතේ ජීවත් වන පුරවැසියන්ට ඒ සේවාව ලබා ගැනීමේ අවශ්‍යතාවය තිබෙනවා . ඒ සඳහා පළාත් සභාවෙන්, අපට ලබා දෙන්න පුළුවන් සහයෝගයක් ලබා දීම සඳහා ක්‍රියාත්මක කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නය කියන එක ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලීම් කරන්න කැමැතියි.

ඊළඟට මෙතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන බලතල අනුව බැලුවාම අපි දැක්කා, මේ පළාත් සභාවේ ප්‍රධාන ඇමතිවරු ගණනාවක් හිටියා. ඒ හිටපු ප්‍රධාන ඇමතිවරුන් ඒ තනතුරේ බලය පාවිච්චි කිරීමේ ඒ උත්සාහය විවිධයි. ඒ ඒ ප්‍රධාන අමාත්‍යවරුන් එක එක විධියට දේශපාලන පක්ෂග්‍රාහීව ඒ බලය ක්‍රියාත්මක කළා. නමුත් අපි ඉතාමත් සතුටින් ප්‍රකාශ කරන්න ඕනෑ. කුහකකමක්, ඉරිසියාවක් නැතිව අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා, මේ පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරු මම හිතන්නේ 104 දෙනාටම එතුමා ඉතාමත්ම සුහදශීලීව ඒ නායකත්වය ලබා දුන් අතර, ඒ තනතුර උපයෝගී කර ගෙන අපේ පළාතේ සංස්කෘතික වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න වුණු අවස්ථාවලදී දැවැන්ත වැඩ පිළිවෙළකට මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න එතුමා කටයුතු කළා. ඒ වාගේම තමයි මේ පළාත් සභාවේ ඉන්න සියලුම මන්ත්‍රීවරුන් එක්ක එකට සහයෝගයකින්, විහිළුවක් කරලා, කථා කරලා ඒ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමට එතුමා ගත්තු උත්සාහය තමයි, අද මේ පළාත් සභාව එදා ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමන්ලා ක්‍රියාත්මක කළා කිව්වාට මේක නිම කර ගන්න, මේ ගොඩනැගිල්ල නිම කර ගන්න, මේ ගොඩනැගිල්ලේ අවශ්‍යතාවයන් ඉටු කර ගන්න, මේ ගොඩනැගිල්ලට මන්ත්‍රීවරු 104 දෙනාම ගෙනැල්ලා මේ පළාතේ ජනතාවගේ අදහස් සාකච්ඡා කරන්න, මේ ගොඩනැගිල්ලට පැමිණීමට හැකි වුණේ. එතුමා නොහිටියා නම් අපට මේ පළාත් සභාව අවසන් වෙන්න කලින් මේකේ මේ සභාව තියන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැයි කියන එකත් අපි ප්‍රකාශ කරන්න ඕනෑ. එහෙම නම් අන්න ඒ වාගේ උසින් අඩු වුණාට එතුමාගේ තිබෙන ක්‍රියාශීලීත්වය, ක්‍රියාකාරීකම මේ පළාත් සභාව ශක්තිමත් විධියට, බස්නාහිර පළාතේ පුරවැසියන්ට ආදර්ශයක් වන හැටියට වැඩ කටයුතු කරන්න එතුමා කටයුතු කළා.

ඊළඟට මම මතක් කරන්න ඕනෑ, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. මේ පළාත් සභාවට අපට පැවරිලා තිබෙන බලතල අනුව එතුමාගේ අමාත්‍යාංශයේ

[ගරු කිත්සිරි කහටපිටිය]

සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීමට, දියුණුව ඇති කිරීම සඳහා අපට බලයක් තිබෙනවා. සංචාරක ව්‍යාපාරය ක්‍රියාත්මක කරන කොට 1994 අංක 03 දරන ප්‍රඥප්තිය අපි පළාත් සභාවේ ක්‍රියාත්මක කළා. 2010 වසරේදී බස්නාහිර පළාතේ සංචාරක මණ්ඩලයක් පිහිටෙව්වා. ගරු සභාපතිතුමනි, මේ බස්නාහිර පළාත් සභාවට මේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා ලොකු බලතලයකුත් තිබෙනවා. ඒකෙන් ආදායමකුත් ලබා ගන්න පුළුවන්. සංචාරක ව්‍යාපාරය දියුණු කරන කොට දේශීය අයට, විදේශීය අයගේ සහයෝගය, මූල්‍ය ප්‍රතිපාදනය යෙදවීම තුළින් දැවැන්ත ආදායමක් අපට සංචාරක ව්‍යාපාරය තුළින් ඇති කරගන්න පුළුවන්. මම මෙහෙම කියන්න හේතුව වුණේ, අපට තිබෙන මේ බලතලය උපයෝගී කර ගත්තාම ලෝකයේ ඕනෑම රටකින් සංචාරකයෝ ඇවිල්ලා රටට ඇතුළු වෙන්නේ, ගොඩබිමට බහින්නේ බස්නාහිර පළාතේ කටුනායක ගුවන් තොටුපළින්. ඒ බැහැලා මෙතැනින් තමයි ඒගොල්ලෝ විසිරිලා ශ්‍රී ලංකාවේ හැම තැනටම යන්න සැලසුම් හදලා ක්‍රියාත්මක වෙන්නේ.

එහෙම නම් මේ පළාතේ සංචාරක ව්‍යාපාරය ශක්තිමත් කරන්න අර අපේ ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රදේශයේ එතුමා උපදේශක කාරක සභාවේ හැමදාම කථා කර ගෙන කියනවා. ඒ උපදේශක සභාවේදී එතුමා දෙන අදහස් ටික අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා පිළිඅරගෙන අපි උපදේශක කාරක සභාවේදී දැවැන්ත සංචාරක ව්‍යාපාරයක් ක්‍රියාත්මක කරවීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන කොට මම ඉතාම සතුටින් ප්‍රකාශ කරන්න ඕනෑ. මදුරාවල ප්‍රදේශයේ අම්පිටිගල විහාරස්ථානය සම්බන්ධ කර ගෙන ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒකට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන, ඒකට අවශ්‍ය මාර්ගෝපදේශක වැඩ සටහන, ඒවා ක්‍රියාත්මක කරවීමේදී අපේ ගම් පළාත එදා දුප්පත් මිනිස්සු, තේ දළු ටික කඩාගෙන, කිරි ටික කපාගෙන හිටපු මිනිස්සු ඒ සංචාරක කලාපය එදා මදුරාවල ආරම්භ කරපු අවස්ථාවේදී, නොයෙකුත් විධියට සංචාරකයින් පැමිණෙන කොට ඒ අයගේ ආර්ථිකය ඉතාමත් වැඩි වෙන්න පටන් ගත්තා. ඒ සංචාරකයෝ ආවාම, ඒ ගම්මාන නිරීක්ෂණය කරලා වරකාගොඩ ගල්ලෙන රජමහා විහාර ස්ථානයේ ප්‍රදේශයට ඒ සංචාරක කලාපය ඇතුළත් කරලා වැඩ කටයුතු කිරීම තුළ බස්නාහිර පළාතේ වටිනාකම ඒ ජනතාවට දැනෙන විධියේ ව්‍යාපෘතියක් එතුමා ආරම්භ කරලා දුන්නා. මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන්. ඔබතුමා එදා අපේ අම්පිටිගල විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේත් හම්බ වුණු අවස්ථාවේදී උන් වහන්සේ ඉල්ලීමක් කරලා තිබෙනවා, මෙම සංචාරක කලාපයේ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ඉඩම රජයෙන් බස්නාහිර පළාත අරගෙන පළාත් සභාවේ මූල්‍ය ප්‍රතිපාදන යොදලා ඒ වැඩ පිළිවෙළට ශක්තියක් ලබා දෙන්නය කියලා. ඒ ඉල්ලීම ඔබතුමා වෙත ඉදිරිපත් කරලා තිබෙනවාය කියන එක උන්වහන්සේ සඳහන් කළා. එහෙම නම් මම ඔබතුමාගෙන් ඉල්ලන්න කැමැතියි. ඒ සංචාරක කලාපය ඒ ප්‍රදේශයේ පමණක් නොවෙයි. කළුතර දිස්ත්‍රික්කයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ නොයෙකුත් ප්‍රදේශවල ඒ වාගේ ස්ථාන හඳුනාගෙන ඒවා මිලදී අරගෙන, ඒවාට සහයෝගය දීලා, සංචාරක ව්‍යාපාරයෙන් බස්නාහිර පළාත සංවර්ධනය කරන්න අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන රැස් කර ගන්න අපට පුළුවන්, හොඳ ආදායමක් ලබා ගන්න පුළුවන් මාර්ගයක් කියන එක මම මේ අවස්ථාවේදී එතුමාට ඔබතුමාගේ මාර්ගයෙන් සඳහන් කරන්න කැමැතියි.

ඊළඟට අපි දැක්කා. අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන ක්‍රියාත්මක කරවීමේදී අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉතාමත් හොඳ අභියෝගාත්මක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කටයුතු කළා. ඒ පිළිබඳව අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ ඇමතිතුමාට, අපේ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු ඒ නිලධාරී මණ්ඩලයට අපි විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. මොකද, මධ්‍යම ආණ්ඩුව මේවාට හැම තිස්සේම හරස් කපන කොට ගරු ප්‍රධාන අමාත්‍යතුමා භය නැතිව, නිර්භීතව ඒ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ස්ථාන හඳුනාගෙන, ඒවාට අවශ්‍ය නීතිමය බලතල අරගෙන ඒ වැඩ කටයුතු කිරීම පිළිබඳව විශේෂ ස්තුතියක් අපි එතුමාට පුද කරන්න ඕනෑ. අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ වැඩ සටහන ගැන අපට හුඟාක් කථා කරන්න තිබෙනවා. නමුත් වෙලාව ප්‍රශ්නයක් නිසා මම ඒක කෙටියෙන් ඉවර කරනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශයේ වැඩ සටහන මෙතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙනවා. මේ වන විට බස්නාහිර පළාතේ 100% ක් ම සම්පූර්ණ වී ඇති විදුලි බලය, නිවෙස්වල විදුලිය පරිභෝජනය පවත්වාගෙන යෑම සඳහා අපට විදුලි බල මණ්ඩලයේ විදුලිය ගන්නවාට වැඩිය, අපට අලුත්

තාක්ෂණය යොදවලා සූර්ය බල ශක්තිය ලබා ගැනීම සඳහා විදුලි බල කට්ටල අපේ පළාත් සභාව තුළින් ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, අපි මිනිස්සුන්ට විදුලිය ලබා දෙනවා වාගේ පුළුවන්කමක් ඇති වෙනවා නම්, ජාතික ජල විදුලිය ඉතිරි කර ගෙන ඒ ගෙවල්වල තිබෙන වහලයට ඒක සවි කර ගත්තාම අපට ඉබේම සූර්යබල විදුලිය ලබා දීමට ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් ඇති වෙනවා.

එහෙම නම් ඔබතුමාගේ මාර්ගයෙන් එතුමාට මේ කරුණු ටික ඉදිරිපත් කරමින් මේ අපි හය වන පළාත් සභාවේ අවසන් අයවැයට කථා කරන්නේ. මම හිතන්නේ ප්‍රධාන අමාත්‍යතුමා ඉතාමත් දක්ෂ, සුහදශීලීව වැඩ කටයුතු කරන පුද්ගලයෙකු හැටියට, මෙය ඉතාමත්ම සුහදශීලී අයවැයක් හැටියට තව මාස තුනකට ඉදිරිපත් වුණු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න එතුමාට, ඒ වාගේම අපේ අමාත්‍ය මණ්ඩලයට, අපේ සියලුම නිලධාරීන්ට ධෛර්ය, ශක්තිය, වාසනාව ලැබෙන්නය කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[පූ.භා. 10.18]

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොමත්ම ස්තූතියි. පළාත් පාලන අපද්‍රව්‍ය කළමනාකරණය, සංචාරක, විදුලි බල හා බල ශක්ති, ජල සම්පාදන හා ජලාපවාහන කටයුතු, පරිසර හා ආර්ථික ප්‍රවර්ධන කියන විෂයන් පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමා පසුගිය කාල සීමාව තුළදී මේ බස්නාහිර පළාත් සභාවේ ගෙන ආ ප්‍රගතිය පිළිබඳව විපක්ෂයේ අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාත්, ඒ වාගේම ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමාත් මට පෙර කථා කළා. ඒ කථා දෙකම මම අහගෙන හිටියා. ඒ කථා දෙක තුළම තිබුණේ බස්නාහිර පළාත් සභාව මේ අවුරුදු කිහිපය තුළ දී, ප්‍රධාන ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගෙනියන මේ අවුරුදු කිහිපය තුළදී ඉතාමත්ම සුහදශීලීව මිත්‍රත්වයෙන් මන්ත්‍රීවරු 104 දෙනාම - අර එදා ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ වෙන වෙනම සහ පොදු වශයෙන් සම්බන්ධීකරණය කර ගෙන ගෙනාපු වැඩ පිළිවෙළක් නිසා තමයි හැමෝගේම ප්‍රශංසාව සහ මීට ඉහතදී ඉදිරිපත් වුණු සියලු අයවැය ඒකමතිකව මේ සභාවේ සම්මත කර ගන්න පුළුවන්කමත් ඇති වුණේ. ඒ ආකාරයෙන් අනෙකුත් ඇමතිවරුන්ගේ යම් යම් අඩුපාඩුකම් මග හරවාගෙන ඒවා පිළිබඳවත් ඒ වගකීම ප්‍රධාන අමාත්‍යතුමා භාර ගෙන ඒ වැඩ කටයුතු කරපු නිසා තමයි ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ ඉන්න සියලුම මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රශංසාව තුළ අයවැය සම්මත කර ගන්න පුළුවන්කමක් ලැබුණේ. දැන් මට ගැටළුවක් තිබෙනවා. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ කථාව පුරාම තිබුණේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යතුමාගේ හොඳ. ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා කථා කළේත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ ඒ පළාත් සභාවේ සුහදශීලීව, මිත්‍රශීලීව ගෙනාපු හොඳ. මෙහෙම කථා කරලා මේ අයවැයට 100% ක් ප්‍රශංසා ගුණයකින් ඡන්දය ලබා දෙයි කියලත් මම විශ්වාස කරනවා. එහෙම නොකරන්නේ නම්, මහජන නියෝජිතයෙකු වශයෙන් තමන්ව මෙහෙයවන වෙනත් බලවේගවලට යටත් වුණු රූකඩයක් වෙන්නේ නැහැයි කියන එකත් අපේ මන්ත්‍රීවරු, අපි විශ්වාස කරනවා. ඒ නිසා එක විධියකට කථා කරලා තව විධියකට පළාත් සභාවේ ඡන්ද වෙලාවේ හැසිරෙන්න අපේ මන්ත්‍රීවරු නොකරාවි කියන විශ්වාසයකුත් මා තුළ තිබෙනවා.

බස්නාහිර පළාත් සභාව තුළ පළාත් පාලන ආයතන පිළිබඳව යමක් කථා කරනවා නම්, එදා සමස්ත පළාත් පාලන ආයතනවල හිටපු මහජන නියෝජිත සංඛ්‍යාව 886 යි. නමුත් දැන් මෙවර පළාත් පාලන ආයතන නියෝජනය කරන මහජන නියෝජිත සංඛ්‍යාව 1757 ක් වෙලා තිබෙනවා. දෙගුණයකට ආසන්නව වැඩි වෙලා තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමා පළාත් සභාව තුළ මේ ගෙනියන මිත්‍රශීලී භාවයෙන්, සුහදශීලී භාවයෙන් සියලු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරගෙන කරනවා වාගේම, ඔබතුමාගේ පෞද්ගලික අවධානය සහ ගරු ප්‍රධාන ලේකම්තුමා ඇතුළු පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ අවධානය යොමු වෙලා මේ 1757 ක් වන ඒ මහජන නියෝජිතයන්ටත් දිගින් දිගටම කරුණු අවබෝධ කර දීලා, මහජන සේවාව කරන්නේ කොයි ආකාරයෙන්ද කියන එක පිළිබඳව පුහුණුවක්, දැනුමක්, අවබෝධයක් කර දෙනවා නම් ඉතාම වැදගත් කියන එකයි මම විශ්වාස කරන්නේ. මට මතකයි. අපි පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් හැටියට දීර්ඝ කාලයක් වැඩ කළා. ඒ කාල සීමාව තුළ අපට බලයක් තිබුණා, යමක් ප්‍රායෝගිකව හිතලා කෙනෙකුට වැඩක් කරන්න පුළුවන්කමක් ඇති වුණා. මට මේ ඊයේ පෙරෙයිදා

[ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා]

ප්‍රශ්නයක් ආවා. එක්තරා මනුස්සයෙක් රු. 150,000 ක ණය මුදලක් අරගන්න බැංකුවට යනවා. ඒ බැංකුවට ගියාම කියනවා තමන්ගේ ඉඩමේ, නැත්නම් නිවසේ පුංචි නිවසක් තිබෙන නිසා. මේකේ ප්ලෑන අනුමත කර ගෙන ගේන්න කියලා. ඒ වාගේ සිද්ධියක් අපි ඉන්න කාලේ අපට ආවාම, අපි ඒ පුංචි මුදල අරගෙන, රිසිට් එකක් කඩලා ඒක බොහොම ලේසියෙන් අනුමත කරලා දෙනවා. ඒ පළාත් පාලන ආයතනයෙන් මේ මනුස්සයාට කියලා තිබෙනවා. ඒ ගේ ආරම්භ කරලයි ඒ loan එක ගන්නේ. ඒ සඳහා රුපියල් 48,000 ක දඩ මුදල ගෙවන්නය කියලා. රුපියල් 150,000 ක ණය මුදලක් බැංකුවෙන් ගැනීමට අවශ්‍ය ඒ සැලැස්ම අනුමත කර ගන්න. වංචාවක් නොවෙයි. නීත්‍යානුකූල දඩ මුදලත් එක්ක මුදල වෙලා තිබෙනවා, රුපියල් 48,000 ක්. මෙන්න මේවා ප්‍රායෝගිකව හිතන්න බැරිකම නිසා, ප්‍රායෝගිකව කටයුතු කරන්න බැරි නිසා ජනතාවට අවශ්‍ය කරන සේවාව ලැබෙන්නේ නැහැයි කියන එකයි මම මේ අවස්ථාවේ පෙන්වන්නේ. මම උදාහරණයක් ඒ කිව්වේ. ඒ වාගේ අවස්ථාවලදී සභාපතිවරයාට ඒකට යම්කිසි ක්‍රියාමාර්ගයක් අරගෙන තමන්ගේ බල ප්‍රදේශයේ ඉන්න ජනතාවට සේවාවක් වන ආකාරයෙන් කටයුතු කරන්න සහ මග පෙන්වන්න අවශ්‍ය පුහුණුව සහ අවශ්‍ය මග පෙන්වීම කරන්නය කියන ඉල්ලීම මම මේ අවස්ථාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලනවා.

ඊට පස්සේ ආදායම් සෙවීමේ උපක්‍රම, ක්‍රමවේද අපට තිබුණා. මට මතකයි. අපි පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් වෙලා ඉන්න කොට, අපි ආදායම් සොයන්න මාසයක් පාසා උසාවි දඩ මුදල් කොපමණ එනවාද කියලා වාර්තාවක් අපි ළඟට අපි ගෙන්වා ගන්නවා. මුද්දර බදු කොපමණ තිබෙනවාද කියලා ඒ උසාවිවලට, එහෙම නැත්නම් අවශ්‍ය කන්තෝරුවලට ගිහිල්ලා සොයා ගැනීමට අවශ්‍ය ක්‍රමවේද පාවිච්චි කරනවා. ඒ නිලධාරීන්ට යම්කිසි දීමනාවක් දෙන්න ක්‍රමවේදයක් අපි හදලා තිබුණා. ඒ නිසා මේ ආයතනවල ආදායම ශක්තිමත් කර ගැනීමේ ක්‍රමවේද පිළිබඳව දිගින් දිගටම වර්තමානයේ ඇති වන පරිසර ගැටළුත් එක්ක නව ක්‍රමවේද සොයා ගැනීම සඳහාත්, ඒ සඳහා ඔවුන්ව පුහුණු කරන්න හා දැනුවත් කරන්න කියන ඉල්ලීමත් මම ගරු ප්‍රධාන අමාත්‍යතුමා හරහා මේ සියලු දෙනාගෙන් ඉල්ලනවා.

දැවැන්ත වැඩ කොටසක් බස්නාහිර පළාත් සභාව තුළ කර ගෙන යෑම සඳහා පසුගිය අවුරුදු කිහිපය තුළදී ඒකට නායකත්වය ගත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා පිළිබඳව මම හිතන්නේ මේ සභාවේදී හිතට එකඟව කථා කරනවා නම් සියලුම මන්ත්‍රීතුමන්ලා, ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ සියලුම මන්ත්‍රීතුමන්ලා වචනයකින් හරි උදව්වක් උපකාරයක් අරගත්තු පිරිසක් මේ ඉන්නේ. ඒක නියමිත පොතේ ක්‍රමයට වඩා, නීත්‍යානුකූල ක්‍රමයට වඩා මිත්‍රත්වයක්, සුහදත්වයක් තුළ අපි ඒ වැඩ කටයුතු කර ගෙන ආවා වාගේම ඉදිරියේදී මේ කාල සීමාව තුළත් එවැනි සේවාවක් මේ පළාත් සභාව තුළ කරන්න සියලු දෙනා එකමුතු වෙයි, ඒකරාශී වෙයි කියන විශ්වාසයක් අපි බලාපොරොත්තු වෙනවා.

මම ඊයේ දිනයේත් මතක් කළා. මෙවැනි දැවැන්ත ගොඩනැගිල්ලක්, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මෙවැනි දැවැන්ත ඉතිහාසගත ගොඩනැගිල්ලකට අපි ඇවිල්ලා අද මේ වාගේ සභාවක් පිහිටුවන්න, මේ තත්ත්වයකට ගේන්න හොඳ නායකත්වයක්, හොඳ මගපෙන්වීමක් විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්තුමා, සභා ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරී මණ්ඩලය ඒකරාශී කර ගෙන ඒ අයත් එක්ක මන්ත්‍රීවරු සහ නැත්නම් මහ ඇමතිතුමා සහ නිලධාරී මණ්ඩලය ඇත් නොවී මිත්‍රශීලීතාවයෙන් වැඩ කටයුතු කළ නිසා තමයි අද අපි තමුන්නාන්සේලාට මෙවැනි ගොඩනැගිල්ලකට ඇවිල්ලා බස්නාහිර පළාතේ මේ දැවැන්ත ජනගහනය වෙනුවෙන් අපට සේවාවක් කරන්න පුළුවන්කමක් ඇති වී තිබෙන්නේ.

ඒ වාගේම අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය, සංචාරක මණ්ඩලය, ඒ වාගේම ආර්ථික ප්‍රවර්ධන කාර්යාලය. මේවා පිළිබඳව වෙන වෙනම මම හිතන්නේ මීටත් වඩා ඉදිරි පියවරකට මේ අත්දැකීම් තුළ ගමන් කරන්න ගරු ප්‍රධාන අමාත්‍යතුමාට, බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු වශයෙන් අපි සියලු දෙනාගේම සහයෝගය බලාපොරොත්තු වෙමින්, ඔබ ගෙනියන වැඩ සටහන තව තවත් ශක්තිමත් වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.30]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, අද බස්නාහිර පළාත් සභාවේ අපේ මහ ඇමතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව අදහස් දැක්වීමේදී මුලින්ම එතුමා පිළිබඳව මම ගුණ වර්ණනා කරන්න යන්නේ නැහැ. මොකද, අපට සංසන්දනය කරන්න වෙනවා. ඊට කලින් හිටපු මහ ඇමතිවරයා සමඟ තමයි ආසන්න වශයනේ එහෙම වුණොත් සංසන්දනය කරන්න වෙන්නේ. කෙනෙකුගේ හොඳ නරක, එහෙම නැත්නම් ගුණ යහපත්කම, දේශපාලන භාවිතාව ඔහුගේ කාර්ය සාධනය පිළිබඳව සංසන්දනය කරන්න පුළුවන් වෙන්නේ කලින් හිටපු මහ ඇමතිවරයාත් එක්ක. මෙතැන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු ඇති. ඇමතිවරු ඇති. නමුත් මම ආධුනික මන්ත්‍රීවරයෙක්. මම ප්‍රථම වතාවට තමයි මේ සභාවට ඇවිල්ලා ඉන්නේ. ඒ නිසා මට තිබෙන්නේ මහ ඇමතිවරුන් දෙදෙනෙකු පිළිබඳ අදහස් ටිකක් පමණයි. දැන් කලින් හිටපු මහ ඇමතිවරයාගේ කිසියම් ආකාරයක අත්තනෝමතික ස්වභාවයක් තිබුණා. ඔහු සෑම විටම කිසියම් මුරණ්ඩු ස්වභාවයකින් කටයුතු කළ බව පෙනී ගියා. මේ සභාව ඔහුගේ අණසකට යටත් කර ගෙන සිටි බවකුත් පසුගිය කාලයේ ඔහු හැසිරුණු ආකාරයෙන්, ක්‍රියා කළ ආකාරයෙන් අපට පෙනී ගියා. ඒකට සියලු දෙනා අවනතව හිටියා. කීකරුව හිටියා. ඉතින් ඒකට ආවතේව කරපු, ඒ මග යන්න උත්සාහ කරපු අයත් මේ සභාවේ ඉන්නවා. ඒ මගේ යන්න ඕනෑ කියලා කල්පනා කරන අයත් ඉන්නවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඔයාට ගෙදර යන්න දුන්නේ ඒක තමයි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

හරිද? තව කියන්න. කරුණාකරලා පොඩ්ඩක් ශීලාචාරකමවත් තියා ගන්න කියන්න කෝ? කථා කරන්න, ඔයාට මගේ වෙලාව දෙන්නම්. මෝඩයෙක් වාගේ හැසිරෙන්න එපා මන්ත්‍රීතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, බාධා කිරීම්වලට යන්න එපා. එතුමාට කථා කරන්න දෙන්න කෝ?

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

හිටපු මහ ඇමතිවරයා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කාලය දෙන්න කෝ? ඔබතුමාගේ කථාවේදී ඒවාට උත්තර දෙන්න. ඔබතුමා කථා කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

පැහැදිලිව කියන්න ඕනෑ. මහ ඇමතිතුමා මේ පදවියට, මේ තනතුරට පත් වුණේ 2015 ජනවාරි 08 වැනිදා සිදු කළ ඒ වෙනසත් එක්ක. එතුමාත් මමත් හිටියේ පසුපෙළ මන්ත්‍රීවරු විධියට. එතුමාට පස්සෙන් තමයි මම හිටියේ. කෙසේ නමුත් 2015 ජනවාරි 08 වැනිදා මේ රටේ කරපු ඒ දේශපාලන වෙනස, ඒ ප්‍රජාතාන්ත්‍රීයව කරපු විප්ලවය නිසා අපේ මහ ඇමතිතුමාටත් ඒ අවස්ථාව ලැබුණා. ඒ වාගේම ගාමිණී තිලකසිරි මැතිතුමා, රංජිත් සෝමවංශ මැතිතුමා, ලලිත් වනිගරත්න මැතිතුමාත්, මමත් අමාත්‍ය ධූරවලට පත් කරනු ලැබුවා. ඉතාම කෙටි කාලයක් ඇතුළත මම පත් වූ අමාත්‍ය ධූරයට අදාළ මගේ වැය ශීර්ෂය පරාද කරලා ඒ අමාත්‍ය ධූරය මට අහිමි කළා. දැන් මේ කිසිවක් පිළිබඳව මට පුද්ගලිකව මේ කවුරුවත් එක්කවත් තරහක් නැහැ. එහෙම නැත්නම් ඒ කවුරුවත් එක්කවත් වෛරයක් ඇත්තෙත් නැහැ. නමුත් මම එක දෙයක් කියන්න ඕනෑ. එතුමාව මේ පදවියට ගෙන එන්න අවශ්‍ය කරන දේශපාලන පසුබිම, වටපිටාව නිර්මාණය කළේ මේ රටේ හැට දෙලක්ෂයක් ජනතාව. එහෙම නම් කිසියම් ප්‍රමාණයකට ඒ හැට දෙලක්ෂයක් ජනතාවගේ අභිමතය, ඔවුන්ගේ අභිලාෂයන්, ඔවුන්ගේ ප්‍රතිපත්ති කිසියම් ප්‍රමාණයකට නිරූපනය කරන්න මහ ඇමතිවරයා කටයුතු කරන්න ඕනෑ. එතුමා ඉතාම නම්‍යශීලීයි. ඒක ඇත්ත. අපි හැම කෙනෙකු එක්කම සුහදශීලීව කටයුතු කළා. ඒක හොඳ ගුණයක්. අපි කවුරුවත් ඒවා නොසලකා හරිනවා නොවෙයි. නමුත් දේශපාලනයේදී කිසියම් ප්‍රමාණයකට හෝ ප්‍රතිපත්ති කියන ඒවා තිබෙනවා. ඒ ප්‍රතිපත්තිවලදී අපි බලාපොරොත්තු වෙනවා, කිසියම් ආකාරයට තුලනාත්මකව සියලු දෙනා දෙස සාධාරණ ඇසකින් බලලා සියලු දෙනාත් එක්ක සාමූහිකව කටයුතු කරයි කියලා. නමුත් මහ ඇමතිතුමාත් පසුගිය කාලය පුරා ඔහුගේ දේශපාලන භාවිතාව තුළ පෙන්නුම් කළේ ඒ යහපාලන ප්‍රතිපත්තියට ගැලපෙන ආකාරයට නොවෙයි. එතුමා ආදර්ශයට අරගත්තේ -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අහගන්න.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මම යහපාලනේ කෙනෙක් නොවෙයි. මම හැමදාම මේ සභාවේ කියලා තිබෙනවා, මම යහපාලනේ කෙනෙක් නොවෙයි කියලා. යහපාලනේ කියන එක ඕගොල්ලන්ට අයිති දෙයක් නොවෙයි. අපටත් අයිතියි යහපාලනය කියන එක. Good governors' කියන එක.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඕවාට අපි උත්තර බලාපොරොත්තු වෙන්නේ නැහැ. පින් ඇමතිතුමන්ලා.

**ගරු අමල් සිල්වා**
Hon. Amal Silva

යහපාලනේ නොවෙයි. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ජනාධිපතිතුමා මාව පත් කළේ නැති වුණත්, කවුරු හරි ඇමති මණ්ඩලයක් පත් කරන්න එපැයි. පක්ෂයේ සභාපති හැටියට.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒ කියන්නේ, එතුමන්ලාම අද කිසියම් ආකාරයක පාපොච්චාරණයක් කරමින් තිබෙන්නේ. අපි මේ යහපාලනයට වග කියන්නේ නැහැයි කියන්නේ තමන් කොහොමද මෙතැනට පත් වුණේ කියන එක පිළිබඳවත් අඩුම වශයෙන් ඒකට ගෞරවයක් දක්වන්න තරම්වත් කෘතවේදීත්වයක් නැහැයි කියන එකයි මේකෙන් පෙනී යන්නේ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

කෘතවේදීතාවය අපි දැක්කා.

**ගරු අමල් සිල්වා**
Hon. Amal Silva

ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා ගියාට පස්සේ තමයි මහ ඇමතිකම හම්බ වුණේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කෘතවේදීත්වය දක්වන්න නේ මෙහා පැත්තට ආවේ. තේරෙන්නේ නැද්ද?

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

උදය ගම්මන්පිල හින්දා. උදය ගම්මන්පිලට ගරු කරන්න ඉස්සෙල්ලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා. ඔබතුමාත් ඔය ගැටුම්වලට යන්න එපා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

හොඳයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ අපේ මහ ඇමතිතුමාගේ පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන, ජලා පවාහන හා සංචාරක අමාත්‍යාංශ සහ ඒ කියන ආයතනවල ප්‍රගතිය පිළිබඳව, කාර්ය සාධනය පිළිබඳව, එහි ඇති වී තිබෙන දියුණුව පිළිබඳව මම කථා කරන්න යන්නේ නැහැ. මොකද, මේ බස්නාහිර පළාත රටේ ආර්ථිකයේ ඩයිනමෝව විදියට තමයි කටයුතු කරන්නේ. ඒකේ මොකක් හරි අලුත් දැති රෝදයක් සවි කළාද? රටේ ආර්ථිකය ඉහළට ගිහිල්ලා තිබෙනවාද? සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයක් ඇති වෙලා තිබෙනවාද? ඒ වාගේම අපද්‍රව්‍ය කළමනාකරණයේ යම්කිසි ප්‍රවර්ධනයක් ඇති වෙලා තිබෙනවාද? පරිසර කටයුතුවල යම්කිසි ප්‍රවර්ධනයක් ඇති වෙලා තිබෙනවාද කියන එක පිළිබඳව ඔබ තමුන්නාන්සේලා සියලු දෙනාම නැවත වතාවක් පසු විපරමක් කරලා බලන එක හොඳයි. පවතින දේවල් නඩත්තු කර ගෙන ගිහිල්ලා තිබෙනවා. අලුත් යමක් එකතු වෙලා තිබෙනවා. සභා ගොඩනැගිල්ලක් එකතු වෙලා තිබෙනවා. අලුත් බිල්ඩිමක් එකතු වෙලා තිබෙනවා. ඒ නිසා ඒ කාර්ය සාධනය පිළිබඳව අපි කථා කරන්න යන්නේ

නැහැ. හැබැයි, එක දෙයක් මම කියන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මේ සභාවේ සියලු දෙනාම මේ පළාත් සභාවේ තිබෙන වරප්‍රසාද, පළාත් සභාව සතුව තිබෙන බලතල ඒ වාගේම මන්ත්‍රීවරුන්ගේ තිබෙන වරප්‍රසාද, බලතල ආරක්ෂා කර ගැනීම සඳහා නිරන්තරයෙන්ම කථා කරනවා. හඬ නගනවා. පොඩ්ඩක් හරි මේ තිබෙන බලතල කවුරු හරි ගන්න උත්සාහ කළොත් විශාල වශයෙන් භීතියට පත් වෙනවා. රණ්ඩු කර ගන්න යනවා. ආණ්ඩුකාරවරයාත් එක්ක රණ්ඩු කර ගන්න යනවා. එහෙම නැත්නම් මහ ආණ්ඩුවේ ඇමතිවරු එක්ක රණ්ඩු කර ගන්න යනවා. මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු 104 දෙනාගේම මේ අයිතිය රකින්න සභාපතිතුමාත්, ඒ වාගේම මහ ඇමතිතුමාත්, අනෙක් ඇමතිවරුත් හැම විටම පෙනී සිටිනවා, අපේ ධුරධාරීන්. ඒක බොහොම හොඳයි. මේ පළාත් සභාවේ ගෞරවය රකින්න. මේ පළාත් සභාවේ ගෞරවය රකින්න ඒ ආකාරයෙන් අපි පෙනී ඉන්නවා වාගේ තමයි රටේ ව්‍යවස්ථාදායකය කවුරු හරි එක පුද්ගලයෙකුගේ තනි අණසකට යටත් කර ගන්න උත්සාහ කරනවා නම්, තමන්ගේ හිතුමතේට, තමන්ගේ අභිමතයට පාර්ලිමේන්තුව අභිමතානුසාරී බලයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ. ඔබතුමා අදාළ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ප්‍රාදේශීය සභාවකට යවලා ගෙන්ව ගන්න. ප්‍රාදේශීය සභාවකට යවන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අදාළ වැය ශීර්ෂය සම්බන්ධව කථා කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

දැන් මම කථා කරන්න ඕනෑ මොනවාද කියන එක පිළිබඳවත් මට Guide line දෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අයවැයට කථා කරන්න කියන්න.

**ගරු අමල් සිල්වා**
Hon. Amal Silva

කන්න ඕනෑ වුණාම තලගොයා. අනික් වෙලාවට කබරගොයා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

බේරුවල මුස්ලිම් ජනතාවට ගහන්න කිව්වේ කවුද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔය කට්ටිය පන්තියක් දානවාද? කථා කරන හැටි උගන්වන්න.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

පළාත් පාලනය ගැන දන්නේ නැහැ නේ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

අද මේ රටේ අධිකරණයට කරන්නෙත් ඔය ටික නේ? අධිකරණය කරන්න ඕනෑ මොකක්ද කියන එක පිළිබඳව අධිකරණයට මග පෙන්වීම කරනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

උගන්වනවා. පන්ති දාලා උගන්වනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

අධිකරණයට බොරු සාක්ෂි දෙනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

අධිකරණයට බොරු සාක්ෂි දීලා තමුන්නාන්සේ නඩුවක පැටලිලා ඉන්නේ. ඒ නිසා අධිකරණය ගැන කියන්න එපා. අධිකරණයට බොරු සාක්ෂි දීලා තිබෙන්නේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔය වාගේ වහල්ලු අපි දැකලා තිබෙනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

අපිත් දැකලා තිබෙනවා ඔය වාගේ ජාතිවාදී වහල්ලු.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

වහල්ලු අපි ඕනෑතරම් දැකලා තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එහෙම කියන්න එපා. ඒ පැත්තේ ඉන්න කොට එහෙම කිව්වේ නැහැ නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඉස්සර කිව්වේ නැහැ ඕක. ඉස්සර කිව්වේ නැහැ ජාතිවාදී කියලා. දැන් තමයි කියන්නේ. ඉස්සර එකට හිටියා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මේ සභාවේ ගෞරවය, මේ සභාවේ බලතල රකින්න අපි කථා කරනවා වාගේ තමයි අපේ රටේ පාර්ලිමේන්තු බලයත් උදුරා ගෙන තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපේ ඡන්දයෙන් ගිහිල්ලා ඒ පැත්තේ ඉඳ ගත්ත එක හොඳද? ඒක ශීලාචාරද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඡන්දවලින් ගියේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ජාතිවාදියා. අර බේරුවල කරපුවා මතකද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒ නිසා මම කියන්න කැමැතියි. පැහැදිලිව මේ රටේ සම්පූර්ණයෙන් ප්‍රජාතන්ත්‍රවාදය හකුලමින් තිබෙන්නේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

බොරු සාක්ෂිකාරයා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ජනාධිපති යූ.එන්.පී. ඡන්ද අරගෙනයි ඒ පැත්තට ගියේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, කිසියම් විධියකට මේ පළාත් සභාවේම ආණ්ඩුකාරවරයා මේ විධියට කටයුතු කළොත්, ඔහුගේ අභිමතය පරිදි මේ පළාත් සභාව විසුරුවන්න ගියොත් අපි කවුරුවත් ඒකට කැමැති නැහැ නේ? තව මාස හතරක් අපට යන්න තිබෙනවා. ඒ නිසා මේක නරක පූර්වාදර්ශයක්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, ජනාධිපති ගැන එහෙම කථා කරන්නත් බැහැ. විශේෂ යෝජනාවක් සම්මත කරන්නේ නැතිව.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඊළඟ පළාත් සභාවේ මේ වාගේ ගෙම්බෝ පන්නනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මේ රටේ ව්‍යවස්ථාව, මේ රටේ නීතිය -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපේ ඡන්දවලින් ඇවිල්ලා. ඊට පස්සේ අනික් පැත්තට ගියාම හරිද? කොහේද ශීලාචාරකම එහෙම නම්?

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාසයක් ඉන්න හම්බ වුණේ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ජාත්‍යන්තරයට වහල්කම් පෙන්වනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

පළාත තුළ සංවර්ධනය කරන්න ගියාද නැද්ද කියන එක පිළිබඳව පසු විපරමක් කරන්න මේක හොඳම අවස්ථාවක්. ඒ නිසා මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, නීතිය, ව්‍යවස්ථාවට ගරු කරන්න කියමින් මම නිහඬ වෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔය මයික්‍රෆෝන ටික off කරලා නිශ්ශබ්ද වෙන්න. මීළඟට මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[පූ.භා. 10.42]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, VI වන පළාත් සභාවේ අවසාන අයවැයට කථා කිරීමත්, ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමගේ විෂයට කථා කිරීමටත් අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා. කථා කරන්න ගිය කාරණාවත් වෙනසකට ගියා, මොකද, එකක් ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා කියපු කාරණාවත්, මීට ඉස්සෙල්ලා කථා කරපු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කියපු කථාවටත් උත්තර දෙන්න අත්‍යවශ්‍ය නිසා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න ඕනෑ. මේ පළාත් සභාව පිහිටෙව්වේ 2014 දී. එතුමා ඡන්දය ඉල්ලුවේ හෙළ උරුමය පක්ෂයත් එක්ක එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන්. අදටත් එතුමා ඉන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ජනතාවගෙන් ඡන්ද ගත්ත මන්ත්‍රීවරයෙකු හැටියට තමයි. එහෙම ඉඳලා පසුගිය 2015 ජනවාරි 08 වැනිදා පැවති ජනාධිපතිවරණයේදී මොන හේතුවක් නිසා හරි විරසක වෙලා එතුමා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාටත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාටත් එතුමාගේ නායකයා එක්ක ගිහිල්ලා ලක්ෂ 62 ක් ලබා ගත්ත එක හරි. අපි ඒක පිළිගන්නවා. හැබැයි, මේ පළාත් සභාව ඊළඟට පැවති 2015 අගෝස්තු මාසේ පාර්ලිමේන්තු මැතිවරණයෙන් තමයි මේ මහ ඇමති ධූරයත්, සියලු ඇමති ධූරත් පුරප්පාඩු වුණේ. ඒක යහපාලනය නිසා වුණු දෙයක් නොවෙයි. පාර්ලිමේන්තු මැතිවරණයට යම්කිසි පළාත් සභාවක ඉදිරිපත් වුණු අපේක්ෂකයෝ පාර්ලිමේන්තුවට පත් වුණායින් පස්සේ - ප්‍රසන්න රණතුංග මැතිතුමා, ඒ වාගේම නිමල් ලාන්සා මැතිතුමා, උදය ගම්මන්පිල මැතිතුමා සහ අනෙකුත් හිටපු අය පාර්ලිමේන්තුවට පත් වුණායින් පස්සේ මේ අමාත්‍යධූර සහ ප්‍රධාන අමාත්‍ය ධූරය හිස් වුණා. ඒ වෙලාවේ ජනාධිපතිවරයාට තමයි ඒකේ පත් කිරීමේ බලය තිබෙන්නේ. එක පැත්තකින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා හැටියටත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නායකයා හැටියටත් ජනාධිපතිවරයා භාරව කටයුතු කරපු නිසා එතුමා එතුමාට හිතවත්, ඒ වාගේම එතුමාට ලැදි පාක්ෂිකයන් වන, අත්දැකීම් තිබෙන මේ පළාත් සභාවේ වැඩිපුර කාලයක් ජ්‍යෙෂ්ඨයන් හැටියට හිටපු අයට තමයි ඒ තනතුරු ලබා දුන්නේ. නැතිව මේ ලක්ෂ 62 ක් දුන්න නිසාවත්, එහෙම නැත්නම් යහපාලන ආණ්ඩුව නිසාවත්, මේ තනතුරු ලැබුණේ නැහැයි කියන එක ප්‍රකාශ කරලා මතක් කරලා දෙනවා. ඒක හොඳාකාරවම කවුරුත් දන්නවා. තමන්ගේ හෘදය සාක්ෂිය දන්නවා මොන විධියට ද පත් වුණේ කියලා. දැන් ඊයේ වෙන කොට කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා අනික් පැත්තට ගියා. නවුසර් ෆවුසි ගරු මන්ත්‍රීතුමා අනික් පැත්තට ගියා. නිශාන්ත වර්ණසිංහ මන්ත්‍රීතුමා අනික් පැත්තට ගියා. නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය ඒ පැත්තට ගියා. හැබැයි, මේ හතර දෙනාම 2014 පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණේ, තමුන්ගේ පක්ෂය ඒකාබද්ධ වුණු එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් බවත්, එසේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඉන්න සියලු පක්ෂවල ජනතාවගේ ඡන්දයෙන් පත් වුණාය කියන එකත් තමුන්ගේ හදවත හොඳටම දන්නවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ඒවා මතක නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තමුන්ට මොනවා හරි හේතුවක් ඇති යන්න. ඒක වෙනම ප්‍රශ්නයක්. ඒ නිසා අපි කියන්න ඕනෑ. තමුන් මුල මතක තියා ගන්න ඕනෑ. තමුන් ඉල්ලුවේ කොහෙන්ද? ඡන්දය දුන්නේ කවුද? පත් වුණේ කොහොමද? මම නම් මන්ත්‍රීවරයෙකු හැටියට මගේ ප්‍රතිපත්තිය නම්, මගේ ජනතාව ඡන්දය දීලා මාව පත් කළා නම්, මම කොහේටවත් යන්නේ නැහැ. මම ගෙදර යනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අපි ඒක ජනාධිපතිතුමාටත් කියනවා. අද ඔයා මෙහෙදී කිව්වා කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කථා කරන කොට කරදර කරන්න එපා. ඔබතුමාට කරදර කළේ නැහැ නේ? අපි ප්‍රතිපත්තියක් හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

සිරිකමල් කඩේ යන්නේ නැතිව ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු බාධා කිරීම් කරන්න එපා. මේ කථාව අහගන්න පොඩ්ඩක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි ප්‍රතිපත්තියක් හැටියට සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජනතා නිදහස් සන්ධානය හැටියට අපි ඡන්දය ඉල්ලුවා නම්, අපි වෙනත් පක්ෂයකට සහ විපක්ෂයේ ගිහිල්ලා වාඩි වෙන්නේ නැහැ. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අයින් වෙලා, ඒ වාගේම පොහොට්ටුව පක්ෂය පිහිටුවලා ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ හැටියට මේ කාල සීමාවේ අපි වැඩ කරගෙන ගියා. අද ඒකේ මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා. හැබැයි, අපට වගකීමක් තිබෙනවා. අපි එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් පත් වුණු නිසා අපේ පත් වුණු ප්‍රධාන අමාත්‍යතුමාට, අමාත්‍ය මණ්ඩලයට අපි උදව් උපකාර කරලා, සහයෝගය දීමට. මේ ශාලාව විවෘත කරන දවසෙත්, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මෙතැනට එන වෙලවේත් අපි අපේ සභාව නිසා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ අමාත්‍ය මණ්ඩලය තනි කරන්න අවශ්‍ය නැති නිසා අපි පොහොට්ටුව නියෝජනය කළත් අපි ඔක්කොම මේ ශක්තිය ලබා දුන්නා. ඒක අපේ වගකීමක්. මොකද, පළාත් සභාව අපේ. ඒක විවෘත කිරීමේ වගකීම තිබෙන්නේ අපට නිසා. ඒ නිසා අපි නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට කියනවා, කථා කරන කොට තමුන්නාන්සේ ඒ පැත්තට ගියාට, තමුන්නාන්සේ අද ගිහිල්ලා එදා කියපු දේ අනික් පැත්ත හැරිලා කථා කළාට, අද ප්‍රධාන අමාත්‍යතුමාව ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා එක්ක සන්සන්දනය කරලා බලන කොට එක එක විධියට පෙනුනාට, ඒක තනිකර තමුන්නාන්සේට පේන්නේ වැරදි විධියට.

අනික් එක තමයි ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ පළාත් පාලන මැතිවරණය නොතියා ඡන්දය කල් දැම්මේ මෛත්‍රීපාල ජනාධිපතිතුමා කියලා. අපිත් පිළිගන්නවා. හැබැයි, ඒකට වගකියන්න ඕනෑ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා සහ අමාත්‍ය මණ්ඩලය. මොකද, ලක්ෂ 62 ක් ඡන්දය අරගෙන, ජනාධිපතිට ඡන්දය ලබා දීලා, ඒ දුන්නේ ජනාධිපතිවරයාට විතරයි. හැබැයි, විනාඩි පහක් ඇතුළත ජනාධිපතිවරයා දිවුරුම් දුන්නායින් පස්සේ 41 ක් හිටපු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිවරයා හැටියට දිවුරුම් දුන්නා. එහෙම කරන්න පුළුවන්. එතකොට බහුතරය නැහැ. මොකුත් නැහැ. අපි ඇහුවේ නැහැ. මොකද, අපි ඇහුවේ නැත්තේ එක හේතුවක් නිසා. ශ්‍රී ලංකාවේ ලක්ෂ 62 ක් ජන මතයක් දුන්නාම ජනාධිපතිවරයාට බලය තිබුණා, ජනාධිපති හැටියට පත් වෙන්න. හැබැයි, අගමැතිවරයාට ඡන්දයක් දුන්නේ නැහැ. හැබැයි, ජනාධිපතිතුමා ඒක පත් කළාම ජනමතයට හිස නමලා මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජය භාර අරගෙන මැදමුලනට ගිහිල්ලා දේශපාලනයෙන් ඉවත් වෙනවාය කියලා පැත්තකට වෙලා හිටියා. මහජනතාව සහ අපි තමයි මහින්ද සුළඟ කියලා ලංකාව වටේ පටන් අරගෙන, නැවත පාර්ලිමේන්තු මැතිවරණයට කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂකයෙකු හැටියට ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවේ 95 දෙනෙකු පත් කර ගත්තේ. ඒ 95 දෙනාගෙන් 46 දෙනෙකු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ඉල්ලීම පිට භාරකාර ආණ්ඩුවක් සහ ජාතික ආණ්ඩුවක් හැදුවා. ඒ ජාතික

ආණ්ඩුවේ ඔක්තෝබර් 26 දක්වා ඒ අය හිටියා. 26 වැනිදා ඉවත් වුණා. හැබැයි, ජනාධිපතිවරයා එදත් අදත් මම හිතන්නේ හෙටත් ප්‍රකාශ කරයි රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත් එක්ක මේ රජය කරන්න බැරි නිසා, ඒ පක්ෂයේ නියෝජ්‍ය නායකයෝ දෙන්නාට කථා කරලා භාර ගන්න බැහැයි කියපු නිසා මේ රට ඉදිරියට ගෙනියන්න බැරි නම් ඊළඟට භාර දෙන්නේ මහින්ද රාජපක්ෂට කියලා, හොර පාරෙන් ඇවිල්ලා භාර ගත්තේ නැහැ. ව්‍යවස්ථානුකූලව, ව්‍යවස්ථාවේ හැටියට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා නීත්‍යානුකූලව දුන්න දේ භාර ගත්තා මිසක් හෙට වුණත් බහුතරය පෙන්වලා, නීත්‍යානුකූලව විශ්වාසභංගයක් ගෙනැල්ලා ඉවත් වෙන්න කිව්වොත් ඉවත් වෙලා විපක්ෂයේ වාඩි වෙලා විපක්ෂ නායකකම අරගෙන අපි ඉන්නවාය කියන එක අපි පැහැදිලිව මතක් කරලා දෙනවා. අපි ඒකට කිසි දෙයකට භය නැහැ. හැබැයි, නීත්‍යානුකූලව. අන්න ඒ නිසා අපි කියන්න ඕනෑ. පළාත් පාලන මැතිවරණය අවුරුදු දෙකහාමාරක් කල් දැම්මේ මෛත්‍රීපාල ජනාධිපතිතුමායි. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමායි. අපි හොඳාකාරවම දන්නවා. 2015 ජනවාරි 09 වැනිදායින් පස්සේ පළාත් පාලන මැතිවරණය තිබ්බේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

හැබැයි, මෙරිල් මන්ත්‍රීතුමා වැඩ තහනමට ලක් වෙලා තිබෙන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාට වචනයක්වත් කථා කළේ නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

වැඩ තහනමකට ලක් වෙලා තිබෙන්නේ අගමැතිතුමා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ අතුරු තහනම් නියෝගයක් නේ? එක්සත් ජනතා නිදහස් සන්ධානයට තිබුණු පළාත් පාලන ආයතන ටික -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හිතේ දුකට කවි කියවෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෛත්‍රීපාල ජනාධිපතිතුමාට විසුරුවන්න කියලා කිව්වේ අගමැතිතුමා සහ ඇමති මණ්ඩලය. මොකද, ඒක අවාසියක් වෙනවා පාර්ලිමේන්තු මැතිවරණයේදී. ඊළඟට අවුරුදු දෙකහාමාරක් කල් දැම්මා. අද වන කොට පළාත් සභා හයක් - පළාත් සභා තුනක් අවුරුද්දයි මාස ගණනාවක් වෙනවා. අනික් පළාත් සභා තුනක් මාස ගණනාවක් ඡන්දයක් නැහැ. කල් දානවා. දවසින් දවස කල් දානවා. ඒ නිසා තමයි ගරු සභාපතිතුමනි, මේ ගැන කල්පනා කරන කොට තමුන් කල්පනා කරන්න ඕනෑ. මෛත්‍රීපාල ජනාධිපතිතුමාව පත් කර ගත්තේ අපි නොවෙයි. ඔය කියන අය තමයි කඬේ ගිහිල්ලා පත් කර ගත්තේ. ඒ නිසා අද ඒගොල්ලන්ට හිත රිදුනාම ඒක අනික් පැත්ත හරවලා මෛත්‍රීපාල ජනාධිපතිතුමාට දොස් කියනවා.

ඊළඟට මම ඔබතුමාට මතක් කරනවා. මොකද, අයවැය විෂය පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ නිසා විශේෂයෙන්ම ඝන අපද්‍රව්‍ය අධිකාරිය. අපි ඝන අපද්‍රව්‍ය අධිකාරිය පිහිටෙව්වේ 2005 වසරේ. මේ වන කොට වසර 13 ක් මේක පිහිටුවලා. ඒ වාගේම මේ දිස්ත්‍රික්ක තුනේම පළාත් පාලන ආයතන, නගර සභා, මහ නගර සභා, ප්‍රාදේශීය සභා 48 ක් තිබෙනවා. මේ 48 ටම මේ වන කොට මේ වසර වෙන කොට මිලියන 1327 ක් වසරින් වසර වෙන් කරලා වැඩ කරලා තිබෙනවා. හැබැයි, අපි පැහැදිලිව කියනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට, මේක අවධානය යොමු කරන්නය කියලා. මොකද, ගරු ප්‍රධාන අමාත්‍යතුමා දැන් ගිණුම් කාරක සභාවේ ඇවිල්ලා වාඩි වෙනවා. එතුමාට වැඩ නැති දවසට එතුමා ඇවිල්ලා වාඩි වෙනවා. වාඩි වුණාම එතුමාටම පෙනුනා මේ ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා 48 ම, මේ කුණු කසළ ප්‍රශ්නය තවමත් ප්‍රාදේශීය සභා මට්ටමෙන් විසඳගන්න බැරි වුණු ආයතන ගණනාවක් තිබෙන බව. ඒක තමයි පළාත් පාලන විෂයේ තිබෙන අත්‍යවශ්‍යම ප්‍රශ්නය විසඳන්න තිබෙන්නේ, මේ කුණු කසළ ප්‍රශ්නය. මේකට ඝන අපද්‍රව්‍ය අධිකාරියට මුදල් ලබා දෙනවාට වඩා මහ ඇමතිතුමා ඉල්ලීමක් කළා දිස්ත්‍රික්ක තුනට රැස්වීම් තුනක් තියලා, පළාත් පාලන ආයතනත් එක්ක සාකච්ඡා කරලා 2019 වසරේ සැලැස්මක්

[ගරු මෙරිල් පෙරේරා]

හදන්නය කියලා. ඒ සැලැස්ම හදලා ඉදිරිපත් කළා. ඒ සැලැස්ම හදලා ඉදිරිපත් කළාම, මේ වන කොට කොළඹට මිලියන 26 ක්. ගම්පහට මිලියන 63 ක්. කළුතර මිලියන 61 ක්. මිලියන 150 ක් ඕනෑ ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා ඒ ආයතන 48 න් වැඩි ආයතන ටිකකට පහසුකම් දීලා, කුණු කසළ ප්‍රශ්නය විසඳගන්න. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා. දැනටත් ආරංචියි. මිලියන 66 යි වෙන් කරලා තිබෙන්නේ. මිලියන 150 ක් ඕනෑ තැනට මිලියන 66 ක් වෙන් කළාම ලබන අවුරුද්දෙත් වෙන්නේ අර අවුරුදු 13 කළා වාගේම ලැබෙන 66 කෑලි කෑලිවලට බෙදලා වෙන් කරන්න. නමුත් ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. එකම තැන තමයි හැමදාම ඉන්නේ. ඒ නිසා ප්‍රධාන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, ගිණුම් කාරක සභාවේ සභාපතිවරයා හැටියට එතුමා මේකට සහභාගී වුණු නිසා, එතුමාගේ නියෝගය පරිදි දිස්ත්‍රික්ක තුනේ කමිටු රැස්වීම් තියපු නිසා, ඒ රැස්වීම් තුනේදීම පළාත් පාලන ආයතන සභාපතිවරු, නිලධාරීන් ගෙනැල්ලා සාකච්ඡා කරපු නිසා ඒකට අවධානය යොමු කරලා, මේ මිලියන 150 ම වෙන් කරලා ලබන වසරේ ක්‍රියාත්මක කරන්න අවස්ථාව ලබා දෙන්නය කියලා.

ඒ වාගේම තමයි පළාත් පාලන ආයතනවලට මෙතුමා ගිය වසරේ අපි යෝජනා කරපු පරිදි මුද්දර ගාස්තුවලින් මුදල් ගෙවන්න කම්පැක්ටර් රථ සහ ට්‍රැක්ටර් රථ ලබා දුන්නා. මේ කම්පැක්ටර් රථ ලබා දීමේදී ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමතිතුමනි, විශාල කාර්යභාරයක් ඉෂ්ට වුණා. මොකද, අපි දන්නවා. අද කුණු කසළ එකතු කරන කොට ට්‍රැක්ටර්වල ගිහිල්ලා ගම්වල කුණු එකතු කරන්න පුළුවන්. හැබැයි, නගරවල ට්‍රැක්ටර්වලින් එකතු කරන්න බැහැ. මොකද, ට්‍රැක්ටර්වල කුණු ගඳ ගහනවා. වට්ටගෙන යනවා. කුණු ටික වට්ටාගෙන යනවා. මිනිස්සු කැමැති නැහැ, අපිරිසිඳු භාවය දකින නිසා. හැබැයි, කම්පැක්ටර් රථයට කුණු ටික පැක් කරපු නිසා කිසි දෙයක් පේන්නේ නැහැ. වැටෙන්නේ නැහැ. ගඳ ගහන්නේ නැහැ. ආරංචියක් තිබෙනවා, අදත් එතුමා ආයතන වගයකට දෙනවාය කියලා. කම්පැක්ටර් රථ වගයක්. ඉතින් අපි එතුමාගෙන් ඉල්ලනවා. පළාත් පාලන ආයතන හැටියට ඒ අයට සභාවේ සල්ලිවලින් මුද්දර ගාස්තුවලින් ලීසිං ක්‍රමයට ගෙවන්න ඉල්ලන ප්‍රමාණය ලබා දෙන්න. ට්‍රැක්ටර් වෙන්න පුළුවන්. කම්පැක්ටර් රථ වෙන්න පුළුවන්. අත් කරත්ත වෙන්න පුළුවන්. මේ ටික ලබා දුන්නොත් ලබන වසර වෙන කොට, අපි ගිණුම් කාරක සභාවේ දුන්න නියෝගය අනුව ක්‍රියාත්මක වන පරිදි පළාත් පාලන ආයතනයේ කුණු කසළවලට තිබෙන මේ ප්‍රශ්නය බොහෝ දුරට විසඳන්න පුළුවන් කියන එක අපි මේ මොහොතේ සභාපතිතුමාගේ මාර්ගයෙන් මතක් කරනවා.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතනවල අවුරුදු ගණනාවක් හදපු පොදු වෙළඳපොලවල් තිබෙනවා. උදාහරණයක් ගත්තොත් ජා - ඇළ නගර සභාව සහ ජා -ඇළ ප්‍රාදේශීය සභාව පොදු වෙළඳපොල හදලා තිබෙනවා, 1976 අවුරුද්දේ. දැන් අවුරුදු 40 කට වැඩි කාල සීමාවක් වෙනවා හදලා. හැබැයි, ඒ පොදු වෙළඳපොළවල් වලට අවශ්‍ය පහසුකම් ටික තිබුණු ප්‍රාදේශීය සභා, නගර සභා ලබා දීලා නැහැ. ඒ නිසා විශාල ප්‍රශ්නයක් තිබෙනවා ඒ වෙළඳ ව්‍යාපාරිකයන්ට. වෙළඳ සංගම්වලින් ඉල්ලීම් කරලා තිබෙනවා. ව්‍යාපාරිකයෝ ඉල්ලීම් කරලා තිබෙනවා. අපි ප්‍රධාන ඇමතිතුමාට මේ මොහොතේ මතක් කරලා දෙනවා. විශේෂයෙන්ම පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා හැටියට මේ වාගේ ප්‍රාදේශීය සභා, නගර සභාවල හඳුනාගත්ත, ඒ වාගේම මුදල් වියදම් කරන්න බැරි ඒ වාගේ ආයතන තිබෙනවා නම්, ඒ ආයතනයට යම්කිසි මුදලක් වෙන් කරලා පළාත් පාලන විෂය භාර ඇමතිවරයා හැටියට මේ පොදු පහසුකම් ටික, අවශ්‍ය පහසුකම් පොදු වෙළඳපොලවලට ටික ලබා දෙන්නය කියලා. මේක අත්‍යවශ්‍යම දෙයක්. අපිටම ලැජ්ජයි ගියාම. මොකද, එදා මෙතුමා ගියා ඒ ජා - ඇළ කොට්ඨාශයේ අපේ උප කාර්යාලයට මුල්ගල තියන්න. අපි ගියාම එතුමාට පෙන්නුවා සමහර තැන්. පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා හැටියට අන්න ඒ අවශ්‍යතාවයන් සඳහා ලබන වසරට මුදල් ටික වෙන් කරලා දෙන්න කියන එකත් මේ මොහොතේ මතක් කරනවා.

ඒ වාගේම තමයි එක පැත්තකින් අපේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ ඉන්න ලේකම්තුමිය. අමාත්‍යාංශයේ ලේකම්තුමියට මේ අමාත්‍යාංශ 48 ම අවුරුදු ගණනාවක් පළාත් පාලන කොමසාරිස්තුමිය හැටියට වැඩ කරපු නිසා විශාල අත්දැකීම් සම්භාරයක් තිබෙනවා. ඒ වාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමිය හැටියට, විශේෂයෙන්ම අලුතෙන් පත් වුණු කොමසාරිස්තුමා, සහකාර කොමසාරිස්තුමියන්ලා, ඒ වාගේම නිලධාරීන් ඒකරාශී කර

ගෙන වැඩි අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලනවා. මොකද අද අපි දකිනවා, එතුමිය කොමසාරිස්වරිය හැටියට හිටපු කාලයට වැඩිය අද පළාත් පාලන ආයතන ටික පොඩ්ඩක් ආපස්සට ගිහිල්ලා තිබෙනවා, නැවත. ඒක අපි හොඳාකාරවම ගිණුම් කාරක සභාවේදී දකිනවා. අපට අඩුපාඩු පේනවා. මොකද, ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා 48 ක් තිබෙන නිසා එතුමියට කියනවා, දැන් අමාත්‍යාංශයේ ලේකම්තුමිය නිසා ඒ කොමසාරිස්තුමා සහ කොමසාරිස්තුමියන් එක්ක පසුගිය කාල සීමාවේ වැඩ කෙරුවා වාගේම දැනුත් අවධානය යොමු කරලා, මේ ආයතන 48 ම කඩා වැටෙන්න දෙන්න එපා. නිලධාරීන් ශක්තිමත් කරලා විෂය භාර අමාත්‍යවරයාගේ ඒ අවශ්‍ය අවධානය යොමු කරලා, ශක්තිමත් කරන ලෙස ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Sirikamal Filician de Silva M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[පූ.භා. 10.58]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම ආරම්භ කරන්නම් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියපු අර පක්ෂ එහාට මෙහාට මාරු කිරීම පිළිබඳව ඒ කටයුත්තෙන්ම. එතුමා නැති වුණත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පූර්වාදර්ශය ගෙනාවේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා තමයි. මුලින්ම යූ.එන්.පී. එකෙන් ඇවිල්ලා ඒ වාගේම තමයි දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ තාත්තා පිලිප් ගුණවර්ධන. ඒ එක්සත් ජාතික පක්ෂයෙන් ඇවිල්ලා පක්ෂ මාරු කිරීම මුලින්ම ආරම්භ කළේ ඇත්තටම එතුමන්ලා තමයි ඒ ආදර්ශය දුන්නේ. ඒ පූර්වාදර්ශය තමයි එකින් එකට එහෙම ඇවිල්ලා තිබෙන්නේ. ඉතින් වර්තමානයේත් එහෙම තමයි. 62 ලක්ෂයක් ඡන්ද ලබා ගන්න ගෙයක් ගෙයක් ගානේ ගිහිල්ලා, පාරක් පාරක් ගානේ ගිහිල්ලා, දාඩිය දාගෙන, ගුටි කන්න ගිහිල්ලා, අඩි 6 ක් යටට යන්න ගිහිල්ලා එහෙම, අපි විශාල කැප කිරීම් කරලා තමයි ඔය නායකත්වයට ඔබතුමන්ලා අද ගුණ ගයන, එදා හිටං හුටං කියලා කථා කරපු ඒ නායකයා, මේ රටේ ඉන්න ප්‍රධාන පුරවැසියා ඔතැනට ගෙනාවේ අපි තමයි. ඉතින් ඒ ගෙනාපු පුද්ගලයා පිළිබඳව තමයි එදා ඔබතුමන්ලා දැක්කේ වැරදි විධියට. නමුත් අද දකින්නේ ඉතාමත් සුපිපි, නිකම් හොඳ කුසුමක් විධියට. ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා 78 ව්‍යවස්ථාව ගෙනාපු අවස්ථාවේ කිව්වාලු මේ ව්‍යවස්ථාව යම් විධියකින් මානසික දුර්වලතාවයෙන් හෙබි පුද්ගලයෙකුට දුන්නොත් හෝ එහෙම නැත්නම් පසුකාලීනව පිස්සු හැදුනු පුද්ගලයෙකුට මේක ලැබුණොත් මොකද වෙන්නේ කියලා. අද ඔබතුමන්ලාට හිතා ගන්න පුළුවන් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒක රනිල්ට කිව්වේ. රනිල්ට දෙන්නේ නැත්තේ ඒක නේ?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ වන කොට රනිල්ට ඒ අවස්ථාව තිබුණේ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒක තමයි දෙන්නේ නැත්තේ. ජනතාව. එතුමා ඒකනේ වංගු දාන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එන්.එම්. පෙරේරා මැතිතුමා කිව්වේ, පිස්සෙක් ජනාධිපති වුණොත් කියලා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ කියලා තිබෙන්නේ අසම්භාව්‍ය ක්‍රියා පදයකින්. වූවොත් කියලා. ඒ නිසා එදා ඒ දේ ප්‍රකාශ -

**ගරු චන්දන ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Chandana Jayakody - Chief Government Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂය පථයට අදාළව ද කථා කරන්නේ?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ජනාධිපතිතුමා ගැන සාමාන්‍යයෙන් කථා කරන්නත් බැහැ. විශේෂ යෝජනාවක් දාන්නේ නැතිව.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

දැන් මෙහෙම කථා කරන කොට ඔබතුමන්ලාට ටිකක් රිදෙනවා. නමුත් මතක තියා ගන්න.

**ගරු චන්දන ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Chandana Jayakody - Chief Government Whip

මේ පළාත් පාලනයද? ඉසුර දේවප්‍රිය මැතිතුමා ගැන ද මේ කථා කරන්නේ?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගුණ වයන්නේ එතුමන්ලා ඒ පිළිබඳව. ඒ නිසා මම ඉන් එහා කථා කරන්න යන්නේ නැහැ. මම එක අතකින් සතුටට පත් වෙනවා අද මහ ඇමතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන අවස්ථාවේ - මට නම් හරි ප්‍රමුඛතාවයක් තිබෙන්නේ. මොකද, මට ඉන්නවා දෙන්නෙක්. මගේ ගම නියෝජනය කරන දෙන්නෙකුම නියෝජනය වෙනවා. එකක් ගරු මහ අමැතිතුමා

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කොයි ගමද?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මහරගම. මහරගම නියෝජනය කරන - (බාධා කිරීම්) ගම්පහ ගිහිල්ලා ගුටි කාලා ආවා. ගම්පහ ගිහිල්ලා බෝඩ් ගහලා ආවා අනාගත මහ ඇමති කියලා. කළුතරත් ගිහිල්ලා කිව්වා. ලැජ්ජයි මහරගමට. අපට අඩුම තරමින් මහ ඇමතිකම ගෙනැල්ලා දුන්න මනුස්සයා. අපි ස්තුතිවන්ත වෙනවා. මෙතුමා විතරයි -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, මේ වැය ශීර්ෂය අනුව කථා කරන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ වාගේම ප්‍රධාන අමාත්‍යතුමාත්, ප්‍රධාන ලේකම්තුමාත් නියෝජනය වෙන්නේ මහරගම. ඒ නිසා එක්තරා අතකින් මම සතුටට පත් වෙනවා. හේතුව තමයි, මම දන්නේ නැහැ. බස්නාහිර පළාත ගැන කථා කිරීම කෙසේ වෙතත් මම හුදෙකලා කරලා මහරගම පිළිබඳව කථා කළොත් එහෙම මහරගම තිබුණු තතත්වය. මහරගම පාරවල් තිබුණේ නැහැ. එක්තරා කාන්තාවක් හිටියා මහරගම නගර සභාවේ. ඒ නගර සභාවේ හිටපු කාන්තාව පාරවල්වලට තාර දැම්මේ නැහැ.

[සභාවේ සෝෂා]

ඒ පාරවල්වලට තාර දැම්මේ නැහැ. තාර දානවා කියලා ආස්මිවලට පැණි දානවා වාගේ හම්බ කර ගත්තේ. යන කොට ඒ කාන්තාව නිකම් නොවෙයි ගියේ. යකඩ ලොරි දෙකක් අරගෙන ගියේ. නගර සභාවේ තිබුණු අබලි ද්‍රව්‍ය. ඒ නිසා මගේ කට අවුස්සා ගන්න එපා. මොකද, මම කියන්න ගියොත් එහෙම හොරකම් සියල්ලම කියනවා. ඒ නිසා මම ඒ පිළිබඳව කථා කරන්න උත්සාහ කරන්නේ නැහැ. (බාධා කිරීම්) මම මහරගම නගර සභාවේ දීර්ඝ කාලයක් හිටපු විපක්ෂ නායකවරයා. ඈ කරපු කාර්යභාරය පිළිබඳව මම දන්නවා. මම තරම් දන්න දෙයක් එතුමාවත් දන්නේ නැතිව ඇති.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේ ඔහොම කියන්නේ. විජයදාස රාජපක්ෂ පාර්ලිමේන්තුවේ කිව්වේ කොහොමද? තමුන්නාන්සේගේ නායකයා විජයදාස රාජපක්ෂ නගරාධිපතිතුමිය ගැන කරපු ප්‍රකාශය -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

නගරාධිපතිවරු නැහැ. ඒකවත් අඩුම තරමේ දන්නේ නැහැ. මහරගම නගර සභාවේ නගරාධිපතිවරු නැහැ. සභාපතිවරු ඉන්නේ. අඩුම තරමින් ඒකවත් අවබෝධ

නැහැ. මම එතුමියගේ මොටහාවය පිළිබඳව කියන්න කැමැති නැහැ. මම වරක් කිව්වා, ඇගේ visiting card එකේ දාලා තිබුණා chairman කියලා. මම එතුමියට ඉඳන් කිව්වා, chairman වෙන්න බැහැ. එහෙම නම් එතුමිය කියනවා, එහෙම නම් ඔබතුමාද chairman. මම කිව්වා chairman වෙන්න බැහැ. Chair man වෙන්න බැහැ නේ? ඔබතුමිය වෙන්න ඕනෑ chair lady. එහෙම නැත්නම් chair person කියලා. ආ.. එහෙම වෙන්න ඇති. මම වෙනස් කරන්නේ නැහැයි කිව්වා. ඊට පස්සේ visiting card එක ගැහුවා. Mayor. Mayor වෙන්නේ කොහොමද? එක්කෝ Mayoress බවට පත් වෙනවා. ඇගේ මොට භාවය පිළිබඳව මට කියන්න අවස්ථාව සලසන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමා කොයි විෂය ද -

[සභාවේ ඝෝෂා]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මම කථා කරන්න ගියේ මහ ඇමතිතුමා පිළිබඳව. මේ වෙන්න හිටපු මහ ඇමති පැනලා ඒක නැති කර ගත්තා. ඒ නිසා ඔබතුමා මහ ඇමති වෙනවා නම් ලබන සැරේ අපි කැමැති වෙනවා. අපි කැමැතියි ඔබතුමා එනවා නම්. මොකද, ඒකත් එන්නේ මහරගමට නේ? ඒ නිසා අපේ එහෙම ඉරිසියාවක් මොකුත් නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේ පරදිනවා. ගෙදර යනවා. ඒකයි මට තිබෙන කනගාටුව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වැඩිය කෑ ගහන්න එපා. ඊළඟ සැරේ හරියට ෆෝම් එක පුරවා ගන්න. නොමිනේෂන් ෆෝම් එක.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා. අපේ ඉසුර දේවප්‍රිය මැතිතුමා පිළිබඳව ගුණ වයනවා නොවෙයි. සමහර විට කියන්න පුළුවන්, ගුණ වැයීමක් කරන්න හදනවා කියලා. මොකද, මා ආදර්ශයට ගත්තේ මා ඉන්නා වූ ආසනය. ඇත්තටම මම ඉස්සෙල්ලා කියපු ආකාරයට මහරගම ඇත්තටම පාරවල් තිබුණේ නැහැ. අඩි පාරවල්, කරත්ත පාරවල් වාගේ ඒවා තිබුණේ. නමුත් ඇත්තටම ඒ මහරගමයි කියලා කිව්වාම, ජාතික ආයතන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ජාතික සම්පත් තිබෙන මධ්‍යස්ථානයක්. ලංකාවේ තිබෙන ප්‍රධාන ඇඟලුම් කර්මාන්ත සහ ඇඟලුම් පුරවරය තිබෙන්නේ මහරගම. ජාතික අධ්‍යාපන ආයතනය, ජාතික තරුණ සේවා සභාව, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ජයවර්ධනපුර රෝහල. මේ වාගේ විශාල ස්ථානයක රැඳිලා තිබෙන තැන්වල පාරක ඉස්සර යන්න බැහැ. ඉතින් අලංකාර පාරක් බවට පත් කරන කොට, ඒ තත්ත්වය ඇති කරලා දුන්න මහ ඇමතිවරයාට විශේෂයෙන්ම, ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමාට මගේ ස්තුතිය පුද කරන්න ඕනෑ. එකක් තමයි ඉසුර දේවප්‍රිය මැතිතුමා අනික් අය වාගේ කිසිම අවස්ථාවක කුහක දේශපාලනයක නියැලුනු පුද්ගලයෙක් නොවෙයි. එතුමා මගේ ප්‍රතිවාදියා වෙන්නේ ඉදිරියේදී. ඊළඟ ඡන්දයේදී අපි දෙන්නා ප්‍රතිවාදීන් හැටියටයි සලකන්නේ. එතුමා සහ මා අතර පොඩි ඥාතීත්වයකුත් තිබෙනවා. එතුමා සහ මා මීට පෙර පෝස්ටර් ගහන්න හිටියේ, එකට හාගේ හාගේ. එතුමා එක පැත්තක්. මම තව පැත්තක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතකයි එතුමා කිසිම අවස්ථාවක - දැන් මීට පෙරත් හිටියා. නගර සභාවේ මම විපක්ෂ නායකවරයා හැටියට කටයුතු කිරීමේදී අපට මොන විධියකින්වත් අපේ නමක් දුන්නේ නැහැ. නමුත් කාපට් පාරක් ගියොත් එහෙම ඒ හැම පාරකම අපේ ඡායාරූපයත් දාන්න තරම් ගුණවත් පුද්ගලයෙක් බවට පත් වුණා. වෙන නායකවරු එහෙම කරන්නේ නැහැ. හිටපු මහ අමැතිතුමාට මම ගිහිල්ලා එක් වතාවක් කිව්වා, මහ ඇමතිතුමා මට පුළුවන්නම් ඉස්කෝලෙට ළමයින් දෙන්නෙක් දාලා දෙන්න කියලා. හරි මල්ලි, මම කරලා දෙන්නම්. හය වෙන්න එපා. උඹට කොහොම හරි කරලා දෙනවාය කිව්වා. පස්සෙන් පස්සට ගියා. අඩුම තරමින් කිසිම දෙයක් කර ගන්න ලැබුණේ නැහැ. මෙතුමා එදත් එහෙම තමයි. මහරගම නගර සභාවේ ඉන්න දවස්වල. අද ඊට පස්සේ ආපු

[ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්]

කාන්තාවෝ විනාශ කරලා දැම්මා ඒ තැන්පතු සියල්ලම. මෙතුමා යන කොට ලක්ෂ 800 ක් ඉතිරි කරලා ගියේ, මහරගම නගර සභාව තුළ සංචිතයක් හැටියට.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් තමුන්නාන්සේ මහ ඇමතිතුමාගේ අයවැයටද කථා කරන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එතුමියගෙන් තොර කථාවක් නැහැ නේ? මහරගම ගැන කථා කරන්න. කාන්ති ගැන කථා කිරීම තහනම්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මම ඈ පිළිබඳව කථා කරන්නේ නැහැ. මේ කාන්තාවක් කිව්වාම සියල්ලම ඔහුගේ බිරිඳ වෙනවා. මම කාන්තාවක් කිව්වාම.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තව වැඩ කොටසක් කර ගෙන යන්න තිබුණා. මහරගම කලාපය තුළ. නමුත් මම ගම්පෙරළිය හරහා කරන්න තිබුණු කාර්යභාරය අපට කර ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ මේ දේශපාලනික විපර්යාසය මැද. නමුත් ඒ අඩුවත් මෙතුමා හදලා දීලා තිබෙනවා. හැබැයි, මම දකින දුර්වලතාවය තමයි මහරගම නොවෙයි පළාත් සභාව කියන්නේ. බස්නාහිර පළාත කියන්නේ විශාල වපසරියක් තිබෙන ප්‍රදේශයක්. හෝමාගම පැත්තට ගියාම පාරවල් නොවෙයි, ඇළ වේලි, විවිධ හු ලක්ෂණ දකින්න ලැබෙන තැන් තිබෙනවා. ඒ නිසා ඒවා නිසි ලෙස කළමනාකරණය කරන්න ඕනෑ. දැන් අපේ ඉස්සර හිටපු අමාත්‍යතුමා, කැබිනට් අමාත්‍යවරයා ලංකාවේ ගත්තොත් එහෙම බහුතරයක් තැන් ගත්තොත් එහෙම, අධිකරණ ගත්තොත් අධිකරණයන් තුළ වැඩි වශයෙන් හිටියේ අපේ ආසනයේ කට්ටිය. නමුත් ඒක එසේ නොවිය යුතුයි. දැන් මහ ඇමතිතුමාත් එහෙමයි. මම කියන්නේ, මහ ඇමතිතුමාට මේ එක ප්‍රදේශයකට සීමා වෙන්නේ නැතිව, සමස්ත ප්‍රදේශයටම පැතිරිලා ගියා නම්, ඊට වඩා හොඳයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේකේ දකින අඩුවක් තමයි. අපේ ආදායමෙන්, ජාතික ආදායමෙන් 59% ක මුදල් ප්‍රමාණයක් උපයන්නේ අපි. බස්නාහිර පළාත. මේ 59% ක් ආදායම් උපදවන කොට මේ 59% කින් 80% ක් ආදායම් උපදවන්නේ එක්තරා පන්තියක් පමණයි. ඒ කියන්නේ ඉහළ පන්තියක් පමණයි. පෝසතුන් පමණක් තමයි මුදල් ඒකරාශී කර ගෙන ඉන්නේ. 20% ක් ඉන්නේ ආදායම් උපදවන මට්ටමේ නොවෙයි. ඉතාම දිළිඳු තත්ත්වයේ. ඉතින් බස්නාහිර පළාත ගත්තාම 20% ක් වාගේ ප්‍රමාණයක් ඉතාමත් දරිද්‍රතාවයෙන් පෙළෙන්නා වූ පාර්ශවයක් නම්, එහි ගැටළුවක් තිබෙනවා. මේ ආදායම් වැඩි කරන්නට මෙතුමාගේ අමාත්‍යාංශය හරහා විශාල වැඩ කටයුත්තක් කරන්න පුළුවන්කමක් තිබෙන්න ඕනෑ. ඒ කටයුතු සඳහා ඒ කාර්යය හරියාකාරව කරලා තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා යටතේ තමයි නීතිය හා සාමය පිළිබඳවත් තිබෙන්නේ. මේ නීතිය හා සාමය යටතේ මම දන්නේ නැහැ කොපමණ ප්‍රමාණයක්, කොයි තරම් වපසරියක් තුළ මෙතුමාට වැඩ කටයුතු කරන්න පුළුවන්ද කියලා. දැන් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව විශාල වශයෙන් වැඩ කටයුතු කරන්න පුළුවන්කමක් තිබෙනවා එතුමාට. මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු අද පාසලක් ගත්තොත් එහෙම පාසල විශාල වශයෙන්ම මත්ද්‍රව්‍ය කටයුතු පිළිබඳව, එහෙම නැත්නම් ඒ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු දරුවන් විශාල ප්‍රමාණයක් පිළිබඳව අසන්න ලැබෙනවා.

මම තව දෙයක් කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Spa පිළිබඳව. මේ ස්ථානයේ ඉඳන් ගත්තොත් එහෙම මහරගම මේ කලාපය ගත්තොත් එහෙම මාළඹේ, විශාල වශයෙන් තියෙනවා. මෙතුමාගේ නීතිය හා සාමය යටතේ තිබෙන්නේ. අද මහරගම පැත්ත ගත්තොත් එහෙම මහරගම පන්නිපිටිය හන්දියේ ඉඳන් පාර්ලිමේන්තුව දක්වා මේ Spa විතරක් 36 ක් තිබෙනවා. එතකොට පන්සල් නැහැ එපමණ ප්‍රමාණයක්. එතකොට මේ පිළිබඳව සොයා බැලීමක් කරලා ඒවාට අදාළ කටයුතු මෙතුමා හරහා

කරන්න පුළුවන්කමක් තිබෙනවා නම් හොඳයි කියලයි මම හිතන්නේ. ඇත්තටම කරුණු ගොඩාක් කථා කරන්න තිබෙනවා. කරුණු ගොන්නනක් කථා කරන්න තමයි ලැහැස්ති වෙලා ආවේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගෙන් විනාඩි පහක් දෙන්නම්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

නමුත් කොහේවත් ඉන්න තමන්ගේ බිරිඳව අල්ලාගෙන එතුමා ඒ පිළිබඳව කථා කරන්න උත්සාහ දැරුවා. මම කාන්තාවක් පිළිබඳව කථා කළේ. (බාධා කිරීම්) මම කනගාටු වෙනවා, මෙවැනි පුද්ගලයෝ මහරගම ඉඳීම පිළිබඳව. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.13]

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සතුටු වෙනවා ප්‍රධාන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව. ඒ වාගේම රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න ලැබුණේ. ඉතින් ඒ ගැන වචනයක් හරි නොකිව්වොත් අඩුපාඩුවක්. එතුමාට මම ගරු කරනවා. එතුමා ඉංග්‍රීසි ගුරුවරයෙකු හැටියටත්, කාලයක් දන්නා නළුවෙක් හැටියටත්. මම වැඩිදුර කථා කරන්නේ නැහැ. හැබැයි මම හිතනවා, මේ සභාවේ කථා කරන කොට අපේ ගෙවල්වල බිරින්දෑවල් පොඩ්ඩක් අතඇරියොත් හොඳයි කියලා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

එතුමා ගෙවල්වල බිරිඳ ගැන නොවෙයි නේ? නගරාධිපතිතුමිය ගැන නේ කථා කළේ ?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

නැහැ. නගරාධිපතිතුමිය වුණත් බිරිඳනේ. ඉතින් මේ වෙලාවේ ඒවා පොඩ්ඩක් sensitive දේවල් නේ? ඊට වඩා මම කථා කරන්නේ නැහැ. මම අදහසක් කිව්වේ. අපි ඒ වාගේ ඒවා අතහරින එක හොඳයි. නගරාධිපතිතුමිය වුණත් බිරිඳනේ. ඒ වාගේ දේවල්. දැන් මේ පළාත් සභාව ඊළඟ සැරේ විසුරුවනවා. අපි කවුරු එයිද නැද්ද කියලා දන්නෙත් නැහැ. එතුමා ඉංග්‍රීසි ගුරුවරයෙක් නේ? We should not leave this place with a bitter taste in our mouths and hearts. Please speak about a wife -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

I spoke about a lady who was -

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

O.K. I am not going to waste more time. We should not leave with a bitter taste.

විශේෂයෙන්ම අද රටේ ආණ්ඩුවක් නැහැ. අගමැති කෙනෙක් නැහැ. අද රටේ ඇමති මණ්ඩලයක් නැහැ. කැබිනට් එකක් නැහැ. හැබැයි, දැන් බස්නාහිර පළාත් සභාව තිබෙනවා. අද රටේ ප්‍රධානම ආයතනය තමයි බස්නාහිර පළාත් සභාව. මම හිතන්නේ ප්‍රධාන කේන්ද්‍රය. රටේ ප්‍රධාන ස්ථානය. ඉතින් අපේ ප්‍රධාන අමාත්‍යතුමා දැන් බලපුවාම රටේ ප්‍රධානතම පුද්ගලයෙක් තමයි. මේ වෙලාවේ ලොකුම ලොක්කෙක්. කාටද ආඩම්බර? දැන් අපේ පළාත් සභාවේ ප්‍රධාන ඇමතිතුමා, අද ප්‍රධානම පුද්ගලයෙක් වෙලා තිබෙනවා. මොකද, දැන් අපි තමයි ඉන්න ලොක්කෝ. එහෙම තමයි වෙලා තිබෙන්නේ. අප්‍රේල් මාසේ වෙනකල් ලොක්කෝ අපි. ජනාධිපතිතුමා තව දවස් කිහිපයකින් ඒකට විශේෂ විසඳුමක් දෙයි. අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ව්‍යවස්ථාව.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ව්‍යවස්ථාව හදන්න තිබෙන්නේ. එහාට මෙහාට හදන්න නේ ඕක තිබෙන්නේ. ව්‍යවස්ථාව මොකද ඉතිහාසයෙන් එන එකක් යැයි. එහාට මෙහාට හදන එකක් තමයි ව්‍යවස්ථාව. ඒකට කලබල වෙන්න එපා. ව්‍යවස්ථාව හරියටම හරි නම් ඔබතුමාට එහා පැත්තේ ඉඳගන්නත් බැහැ නේ? ඒක හදන්නම් අපි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා මේ පළාත් පාලන විෂය ගැන කථා කරන්න.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

අද අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ආයතනයක් - විශේෂයෙන්ම පළාත් පාලනය යටතේ එතුමාට විශාල කාර්යභාරයක් තිබෙනවා. එතුමා ප්‍රධාන අමාත්‍යතුමා වුණාට සෑම අමාත්‍යාංශයකම තිබෙන හොඳ හෝ නරක දෙක තුනටම එතුමා තමයි වගකියන්න ඕනෑ. එතුමාගෙන් තමයි ප්‍රශ්න අහන්නේ. පළාත් සභා කියලා තමයි කියන්නේ. පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය, පළාත් සභාවේ මහා මාර්ග අමාත්‍යාංශය, පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය කියලා කියන්නේ නැහැ. පළාත් සභාව කියලා කියන්නේ. ඒ නිසා හැම දේකටම අවසානයේ මහ ඇමතිතුමා තමයි වගකියන්න ඕනෑ. අපේ රටේ මම හිතන්නේ පළාත් පාලන ආයතනවල තිබෙන ප්‍රශ්න. පසුගිය කාලයේ ආණ්ඩුවට අපේ පසුගිය ආණ්ඩුවට, ගොඩක් ප්‍රශ්න තිබුණේ, පළාත් පාලන ආයතනවලින්. මේ පළාත් සභාවේ අපි ඇමතිතුමාට කියන්නේ මේ පළාත් පාලන ආයතන හොඳ පාලනයක් ඇතිව ගෙනියනවා නම් හොඳයි කියලයි. මොකද, ඒගොල්ලොන්ගේ ක්‍රියාකාරීත්වය ගොඩක් රජයේ පැවැත්මට බලපානවා. ඒගොල්ලන්ගේ තිබෙන විනය කටයුතු. මම අහගෙන හිටියා කුණු ප්‍රශ්නය ගැන කථා කරනවා. දොම්පේ ආසනයේ කුණු ප්‍රශ්නය ගැන මේ ටිකේ නම් වැඩි ප්‍රශ්නයක් ඇති වුණේ නැහැ. හොඳම කසළ කළමනාකරණ ආයතනය තිබෙන්නේ, දොම්පේ. මිලියන 600 ක් වියදම් කළා. කොහොම හරි දැන් පිට කුණු ගේන්නේ නැහැ. ජනාධිපතිතුමා ප්‍රකාශ කරලා තිබුණා මේකට තෝරපු නැති කුණු ගේන්න එපාය කියලා. නීතියක් දාලා තිබුණා. තෝරපු නැති ඒවා ගේන්න එපාය කියලා. තෝරපුවා ගේනවා නම් අපට කමක් නැහැ. නිකම් කුණු ගොඩවල් ගේන කොට තමයි අපට ප්‍රශ්න ඇති වෙන්නේ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඒ වුණාට ඒකට අද බිස්නස්කාරයෝ රෙදි කැබලි ගෙනැල්ලා දානවා. සල්ලි අරගෙන රෙදි කැබලි ගෙනැත් දානවා. බිස්නස්කාරයෝ තමයි එන්නේ. මහා ව්‍යාපාරිකයෝ රෙදි කැලි ටික ගෙනැල්ලා එතැනට දානවා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මම ඒකට එක උත්තරයයි දෙන්නේ. ප්‍රාදේශීය සභාව පිහිටුවන්න ඉස්සෙල්ලා මම ඒක පරිස්සම් කර ගෙන හිටියා. කාටත් ඒවා කරන්න දුන්නේ නැහැ. එතකොට මම නේ සංවර්ධන කමිටුවේ සම සභාපති හැටියට දොම්පේ ආසනයේ හිටියේ. අපි ඒවා එකක්වත් ගේන්න දුන්නේ නැහැ. දැන් ඉතින් ප්‍රාදේශීය සභාව පිහිටුවලා නේ තිබෙන්නේ. ඒ සභාපතිවරු දැන ගන්න ඕනෑ ඒවා කර ගන්න.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඔබතුමා පළාත් සභාවේ ඉන්නවා නේ?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

පළාත් සභාවට නොවෙයි. මේක පළාත් පාලනයට නේ අයිති. එතකොට එහෙම නම් ඒගොල්ලෝ තමයි වගකියන්න ඕනෑ. මොකද, මම දන්නවා. ඔබතුමා කියපු එක හරි. සල්ලි දීලා කුණු ලොරි ගේනවා. ඒ කියන්නේ කොන්ත්‍රාත්කරුවන්ට භාර දුන්නාම ගෙනියන්න කියලා, එක ලොරියකට 25,000 ක් විතර ගෙවනවා, අයින් කර ගන්න. ඒගොල්ලෝ ඉතින් මොන මොනවා හරි කරනවාද කියලා මම දන්නේ නැහැ. මම මේ වෙලාවේ කාටවත් චෝදනා කරන්නේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා සොයලා බලන්න එපැයි.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

දැන් ප්‍රාදේශීය සභාව තිබෙනවා නේ? ඒ ප්‍රාදේශීය සභාව මගේ පක්ෂයේ එකකුත් නොවෙයි නේ? ඒක දීර්ඝ කථාවක් යනවා. ඒක තමයි මම කිව්වේ, ඇමතිතුමාට සොයා බලන්නය කියලා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

එහා පැත්තේ තිබෙන ප්‍රාදේශීය සභාවේ ඒවා ගන්නේ නැහැ. නමුත් කොන්ත්‍රාත්කාරයන්ගේ ඒවා,

සල්ලිකාරයන්ගේ ඒවා, කොම්පැනිකාරයන්ගේ ඒවා ගන්නවා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ඒක වැරදියි. හැබැයි, මතක තියාගන්න. මමයි හර්ෂණ රාජකරුණා මැතිතුමායි මේක කරන්න ඉඩ දුන්නේ නැහැ. අපි දෙන්නා සම සභාපතිවරු හැටියට ඉන්න කොට. ඒක අපේ යටතේ තිබෙද්දී. දැන් ඒක අපේ යටතේ නොවෙයි තිබෙන්නේ. දැන් වෙනමම ප්‍රාදේශීය සභාවක් පිහිටුවලා තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා ඒක. පොහොට්ටු පාලනය යටතේ වෙන්නේ. ඒ නිසා මම ඒකට ඇඟිලි ගහන්න යන්නේ නැහැ. මම බලාගෙන ඉන්නවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පොහොට්ටු පාලනය හරියට වැඩ කරන්නේ නැත්නම්, අපි නීතියට යමු.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒක කරන්න ලැබේවායි කියලත් මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඒ රෝස් හදන්නේ ගාස්තුවක් අය කරන්න. ඒ ගැන ජනාධිපතිතුමාට කියන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකරලා ඔබතුමාගේ කථාව කර ගෙන යන්න. සංවාදයකට වැඩිය.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මම කෙළින්ම කිව්වා, මහ ඇමතිතුමාට මේවා පිළිබඳව සොයා බලන්න ඕනෑය කියලා. මම මේවායේ details පිළිබඳව කථා කරන්න යන්නේ නැහැ. මොකද, ඒ කථාවටත් ප්‍රශ්නයක් මතු වන නිසා. හැබැයි, මම දන්නවා. මේවා සල්ලිවලට කුණු දාන බව මම දන්නවා. හැබැයි, මම ඒවා දාන්න දුන්නේ නැහැ. ප්‍රාදේශීය සභාව පිහිටුවන්න ඉස්සෙල්ලා. ඒ ලේකම්තුමියත් සමඟ සම්බන්ධ වෙලා, අපි ඒවා කරන්න දුන්නේම නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩි 04 ක කාලයක් තිබෙන්නේ.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ගොඩක් කියන්න තිබෙනවා. ඒ වාගේම අපේ අමාත්‍යාංශ හැම එකක් ගැනම වගකියන්න ඕනෑ කිව්වා නේ? දැන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා අපි කියන දේවල් ගොඩක් සාර්ථකව ඉෂ්ට කරනවා. වැඩ කටයුතු කරනවා. දැන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇමතිතුමා බොහොම හොඳයි. නමුත් ගොඩාක් ප්‍රශ්න තිබෙනවා. ඒකට හේතුව වෙන මොකක්වත් නොවෙයි. අපට ගුරු අඩුපාඩු තිබෙනවා. නිලධාරීන් හොඳයි. ගුරු අඩුපාඩු ගොඩක් තිබෙනවා. ඒවාත් මහ ඇමතිතුමා මුදල් වෙන් කරලා තමයි මම හිතන්නේ ගන්න වෙන්නේ. එදා ජනාධිපතිතුමා ගුරු පත්වීම් දෙන අවස්ථාවේ කිව්වා, ගුරු අඩුපාඩු 3000 ක් විතර තිබෙනවා කියලා. ඉතින් මහ ඇමතිතුමා නේ මුදල් වෙන් කරන්නේ. ඒකයි මම මේ කියන්නේ. විශේෂයෙන්ම ප්‍රසූත නිවාඩු ගියාම එහෙම ගුරු සංචිතයක් ඕනෑ. ගුරුවරු 3000 ක් වත් ඕනෑ. ඔබතුමා දන්නවා. අපි ගම්පහ ව්‍යුහ කමිටුවලට ගියාම විශාල ප්‍රශ්න. ගුරුවරු නැහැ. ගුරුවරු නැහැ. ගුරුවරු නැහැ. විදුහල්පතිවරු නැහැ. ඉතින් ප්‍රධාන ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරන්නේ අධ්‍යාපනයට විශේෂ මුදලක් වෙන් කරන්න කියලා. මොකද, අපි මොනවා හැදුවත් ඔය මහා මාර්ග, කර්මාන්ත ශාලා, ගොඩනැගිලි, ගුවන් තොටුපලවල්, වරායවල් මොනවා හැදුවත් වැඩක් නැහැ. තරුණ පරම්පරාව හැදුවේ නැත්නම්. එහෙම නම් අධ්‍යාපනයට තමයි වැඩිම මුදලක් වෙන් කරන්න ඕනෑ. සියල්ලටම වඩා. ඉතින් මම මහ ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරනවා, මේ අයවැයේදී. ඒ ගුරු අඩුපාඩු ටික ලබා දෙන්නය කියලා. ඒ වාගේම දැන් අපේ මහා මාර්ග ඇමතිතුමා ගැන මම ගොඩක් කථා කරන්න යන්නේ නැහැ. එතැනත් බලන්න ඕනෑ. එතැනත් මිනිස්සු අපට බණිනවා නේ? අර මහා මාර්ග ඇමතිතුමාගේ ඒවා මහ ඇමතිතුමා බලන්න ඕනෑ. මහාමාර්ග ඇමතිතුමාගේ පුතාගේ ෆොටෝ එක ගහලා තිබෙනවා හැම බස් ස්ටෑන්ඩ් එකකම. ඒකටත් මිනිස්සු බණින්නේ අපට තමයි. ඇයි එයාගේ ෆොටෝ එක ගහන්නේ කියලා. මම එතුමාගේ අමාත්‍යාංශයේදී වෙලාව අරගෙන ඒ ගැන කථා කරන්නම්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පින් ඇමතිලායි. පින් පුත්තුයි.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

වැරදියි නේ? ඒකට ගහන්න බැහැ නේ? අයිතියක්, නීතියක් නැහැ නේ? මහ ඇමතිතුමාට තමයි බණින්නේ. මේ පළාත් සභාව මහ ඇමතිතුමාගේ නේ? ඇමතිවරු කරන හැම දේකින්ම බැණුම් අහන්නේ මහ ඇමතිතුමා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අපේ පැත්තේ ඒවායේ නම් පුතාගේ ෆොටෝ නැහැ.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ගම්පහ දිස්ත්‍රික්කයේ විතරයි ගහලා ඇත්තේ එහෙම නම්. හේතුවක් නැහැ නේ ගහන්න. එහෙම ගහන්න බැහැ. මොකද, මේවා රාජ යෝග. අපේ මහ ඇමතිතුමාට අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරි කාලයේත් එතුමාට දේශපාලන ශක්තියක් ලැබේවායි කියලා. ඒ හින්දා මම නම් දන්නේ නැහැ මොනවා වෙයිද කියලා. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හැමදාම හිටපු කෙනෙක්. 1993 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මට දුන්නේ දොම්පේ සංවිධායකකම. ඒක බොහොම ගෞරවයෙන් ආරක්ෂා කර ගෙන හිටියා. මම පොහොට්ටුවට ගියේ නැහැ. මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක මම ගොඩක් හිතවත්. මගේ හදවත එතුමා එක්ක තිබෙනවා. හැබැයි, එතුමාගේ පක්ෂයට බැඳුනේ නැති වුණාට, හදවතින් එතුමා එක්ක මම හැමදාම හිටියා. ඉදිරි කාලයේත් එහෙම ඉන්නවා. එතුමාත් දන්නවා මම එතුමාට ගොඩක් හිතවත් කියලා. හැබැයි, මට පොහොට්ටු පක්ෂයට බැඳෙන්න යන්න බැහැ. ඉදිරි කාලයේ දේශපාලනය ගොඩක් වෙලාවට - මේ අවසාන අයවැය වෙන්න පුළුවන්. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉඳලා අයින් වෙනවා මිසක්. මට නම් ඔය එක එක ඒවාට බැඳෙන්න බැහැ. දැන් මහ ඇමතිතුමා අපි දන්නවා. එක එක්කෙනාට යෝග තිබෙනවා. රාජ යෝග තිබෙනවා. ඒ යෝග අනුව තමයි ගොඩක් වෙලාවට මේවා සිද්ධ වෙනවාය කියන්නේ. මහ ඇමතිතුමාට අපි බලාපොරොත්තු වෙනවා, හොඳ රාජ යෝගයකින් ඉදිරි කාලයේදී - ඔය රාජ යෝගවලත් තිබෙනවා, චොට් ගණනක්. හුඟාක් කට්ටිය වරද්දා ගන්නේ ඒක නේ? දැන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ටත් කියනවා, උඹට රාජ යෝගයක් තිබෙනවාය කියලා. ඒ තිබෙන්නේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙක් වෙන්න. චොට් 25 එකක්. දැන් සමහර කට්ටියගේ රාජ යෝග ගත්තාම චොට් 50 යි. ඒක පළාත් සභාවට. නැතිව අපි රජ වෙන්නේ නැහැ. දැන් වෙලා තිබෙන්නේ සමහර මහ ඇමතිවරුත් ඒගොල්ලන්ට රාජයෝග තිබෙනවාය කියලා අගමැති වෙනවා කියලා හිතනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ මහ ඇමතිවරයාගේ චොට් ගණන කීයද?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

දැන් එහෙම අගමැතිවරයෙක් නැහැ. එහෙම රාජ යෝග තිබුණා කියලා ඔක්කොම රජ වෙන්නේ නැහැ ඉතින්. එක එක චොට් ගණන තමයි තිබෙන්නේ. මම කියන්නේ, එක එක්කෙනාගේ රාජ යෝග තිබුණාම ඒගොල්ලෝ හිතනවා, රජ වෙනවාය කියලා. ඒ රාජ යෝගයට ලැබිය යුතු තනතුර ලැබිලා තිබෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බොරුවටත් ඕක දා ගන්නවානේ? වෙලාව වෙනස් කරලා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මගේ හඳහනේ මට කිව්වා, රාජ යෝගයක් තිබෙනවා. මොකක්ද මට කිව්වේ. මට කිව්වා, මට හොඳ කුමාරිකාවකුයි හොඳ දරුවෝ දෙන්නෙකුයි හම්බ වෙනවාය කියලා. මගේ රාජ යෝගයෙන් මට ඒ දෙකම ලැබිලා තිබෙනවා. මට ඊට වඩා රාජ යෝග ඕනෑ නැහැ. මට අවශ්‍ය දේවල් ලැබිලා තිබෙනවා. මම පළාත් සභාවේ බොහොම - ඉතින් මගේ චොට් ගණන කෙසේ වෙතත් මේ රාජ යෝග ගැන වරද්දා ගන්න එපා. ඒකේ චොට් ගණනක් තිබෙනවා. හුඟ දෙනෙක් වරද්දා ගන්නේ මේ චොට් ගණන නිසා. කෙසේ වෙතත් අපේ මහ ඇමතිතුමාටත්, මෙතැන ඉන්න හැම දෙනාටම ඉදිරි පළාත් සභා මැතිවරණයෙන් ජය ගෙන මේ රටට තවත්

කාලයක් සේවය කරන්න ශක්තිය, ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. මම හුඟාක් වෙලාවට ගෙදරට වෙලා ඔබ දිහා සතුටින් බලාගෙන ඉන්න පුළුවන්. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.25]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ අදහස් දක්වන්න කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මුලින්ම කියන්න කැමැතියි, නිතරම අපට තිබෙන චෝදනාවක් තමයි මේකේ හොඳක් දකින්නේම නැද්ද? කිසිම හොඳක් සිද්ධ වෙලා නැද්ද? මෙන්න මේ නිසා මම අද කල්පනා කළා, මම ප්‍රධාන අමාත්‍යතුමාගේ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් මගේ ඉල්ලීම් න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා ඒ ඉල්ලීම්වලට එතුමා දක්වපු ප්‍රතිචාරය පිළිබඳවත් සඳහන් කරමින් මගේ කථාව කර ගෙන යන්න. මම මුලින්ම ඉල්ලා සිටියා එතකොට පළාත් පාලන ආයතන විසුරුවලා හැරලා තිබුණු අවස්ථාවක. හෝමාගම බෙරුකැටිය ප්‍රදේශයේ LRC ඉඩමක් එක්තරා අමාත්‍යවරයෙක් - බලහත්කාරයෙන් කිව්වොත් නිවැරැදියි. අක්කර 48 ක ඉඩමක් එතුමාත් අත්පත් කරගෙන ඒකේ කොටසක් ලෑන්ඩ් සේල් සමාගමකට දීලා, ඒක වෙන්දේසි කරන්න වැඩ කටයුතු ආරම්භ කරලා තිබුණා. තාප්ප ගහලා, සංවර්ධන කටයුතු කරලා, තිබුණු සශ්‍රීක පොල්ගස් ඒ අය ඉවත් කරගෙන සංවර්ධන කටයුතු කරගෙන ගියා. මේක කරගෙන යද්දී ප්‍රදේශවාසීන් මගෙන් කරන ලද ඉල්ලීමක් අනුව, මම මෙය හෝමාගම සම්බන්ධීකරණ කමිටු රැස්වීමටත් ඉදිරිපත් කළා. ප්‍රධාන අමාත්‍ය උපදේශක කාරක සභාවටත් ඉදිරිපත් කළාට පස්සේ මේ අකටයුත්ත නතර කරගන්න එතුමා මැදිහත් වුණා. මම එතුමාට ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීමට ඒ LRC ඉඩම නැවත බේරලා දෙන්න පුළුවන් වීම පිළිබඳව සතුටු වෙනවා. මම හිතනවා ප්‍රාදේශීය සභාව පිහිටුවලා තිබුණා නම් ඒක කරගන්න ලැබෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙමනම් ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු ටික මැදිහත් වෙලා ඒ වැඩ කටයුත්ත සම්පූර්ණයෙන් අර අමාත්‍යවරයාගේ පැත්තට වාසි වන විධියට ක්‍රියාත්මක කරන බවට මට ඉරහඳ වාගේ විශ්වාසයි. ඒ ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම ඉෂ්ට කරගන්න බැරි වෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ කාර්යය කර දීම පිළිබඳව මගේ සතුට ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම උපදේශක කාරක සභාවේදී ඉල්ලා සිටියා, වසර ගණනාවක් ජලය නොමැති ප්‍රදේශයක් - හෝමගම වෑකන්ද ප්‍රදේශයේ ඒ වැවේවත්ත කියන ගමට. එතුමා ඒ සඳහා ප්‍රතිපාදන ලබා දුන්නා. ප්‍රතිපාදන ලබා දීලා අද වැඩ කටයුතු කෙරෙමින් යනවා. ඒ වැඩ කටයුතු කරගෙන යෑමේදී විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය, අමාත්‍යාංශයේ නිලධාරී මහත්වරුන්, සුමිත් මැතිතුමා ඇතුළු අය - මොකද ආයතන කීපයක් මේකට සම්බන්ධ කරගන්න ඕනෑකම තිබුණා. ඒක තමයි ප්‍රශ්නය වෙලා තිබුණේ. කාපට් කරපු පාරක ජලනල එළීමේ ගැටලුවක් තිබුණා. ළඟදී කාපට් කරපු නිසා. PRD එක සම්බන්ධ කරගන්න ඕනෑ. ඒ වාගේම ප්‍රාදේශීය සභාව. පළාත් සභාවේ ප්‍රතිපාදන. මෙන්න මේ නිසා ඒ වැඩ කටයුත්ත කරගන්න අධ්‍යක්ෂතුමන්ලා ඇතුළු ඒ ආයතනවලින් ලැබුණු සහයෝගය පිළිබඳවත් මම ස්තුතිවන්ත වෙනවා. පුද්ගලිකව මට නොවෙයි. මිනිස්සු සැලකිය යුතු ප්‍රමාණයකට පානීය ජල පහසුකම් ලබාගන්න ඉදිරියේදී පුළුවන්කම ලැබෙනවා.

ඒ වාගේම තමයි මාළබේ දැඩි ලෙස අබලන්ව තිබූ පාරක් සම්බන්ධයෙන් මෙතුමාගේ මම උපදේශක කාරක සභාවට යෝජනාව දැම්මාම, එතුමා එම පාර කාපට් කරන්න ඒ සඳහාත් ප්‍රතිපාදන ලබා දුන්නා. මම යමක් පුද්ගලිකව ඉල්ලලා නැති වුණත්, මෙන්න මේ පොදු කාරණාවලදී එතුමා මැදිහත්වීමෙන් ඒ කාරණා කරගන්න ලැබුණා. ඒ වාගේම තමයි පසුගිය අයවැයේදී, මම 2012 වර්ෂයේ සිටම මතක් කරමින් ආපු ප්‍රධාන කාරණයක් තිබුණා. මෙතුමාගේ අයවැය ලේඛනයේ මෙවරත් ඉදිරිපත් කරලා තිබෙනවා. අයවැය ප්‍රකාශයේ තිබෙනවා. කැලණි ගඟ අපවිත්‍ර වීම වැළැක්වීම උදෙසා මම මේ පළාත් සභාවේ මට කරන්න පුළුවන් හැකි උපරිම දේ මම කරලා තිබෙනවා. මම කවදාහරි මෙතැනින් නික්ම යන්නේ, ඒ පිළිබඳව මගේ උපරිම සහාය මම දැරුවා කියන සතුටින්. ඒ දරපු උත්සාහයේ එක්තරා අවස්ථාවක ලැබුණු ප්‍රතිඵලයක් තමයි ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ සම්බන්ධයෙන් පරීක්ෂා කරන්න, ඒ පිළිබඳව විධිමත් සොයා බැලීමක් කරන්න රුපියල් ලක්ෂ අටක් විතර ප්‍රතිපාදන වෙන් කරලා, ජලය පිළිබඳව අවබෝධය තිබෙන ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙක් ඇතුළු පිරිසකගෙන් සමන්විත විද්වත් කමිටුවක් මේකට පත් කිරීම. ඒ පත් කරලා, ඔවුන් වසරක් විතර පර්යේෂණ කරලා ඔවුන් ඊට කලින් කරලා තිබුණු

[ගරු සරත් පතිරණ]

පර්යේෂණ ප්‍රතිඵලත් එක්ක පළාත් සභාවට පරීක්ෂණ වාර්තාවක් ලබා දුන්නා. පරීක්ෂණ වාර්තාව ලබා දීලා දැන් සැලකිය යුතු කාලයක් වෙනවා. නමුත් ඒ පරීක්ෂණයේ ප්‍රතිඵල මට හෝ මේ පළාත් සභාවේ ඒ පිළිබඳව උනන්දුවක් දක්වපු අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා වාගෙ අයට. මේ කාටවත් මේකේ වාර්තාව දැනගන්න ලැබුණේ නැහැ. ඇයි කියන ප්‍රශ්නය අපි ඉස්සරහා තිබෙනවා. මේ වාර්තාව එළියට දැක්වූවා නම් විශේෂයෙන්ම කැලණි ගඟට එකතු වන ඒ ජල මාර්ග, ඇළ මාර්ග, පුස්වැලි ඔය, දිගටම තිබෙන ඔය ඇළවල් ටික අපවිත්‍ර කිරීමත් අපට නතර කරගන්න තිබුණා අර වාර්තාව අතට ආවා නම්. අහවල් ස්ථානයේ ජලය තිබෙන ප්‍රතිශතය මෙච්චරයි. PH අගය මෙච්චරයි කියලා ඒ එකතුවන අපද්‍රව්‍යවල ඒ ප්‍රතිශතයන් ටිකේ වාර්තාව ලැබුණා නම් - ඒ වාගේම ඒකට කළ යුතු ප්‍රතිකර්ම එතුමන්ලා ඉදිරිපත් කරලා ඇති. මෙන්න මේ ප්‍රතිකර්ම ටික අපට කරගන්න පුළුවන්කම ලැබෙනවා. මේක අනාගත පරපුරට කරලා දෙන ආයෝජනයක්. අද මේ අතපසු කරමින් තිබෙන්නේ - මම කියනවා, තවමත් ප්‍රමාද නැහැ.

අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා, මෙන්න මේ කාරණය දැන් සැලකිය යුතු විධියට මේක වැඩි වෙලා තිබෙනවා. මේ කැලණි ගඟ අපවිත්‍ර කිරීම. මේ අපවිත්‍ර කිරීම කෙසේද කියනවා නම් - ඔබතුමන්ලා දකින්න ඇති මේ දවස්වල අන්තර්ජාලයේ යනවා, ඉන්දියාවේ ගංගාවක අර සබන් පෙන මතු වෙලා වාගේ මුළු ගඟේම ඒ පෙන මතු වෙලා තිබෙනවා. ඉන්දියාවේ මිනිස්සු මේක දෙවියන් විසින් ලබා දීපු දෙයක්. දෙවියන් විසින් කරපු ආශ්චර්යයක් හැටියට සලකලා ඔවුන් ඒකේ දිය පරිහරණය කිරීමේ කටයුතු කරනවා. ඉන්දියානුවන්ට වඩා මම හිතනවා ලංකාවේ ඉන්න මිනිස්සු ඊට වඩා සබුද්ධික මිනිස්සු ටිකක් කියලා. කැලණි ගඟ දෙපස දිස්ත්‍රික්ක දෙකේම බුද්ධිමත් මිනිස්සු ඉන්නේ. මේ අයට තනි තනිවම මේක කරගන්න බැහැ. ඒ අය මේ අපරාධය දකිනවා. ගඟ දෙපස ඉන්න මම දන්න හොඳ උගතුන් හමු වුණාම, ඔවුන් මේ අපරාධය ගැන අපට කියනවා. නමුත් අපට මේ වරද නිවැරදි කරගන්න, මම දන්නවා එක්තරා පෞද්ගලික සිසිල් බීම සමාගමකින් ඒ අපවිත්‍ර ජලය කැලණි ගඟට මුසු වුණු වෙලාවේ ජලසම්පාදන මණ්ඩලයේ සියලුම පිල්ටර් සම්පූර්ණයෙන්ම අක්‍රිය වුණා. ඔවුන්ට ඒ සඳහා වන්දි මුදලක් ලබා දුන්නා. හැබැයි එතෙක් ඒ වතුර පාවිච්චි කරපු මහජනතාවට ලැබුණු ප්‍රතිලාභය මොකක්ද? අපි දන්නේ නැහැ, හෙට දවසේ මේ ජලය පරිහරණය කරපු දරුවන්ට, ඒ වාගේම මහජනතාවට ඒකෙන් ලැබෙන ප්‍රතිඵලය මොකක් වෙයිද කියලා. තවම ඒවා ගණනය කරලා නැහැ. අතන අලාභය ගණනය කරලා ඒ සමාගම ගෙව්වා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා අතින් පසුගිය පළාත් සභා අයවැයේදී මම ඉදිරිපත් කරපු කාරණය ඉෂ්ට කරගන්න මේ ඉදිරි කාලයේදීවත් එතුමාගේ අවධානය යොමු වෙන්න අර පරීක්ෂණ වාර්තාව අනුව කටයුතු කරන්න ඕනැය කියන ඒ යෝජනාව කරනවා.

මම මේ අලුතින් යමක් මතක් කරන්නේ නැහැ. පසුගිය පළාත් සභාවේ අයවැයේදී මම මතක් කරපු කාරණා ඉෂ්ට නොවුණු කාරණා පිළිබඳව මතක් කිරීමක් කරන්නේ. මම ඉදිරිපත් කළා, බස්නාහිර පළාත් සභාවට අයත් ආයතනවල - පළාත් සභාවට අයත් ආයතන විශාල පද්ධතියක් තිබෙනවා. මෙන්න මේ ආයතනවල වාහන භාවිතා කිරීමේදී, මේ වාහන පරිහරණය කිරීමේදී ඒවා අක්‍රමවත් විධියට පරිහරණය වෙනවා, අපි ඕනෑතරම් දැකලා තිබෙනවා. මේක විධිමත් කරගන්න, අඩුම තරමින් මේක කිසියම් පාලනයකට යටත් කරගන්න අපි යෝජනා කළා වාහනවල රාජ්‍ය ලාංඡනය ඇතුළත් කරන්න. හරි සරල කාරණයක්. රාජ්‍ය ලාංඡනය ඇතුළත් කළ යුතුයි. ඒ චක්‍රලේඛය මගේ අතේ තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ චක්‍රලේඛය අනුව වැඩ කටයුතු කළ යුතුයි. මෙහි විශේෂයෙන්ම සඳහන් කරලා තිබෙනවා, කාරණා අංක එකේ තුන යටතේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අංක 26/92(1) ප්‍රකාරව සංචිත වාහන සඳහා රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම යෙදීමට කටයුතු කළ යුතුය. ඒක පළාත් සභාවෙන්ම නිකුත් කරපු, ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාතෙන් නිකුත් කරපු ලියවිල්ලක්. ඒ අනුව කටයුතු කරන්න. ගිය අවුරුද්දේ මම ඉදිරිපත් කළාට පස්සේ ඇයි තවමත් මේවා ප්‍රමාද කරන්නේ. මේ අවභාවිතා වෙන්නේ මහජනතාවගේ මුදල්. කාගෙවත් පෞද්ගලික මුදල් නොවෙයි. ඒ නිසා මේ පළාතේ ඉතාමත්ම අමාරුවෙන් බදු මුදල් ගෙවන මිනිස්සුන්ගේ බදු මුදල්වලට සාධාරණයක් ඉෂ්ට කරගන්න, 100% ක් කර ගන්න බැරි වුණත් මෙවැනි දේවල් නතර කරගන්න පුළුවන් හරිම සරල උදාහරණයක් මේ තිබෙන්නේ. රාජ්‍ය ලාංඡනය වාහනවලට යොදන්න.

දැන් වාහන ගැන කියද්දී, පළාත් සභාවේ මම, ඒ වාගේම අපේ ගොඩක් මන්ත්‍රීවරු අපේ පක්ෂයේ. මෙතැනට එන්නේ මෝටර් සයිකලෙන්. දැන් උදේ අපේ ගරු සභාපතිතුමා එක මාධ්‍ය ආයතනයක් විසින් කරපු ප්‍රකාශයක්, උදේ පුවත්පත් වැඩ සටහන් ඉදිරිපත් කිරීමේදී මාධ්‍යවේදීන්ට මේක ඇතුළට එන්න බැරි වෙන්න දොර වහලා තිබුණා කියන එකයි මාධ්‍ය ආයතනය ඒ උදේ විකාශනය කරපු පුවත්පත් සිරිස්තල කියද්දී කිව්වේ. අපිත් දැක්කා මාධ්‍යවේදීන් මේකේ ඊයේ සිටියා. හැබැයි ඔවුන් අපේ මන්ත්‍රීවරු නිල් චිත්‍රපටි බලන ඒවා පුවත්පත්වල headline දැම්මාට පස්සේ අඩුම තරමේ ඒ මොන පක්ෂයේද කියලාවත් දාන්නේ නැහැ. පොදුවේ සමස්තයටම තමයි මේ අසාධාරණය සිද්ධ වෙන්නේ. කවුරු හරි බැලුවා නම් බලපු අයගේනම් දාන්න, භය නැතිව. කොන්දක් තිබෙන මාධ්‍යය. ඒ ප්‍රවෘත්තිය ගියාට පස්සේ මම කියන්නේ, එවැනි ප්‍රවෘත්තියක් දැමීමත් වැරැදියි. මම ඒ වෙලාවේම සභාපතිතුමාට කථා කරලා කිව්වා, අඩුම තරමින් ගරු සභාපතිතුමනි ඒ මන්ත්‍රීවරු වැරැද්දක් කළත්, ඒ මන්ත්‍රීතුමන්ලාගේ දරුවෝ, බිරින්දෑවරු - මම දැනගෙන සිටියේ නැහැ, අපේ මන්ත්‍රීතුමාගේ නෝනා පාසල් විදුහල්පතිවරියක් කියලා කිව්වා. ඒ අය ගැනවත් සිතන්න ඕනෑ.

හරි, මාධ්‍යය ඒ කාර්යභාරය කළා කියන්න කෝ. මේ පළාත් සභාවට අවුරුදු 18 ක් මෝටර් සයිකලෙන් එන - දැනුත් මෝටර් සයිකලේ මෙතැනින් මම දාන කොට security එකේ මහත්වරු පස්සෙන් දුවගෙන එනවා, දාන්න බැහැයි කියලා. මොකද ඒ අය මාව අඳුරන්නේ නැහැ. අපේ අනික් මන්ත්‍රීවරුත් එහෙමයි. නන්දන මන්ත්‍රීතුමා, රන්වල මන්ත්‍රීතුමා. එතුමාගේ නෝනට වාහනයක් තිබෙනවා, වෛද්‍යවරියක් නිසා. වටගල මන්ත්‍රීතුමාගේ නෝනට වාහනයක් තිබෙනවා, වෛද්‍යවරියක් නිසා. එතුමන්ලා සමහරවිට ඒ වාහනවල එනවා. හැබැයි වැඩිපුර වාර ගණනක් එන්නේ මෝටර් සයිකලෙන්. මේ මාධ්‍යය එකකවත් දැම්මාද ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු එන්නේ මෝටර් සයිකලෙන් කියලා. මෙන්න මේවත් මාධ්‍යවල යා යුතු දේවල්. හැබැයි, මේ වසර 18 ම එකදු මාධ්‍යයකවත් අපි පිළිබඳව සඳහනක් කළේ නැහැ. හැබැයි මන්ත්‍රීවරයෙක් මොකක් හරි - මේක කවුරුත්, ඉස්කෝලේ හතේ අටේ කොල්ලොත් දැන් ඔය බලන දේවල්. මම කියන්නේ නැහැ, පළාත් සභාව ඇතුළේ මේක කළ එක හොඳයි කියලා. හැබැයි එවැනි ප්‍රවෘත්ති දාන අතරේ මේ මන්ත්‍රීවරු හැසිරෙන විධිය සම්බන්ධයෙනුත් අපි හැසිරෙන විධිය සම්බන්ධයෙනුත් මේ මාධ්‍යයවල දාන්න. ඒ පිළිබඳව මතක් කරනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතන ගැන කියද්දී හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මත්තේගොඩ ඒ Housing scheme එකට මට ලැබුණු ප්‍රතිපාදනවලින් ලක්ෂ පහකුත්, අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රතිපාදනවලින් ලක්ෂ පහකුත්, ඒ වාගේම සුනිල් වටගල අපේ ගරුමන්ත්‍රීතුමාගේ ලක්ෂ පහකුත් එකතු කරලා අපි දැම්මා කලාකරුවන්ගේ ඉල්ලීමකට මෙතැන රංග පීඨයක් ඉදි කරන්න කියලා. වැඩ කටයුතු සකස් කරන්න අපි ලක්ෂ පහළොවක් වෙන් කළා. ඇත්තටම ඒ එතැන ඉන්න කලාකරුවන්ගේ ඉල්ලීමක්. මත්තේගොඩ ප්‍රදේශයේ කලාකරුවන් විශාල ප්‍රමාණයක් ජීවත්වන ප්‍රදේශයක්. ඔවුන්ගේ ඉල්ලීම අනුව තමයි අපි මේ කටයුත්ත කළේ. එතැනට කියන්නෙත් බේසම කියලා. මොකද එතැන තිබෙන්නේ, බේසමක හැඩයක්. මෙතැන එළිමහන් රංග පීඨයක් හදන්න අපි යෝජනා කළා. විහාර මහා දේවි එකේ, ඒ වළ වාගේ. ලොකු වියදමක් යන එකක් නොවෙයි. හැබැයි මේක කරන්න කලින් අපට සභාවේ විරෝධතාවයක් නැහැයි කියලා මේ පළාත් සභාවට ඉදිරිපත් කරගන්නත් ඕනෑ. ඒ නිසා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩියක් දෙන්න. අපි මේ යෝජනාව ඉදිරිපත් කරද්දී ප්‍රාදේශීය සභාවේ යෝජනාවක් සම්මත කර ගත්තා, අපේ මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් කරලා. මෙන්න මේ සම්මත වුණු යෝජනාව අනුව තමයි ප්‍රතිපාදන වෙන් කළේ. දැන් සභාපතිතුමා පොහොට්ටුවේ කෙනෙක්. මේ වැඩේ කරනවාට ප්‍රදේශයේ ඉන්න එක මන්ත්‍රීවරයෙක් විරුද්ධ වුණා. අද මේ ආයතනය නියෝජනය කරන කලාකරුවන් විශාල පිරිසක් ඉන්නවා. මම ඒ කලාකරුවන්ගෙන් අහනවා. මේ වැඩේ කරන එක නතර කරපු එක සාධාරණද? යුක්ති සහගතද? කියලා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත්

[ගරු සරත් පතිරණ]

කරුණු කාරණා ගොඩක් දේවල් කියන්න තිබෙනවා. කාලසීමාව ඉක්ම ගිය නිසා එය කළ නොහැකියි. මෙන්න මේ මම කියපු කාරණා පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්නය කියලා ඔබතුමා මගින් ඉල්ලා සිටිමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. ශ්‍රීනාත් මහේන්ද්‍ර පෙරේරා ගරු මන්ත්‍රීතුමා, එතුමා නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [සිරිකමල් පිලීෂියන් ද සිල්වා මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Hon. Sirikamal Filician de Silva M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා, එතුමා නැහැ. උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 11.41]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය වෙනුවෙන් කථා කරන්න ලැබීම සතුටක්. ඒ වාගේම එතුමාගේ උපදේශක කාරක සභාවත් මා නියෝජනය කරනවා. කියන්න තිබෙන ප්‍රථම කාරණාව තමයි මේ බස්නාහිර පළාත් සභාවට මම අඛණ්ඩවම සහභාගි වන මන්ත්‍රීවරයෙක්. උදේට මේ සභාවට ආපුවාම හවස තමයි නැවත ගෙදර යන්නේ. ඒ වාගේම සෑම කාරක සභාවකටම මම සහභාගි වෙනවා. ඊයේ දවසේ තිබුණු පොදු සාකච්ඡාවේදී අපට වචනයක් කථා කරන්න අවස්ථාව ලැබුණේ නැහැ. වර්ෂයකට වතාවක් මේ අයවැය යෝජනාවක් එන කොට අඩුම වශයෙන් අපේ කැප කිරීම, මේ බස්නාහිර පළාත පවත්වාගෙන යන්න අපි දක්වන සහයෝගයට යම්කිසි ඇගයීමක් කරන්න තිබුණා. ඒ ලැයිස්තු හැදුව කෙනා කවුරු වුණත් මම හිතන්නේ අපට කළේ අගතියක්. ඒවා දේශපාලන නොවෙන්න පුළුවන්. පරිබාහිරව නොවෙන්න පුළුවන්. නමුත් බස්නාහිර පළාත සම්බන්ධයෙන් අපට යම් හෝ අදහසක් දක්වන්න තිබුණු අවස්ථාව මඟහැරිලා ගියා. ඒ නිසා මගේ කනගාටුවයි ප්‍රධාන වශයෙන් මේ සභාවට යොමු කරන්නේ.

මම හැමදාමත් කියනවා වාගේ මම එන්නේ ඇත දුෂ්කර ගමක ඉඳලා. අත්තනගල්ලේ ඉතාමත් පිටිසර ගම්මානයේ ඉඳලා. ගමේ මිනිස්සුන්ගේ හඬයි මම අරගෙන එන්නේ. මම මෙතැන ව්‍යාපාරයක අදහස් අරගෙන එන්නේ නැහැ. එහෙම නැත්නම් පෞද්ගලික වෛර පිරිමහන්න අදහස් අපි අරගෙන එන්නේ නැහැ. අපි ගේන්නේ අපේ අහිංසක මිනිසුන්ගේ යෝජනා. අදහස්. ඒ අදහස්වලට මේ සභාවේ තැනක් නැත්නම් අපට ඡන්දය දුන්නු මිනිසුන්ට අපි නිසි සාධාරණය ඉටු කළා වෙන්නෙ නැහැ. ඒ නිසා අපි විශ්වාස කරනවා, අනාගතයේ හරි අහිංසක මිනිසුන්ගේ හඬට අපට අවස්ථාව ලැබෙයි කියලා. කොහොම වුණත් පළාත් පාලන විෂයය සම්බන්ධයෙන් එහි ආයතනයක බලධාරීත්වය දරපු පුද්ගලයෙක් වශයෙන් මට මේ පළාත් පාලනය පිළිබඳව යම් හැඟීමක් තිබෙන කෙනෙක්. ඒ නිසා මේ පළාත් පාලන අමාත්‍යාංශය හරහා අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ප්‍රධාන ලේකම්තුමා අමාත්‍යාංශ ලේකම් හා කොමසාරිස් ධූරය දරපු අපේ ලේකම්තුමිය සහ ඒ අනුබද්ධ සියලු කාර්ය මණ්ඩලය ඉහත අවුරුද්ද තුළ යම් වැඩ කොටසක් කළා. අපි දැක්කා. ඒ වකවානුව ඉතාමත් කාර්යභාර තත්ත්වයට පත් වුණා. මම දැක්කා, පළාත් පාලන ලේකම්තුමිය දැඩි අසීරුතාවයට පත් වෙනවා. දේශපාලන වශයෙන් නිරාවරණය වෙලා තිබුණු පළාත් පාලන ආයතනය සක්‍රිය වුණාට පස්සේ, එහි බලය පිහිටුවන්න ගියාම රාජ්‍ය නිලධාරීන් වශයෙන් මොනතරම් අසරණතාවයට පත් වුණාද? උදාහරණයක් වශයෙන් ගත්තොත් මා නියෝජනය කරන අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාව පිහිටුවන්න ගිහිල්ලත් යම් අසරණතාවයකට පත් වුණා. ගරු මහ ඇමතිතුමාත් ඒ නිලධාරීනුත් තමන්ගේ කාර්යභාරය නිවැරදිව ඉටු කරලා මේ බස්නාහිර පළාත තුළ ඒ පළාත් පාලන ආයතන හරියට ස්ථාපිත කරන්න තමන්ගේ වගකීම ඉටු කළා. මම හිතන්නේ ඔවුන්ට අතීතයෙන් යමක් අනාගතයට එකතු වුණා, මේ තිබෙන පීඩාකාරී තත්ත්වය හා ඒ අවස්ථාවයට මුහුණ දීම සම්බන්ධයෙන්. එතකොට මේ පළාත් සභා හරහා අපි දැක්කා, පළාත් පාලන ආයතනවලට අපේ ගරු මහ ඇමැතිතුමාගේ අමාත්‍යාංශය හරහා විශාල වැඩ කොටසක් කරන්න පුළුවන් තැනක් බව. මේ වැඩ කොටස කරන්න පුළුවන් තැන, අපි අවබෝධ

කරගන්නට ඕනෑ. ඒ නිසා මම හිතනවා මේ බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා හරහා, ඒ කාර්ය මණ්ඩලය හා නිලධාරීන් හරහා යම්කිසි වැඩ කොටසක් ක්‍රමානුකූලව සිද්ධ වෙමින් පැවතුණා. අපි ඒවා අගය කරන්නට ඕනෑ. විශේෂයෙන් මේ පළාත් පාලන ආයතන හරහා බොහොම හැංගිලා තිබුණු ඒවා තමයි පෙර පාසල් කියන ඒවා. මේ පෙර පාසල් අද සක්‍රිය තත්ත්වයට ගෙනැල්ලා, එම ගුරුවරු හොඳ ශක්තිමත් භාවයට පත් කරන්න, ඔවුන්ගේ හැඟීම් සහ ඔවුන්ගේ දක්ෂතාවයන් එළි පෙහෙළි කරන්න, ආයුර්වේද වෛද්‍ය සේවය ප්‍රචලිත කරන්න හා එහි තිබෙන ගුණාත්මක භාවය වැඩි දියුණු කරන්න, ඒ වාගේම නගරය අලංකාර කරන, ඒ වාගේම මේ සමාජයට මහා වැඩ කොටසක් කරන අහිංසක කම්කරුවන්ට ඔවුන්ගේ සේවය අගයමින්, ඒ ඇගයීම් කරනවා වාගේම ක්‍රීඩා පැත්තෙන් නංවලා ඒ අයට සතුට ගෙන දෙමින්, තමන්ගේ සේවය කරන ආයතනය තුළ, තමන්ගේ බල ප්‍රදේශය තුළ තරගකාරීත්වය ඇති කළා විතරක් නොවෙයි, පළාත් පාලන ආයතන අද ඉතා දියුණු තත්ත්වයට ඇවිල්ලා ඔවුන්ගේ කළමනාකරණ තරගයෙන් ඔවුන් ප්‍රමුඛ වෙන්නේ කොහොමද කියලා ඒ හැම කෙනාම ඒ ගුණාත්මක සේවයක් ඇති කරන්න, පෙරටුගාමී කාර්යාල පිහිටුවන්න, ඒ වාගේම නීත්‍යානුකූල වැඩ කොටස් කරන්න, සභා අනුමැතියන් ගන්න, මුදල් වෙන් කරගන්න, වැය ශීර්ෂයන් වෙන් කරගන්න, ඒ වාගේම තමන්ගේ සභා ගැබ හොඳින් පවත්වාගෙන යන්න හොඳ කළමනාකරණයක් මේ සභාවන් තුළ ඇති කරන්න ලොකු කැප කිරීමක් කළා. ඒ නිසා මට තේරෙන විධියට පළාත් පාලන ආයතන දැන් උත්සාහ කරන්න විගණන මතයක් අපි ලබා ගන්නේ කොහොමද? අපි මේ මුදල් වියදම් කිරීම සම්බන්ධයෙන් සතුටුදායකයි කියලා කොහොමද උත්තරයක් ගන්නේ. අද පළාත් සභාව විගණනය කරනවා, ඒ පළාත් පාලන ආයතන. පළාත් පාලන ආයතන නව මහකට යොමු කරන්න පළාත් සභාව වශයෙන් මහ ඇමතිවරයාත් ඒ අදාළ ලේකම්තුමිය ඇතුළු නිලධාරී මණ්ඩලයත් ලොකු වැඩ කටයුත්තක් කරනවා.

විශේෂයෙන් මා මෙම බස්නාහිර පළාතේ - කෙනෙක් කියන්න පුළුවන් බස්නාහිර පළාත් සභාව කියන්නේ සුදු අලියෙක් කියලා. මම මේ පළාත් සභාවට තරග කරන කොට අපේ ප්‍රදේශයේ ජනතාව මට ඡන්දය ලබා දුන්නේ නැහැ. ඔබතුමා යන්නේ නිකන් ඉන්න තැනකට. ඕතැනට යන්න එපා. ප්‍රාදේශීය සභාවේ ඉන්න කියලා බොහෝ අය මට ඡන්දය දුන්නේ නැහැ. හැබැයි මම ඒ අයට, ගමට පණිවිඩයක් අරගෙන ගියා. මේ බස්නාහිර පළාත් සභාව කියන්නේ, කම්මැලි නැතිව වැඩක් කරනවා නම් වැඩක් කරන්න තිබෙන හොඳම තැන පළාත් සභාව කියන එක. එහෙමනම් ජනතාව තේරුම් ගත්තා. අද දවසේ කුඹුරට වී ටික ගහන එකේ ඉඳලා, එහෙම නැත්නම් ගොවිතැන් කරන එකේ ඉඳන් ගත්තත්, ගවයෝ හදන එක ගත්තත්, පාරවල් හදන එක ගත්තත්, පාසල් අධ්‍යාපනය ගත්තත් ඒ හා සමානව ගත්තත් සුවිශල් සේවාවන් බලන කොට පළාතට මොනතරම් සේවයක් කරන්න පුළුවන්ද? කියලා. අහිංසක ආච්චි අම්මාට රබාන අතට දීලා, වැඩිහිටි සංවිධාන ශක්තිමත් කරන්න පුළුවන් නම්, ගමේ තරුණ සංවිධානය ශක්තිමත් කරන්න පුළුවන් නම්, ළමා සමාජය ශක්තිමත් කරන්න පුළුවන් නම් අපට මොනතරම් සේවාවක් මේ බස්නාහිර පළාත තුළ කරන්න පුළුවන්ද? ඒකට කැප කිරීම අවශ්‍යයි. වැය ශීර්ෂයන් පිළිබඳව අවබෝධයක් ගන්නට ඕනෑ. ඒ නිසා මේ නිකන්ම ඉඳගෙන පළාත් සභාවෙන් වැඩක් වෙන්නේ නැහැ. පළාත් සභාව වැඩක් නැහැ. ඇමතිවරුන්ට අවලාද කියනවාට වඩා, නිලධාරීන්ට අවලාද කියනවාට වඩා තමන් කැප වෙන්නට ඕනෑ.

මම එක අමාත්‍යාංශයක ලෝක බැංකුව හරහා එන 10% ක මුදලක් යන්නේ කොහාටද කියලා සොයා ගන්න අමාත්‍යාංශ ගණනාවකට ගියා. මම එසේ ගිහිල්ලා සොයා ගත්තා, ලෝක බැංකු ආධාර යටතේ ලැබෙන මුදල්වලින් 10% ක් කොයි තැනටද යන්නේ? ඒ තැනින් අපට ගන්න පුළුවන් මොනවාද? කියලා. එය අත්තනගල්ල ආසනයේ ජනතාව වෙත මම අරගෙන ගියා. මම දන්නවා මේ බස්නාහිර පළාතේ වෙන කිසිම මන්ත්‍රීවරයෙක් ඕක දන්නේ නැහැ. කොහෙද තිබෙන්නේ? මොනවද කරන්නේ කියන එක. අපි විමර්ශණය කරන්නට ඕනෑ. මට තිබෙන කනගාටුව තමයි මේ බස්නාහිර පළාතේ වැය ශීර්ෂය කියන කොට තිබෙනවා නම්‍යශීලී ගම්මාන. අසමතුලිත ගම්මාන. විශේෂ අවශ්‍යතා ඇති ගම්මාන. මේවා පිළිබඳව මනා අවබෝධයක් අපි ලබා ගත්තා. අපට දීමනාවක් ලැබෙනවා. මේ දීමනාව පාවිච්චි කරලා ලිපි ද්‍රව්‍ය ටික ගන්නවා. අපි තෙල් ටික ගහගෙන වාහනයේ ගිහිල්ලා මට යම්කිසි පළපුරුද්දක් තිබුණා. අර නිලධාරීන් අතර ඉන්නවා, අපේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම්වරයා වශයෙන් කටයුතු කරපු විජයබන්දු මහත්මයා. එතුමාගෙන් මම ඉගෙන ගත්තු දෙයක් තිබුණා. ඒ තමයි ගමක සංවර්ධනය මිනිස්සු ඉල්ලනවා නම්, ගමට යන්නට ඕනෑ. ඒක එතුමාගෙන් මම ප්‍රායෝගිකව දැක්ක දෙයක්. මම එහෙම දුෂ්කරතා තිබෙන

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

ගම්වලට ගිහිල්ලා, ගමේ මිනිස්සු ඒකරාශී කරලා, තැනකට එකතු කරලා මම ගමේ මිනිස්සුන්ට කියනවා ඔබම ඔබේ ගම අඳින්න. ගල් වැටි අඳින්න. ඇළ වේල්ල අඳින්න. පාර අඳින්න. ඔබේ වෙල් යාය අඳින්න. ඔබේ අවශ්‍යතාව ටික පෙළගස්වන්න. ගමේ අය සිතියම හදලා, පොත හදලා මට ගෙනත් දෙනවා, ව්‍යාපෘතියක් විධියට. ඔය ව්‍යාපෘතිය මම ගෙනැල්ලා ප්‍රධාන ලේකම්තුමාට, ගරු මහ ඇමතිතුමාට, අමාත්‍යාංශවලට දීලා විශාල මුදල් ප්‍රමාණයක් අත්තනගල්ල ආසනයට හැරෙව්වා. එය බස්නාහිර පළාතේ කරපු එකම මන්ත්‍රීවරයා මම වෙන්නට පුළුවන්. ගම්මාන දෙකක් හෝ තුනක් මම සමස්ත ගම්මානවල වැඩ ඉවර කළා. ඒකේ කුඹුරු යාය වෙන්න පුළුවන්. ඇළ වේල්ල වෙන්න පුළුවන්. පාර වෙන්න පුළුවන්. ප්‍රජා ශාලාව වෙන්න පුළුවන්. දුගී නිවස, එහෙම නැත්නම් වැසිකිළිය වෙන්න පුළුවන්. මේ සියල්ල හදන්න පුළුවන්කමක් ඇති වුණා, එහෙම කැපවීමක් ඇති නිසා. නමුත් අවාසනාවකට අත්තනගල්ල ආසනයේ යම් යම් දේශපාලන අධිකාරීන් හා බලාධිකාරීන් කලබලයට පත් වුණා. මේ උපුල් කියන පුද්ගලයා ගිහිල්ලා සල්ලි අරගෙන එනවා. කොහෙන් සොයනවද දන්නේ නැහැ. අන්තිමට අපට මේ දේශපාලන මතය ගොඩනඟන්නට පුළුවන්කමක් නැහැ. මේක නවත්වන්න ඕනෑය කියලා මට මේ වසර 01 ½ ක කාලය තුළ යමක් කරගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. හැබැයි මගේ කැප කිරීම අදටත් පොත් ගණනාවක් නිර්මාණය කරලා තිබෙනවා. ඒ අහිංසක මිනිසුන්ගේ මාර්ග, මිනිසුන්ගේ වැසිකිළි, මිනිසුන්ගේ ජල ප්‍රශ්න මේවාට මම කැප වෙලා රූපරාමු සහිතව ව්‍යාපෘති හදලා තිබෙනවා.

ගරු මහ ඇමතිතුමාගේ හෘද සාක්ෂිය දන්නවා. උපුල් මන්ත්‍රීතුමාට කීයක් හරි දෙන්න ඕනෑ. ලේකම්තුමා දන්නවා. ලේකම්තුමිය දන්නවා. මේ මනුස්සයාට උදව්වක් කරන්න ඕනෑ. කැප වෙලා වැඩ කරන නිසා කියලා. දේශපාලනය හරස්වීම නිසා අත්තනගල්ල අහිංසක ජනතාවට කරන්න තිබුණු සේවාව කරගන්න බැරි වුණා. කරන්න පුළුවන් කාලයකුත් නැහැ. අද අවසානයේ හිතන්නේ අත්තනගල්ල ගැන සුරපුරයක් කියලා. අහිංසක මිනිස්සු ඉනිමඟේ ගිහිල්ලා තමයි ගෙවල්වලට යන්නේ. අසරණ මිනිස්සු පුටු හදලා තිබෙනවා, ලෙඩ්ඩු කරේ තියාගෙන ගේන්න. එක දවසක් අපේ නිලධාරීන් ගියාම අම්මා කෙනෙක් ඇවිල්ලා කිව්වා, අනේ මහත්තයෝ මගේ අම්මා මැරුණා. අම්මාගේ මිනිය ගත්තේ කන්ද පල්ලෙහාට ගෙනැල්ලා තවත් ගෙදරක. මගේ තාත්තාගේ මිනිය ගන්නවත් පාර හදලා දෙන්න කියලා ඒ මිනිස්සු ඉල්ලුවා. කරගන්න බැරි වුණා. මේ දේශපාලන මතවාදය. ඒ නිසා අපට තිබෙන්නේ දේශපාලන මතයක් නොවෙයි. අපි නියෝජනය කරන්නේ අහිංසක මිනිස්සු. ඒ මිනිස්සු වෙනුවෙන් වැඩ කරන්න ඕනෑ. දහමේ ඉගැන්නුවෙත් "සන්තුට්ඨී පරමං දනං". ආපසු හැරිලා බලන කොට කරපු දෙයක් සමාජයට තිබෙන්නට ඕනෑ. තමන්ට ලැබුණු මේ තනතුරෙන් සමාජයට සේවයක් කරන්න මේ අන්තවාදී දේශපාලන බල අරගලය අපට අවස්ථාව දුන්නේ නැහැ. මම කථා කරන්නේ කනගාටුවෙන්. නමුත් බොහෝ දේ කරන්න පුළුවන් වුණා කියලත්, මම ඔබට කිව්වා.

ඒ වාගේම මම විශේෂ අවධානයක් යොමු කළා, බස්නාහිර පළාතේ සංචාරක අමාත්‍යාංශය සම්බන්ධයෙන්. ඒ සම්බන්ධයෙන් විශාල කර්කාවතක් ඇති කරගන්න පුළුවන්කම ඇති වුණා. ඒ හරහා බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා, එතුමාගේ කාර්ය මණ්ඩලය කැප වෙලා පොතක් නිර්මාණය කළා, අපේ බස්නාහිර පළාත කියලා. අද ඉතාම වටිනාකමකින් යුතු පොතක් බවට පත් වුණා. ඒ පොතට වැඩි වශයෙන් කියනවා උතුරු - නැගෙනහිර ප්‍රදේශයේ - අපි ඒ ප්‍රදේශයේ කටයුතු කරන්න ගියාම අපට පොඩි පොත් පිංචක් ලබා දුන්නා. සංචාරකයක් වෙනුවෙන් යම් පොතක් අතට දුන්නා. මේකේ සියලු දේවල් නිර්මාණය වෙලා තිබෙනවා. සංචාරක මණ්ඩලයට මම යෝජනා කරනවා, ඒ වාගේ පොඩි පොතකුත් හදන්න. තවත් සංචාරක කලාප හොඳින් තෝරා ගන්න. ඒ තෝරාගෙන සංචාරක සිතියම මනාව ඇති කළොත් මිනිසුන්ගේ ඇහැ ගැටෙන්න, අපි නොදැක්ක දේවල් අපට ලබා ගන්න, මේ සංචාරක ව්‍යාපාරය හරහා අපට කරන්න පුළුවන්. ඒ කරන කාර්යයත් අපි අගය කරන්නට ඕනෑ.

ඒ වාගේම තමයි විශේෂයෙන් පළාත් පාලන ආයතනයක් වශයෙන් බස්නාහිර පළාතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ආයතනය විශාල කාර්යභාරයක් කරනවා. ඔවුන්ට හොඳ දැක්මක් තිබෙනවා. මම හිතනවා ඔවුන් මේ ප්‍රශ්නවලට විසඳුම් සොයන්න නම් අපි පුංචි ළමයා ළඟට යන්න ඕනෑ. පෙර පාසලට, පාසලට යන්න ඕනෑ. එහෙම නැත්නම් අපේ ප්‍රදේශයේ මේවා පිළිබඳව දැනුවත් කරන්න - මම හැමදාමත් කියන විධියට මේ බස්නාහිර පළාතේ අපි, ඒකාබද්ධ වැඩ සටහනක් බවට පත් වෙන්නට ඕනෑ. කෘෂිකර්ම

අමාත්‍යතුමාට පුළුවන් නම් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට සම්බන්ධ වෙන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට පුළුවන් නම් සෞඛ්‍ය ඇමතිතුමාට සම්බන්ධ වෙලා ඒකාබද්ධ වැඩ සටහනක් කරන්න. මම මේ ඝන අපද්‍රව්‍ය අධිකාරියේ නිලධාරීන් ගෙනගිහිල්ලා පෙන්නුවා, මගේ ප්‍රදේශයේ අහක දාන කසළ වලින් බෝතල්, බැරල්, එහෙම නැත්නම් යම් යම් දේවල් පාවිච්චි කරලා ගෙවතු වගා කරන විධිය. හැම ගෙදරකම ගෙවතු හදලා, වස විෂ නැති ආහාර වේලක් ගන්නේ කොහොමද? ඒ නිලධාරීනුත් පුදුමයට පත් වුණා. කොහොමද මේ බෝතල් කපලා එල්ලලා කංකුං වවලා තිබෙනවා. ලී පතුරු එකතු කරලා ගොටු කොළ වවලා තිබෙනවා. මිරිස් වවලා තිබෙනවා. ඒ හරහා ඝන අපද්‍රව්‍ය ටික පාවිච්චි කරලා, ඒ නිර්මාණවලට ඒවා බඳුන් වශයෙන් ගන්න කොට කසළ ටික -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

බස්නාහිර පළාතේ ගරු මහ ඇමතිතුමාගේ අමාත්‍යාංශය හරහා මම හිතන්නේ ලොකු වැඩ කොටසක් කරන්න පුළුවන් තැනක්. ඒ වැඩ කොටස මනාව අපි අවබෝධ කරගන්නට ඕනෑ. ඒ නිසා කාල වේලාව අඩු නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මම මේ බස්නාහිර පළාතට පත් වෙලා දැන් අවුරුදු පහක සභා කාලය අපි අවසන් කරන්න යන්නේ. ඊළඟ අවස්ථාවේ අපි පත් වෙයිද? පත් නොවෙයිද? කියන එක අපි දන්නේ නැහැ. නමුත් ජනතාව තමයි තීන්දු කරන්නට ඕනෑ. හැබැයි ඒ කාලය තුළ මට සිහිනයක් තිබුණා, මම බස්නාහිර පළාතේ ගරු මහ ඇමතිතුමාගේ උපදේශක කාරක සභාව නියෝජනය කරමින්, මම මුල් අවස්ථාවේදී යෝජනා කළා අපේ අත්තනගල්ල ආසනයට අදාහනාගාරයක් ලබා දෙන්න. ඒක වර්ග කිලෝ මීටර් 151 ක් විශාලයි. විශාල ජනතාවක් විසිරිලා ඉන්න මෙම ප්‍රදේශයට ආදාහනාගාරයක් හෝ තිබෙන අදාහනාගාරය ද්විත්ව ආදාහනාගාරයක් කරලා දෙන්නය කියලා ඉල්ලීමක් කළා. එය මගේ සිහිනයක් බවට පත් වෙලා තිබුණා. එය ඉටු කරගන්න නොහැකි වෙලා තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන් මම මේ උපදේශක කාරක සභාවට යෝජනා කළා මේ ජන සමාජයේ මිනිස්සු හදන්න නම් පොත පත කියවන්නට පුරුදු කරවන්නට ඕනෑ. තාක්ෂණික මෙවලම් දියුණු වෙලා තිබෙනවා තමයි. මේ රටේ අන්තර්ජාල පහසුකම් දියුණු වෙලා තිබෙනවා තමයි. නමුත් කියවීමෙන් තමයි මිනිහෙක් සම්පූර්ණ කරන්න පුළුවන් කියලා ජන සමාජයේ කථාවක් තිබෙනවා. යාපනය පුස්තකාලය ගිනි තැබීම හරහා ලෝකයට පණිවිඩයක් දුන්නා. ජංගම පුස්තකාල සේවයක් ආරම්භ කරන්න, ආරම්භයක් වශයෙන් නියාමක ව්‍යාපෘතියක් ආරම්භ කරන්න අපට ලොකු ආශාවක් තිබ්ලා, මම අවස්ථා කීපයකදී උපදේශක කාරක සභාවට ගෙනාවත් එයත් ඉටු කරගන්න තවම නොහැකි වෙලා තිබෙනවා. මම මේ ඉටු කර ගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන් කනගාටුව නොවෙයි. මීත් ඉදිරියට හෝ මේවා ක්‍රියාත්මක කරගන්න අපට පුළුවන් මැදිහත්වීම් කරගන්න මොන විධියට කරන්න පුළුවන් කියලා තමයි මම උත්සාහ කරන්නේ. ඒ නිසා මෙම බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා හරහා ඒ අපට කරන්න පුළුවන් කාර්යය සඳහා අඛණ්ඩව එතුමා අපට සහයෝගය, ඒ තැන හිටපු පුද්ගලයෙක් වශයෙන් ඒ නිලධාරීන් එක්ක ලබා දුන්නත් මේ සමාජයේ අර ළඟ බලන මිනිසුන්, දේශපාලන හස්තයන් නිසා මම හිතන්නේ, මම ගත්තා වූ උත්සාහයන් බොහෝවිට වැළකුණා. ඒ නිසා අනාගතයේ ඒ දේශපාලන කඩතුරාවෙන් මිදිලා අහිංසක ජනතාව වෙනුවෙන් වැඩ කරන්න අවස්ථාව ලැබෙයි කියලා බලාපොරොත්තු වෙමින් නිහඬ වෙනවා.

[පූ.භා. 11.56]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හය වැනි පළාත් සභාවේ අවසාන මුදල් ප්‍රකාශය විවාද කරන අවස්ථාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ විෂයය පථයට අයත් පළාත් පාලන විෂයය, සංචාරක විෂයය පිළිබඳව කථා කරන්න ලැබීම ගැන සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යවරයා මේ පළාත් සභාවේ අවුරුදු හතරකට ආසන්න කාලයක් මේ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා හැටියට කටයුතු කෙරුවා. අපි දැක්කා මීට ඉහත ප්‍රධාන අමාත්‍යවරයාට බොහෝ අවස්ථාවලදී ලැබුණේ පළාත් සභාවේ අධ්‍යාපනය කියන විෂයයත් එකතු වෙලා. නමුත් මේ ප්‍රධාන ඇමතිවරයාව පත් කරපු අවස්ථාවේදී අධ්‍යාපනය වෙනම අමාත්‍යාංශයක් බවට පත් කරලා එතුමාට වඩාත් වගකීමක් තිබෙන පළාත් පාලනය, සංචාර, විදුලිබල වැනි විෂයයන් එතුමාට පැවරුවා. ඇත්ත

[ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා]

වශයෙන්ම මම හිතන්නේ ඉතාම අසීරු කාලසීමාවක් තමයි මේ වසර හතරක කාලය තුළ එතුමා පසු කෙරුවේ. එතුමාට මේ අභියෝගවලට මුහුණ දෙන්න බොහොම හැකියාව තිබෙනවා. බොහොම පරිණත දේශපාලඥයෙක් හැටියටත්, පළාත් පාලන ආයතනයක සභාපතිවරයෙක් හැටියටත් කොහොමද මන්ත්‍රීවරුන්ව හසුරගෙන කටයුතු කරන්නේ කියන එක අපි මේ අවුරුදු හතර තුළ දැක්කා. මම කියන්නේ නැහැ, එතුමා හැමෝටම සාධාරණව එකම හැන්දෙන් බෙදුවා කියලා. එතුමා ඒ අවශ්‍ය වෙලාවට, අවශ්‍ය කරන මන්ත්‍රීවරයා තමන්ගේ පක්ෂයේද? විරුද්ධ පක්ෂයේද? කියලා බලන්නේ නැහැ. ඒ වැඩේට ඕනෑ කරන පුද්ගලයා කිට්ටු කරගෙන ඒ වැඩ ටික කරගෙන - අර සාමාන්‍ය විධියට කියනවා, ෂේප් න්‍යාය කියලා. ඒක ඉතාමත් ඉතා හොඳින් ප්‍රගුණ කරපු පුද්ගලයෙක් විධියට මේ අමාත්‍යාංශයේ කටයුතු ටික කරගෙන ගියා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ අය වගේ ෂේප් න්‍යාය නැහැ. අපි කරනවා නම් කෙළින්ම කරනවා. බැරි නම් බැහැයි කියනවා. ෂේප් න්‍යාය නැහැ. ෂේප් න්‍යාය ගියා නම් -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එතුමාත් එක්ක මම තර්ක කරන්න යන්නේ නැහැ. එතුමාව මම අගය කරන පුද්ගලයෙක් හැටියට -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ෂේප් න්‍යායට ගියා නම් කෝටි පහක විතර වැඩ කරගන්න හම්බ වෙන්නේ නැහැ. රෝස් ගරු මන්ත්‍රීතුමියට කර ගන්න හම්බ වුණේ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සිරිකමල් ගරු මන්ත්‍රීතුමා, ඔන්න ගණන හෙළි වුණා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක තමයි මම කිව්වේ. හැමෝටම එක සමානව සැලකුවේ නැහැ. එතුමා ඒ ඒ පුද්ගලයාට ඒ ඒ විධියට සැලකුවා කියලා. ඒක තමයි කිව්වේ. දැන් මට සලකපු විධියට ඔබතුමා රෝස් ගරු මන්ත්‍රීතුමියට සැලකුවේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා තමයි ගාණට අර්ථ දැක්වුවේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක තේරුම් ගන්න ඕනෑ. මට සලකපු විධියට රෝස් මන්ත්‍රීතුමියට සැලකුවේ නැහැ. ජානක මන්ත්‍රීතුමාට සලකපු විධියට නොවෙයි, මෙරිල් ගරු මන්ත්‍රීතුමාට සැලකුවේ. ඒ නිසා ඒ ගැන ඔබතුමාම හෘද සාක්ෂිය විමසලා බලන්න. ඔබතුමාගේ ඒ න්‍යාය කොයිතරම් දුරට සාර්ථක වුණාද කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ජානක මන්ත්‍රීතුමාගෙන් අහන්න කෝ ඔබතුමා කෝටි කීයක්ද කියලා. බොරුවට ජානක මන්ත්‍රීතුමාව අන්දන්නේ නැතිව.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඊටත් අමතරව මම ඔබතුමාට කියන්න ඕනෑ. මේ විවාදයකට පැටලෙන්න නොවෙයි. ඔබතුමාට ඉතාම අසීරු කාලසීමාවක් තමයි මේ ගෙවන්න සිද්ධ වුණේ. මොකද, මධ්‍යම රජයේ යම්කිසි ප්‍රතිපත්තියක් තිබුණා, යහපාලන ආණ්ඩුවක් ඇවිල්ලා, ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එකතු වෙලා ආණ්ඩු කරන කාලයේ ඒ යහපාලනයෙන් උපන් මහ ඇමතිවරයෙක් හැටියට තමයි ඔබතුමාව මම දකින්නේ. නමුත් ඔබතුමාට වඩා යම්කිසි ජ්‍යෙෂ්ඨත්වයක් තිබෙන, ඇමතිකම් දරන පුද්ගලයන් ඉන්න කොට ඒ යහපාලන ආණ්ඩුව බිහි වීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි ඔබතුමා මේ පළාත් සභාවේ ප්‍රධාන ඇමතිතුමා බවට පත් වෙන්නේ. මම ඒ ගැන සන්තෝෂයි. මොකද අපේ පන්තියේ, මේ මහ පොළවේ පය ගහලා ඉන්න, පළාත් පාලන විෂයය ගැන හොඳට දන්න, මිනිසුන්ගේ ගඳ සුවඳ හොඳට දන්න, කොහොමද මල්ලි කියලා කරට අත දාලා, ගරු මන්ත්‍රීතුමා කියලා කථා කරන්නේ නැතිව සිරා කියලා කථා කරන්න පුළුවන් පුද්ගලයෙක් මේ පළාත් සභාවේ මහ

ඇමතිවීම ගැන සතුටු වෙනවා. අපි දැකලා තිබෙනවා, මීට පෙර හිටපු මහ ඇමතිවරු. වෙනමම කල්ලි හදාගෙන, Kichen Cabinet හදාගෙන මේ පළාත් සභාව පාලනය කෙරුවේ. ඔබතුමා එහෙම නොවෙයි. අපි ඒක ගැන සන්තෝෂ වෙනවා. ඒ නිසා ඉතාම අමාරු කාලයක් තිබුණේ. එතැනදී ඔබතුමාට පසුගිය කාලයේදී පළාත් පාලන මැතිවරණයකට මුහුණ දෙන්න සිදු වුණා. ඒ පළාත් පාලනවල යම්කිසි ආයතන පිහිටුවන කොට, සභාපතිවරු උපසභාපතිවරු පිහිටුවන කොට පක්ෂ දෙක තුනෙන් පිහිට වුණේ. දැන් ඒකේ ප්‍රතිඵලය ලැබිලා තිබෙනවා. අද මේ වන විට පළාත් පාලන ආයතනවල 2019 අවුරුද්දේ මුදල් ප්‍රකාශය, අයවැය ලේඛනය පිළිබඳව සාකච්ඡා කරන වෙලාවේ එහෙම පිහිටවපු පළාත් පාලන ආයතන අද පරාජයට පත් වෙලා තිබෙනවා. සභාපතිවරයා ඉදිරිපත් කරපු අයවැය ලේඛනය. දැන් මෙවැනි දේශපාලන ව්‍යාකූල තත්ත්වයක් යටතේ තමයි අපේ 2019 මුදල් ප්‍රකාශය එන්නේ.

මම මෙතැනදී විශේෂයෙන්ම වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. පසුගිය යහපාලන රජය තිබුණු කාලයේ අති විශාල මුදල් ප්‍රමාණයක් මේ පළාත් පාලන ආයතනවලට දුන්නා. කෝටි ගණන් මුදල් දුන්නා. ගම් පෙරළියෙන් දුන්නා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් දුන්නා. හැබැයි මේ දේශපාලනය ඔළුවට අරගත්තු සභාපතිවරු - අත්තනගල්ලේ උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා මම ඉතාමත් අගය කරන මන්ත්‍රීවරයෙක්. එතුමා හොඳ කථාවක් මේ සභාවේ කළා. එතුමාගේ හෘද සාක්ෂිය මෙතැන කිව්වා. නමුත් පළාත් පාලන ආයතනවලට දීපු ඒ කෝටි ගණන් සල්ලි අපරාදේ ආපසු ඇරියා. වත්තල ප්‍රාදේශීය සභාව විතරයි මේකෙන් උපරිම ප්‍රයෝජනය ගත්තේ. කාටද මේ වැඩ කරන්නේ? කාගේ පාරද මේ හදන්නේ? කාගේ මිනී කනත්තද හදන්නේ? කාගේ ප්‍රජාශාලාවද හදන්නේ? කාටද මේ බෙහෙත් ටික ගේන්නේ. අනික් සියලුම ප්‍රාදේශීය සභාවල, නගර සභාවල මුදල් ආපසු යන්න ඇරියා. මොකද ඒක යහපාලන ආණ්ඩුවෙන්, එහෙමත් නැත්නම් ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන්, ගම්පෙරළියෙන් ලබා දුන්නු මුදල් කියලා. වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා දේශපාලන වශයෙන් පොහොට්ටුවේ. ඒක වෙනම කතන්දරයක්. එතුමාත් අපේ ප්‍රාදේශීය ලේකම්තුමියත් එකතු වෙලා කිව්වා, නැහැ මේ සල්ලි අපි ගන්න ඕනෑ. අරගෙන අපි අපේ ප්‍රදේශයට වැඩ කරමු. ගිය සතියේ සභාපතිතුමා මට හම්බ වුණ වෙලාවේ කිව්වා, මන්ත්‍රීතුමා ඒ සල්ලි ගත්තු නිසා ඊළඟ අවුරුද්දේ මට පාරවල්වලට වෙන් කරන්නේ නැතිව ප්‍රාදේශීය සභාවේ අරමුදල් වෙනත් වැඩකට යොදවන්න පුළුවන් කියලා. එහෙම ඉදිරිපත් කරපු අයවැයත් ඊයේ වත්තල ප්‍රාදේශීය සභාවේදී පරාජයට පත් කෙරුවා. මොකක්ද මේ දේශපාලනය? මට තිබෙන කනගාටුව ඒකයි. ඒ දේශපාලනය ඔළුවට අරගෙන අද තිබෙන - අද අපට වුණත් සිද්ධ වෙලා තිබෙන්නේ ඒකයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගැන, ලලිත් වනිගරත්න අමාත්‍යතුමා ගැන, අනික් අමාත්‍යවරු අපට මෙහෙම උදව් කළා කියලා අපට එහෙම කියන්න සිද්ධ වෙනවා. කරපු දේවල් අපට කියන්න සිද්ධ වෙනවා. නමුත් අපේ ඉහළ දේශපාලන අධිකාරිය යම් දේශපාලන තීන්දුවක් ගත්තොත් අපට ඒකට පක්ෂයේ මතය අනුව අවනත වෙන්න සිදු වෙනවා. එවැනි කාලකණ්නි සමාජයක තමයි මේ ජීවත් වෙන්නේ කියන එක මම කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් පාලන ආයතනවල කටයුතු ගැන කථා කරද්දී මේ වෙලාවේ ස්තුතිවන්ත වෙන්න ඕනෑ. දැන් මේ විෂයය භාර අමාත්‍යාංශ ලේකම්තුමිය පළාත් පාලන කොමසාරිස් හැටියට වැඩ කරපු කාලයේ ඉතාමත්ම විශිෂ්ට සේවාවක් මේ පළාත් සභාවේ කටයුත්තේදී දායක වෙලා කෙරුවා. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මන්ත්‍රීවරු මොනවා හරි කිව්වාම ඉතාමත්ම ඉක්මණින් ඒ සඳහා ක්‍රියාත්මක වෙලා වැඩ කටයුතු කෙරුවා. දැන් එතුමිය පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙලා ඇවිල්ලා ඉන්නවා. මේ අලුතින් පත් වුණු පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට විරුද්ධව මේ වන කොට මොනතරම් පැමිණිලි සංඛ්‍යාවක් ඇවිල්ලා තිබෙනවාද කියලා එතුමියගෙන් විමසලා බලන්න පුළුවන්. හැබැයි, මේ පිළිබඳව තවමත් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ නිසා පළාත් පාලන විෂයය භාර ඇමතිවරයා හැටියට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වගකීම තිබෙනවා. මේ පළාත් පාලන ආයතන යහ මාර්ගයේ අරින්න. මොකද, එතුමා පළාත් පාලනයෙන් බිහි වුණු දරුවෙක්. එතුමයි මමයි එක කාලයේ තමයි පළාත් පාලන ආයතනවල සභාපතිවරු වෙලා සිටියේ. ඒ නිසා මේවායේ කරන කෙරුවාව පිළිබඳව එතුමා හොඳට දන්නවා. ඒ නිසා එතුමාට වගකීමක් තිබෙනවා. මේ පළාත්

[ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා]

පාලන ආයතන නිසි මාර්ගයේ අරින්න ඕනෑ නම්, මේ වැරදි කරන, වැරදි තීන්දු ගන්න පළාත් පාලන ආයතනවල සභාපතිවරු ගැන කටයුතු කරන්න.

ඊයේ පොදු සාකච්ඡාව වෙලාවේදී ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා හොඳ ප්‍රකාශයක් කෙරුවා. ගම්පහ මහ නගර සභාවේ නගරාධිපතිවරයා පිළිබඳව. ගිණුම් කාරක සභාවට ඇවිල්ලා එතුමා කරන ප්‍රකාශය. මම හිතන්නේ එතුමා කිව්වා, පැය 24 ම වැඩ කෙරුවත් මේ විධියට තෙල් ගහලා වාහන දුවන්න බැහැයි කියලා. ඒක තමයි ඇත්ත කතන්දරය. ඒ නිසා ඒවා පිළිබඳව තීරණ ගන්න ඕනෑ. එක එක්කෙනාගේ දේශපාලන කතන්දර නොවෙයි. මේවා මහජනතාවගේ සල්ලි. මේවාට වගකියන්න ඕනෑ. මේවාට විගණනයක් තිබෙනවා. ඒ නිසා තමයි මේ විධියට පත් කරලා තිබෙන්නේ. එහෙමනම් ඒ වාර්තාවක් ඉදිරිපත් කෙරුවාම එයා එක්සත් ජාතික පක්ෂයේද? එයා පොහොට්ටුවේද? එයා ජනතා විමුක්ති පෙරමුණේද? එයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේද? ඒවා අපට වැඩක් නැහැ. පළාත් පාලන ආයතනයට පත් වෙන මන්ත්‍රීවරයාගේ, සභාපතිවරයාගේ වගකීම තිබෙන්නේ - අපට උගන්වලා තිබෙන්නේ රටේ බදු ගෙවන ජනතාවගේ උප්පත්තියේ සිට මරණය දක්වා කටයුතු කරන්න පුළුවන් ආයතනය තමයි පළාත් පාලන ආයතනය. එහෙම නම් ඒවායේ නියෝජනය කරන සභාපතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට - දැන් අපේ කාලයේ වාගේ නොවෙයි. අද ඉතාමත්ම හොඳට පහසුකම් තිබෙනවා. ඒ පහසුකම් උපයෝගී කරගෙන කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. විශේෂයෙන්ම ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමා මේ සභාවේ ඉන්න නිසා කියන්න ඕනෑ. මේ අලුත් මන්ත්‍රීවරු පත් වුණාම විශාල අඳෝනාවක් තිබුණා. අපට යම්කිසි ණය මුදලක් දෙන්න, අපට මෝටර් සයිකලයක් ගන්න. අපට දුරකථනයට ගෙවන්න. මේ විධියට විශේෂ ඉල්ලීම් මාලාවක් තිබුණා. අපි ඒ පත් වුණු අලුතම මේ සභාවේ ඒ පිළිබඳව කටයුතු කෙරුවා. ඒ නිසා යම්කිසි වෙලාවක දැන් මේ පිළිබඳව තීන්දුවකට, තීරණයකට එනවා නම්, දැන් මේ පළාත් පාලන ආයතන පිහිටුවලා, මන්ත්‍රීවරු පත් වෙලා අවුරුද්දක විතර කාලයක් වෙනවා. ඒ නිසා ඒ අය පිළිබඳව මේ මුදල් ප්‍රකාශයෙන් පසුවවත් තමුන්නාන්සේලා තීන්දුවක් ගන්න ඕනෑ. විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඒ වගකීම තිබෙනවා. සමූපකාර විෂයය භාර ඇමතිවරයා හැටියට ඔබතුමාට පුළුවන් පළාත් පාලන මන්ත්‍රීවරුන්ට යම්කිසි ණය මුදලක් ලබා දීලා, ඒ අවශ්‍ය කරන කටයුතු කරන්න. මම හිතන්නේ පළාත් පාලන විෂයයට ආදරය කරන මහ ඇමතිවරයෙක් ඉන්න නිසා ඒ පිළිබඳව විශේෂයෙන්ම කටයුතු කරයි කියන කාරණය මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි පළාත් පාලන විෂයයට අමතරව ගරු ප්‍රධාන අමාත්‍යතුමාට සංචාරක කටයුතුත් පැවරෙනවා. මම පසුගිය මුදල් ප්‍රකාශය වෙලාවේදීත් මේ කථාව කිව්වා. මේක හුදකලාව යන්න පුළුවන් පළාත් සභාවක් නොවෙයි. යම් යම් කාරණා තිබෙනවා. යම් යම් විෂයයන් තිබෙනවා. මධ්‍යම රජයේ ඒ අමාත්‍යාංශත් එක්ක සමගාමීව, එහෙම නැත්නම් සම්බන්ධ වෙලා යන්න. මම නියෝජනය කරන්නේ, ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල මැතිවරණ කොට්ඨාශයේ මුහුදුබඩ තීරය. ඉතාමත් හොඳ සංචාරක කලාපයක් තිබෙනවා. ඒ වාගේම හැමිල්ටන් ඇළ තිබෙනවා. ඒ නිසා මම ගිය සැරෙත් යෝජනා කෙරුවා. එම ආසනය භාර, එම මැතිවරණ කොට්ඨාශය භාරව නියෝජනය කරපු ජෝන් අමරතුංග මැතිතුමා තමයි රේඛීය අමාත්‍යාංශයේ මධ්‍යම රජයේ සංචාරක කටයුතු අමාත්‍යවරයා හැටියට කටයුතු කෙරුවේ. ඒ නිසා කරුණාකරලා එකතු වෙලා, යම්කිසි ව්‍යාපෘතියක් හදලා, අපේ ලස්සන මුහුදු තීරය ප්‍රීති පුර, අපට තිබෙන හැමිල්ටන් ඇළ පාවිච්චි කරලා කටයුතු කරන්නය කියලා. හැබැයි මම දන්නේ නැහැ මොනවා කටයුතු කෙරුවාද කියලා. නමුත් මේ පොතේ නම් තිබෙනවා, ජෝන් අමරතුංග මහත්මයා එක අවස්ථාවක ඇවිල්ලා පොල් තෙල් පහනක් පත්තු කරනවා, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් එක්ක.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියයි කාලය තිබෙන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හරි ස්තූතියි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ මනුස්සයා අපේ Tourism වලට, Western Province එකට උදව් කළා. එතුමා ඔබතුමාව ගණන් ගන්නේ නැති

එක මට ප්‍රශ්නයක් නොවෙයි. ගරු ඇමතිතුමා, Western Province එකේ Tourism වලට උදව් කළා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක තමයි මම කිව්වේ. ඒක තමයි මම මේ කියාගෙන එන්නේ. එතුමා මේ වැරැදි පැත්තට හැරිලා ඉන්නේ. ඒකයි මේ වෙලා තිබෙන්නේ. ඒ නිසා කරුණාකරලා මම ඔබතුමාට කියන්නේ තව අවස්ථාව තිබෙනවා. මේ අවුරුද්දේ ඒ කටයුතු ටික මේ ප්‍රදේශයේ, මේ මුහුදුබඩ තීරය සංචාරක කර්මාන්තයට මේ පළාත් සභාව දෙන දායකත්වය පිළිබඳව මීට වඩා වගකීමෙන් යුතුව කටයුතු කරන්නය කියලා.

අවසාන වශයෙන් මම කියන්න ඕනෑ. විශාල ප්‍රශ්නයක් තිබුණා. දැවෙන ප්‍රශ්නයක්. කැළි කසළ පිළිබඳ ප්‍රශ්නය. කොළඹ කුණු ටික වත්තලට ගෙනැල්ලා තමයි මේ ප්‍රශ්නයට තාවකාලික විසඳුමක් ගත්තේ. ඒ වෙලාවේ පාරට බැහැලා අරගල කරන්න අපට සිද්ධ වුණා. මොකද, මේ කුණු ගෙනැල්ලා දාලා, දවසේ පැය 24 ම ලෙඩ රෝග බෝවන, ගඳ ගහන තත්ත්වයට තමයි වත්තල, ඒ අවට ජනතාවව පත් කෙරුවේ. නමුත් මේ පිළිබඳ තීරණ ගන්න යම්කිසි කාලසීමාවක් ගියා. කොළඹ නොදිරන කැළි කසළ ගෙහිල්ලා අරුවක්කාරුවල දානවා කියලා වැඩ සටහන් කරගෙන ගියා. දැන් ඒක මොන තත්ත්වයක තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ. නමුත් තවමත් කොළඹ ඇතුළු අනික් පළාත් පාලන ආයතනවල කැළි කසළ ටික වත්තලට එනවා. කෙරවලපිටියට එනවා. හැබැයි දැන් යම්කිසි ප්‍රමාණයකට මර්දනය කරගෙන ඒ කැළි කසළ වලින් පොහොර නිෂ්පාදනය කරන වැඩ පිළිවෙළක් පසුගිය කාලයේ චම්පික රණවක ඇමැතිතුමා නිර්මාණය කළා. ඒක විශාල ආදායම් එන මාර්ගයක්. හැබැයි ඒ ප්‍රශ්නය එතැනින් ඉවර නැහැ. ඒ නිසා කරුණාකර ගරු මහ ඇමතිතුමනි, තමුන්නාන්සේ යෝජනා කෙරුවා. පළාත් පාලන ආයතන වෙන වෙනම මේ කර්තව්‍යය කරන්න ඕනෑ වැඩ පිළිවෙළක්. ඒ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න. මේක මහ ආණ්ඩුව, එහෙම නැත්නම් රජය මේ පිළිබඳව කටයුතු කරනවා වාගේම පළාත් සභාවක් හැටියට අපට තමයි මේකේ ශුද්ධ වූ අයිතිය තිබෙන්නේ. ඒ අයිතිය පාවිච්චි කරලා, පළාත් පාලන ආයතනත් එක්ක සම්බන්ධ වෙලා වෙන වෙනම ඔවුන්ට ඒකක හදලා මේ ප්‍රශ්නයට උත්තරයක් සොයන්න කියන ඉල්ලීම කරමින්, විශේෂයෙන්ම මගේ කල්‍යාණ මිත්‍රයා, ගරු ප්‍රධාන ඇමතිතුමා. ඔබතුමා මට පෞද්ගලිකවම, මේ පසුගිය කාලසීමාවේදී මොනවා හරි කිව්වාම, මට විහිළු කරලා හරි කමක් නැහැ, ඒ උදව්ව කෙරුවා. හැබැයි යම්කිසි අවස්ථාවක දේශපාලන තීන්දුවක් ගන්න සිදු වුණොත් ඉතාම කනගාටුවෙන්, වරදක් කළත් සිතකින් නොවේ කියලා ඒ තීන්දුව ගන්න සිද්ධ වෙනවා කියන එක ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හරි. හරි. ඒ අයට අරගෙන බලන්න කියන්න කෝ. මොකද වෙන්නේ කියලා.

[අ.භා. 12.09]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ශීර්ෂ අංක 104, 109, 110, 111 සහ 112 යටතේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව. විශේෂයෙන්ම මම සතුටු වෙනවා, ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවක කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව. ඔබතුමා පළාත් පාලන අයාතනයක සභාපතිවරයෙක් විධියට ඉඳලා පළාත් සභාවට ආපු නියෝජ්‍ය සභාපතිවරයෙක්. ඒ වාගේම මම සතුටු වෙනවා, ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමා පළාත් පාලන විෂයය භාර ඇමතිවරයා විධියට ඉන්න විට කථා කරන්න ලැබීම පිළිබඳව. මේ එතුමාගේ හතරවැනි අයවැය ලේඛනය. මම හිතන්නේ එතුමා අවුරුදු විස්සකට අධික කාලයක් මේ පළාත් සභාව තුළ අයවැයවලට ඉඳලා තිබෙනවා. එතුමා දේශාපලනය පටන් ගත්තෙත් පළාත් පාලන ආයතනවලින්. පළාත් පාලන ආයතනයක සභාපතිවරයෙක් වෙලා ඉඳලා, ඒකේ කටයුතු කරලා, ඒ අත්දැකීම, අවබෝධය ඒ සියල්ල අරගෙන තමයි එතුමා මේ ස්ථානයට ආවේ. පළාත් සභාවට ආවේ. පළාත් සභාවේ දීර්ඝ කාලයක් ඉඳලා තමයි එතුමා ප්‍රධාන ඇමතිවරයා වුණේ. ඒ සියලු ඇත්දැකීම් එතුමා පළාත් පාලන විෂයය හසුරුවන්න භාවිතා කරනවා කියන කාරණය අපට දැනෙනවා. තේරෙනවා. ඒ නිසාම පළාත් පාලන විෂයයට එතුමා දක්වන ඇල්ම ආදරයත් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසාවෙන්ම පළාත් පාලන ක්ෂේත්‍රය වඩාත් සංවර්ධනාත්මක විධියට මෙහෙය ගන්න පුළුවන්කම

[ගරු මහේෂ් අල්මේදා]

ලැබෙනවා කියන විශ්වාසය අපට තිබෙනවා කියන කාරණය මුලින් මතක් කරන්න ඕනෑ.

පළාත් පාලනය තමයි ලංකාවේ පැරණිම පාලන ව්‍යුහය බවට පත් වෙලා තිබුණේ. පළාත් පාලන ඉතිහාසය දීර්ඝ කාලයක් ඈතට දිවෙනවා. පළාත් පාලනය මහජනතාවට ඉතාම සමීපම මහජන බල කේන්ද්‍රය ලෙසට ලංකාවේ පත් වෙලා ඉවරයි. ඉන්දියාවේ නම් මේක ඊටත් එහා ගිහිල්ලා. ග්‍රාම පංචායත් හැදිලා. ගමට ආයතන හැදිලා. ගම පාලනය කරන පරිපාලන ව්‍යුහයක් නිර්මාණය වෙලා තිබෙනවා. අපි තවම පළාත් පාලන ආයතන තුළ ඉඳගෙන මේ පළාත් පාලන ආයතන හරහා ජනතාවගේ ප්‍රශ්න විසඳීමේ කටයුතු සිද්ධ කරගෙන යනවා. දැන් මේකේ බරපතළ ව්‍යුහාත්මක වෙනසක් ගෙවුණු මේ අවුරුද්දේ පෙබරවාරි මස 10 වැනිදා සිද්ධ වනු ලැබුවා. අපි දන්නවා, පළාත් පාලන ඡන්ද ක්‍රමය වෙනස් වුණා. ඒ වාගේම පළාත් පාලනයට පත්වන සභිකයන්ගේ ප්‍රමාණය අතිවිශාල ප්‍රමාණයකින් පසුගිය මැතිවරණයේදී වැඩි වෙන්න පටන් ගත්තා. විශේෂයෙන්ම මේ මැතිවරණයේදී සිදු වුණු ප්‍රධානම සිද්ධිය තමයි පළාත් පාලන විෂයයට එකතු වුණේ, පළාත් පාලන මහජන නියෝජිතයින් බවට පත් වුණේ පළාත් පාලන ක්ෂේත්‍රය ගැන දැනුමක්, අවබෝධයක්, අත්දැකීමක් තිබෙන අය නොවෙයි. අපි සියලු දෙනා දන්නවා. පසුගිය දවස්වල තිබුණු දේශපාලනය පසුබිම මත අපි කිව්වා, අර පොල්පිත්තක් දැම්මත් දිනනවා කියන තත්ත්වයක් ඇති වෙලා, පළාත් පාලන ආයතනවලට කිසිම දේශපාලන අවබෝධයක්, අත්දැකීමක්, දැනුමක් නැති අය මහජන නියෝජිතයින් බවට පත් වෙලා ඒ අය පළාත් පාලන ආයතන සභිකයන් බවට පත් වුණා. මේ නිසාම තමයි බරපතළ ප්‍රශ්නය මතු වුණේ. අද මම විශ්වාස කරනවා, පළාත් පාලන දෙපාර්තමේන්තුවට අතිවිශාල රාජකාරියක් පැවරිලා තිබෙනවා කියලා, මේ අලුතින් ඇති වුණු ව්‍යුහාත්මක වෙනසත් එක්ක යම් පර්යේෂණ මට්ටමක පළාත් පාලන විෂයය ක්ෂේත්‍රය ගමන් කළ යුත්තේ කොයි දිශාවටද කියන කාරණය පිළිබඳව ලොකු අධ්‍යයනයක් කරන්න අවස්ථාව ලැබිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා අවුරුදු 2 ½ ක් තිස්සේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අකුලා දමමින් පළාත් පාලන සඳහා මැතිවරණ තිබීම නතර කරලා දාලා තිබුණා. ඒ නිසා මහජනතාවගේ ප්‍රශ්න ගැටලු රාශියක් එකතු වෙලා, ගොඩගැහිලා තිබුණා. ඒවා දැන් තමයි විසඳගන්න අවස්ථාව, මේ ආයතන බිහිවීම තුළ ලැබිලා තිබෙන්නේ. මේකේදී විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි හැමදාමත් කිව්වා වාගේ මේ බලය ගොඩනඟා ගැනීම විද්‍යාවක්. කලාවක්. මේ කලාව අර Academic Lessons වලින් කියලා දෙන්න පුළුවන්කමක් නැහැ. ලංකාවේ පාසල්වල, ලංකාවේ විශ්ව විද්‍යාලවල, ලෝකයේ කොහෙවත් විශ්ව විද්‍යාලවල බලය ගොඩනගා ගැනීම සඳහා පන්ති කාමර පුහුණු පාඨමාලා තියන්නේ නැහැ. ඒ අය බලය ගොඩනගා ගන්නේ, ඒ අය ළඟ තිබෙන සහජ හැකියාවක් තුළින්. හැබැයි බලය ගොඩනඟා ගත්තාට පස්සේ මේ අය පුහුණු කරලා, දැනුවත් කරලා පළාත් පාලන සභිකයෙක් විධියට මහජන සේවයේ නිරත වෙන්නේ කොහොමද කියන කාරණය ගැන යම් පුහුණුවක්, අවබෝධයක් ලබා දීමේ වගකීම පළාත් පාලන දෙපාර්තමේන්තුව සතුව තිබෙනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අතිවිශාල සංඛ්‍යාවක් පත් වුණු මන්ත්‍රීවරු, සීතාවක ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු 22 යි සිටියේ. ඒක 43 ට ඉහළට ගියා. කොළඹ මහ නගර සභාවේ රැස්වීම් ශාලාව ඇතුළේ තමන්ගේ සභිකයන් සංඛ්‍යාව ගාල් කරගන්න බැරි තරම් සභික සංඛ්‍යාවක් වැඩි වුණා. ලංකාවේ හැම තැනම අතිවිශාල සභිකයන් සංඛ්‍යාවක් වැඩි වුණා. ඒක මම හිතන්නේ භාරදාහකටත් එහා පැත්තට මේ සභික සංඛ්‍යාව ගියා. මේ අය පුහුණු කිරීම පළාත් පාලන දෙපාර්තමේන්තුවේ බරපතළ වගකීමක් කියලා මම විශ්වාස කරනවා. මම බොහොම සතුටු වුණා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා වේලාසනින්ම මේ කාරණාව දැකලා 2017 අයවැයේ මුදල් වෙන් කරලා තිබුණා පළාත් පාලන ආයතන සභිකයන්ව පුහුණු කරන්න. ඒ සඳහා අවස්ථාවක් ලැබුණා. 2018 පෙබරවාරි මස 10 වැනිදා මැතිවරණයට පස්සේ පත් වුණු සභිකයන්ව පුහුණු කිරීමේ අවස්ථාව ලැබුණා. හැබැයි ඒ පුහුණුවල කටයුතු පිළිබඳව යම් පර්යේෂණයක්, යම් අධ්‍යයනයක් කරලා, ඒක මේ සභාවට ඉදිරිපත් කිරීමේ වගකීම පළාත් පාලන දෙපාර්තමේන්තුවට තිබෙනවා කියන කාරණය මතක් කරන්න ඕනෑ. මම එහෙම කියන්නේ, මේ එක එක පුහුණු වැඩ සටහන් සඳහා සහභාගි වුණු සභිකයන් සංඛ්‍යාව කීයද? ඉතාම හදිසියේ මේ පුහුණු වැඩ සටහන් සංවිධානය කරනු ලැබුවා. ඒ අය සභාවට ආවා විතරයි. මම දන්නවා සීතාවක ප්‍රාදේශීය සභාව සහභාගි වුණු පළාත් පාලන ආයතන පහක් විතර සම්බන්ධ කරලා

කුරුණෑගල කරපු පුහුණු වැඩ සටහනට - පුහුණු වැඩ සටහන දවසේ රාත්‍රියේ කෑම 400 කට විතර හදලා තිබුණා. හැබැයි, සභිකයන් සහභාගි වුණේ, දෙන්නෙක් නැත්නම් තුන්දෙනෙක් විතරයි. සභිකයන් ඊ මේකට ආවේ නැහැ. පසුවදා සභික සංඛ්‍යාව වැඩි වුණා. හැබැයි බලාපොරොත්තු වුණු සැබෑ සභික සංඛ්‍යාව පුහුණු වැඩ සටහනට ඇවිල්ලා තිබුණේ නැහැ. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මේ සභාවට ඉදිරිපත් කරන්න පුළුවන් නම්, එහෙම නැත්නම් පළාත් පාලන කොමසාරිස්තුමාට කී දෙනෙක් පුහුණු වැඩ සටහන්වල එක එක වැඩ සටහන්වලට සහභාගි වුණාද කියලා. ඒක වැදගත් වෙනවා අනාගතයේදී පුහුණු වැඩ සටහන් සංවිධානය කරද්දී කියන කාරණය මතක් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඇත්තට සභිකයෝ ඒකේ ප්‍රයෝජනය ගත්තේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

පැහැදිලිව ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒක ගත්තේ නැහැ. ඒක ගන්න තරම් අවබෝධයක් තිබුණේ නැහැ. මොකද දේශපාලනය පිළිබඳ අවබෝධයක්, දැනුමක් නැති මල් කණ්ඩායමක් තමයි ඡන්දවලින් දිනලා තිබුණේ. ඒ අයට මන්ත්‍රී වෙලා, මන්ත්‍රීවරයෙක්ගේ Prestige එක ගන්නවා මිසක මහජන සේවය සඳහා තමන් කැප වෙන්න ඕනෑද කියන අදහස, තේරුම තිබුණේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බොරුවටත් මල් නොවෙයි. හිස් බෙලෙක්ක.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සමහර වෙලාවට හිස් බෙලෙක්කත් වෙන්න ඇති රෝස් වගේ. නමුත් ඒ අය ආවාට පස්සේ වගකීමක් තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බොරුවටත් ඒ පොහොට්ටුවේ නේ? අපි නොවෙයි නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ අය ආවාට පස්සේ ඒ අයට වගකීමක් තිබෙනවා, තමන් මේ සභාවල් ඇතුළේ කරන කාර්යයන් පිළිබඳව යම් දැනුවත් කිරීමක් කරන්න. මේ පොතෙත් දාලා තිබෙනවා. මහ නගර සභා ධුරධාරීන් 125 ක්, නගර සභා ධුරධාරීන් 295 ක්, ප්‍රාදේශීය සභා ධුරධාරීන් 1087 ක්. මේ අය සඳහා පුහුණු වැඩ සටහන් පැවැත් වූ අදියර සංඛ්‍යාව එකයි, එකයි, එකයි කියලා තමයි දාලා තිබෙන්නේ. මම හිතන්නේ ඊට වැඩි සංඛ්‍යාවක් පුහුණු වැඩ සටහන් තිබුණා කියන විශ්වාසය තමයි මට තිබෙන්නේ. මේ සඳහා මිලියන 9.5 ක් වියදම් කරලා තිබෙනවා. දැවැන්ත මුදලක්. මිලියන 10 කට අධික සංඛ්‍යාවක්. මේ පුහුණු වැඩ සටහන් සඳහා ලක්ෂ 100 ක් වියදම් කරලා තිබෙනවා. හැබැයි එහි ප්‍රයෝජනය ලැබුණාද කියන කාරණය පිළිබඳව යම් පර්යේෂණයක නිරත වෙලා වාර්තාවක් ඉදිරිපත් කරන්න පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතුයි කියන කාරණය මතක් කරනවා. ඒ වාර්තාවේ තොරතුරු අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ උපදේශක කාරක සභාවට දෙන්නටම ඕනෑ. ඒ හා සමානවම නිලධාරීන් පුහුණු කිරීමේ කටයුත්තත් මේ පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් කරන්නට ඕනෑ. අපි දන්නවා, නිලධාරීන් පුහුණු කිරීමේ වැඩ සටහන් වලදී විවිධ ආයතන හරහා පුහුණු වැඩ සටහන් රාශියක් මෙහෙයුවා කියලා මේ වාර්තාවල ඉදිරිපත් කරලා තිබෙනවා. සමස්ත පුහුණු නිලධාරීන් සංඛ්‍යාව, 7000 ක් විතර නිලධාරීන් සංඛ්‍යාවක් පුහුණු කළා කියලා මේ වාර්තාවල සඳහන් වෙලා තිබෙනවා. හැබැයි, ඒ පුහුණු වැඩ සටහන්වල ප්‍රගතිය, එහි ප්‍රතිඵලය කුමක්ද කියන කාරණය තවමත් ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා දන්නවා දැන් හැම පළාත් පාලන ආයතනයක් සඳහාම විමර්ශණ නිලධාරියෙක් පත් කරලා තිබෙනවා. හැබැයි අපි ගිණුම් කාරක සභාවට යද්දී දකිනවා, මේ විමර්ශණ නිලධාරීන්ට තමන්ගේ වගකීම ගැන අබමල් රේණුවක අවබෝධයක් නැහැ. ඒ අය හුඟක් වෙලාවට ගිහිල්ලා පළාත් පාලන ආයතන විමර්ෂණය කරන්නේ නැහැ. පළාත් පාලන ආයතනවලින් වරප්‍රසාද, වරදාන අරගෙන තමන්ගේ රාජකාරිය හරියට ඉෂ්ට කරන්නේ නැතිව යනවා. ඒ නිසාම විගණනය පිළිබඳ කාරණය පළාත් පාලනය ඇතුළේ කඩා වැටිලා තිබෙන්නේ. මේ කඩා වැටීම පළාත් පාලන ආයතන ඇතුළේ බරපතළ වංචාවන්, දූෂණයන් ඇති වෙන්නට බලපානවා. මේවා ගැන නිසි අවධානයක් යොමු කරලා පළාත් පාලන ආයතනයේ ඉහළ නිලධාරීන් කටයුතු කළ යුතුව තිබෙනවා. පළාත්

පාලන කොමසාරිස්වරයාටයි, දිස්ත්‍රික්ක තුනේ ඉන්න සහකාර පළාත් පාලන කොමසාරිස් තුන්දෙනාටයි බරපතළ වගකීමක් පැවරෙනවා, මේ රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම නිවැරැදිව ඉෂ්ට කරනවාද කියන කාරණය සොයා බලලා අවබෝධයක් අරගෙන වැඩ කරන්න. එය නිවැරැදිව සිද්ධ වෙන්නේ නැහැයි කියන කාරණය මතක් කරන්න ඕනෑ. ඒකට මීට වඩා මැදිහත්වීමක් අනිවාර්යයෙන්ම කළ යුතුව තිබෙනවා. ඒ කාරණය පිළිබඳව ඔබතුමාට මතක් කරනවා.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා හරහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. මේ සභික සංඛ්‍යාව වැඩි වුණු නිසා අද පළාත් පාලන ආයතන ඇතුළේ තමන්ගේ කටයුතු කරගෙන යන්න බැරිව බරපතළ අභියෝගයක් තිබෙනවා. අපි වැඩ කරපු, අපි තනතුරු දරාපු අපේ පළාතේ තිබෙන සීතාවක ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු 22 ක් ඉන්න කොට තිබුණු කාර්ය මණ්ඩලයම තමයි මන්ත්‍රීවරු 43 ක් ඉන්දිත් අද වැඩ කටයුතු කරන්නේ. මේ කාර්යය මණ්ඩලය වැඩි කරන්න, ඒ මන්ත්‍රී සංඛ්‍යාවට මහජන සේවා සංඛ්‍යාවට අදාළව කටයුතු කරන්න පුළුවන් පරිදි ඒ තනතුරු සංඛ්‍යාව වැඩි කරන්න පළාත් පාලන දෙපාර්තමේන්තුව භාණ්ඩාගාරය හරහා කටයුතු කෙරුවේ නැත්නම් මහජන සේවාව නිවැරැදිව කරගන්න බැරිව යනවා. ඒ වාගේම තමයි ඒ ආයතන සතුව තිබෙන සම්පත්. දැන් ප්‍රාදේශීය සභාවල්වල තිබෙන සමහර යන්ත්‍ර සූත්‍ර මන්ත්‍රීවරු සියල්ලටම ලබා දෙන්න පුළුවන්කමක් නැහැ. මන්ත්‍රීවරු හැමදාම ප්‍රශ්න ඇති කර ගන්නවා. තමන්ට වැඩිපුර මහජන සේවාව කරන්න අවශ්‍ය කරන යන්ත්‍රසූත්‍ර ගන්න, මිල මුදල් නැහැ. සභාවල්වල ආදායම් නැහැ. සභික සංඛ්‍යාව වැඩි වුණු සංඛ්‍යාවට ආදායම් නැති නිසා මේ සභාවල් ආර්ථික අපහසුකම්වලින් පෙළෙනවා. සංවර්ධනය නිවැරැදිව ක්‍රියාත්මක කරගෙන යන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා මේවා ගැන අවධානය යොමු කරලා, මේවා ගැන යම් පර්යේෂණාත්මක උත්සාහයක් පළාත් පාලන දෙපාර්තමේන්තුව කෙරුවේ නැත්නම්, මේ පළාත් පාලන ආයතන නිවැරැදිව මෙහෙයවාගන්න බැරිව යනවා. අද මේ මැතිවරණ ක්‍රමය ගැනත් පළාත් පාලන දෙපාර්තමේන්තුව විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්න ඕනෑ. මේ මැතිවරණ ක්‍රමය තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යනවාද? මේ මැතිවරණ ක්‍රමය හරහා බිහි වුණු පළාත් පාලන ආයතන තුළ තිබෙන ප්‍රශ්න ගැටලු මොනවාද? ඒවා සංවර්ධන කරන්න ඕනෑද? එහෙම නැත්නම් මේවා නැවතත් සංශෝධනය කරලා, හකුලලා පරණ තිබුණු තත්ත්වයට ගේනවාද කියන කාරණා ගැන විද්‍යාත්මක පර්යේෂණ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් කළ යුතුව තිබෙනවා. ඒවා කළේ නැත්නම් නැවත වතාවක් අපි තව අවුරුදු තුනකින් ඊළඟ මැතිවරණ කාලසීමාව එන කොට ඉතාම අසීරුතාවයකට යනවා. ඒ නිසා මේ පර්යේෂණ කාර්යභාරය පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මඟහැරී තිබෙන බව මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. ඒක අත්‍යවශ්‍යයි. පළාත් පාලන ක්‍රමයේත්, පළාත් පාලන ක්‍රියාවලියේත්, මහජන සේවාවේත් අනාගත සුභ සිද්ධිය සඳහා ඒක අත්‍යවශ්‍යය දෙයක්. ඒ නිසා පර්යේෂණ කාර්යභාරය මීට වැඩිය නියැලෙන්න පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුව මහන්සි වෙන්න කියන කාරණය මතක් කරන ගමන්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොමත්ම ස්තුතියි. මීළඟට නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 37(1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම උදේ ආවාම මගේ සීට් ඔක්කොම වෙනස් වෙලා. මේ කම්පියුටර් එකේ තිබෙන්නේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාගේ නම. මගේ නම තිබෙන්නේ අතන. හැබැයි බෝඩ් මෙහාට ඇවිල්ලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඊයේ ගරු මන්ත්‍රීතුමන්ලා දෙන්නෙක් මේ පැත්තෙන් ඔය පැත්තට පුටු මාරු කළා. මම හිතන්නේ ගරු සභාපතිතුමා උදේ පැහැදිලි කිරීමක් කළා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සීට් මාරු වෙලා තිබෙන්නේ මොකද කියලා මම අහන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට යම් ගැටලුවක් එනවා නම් ඒකට වැඩ පිළිවෙළක් සකස් කරන්නම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙන් දෙන්නෙක් මෙහාට ආවා නම් හරි යනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම අහන්නේ මේ සීට් එක වෙනස් වුණේ මොකද කියලා. ඒ අය මාරු වුණ එක ගැන නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මන්ත්‍රීතුමන්ලා දෙන්නෙක් මේ පැත්තෙන් ඔහෙට ගියා. ඒකත් එක්කම උදේ ගරු සභාපතිතුමා පැහැදිලි කිරීමක් කළා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ පදනම මොකක්ද කියලා මම අහන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඔහෙන් මෙහෙට කීප දෙනෙක් එව්වොතින් ආපසු -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම නියෝජ්‍ය සභාපතිතුමාගෙන් අහන්නේ. පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒ ගරු මන්ත්‍රීතුමන්ලාගේ ජ්‍යෝෂ්ඨත්වයත්, තනතුරුවල ස්වභාවයත් මත තමයි ඒවා මාරු කරලා තිබෙන්නේ. ඒ පිළිබඳව ගැටලුවක් තිබෙනවා නම් පස්සේ සාකච්ඡා කරන්න පුළුවන්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ අයවැය වෙලාව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අයවැය වෙලාව නොවෙයි. මේකත් වැදගත් ප්‍රශ්නයක්. මොකද එක පාර ඇවිල්ලා කට්ටියක් මෙහේ ඉඳගෙන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උදේ පැහැදිලි කළා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පැහැදිලි කිරීම නොවෙයි, ප්‍රශ්නය තිබෙන්නේ. අපව එහාට මෙහාට තල්ලු වෙලා තිබෙන එකයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 12.22]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මතක් වෙනවා 2015 මාර්තු මාසයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මගේ ආරාධනයකින් මගේ ප්‍රථම දේශපාලන ග්‍රන්ථය එළිදැක්වීමේ උත්සවයේ ප්‍රධාන ආරාධිතයා විධියට ආපු දවසේ මම කරපු කථාවේ කොටසක් මේ සභාව දැනුවත් කරන්න.

*හිරුට අයිති බව හිරු පවසනවා*
*සඳුට අයිති බව සඳු පවසනවා*
*විලට අයිති බව විල පවසනවා*
*නුඹ කාටද හිමි නෙළුම් මලේ*

මම ජනාධිපතිතුමාව ඉස්සරහා තියාගෙන ඇහුවා, මේ කථාව. මම කිව්වා, කිසිදු හේතුවක් මත දේශීය හෝ විදේශීය හෝ අභ්‍යන්තර හෝ බාහිර පාර්ශවයන්ගේ

[ගරු නිරෝෂන් පාදුක්ක]

මැදිහත්වීමක් මත ඔබතුමාත් අග්‍රාමාත්‍යතුමාත් අතර පවතින මේ පවතින සංහිඳියාව නොබිඳිය යුතුය කියන කාරණාව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මම එදා ප්‍රකාශ කළා. මම කිව්වා, කිසිඳු හේතුවක් මත. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නමුත් අද අතිගරු ජනාධිපතිතුමා මේ රටේ ජනාධිපති ධූරයට පත් වෙලා කරපු පළමුවැනි පත්වීම තමයි රනිල් වික්‍රමසිංහ විරෝධී ශිරාල් ලක්තිලක තමන්ගේ කාර්ය මණ්ඩලයට පත් කර ගැනීම. එදා ආරම්භ වුණු මේ සංහිඳියාව පිළිබඳ ගැටලුව දවසින් දවස, ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වුණා. අපි අතිගරු ජනාධිපතිතුමාට කිව්වා. කිසිඳු හේතුවක් මත ඔබ දෙපළ මේ ඇති කරගත්ත සංහිඳියාව, ඔබ දෙපළ අතර ඇති කරගත්ත අන්‍යොන්‍යාය අවබෝධය, මගේ භාෂාවෙන් කිව්වා, run out වෙන්න බැහැයි කියලා. මම කිව්වා, run out වෙන්න බැහැයි කියලා. අද අපි බලන් ඉද්දී run out වෙලා තිබෙනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි අද මේ අයවැය ඉදිරිපත් කරන්නේ අග්‍රාමාත්‍යවරයෙක් හෝ කැබිනට්ටුවක් නැති රටක. අද මේ රටේ ඉතාමත් බරපතළ අර්බුදයක්. අපි අයවැයක් ඉදිරිපත් කරනවා, මධ්‍යම රජයක අයවැයක් නැති රටක. අපේ වියදම් ශීර්ෂයන් පිළිබඳව මධ්‍යම රජයට කිසිඳු සැලසුමක් නැති මොහොතක අපි අයවැයක් ගෙනැල්ලා, සිහින ලෝකයක් පිළිබඳව කථා කරනවා. ඒ නිසා මේ මහ පොළවේ යථාර්ථය තුළ, මේ පළාත් සභාව තුළ ඒ දේ වෙන්නේ නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මගේ මිත්‍රයෙක් දැන් ප්‍රකාශ කළා, පළාත් පාලන ඡන්දය අවුරුදු 3 ½ ක් කල් ගියා කියලා. ඔව්. ඒකට සම්පූර්ණ වගකීම අතිගරු ජනාධිපතිතුමා භාරගන්න ඕනෑ. එතුමා තමයි අවුරුදු 3 ½ ක් මේ මැතිවරණ ක්‍රමය විවිධ යෝජනා ගෙන එමින්, කල් දමමින් ක්‍රියා කළේ. මේක තමයි යථාර්ථය. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද බස්නාහිර පළාතේ ඉසුර දේවප්‍රිය මැතිතුමා මහ ඇමතිතුමා විධියට තෝරාගන්න ඉස්සෙල්ලා අපිත් ජනාධිපතිතුමාට කිව්වා. ඔව්. ඉසුර දේවප්‍රිය මහත්තයා හොඳයි. ඉන්න අය අතරින් ඔහු සුදුසුයි කියලා. ඒ කාලයේ එතුමා අපිත් එක්ක තමයි තුන් වේල කෑමට පෙර, කෑමට පසු හිටියේ. ඔබතුමන්ලාත් එක්ක නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ කියන්න උත්සාහ කරන්නේ ඒක නොවෙයි. රටක මූලික නීතිය ව්‍යවස්ථාව. මේ රටේ ප්‍රෞඪ ඉතිහාසයක් ගැන අපි කථා කරනවා. අවුරුදු 2600 කට එහා. අපට සම්ප්‍රදායක් තිබෙනවා. පාර්ලිමේන්තු සම්ප්‍රදායක් තිබෙනවා. ඒ නිසා මේ සම්ප්‍රදායයි, මූලික නීතියයි එකම පැත්තකට ගමන් කළ යුතුයි. එහෙම ගමන් නොකරන දවසක් උදා වෙනවාද? ඒ රට අස්ථාවර වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අද මේ රටේ ඒක වෙලා තිබෙනවා. ඒ අස්ථාවරත්වය මේ බස්නාහිර පළාතට, ලංකාවේ ලොකුම පළාතට බලපාලා තිබෙනවා. අද අපි මේ ඉදිරිපත් කරන අයවැය හුදෙක්ම සෝමවීර චන්ද්‍රසිරි ශ්‍රීමතාණන් කී පරිදි ඉලක්කම් විජ්ජාවක් පමණයි. මෙහි සැබෑ යථාර්ථයක් නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියනවා. මේ විධියට විශ්වාසය පළුදු වුණු රටක, රාජ්‍ය නායකයා පිළිබඳව විශ්වාසය පළුදු වුණු රටක, අයවැයක් හදන්න මුදල් ඇමැති කෙනෙක් රටක නැති දවසක විශේෂයෙන්ම warrant ආඥාවක් නිකුත් කරලා තිබෙන රටක මොකක්ද කියන්නේ? Show your powers. Quo-Warranto කියන්නේ මොකක්ද? Show your powers. පෙන්වන්න ඔබේ බලය. එහෙම පෙන්වන්න බලයක් අද මේ රටේ නැහැ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොකක්ද මේ ආඥාවෙන් කිව්වේ? තනතුරුවල හිටියත්, ක්‍රියාත්මක වෙන්න ඔබට හැකියාවක් නොමැත කියලා. ඒ නිසා බලයක් නැති කරලා තිබෙනවා. ඒ නිසා ජාත්‍යන්තරව හෝ දේශීයව කිසිඳු ආකාරයක ගිවිසුම්, ලිපි ලේඛනයකට අත්සන් තැබීම හෝ ක්‍රියාත්මක කිරීම මේ කැබිනට් මණ්ඩලයටවත් අග්‍රාමාත්‍යවරයාටවත් කළ නොහැකි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ තත්ත්වය තුළ අපි ලඳ, බොළඳ, සිහින, මාස්මිලෝස්, ජුජුප්ස් අයවැයක් ඉදිරිපත් කරලා. ඒක තමයි තිත්ත වුණත් ඇත්ත ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ තුළ ඉසුර දේවප්‍රිය මැතිතුමා වෙනම අයවැයක්. අධ්‍යාපන ඇමැතතුමාට half boile අයවැයක්. ඒ විධියට හැමෝටම හදලා තිබෙනවා. ඒ නිසා මේ කතන්දරය ඇතුළේ අපි හැමෝම ඉතිහාසයේ කථා කරලා තිබෙනවා. මගේ දශක 1 ½ ක පළාත් සභා මන්ත්‍රී ජීවිතයේ මුහුණ දෙන ඉතාමත්ම අවාසනාවන්තම අයවැය. මේ අයවැය කිසිසේත් ක්‍රියාත්මක තලයට ගෙන එන්න බැරි අයවැයක් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේක වෙනස් කරන්න වෙනවා ජනවාරි මාසය වනකොට. පෙබරවාරි මාසය වනකොට. මම සතුටු වෙනවා, දවස් හතරකට අඩු කරපු එක ගැන. වියදම හරි අඩු වෙන්න. ඒ නිසා මේ පළාත් සභා ක්‍රමය අද අනතුරකට ලක් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, බස්නාහිර පළාත මේ රටේ වැඩිම ආදායමක් ගෙන එන පළාත. අද ජනතාවගේ ජන ජීවිතය කඩාකප්පල් වෙනවා.

මේ මොහොතේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රධාන ඇමැතිවරයා යටතේ තිබෙන බොරලැස්ගමුව නගර සභාවේ සේවකයෝ 24 දෙනෙක් උදේ 8.30 ට පොත අත්සන් කරලා ඇවිල්ලා, දැන් මේ මොහොත වනකොට වේරහැර RMV එක ඉස්සරහා උද්ඝෝෂණය කරනවා. මම නම් 24 ම තමුන්නාන්සේට සභාගත කරන්න සූදානම්. ඒ ආකාරයට මේක තමයි අද පළාත් පාලනයේ ක්‍රියාත්මක වෙන්නේ. එදා සාමාන්‍යයෙන් නයයි, මුගටියයි හැමදාම රණ්ඩු වෙනවා. නයයි, මුගටියයි උප්පත්තියෙන් වෛරක්කාරයෝ දෙන්නෙක්. හැබැයි ගංවතුරක් ආවා. නයත් බලනවා බේරෙන්න ඕනෑ. මුගටියත් බලනවා බේරෙන්න ඕනෑ. මේ මහ වරුෂාව ඇවිල්ලා ගංවතුර ගලාගෙන යනවා. මේ නයයි, මුගටියයි දෙන්නාම නඟිනවා එක කොටයක් උඩට.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

එක ඉපලේ නඟිනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔව්. එක කොටයට නැඟලා ගංවතුර බැහැලා යනකල් කොටේ දෙපැත්තට බැලන්ස් කර කර දෙන්නා ඉන්නවා. හැබැයි ගංවතුර බැහැලා ගියාට පස්සේ දෙන්නා කොටෙන් බැහැලා ආයෙත් මරා ගන්නවා. ඒ දවස හෙට අනිද්දා උදා වෙනවා කියලා අපි දන්නවා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ ජනතාවගේ ජීවිතත් එක්ක මේ රටේ තනි පුද්ගලයෙකුට මේ විධියට හිතුමතේ ක්‍රියාත්මක කරන්න බැහැ. ඒ නිසා අපි බොහොම වගකීමෙන් කියනවා. ජීවිත කාලයටම පරද්දන්න බැහැ කියපු මහින්ද රාජපක්ෂ මහත්තයාව අපි ජනවාරි 08 වැනිදා පැරැද්දුව. පරද්දලා අපි ගොවියෙකුගේ පුතෙක්ව මේ රටේ ජනාධිපති කළා. නමුත් ඒ ගොවියා තමන්ගේ තාත්තාගේ කුඹුරට කරපු දේම මේ රටේ දොකෝටි විසි ලක්ෂයක් ජනතාවට කළා කියන එක ඉතාම කනගාටුවෙන් සහ වේදනාවෙන් මේ උත්තරීතර සභාවට මම වාර්තා කරනවා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

කුඹුරට මක් වුණාද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒක දුවගේ පොතේ බලන්න ඕනෑ. 331 ක් වන පිටුව. කුඹුරට වුණු දේ ගාණට කියලා දෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි තමුන්නාන්සේලා මේ ගෞරවනීය සභාවේ මන්ත්‍රීවරු විධියට කටයුතු කළ යුත්තේ, බස්නාහිර පළාතේ ජනතාවට ලැබෙන කීර්තියක් අනුව. ඒ නිසා මම දිගින් දිගටම උත්සාහ කරන්නේ, ඔබතුමාට දැනුම් දෙන්න. මේ අයවැය ලේඛනය, මේ නිලධාරීන් පාවිච්චි කරලා ලංකාවේ පළාත් සභා තුනක හදනවා. එකක් මේක. එකක් දකුණ. එකක් ඌව. මේ පළාත් සභා තුනම එකතු වෙලා එකම Model එකට අයවැය තුනක් හැදුවත් ඒ අයවැය මේ මහ පොළොවේ යථාර්ථය නොවෙයි. ඒ නිසා පාර්ලිමේන්තුවට අයවැයක් ඉදිරිපත් කරන්න බැරි වුණු මොහොතක මේ රටේ පළාත් පාලන ආයතනවලට දෙන, පළාත් සභාවලට දෙන මුදල තීරණය කර ගන්න බැරිව තිබෙන මොහොතක - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඩොලරය ගැන කථා කරන්නෙත් නැහැ. මේ දවස්වල තෙල් මිලට මොකද වුණේ කියලා කියන්නෙත් නැහැ. හැබැයි මේ මොහොතේදී මේ රටේ තමුන්නාන්සේට දැනුවත් කරන්නේ මේ උත්තරීතර සභාවේ වගකිව යුතු නිලයක් දරන ඔබතුමා බස්නාහිර පළාතේ ජනතාවට මේ ගෙන එන්නේ අමූලික බොරුවක්. මේ අයවැය කියලා කරන්නේ අමූලික බොරුවක්. ඒ නිසා මේ මොහොතේදී විශේෂයෙන්ම රටේ දේශපාලන ස්ථාවරභාවය වෙනුවෙන් පෙනී සිටින්න.

සමහරු මේ රටේ ඡන්ද ගැන කථා කරනවා. පාර්ලිමේන්තුවේ 225 ට ඇවිල්ලා ඡන්දයක් පාවිච්චි කරන්න දෙන්නේ නැතුව මිරිස් කුඩු ගහන රටක එක්ලක්ෂ විසි දහසකට ඡන්දය පාවිච්චි කරන්න නිදහසක් තියෙනවාද? පාර්ලිමේන්තුවේ 225 කට ඡන්දය පාවිච්චි කරන්න දෙන්නේ නැහැ. එහෙම නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ ගෞරවනීය සභාවට කියනවා මේ අයවැයවල් ඔක්කෝම පුස්සක්. වහාම පාර්ලිමේන්තුවේ බහුතරය සතු කණ්ඩායමට පාර්ලිමේන්තුවේ බලය දීලා, අයවැයක් හදන්න දීලා, ඒ අයවැයෙන් පළාත් සභා සඳහා වෙන් කරන ප්‍රතිපාදන ලබාගෙන මේ පළාත් සභා ක්‍රමයත්, මේ රටේ පරිපාලනයත් ශක්තිමත් කරන්න ඕනෑ වැඩ සටහනකට යන්න ගරු ජනාධිපතිතුමාට ප්‍රඥාව ලැබේවා. ගරු ජනාධිපතිතුමාට සියලු දැනුම පහළ වේවා. ඒත් එක්කම අපි අද මේ සභාවේ ඔබතුමාට ගරු කරන්නේ

[ගරු නිරෝෂන් පාදුක්ක]

නියෝජ්‍ය සභාපතිවරයා විධියට. ඔබතුමාට නොවෙයි අපි සලකන්නේ. නියෝජ්‍ය සභාපතිවරයා විධියට. ඒ නිසා රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් එක්ක මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ප්‍රශ්න තියෙන්න පුළුවන්. හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනයේ 46 (4) වගන්තියට අනුව පාර්ලිමේන්තුවේ බහුතරය හිමි විය යුතු පුද්ගලයා මේ රටේ අගමැතිවරයා විය යුත්තේය. ඒක දන්නේ නැත්නම් මේ ඉන්න උගත් මන්ත්‍රීවරු, එතුමාට ආදරය කරන අය ඉන්නවා නම්, එතුමාත් එක්ක නව දීගයට එකතු වුණු අය ඉන්නවා නම් ගිහිල්ලා කියන්න. මේ රටේ පාර්ලිමේන්තුව ස්ථාවර කිරීමේ සම්පූර්ණ වගකීම එතුමාට තියෙනවා. එතුමා ඒක පැහැර හැර යනවා නම් අනාගතයේදී එතුමාට එරෙහිව මේ රටේ පාර්ලිමේන්තුව තුළ දෝෂාභියෝගයක් නිර්මාණය වෙමින් යන තත්ත්වයක්ද උදා වෙනවා කියලා මතක් කරමින්, මේ අයවැය ජනතාව නොමඟ යවන අමූලික බොරු අයවැයක් කියන එක ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා.

[අ.භා. 12.34]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් හයවැනි පළාත් සභාවේ මහ ඇමැතුමාගේ විෂයය සම්බන්ධව කථා කරන කොට විදුලිය, පළාත් පාලනය, සංචාරක යන විෂයය ගණනාවක් තුළ කථා කරන්න ලැබීම ගැන මම ප්‍රථමයෙන්ම සතුටු වෙනවා. විශේෂයෙන්ම අද පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට ඡන්ද වරමක් දීලා පත් කරලා තිබෙන්නේ, ජාතික දේශපාලනය කථා කරන්න නොවෙයි. මේ අයවැය විවාදයක්. මේ හයවැනි පළාත් සභාව. එතකොට බස්නාහිර පළාත් සභාව ලංකාවේ තිබෙන ලොකුම පළාත් සභාව. ලොකුම ජනගහනයක් ඉන්න පළාත් සභාව. ලොකු ව්‍යාපාරික සංඛ්‍යාවක් ඉන්න පළාත් සභාව. ලොකුම සංචාරක හෝටල් තිබෙන පළාත් සභාව. ලොකුම ඇළ මාර්ග, වාරිමාර්ග, ගංගා ගලලා මුහුදට යන පළාත් සභාව. එතකොට හොඳ අධ්‍යාපනයක් තිබෙන පළාත් සභාවක්. හොඳම ඉස්කෝල, ජාතික පාසල් තිබෙන පළාත් සභාව. බලන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභාවේ මේක කථා කළාම දැන් මොනවාද කථා කරන්නේ? මෛත්‍රීපාල සිරිසේන 2015 ජනවාරි 08 වැනි දා යහපාලන ආණ්ඩුවක් පිහිටුවලා රනිල් වික්‍රමසිංහ එක්ක යම් දෙයක් කරන්න පොරොන්දුවක් දුන්නා. දැන් මෛත්‍රීපාල සිරිසේන ඒ පොරොන්දුව තුළ ගිහිල්ලා එක්සත් ජාතික පක්ෂයත් එක්ක සන්ධානයක් ගහලා, ජාතික හෙළ උරුමය පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය, ටී.එන්.ඒ. පක්ෂය, මුස්ලිම් කොංග්‍රස් පක්ෂය, එතකොට අනෙක් එක අපේ අපවත්වී වදාළ සෝම හාමුදුරුවන්ගේ සංවිධාන 48 මේ ඔක්කෝම රොටිය රත් කරගෙන කාපිය කියලා දුන්නා. තැටිය රත් වෙනවා. රොටිය කාපිය කියලා. අපේ අයත් ගිහිල්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අත් උස්සලා, 2/3 දීලා 19 වැනි සංශෝධනය ගෙනැල්ලා මේ රටට යමක් කරන්න. මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න. මේ රටට කොමිෂන් පත් කරන්න. මේවා ඔක්කෝම දැම්මා. මේ වෙනකොට මොකක්ද වෙලා තිබෙන්නේ? මේ වනකොට මෛත්‍රීපාල සිරිසේන, රනිල් වික්‍රමසිංහගේ නායකත්වයෙන් තිබෙන එක්සත් ජාතික පෙරමුණට එරෙහිව නැවත 26 වැනිදා මහින්ද රාජපක්ෂව නැවත අගමැති කළා. මහින්ද රාජපක්ෂව පරාජය කරපු -

[සභාවේ ඝෝෂා]

ඒක තමයි කියන්නේ. අහගෙන ඉන්න. මහින්ද රාජපක්ෂව පරාජය කරපු රනිල් වික්‍රමසිංහ මහත්තයා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා. වැරැදීමක් වුණේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ පසුගිය අවුරුදු 3 ½ තුළ තමුන්නාන්සේලාගේ යහපාලන ආණ්ඩුවට මේ පළාත් සභාවට Treasury, මහ බැංකුවෙන් දෙන්න ඕනෑ මුදල් කීයක් දුන්නාද කියලා එක්කෙනෙක්වත් කථා කරනවාද? තමුන්නාන්සේලාගේ ආණ්ඩු පක්ෂය කථා කළාද? එදා තමුන්නාන්සේලා 39 දෙනෙක් මේකට විරුද්ධව මේ පළාත් සභාවේ, මහින්ද රාජපක්ෂ කෙළින් හිටගන්න කොට තමුන්නාන්සේලා මහ ඇමැතිතුමාට කත් ඇදලා, පක්කිලි සර්විස් කරලා, තමුන්නාන්සේලා දින්නා. දැන් තමුන්නාන්සේලා මහ ඇමැතිතුමාට විරුද්ධව කථා කරනවා. මෛත්‍රීපාල සිරිසේනට විරුද්ධව දැන් කථා කරනවා. ලැජ්ජ නැද්ද කලිසමක් ඇඳගෙන (බාධා කිරීම්) මගේ මිත්‍රයා පොඩ්ඩක් කට වහගෙන ඉන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අයවැයද? මේකද විෂයය?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ද්‍රෝහීන්ට ද්‍රෝහීයා කියනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේලාගේ ආගමේ බොරු කියන්න බැහැ. සල්ලි පොළියට දෙන්න බැහැ කියලා කියනවා නේ?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ද්‍රෝහීන්ට ද්‍රෝහීයා කියනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා මයික් පාවිච්චි කරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ සභාවේ කියන බොරු ටික බලන්න කෝ දැන්? මේ ආගමට විරුද්ධව

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

අදහන, සිකුරාදාට ගිහිල්ලා පැයක් යාඥා කරලා, මෙතුමා සභාවට ඇවිල්ලා කියන බොරු ටික බලන්න.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

කිව්වා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

කිව්වා මෛත්‍රීපාල සිරිසේනට මේ යකා හරි යන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ ඇතුළු

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

ආණ්ඩුව. මේක හරි යන්නේ නැහැ. ඒ නිසා මේ ආණ්ඩුව විසුරුවා හරින්න -

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

ආගම්වලට අපහාස කරන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේවාට ආගම් පටලවා ගන්න එපා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

මේ ආගමට දේශපාලනය ගාව ගන්න එපා. ඒක ඉල්ලා අස්කර ගන්න. කොඩිකාර මන්ත්‍රීතුමා -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඒක ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, දේශපාලන කථාවක් කථා කරනකොට ආගම ගැන කථා කරන්න මේ මනුස්සයාට පිස්සුද? වහාම ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට බාධා කිරීම් කරනකොට ඒ අයගේ කාලයෙන් අඩු කරලා මට කාලය දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ආගම අදින්න එපා. ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන කොට ආගම් පිළිබඳව කථා කරන්න එපා. ඒක අපි හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කියලා තියෙන දේ මම කියන්නේ. (බාධා කිරීම්) සමාවෙන්න. ඔබතුමාට වැඩක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා සීට් එකට යන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බොරු කියන්න කියලා තිබෙනවාද? මම අහන්නේ ඔබතුමාත් එක්ක නොවෙයි මගේ ප්‍රශ්නයක තිබෙන්නේ. මම අහන්නේ ඔයගොල්ලන්ගේ ආගමේ බොරු කියන්න කියලා තිබෙනවාද? අපි සිංහල බෞද්ධායෝ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ඒක ඉල්ලා අස් කර ගන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විරෝධය පෑමක් හැටියට සභා ගර්භය මැදට පැමිණීමෙන් නැති ප්‍රශ්න ඇති වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේක විහිළුවක් වෙනවා. ඒක ඉල්ලා අස්කර ගන්න. ආගමකට එහෙම කථා කරන්න එපා. ඔබතුමා ඒක ඉල්ලා අස්කර ගන්න. ආගමක් සම්බන්ධයෙන් එහෙම කථා කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ආ ... මට සමාවෙන්න.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කියන වචනය ඉල්ලා අස්කර ගන්නවා. එහෙම නම් මේකේ කියපු බොරු හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න කියලත් මම කියනවා. මහ ඇමැතිතුමා ඊයේ බොරු කිව්වා.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කවුරුත් සහෝදරයෝ. අපට එහෙම ප්‍රශ්නයක් නැහැ. මේක ඉල්ලා අස්කර ගන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් බලන්න අද පත්තරේ තියෙනවා, බස්නාහිර පළාතේ ඩෙංගු රෝගීන් 4372 යි. මේ කාල සීමාව තුළ මියගිය සංඛ්‍යාව කීයද? 982 යි. රෝහල්වල 2772 යි. දාන්න තැනක් නැහැ. මේවා ගැන එක්කෙනෙක්වත් කථා කරනවාද? මේකේ කවුරුවත් මේවා කථා කරන්නේ නැහැ නේ? මොනවාද කථා කරන්නේ? දේශපාලනය. මේ ගැන තේරුම් ගත්තු අපේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා. අපේ මිත්‍ර නිශාන්ත ශ්‍රී වර්ණසිංහ. අපේ මිත්‍ර නවුසර් ෆවුසි. මේ කට්ටියට බුද්ධිය පහළ වෙලා එක්සත් ජාතික පක්ෂය පැත්තෙන් වාඩි වෙලා ඉන්නවා. දැන් බලන්න, කොපමණ බුද්ධිය පැදිලා තියෙන හැටි. මෛත්‍රීපාල සිරිසේන කියනවා ඔක්තෝබර් 26 වැනිදා ගත්තු තීරණය නිවැරදි තීරණයක් කියලා. ඇයි එහෙම කියන්නේ? මේ පළාත් සභාවට මහ බැංකුවෙන් දෙන්න ඕනෑ මුදල් ශත

පහක් දීලා නැතුව ණය වෙලා. මේ පොතේ, මේ ඡේදයේ පෙන්නනවා. මේ ගොඩනැගිල්ල හදන්න දීපු සල්ලි මිලියන 600 ක් තවම දීලා නැහැ සෙන්ට්‍රල් බැංකුවෙන්. එතකොට දැන් පළාත් පාලන ආයතන දියුණු කරන්න කථා කළා. පළාත් පාලන ආයතන දියුණු කරන්න කථා කරන මහජනයාගේ බදු. මහජනයාගේ බදුවලින් දියුණු කරන්නේ. අපේ රොඞ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා මෙතැන නැහැ. එතුමා කිව්වා අපේ නෝනා ගැන. අපේ නෝනා ලංකා ඉතිහාසයේ වාර්තා තියලා පළාත් පාලන ආයතනවලින් තුන්වැනි තැනට තේරුණා. හරිද? නගරාධිපතිතුමිය. ලෝකයේ රටවල්වලින් ජපන් රටෙන්, කොරියන් රටෙන්, එතුමිය ගිය සංචාරවලදී

[සභාවේ ඝෝෂා]

කුණු එකතු කරන dumpers 14 ක් නොමිලේ ගෙන ආවා, මහරගම නගර සභාවට. එතකොට මේ ඉන්න අපේ මහ ඇමැතිතුමා ලෝකයේ රටවල් ගණනාවක සංචාරයේ ගියා. එක කුඹියෙක් ගේන්න පුළුවන් වුණාද කියලා බලන්න. ගේන්න බැරි වුණා. මම සමූපකාර ඇමැතිවරයා හැටියට ඉන්න කාලේ ලෝකයේ තිබුණු සමූපකාර සම්මේලනයෙන් අපි අපේ අරමුදලට සල්ලි ගෙනැල්ලා සුළු ව්‍යාපාරිකයන්ට ණයක් දෙන්න පුළුවන්කම ලැබුණා. රටත් එක්ක නොවෙයි. පළාත් සභා, ලෝකයේ තවත් පළාත් සභා එක්ක. මේ පනතේ තිබෙනවා. අපට ගනුදෙනු කරන්න පුළුවන් ආකාරයට. අපට ඒවාත් එක්ක සම්බන්ධ වෙන්න පුළුවන්. ඒවත් එක්ක සංවර්ධන වැඩවලට මුදල් හුවමාරු කරගන්න පුළුවන්. ඒක මහ බැංකුවත් එක්ක, මහ ආණ්ඩුවත් එක්ක කථා කරලා ඒ කටයුතු කර ගන්න පුළුවන්. අපේ එහෙම කරපු කවුරුවත් ඉන්නවාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි ලලිත් වනිගරත්න ඇමැතිතුමා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතුමා ඔක්කෝම සමූපකාර - මම ඒ විෂයේදී කියන්නම්. හෙක්ටර් බෙත්මගේ ඇමැතිතුමාත් හිටියා නේ? මම කියාගෙන ආවේ ඩෙංගු ගැන. හෙක්ටර් බෙත්මගේ මැතිතුමාටත් ඩෙංගුවා විද්දා. මගේ දරුවෙකුටත් ඩෙංගුවා විද්දා. දැන් මේ පළාත් පාලන ආයතන. අතන ඉන්නවා අපේ නිලධාරී මහත්වරු, කොමසාරිස්වරු, සහකාර ලේකම්වරු, ඒත් එක්කම අපේ ආපදා කළමනාකරණය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව විනාඩි 02 ක කාලයක් තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ Disturb කරපු විනාඩි 04. ඒක එක්සත් ජාතික පක්ෂයෙන් කපලා දෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විනාඩි 02 යි තියෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපේ ආපදා කළමනාරකණය. අපි පළාත් පාලන ආයතනවලට ආපදා කළමනාකරණය අපේ එල්ලාවල මන්ත්‍රීතුමා මේ සභාවට යෝජනාවක් කළා. ගංවතුරක් ආවාම, නියඟයක් ආවාම, සුළි සුළඟක් ආවාම මේ පනත සංශෝධනය කරලා, ඒ මිනිස්සුන්ට දෙන්න යමක් කරන්න පුළුවන් ක්‍රමවේදයක්. බලන්න, අද වනකොට මේ අයවැයේ ඒ පිළිබඳ එක යෝජනාවක් තියෙනවාද කියලා. මේ විෂයය එක්ක. අපි පැය ගණන් කථා කළා. මහජනයාගේ සල්ලි. ලයිට් පුච්චලා, උදේටයි, දවල්ටයි කෑම කාලා මේක ඇතුළේ අපි කථා කරන දේවල් මේ නිලධාරී මහත්වරු කන් දෙකෙන් අහලා, මේවා ඇතුළ් කරලා තිබෙනවාද? ජනතා විමුක්ති පෙරමුණත් හොඳ යෝජනා ගේනවා. කෝ මේ යෝජනා. දැන් මෙතැනදී මේක මහ ඇමැතිද? අර ඇමැතිද? මේ ඇමැතිද? නොවෙයි. පළාත් සභාව අපේ. ඔයගොල්ලන්ටත් වගකීමක් තිබෙනවා. අපටත් වගකීමක් තිබෙනවා. එතකොට මේකේ ඇමැති මණ්ඩලයට විතරක් නොවෙයි වගකීමක් තිබෙන්නේ. ඔයගොල්ලන්ට විශේෂයෙන් වගකීමක් තිබෙනවා. රටේ සෑම තැනම අවුල් කරන්න. ඒක ජනතා විමුක්ති පෙරමුණේ තිබෙන වැඩ සටහන. ඒක නිසා ජනතා විමුක්ති පෙරමුණට ප්‍රශ්නයක් නැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

හැබැයි අපි ගිහිල්ලා පන්සල්වල හාමුදුරුවරුන්ට ගහන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒකේ කාලා බීලා ඔයගොල්ලන්ගේ පවුල්වල දරුවන්ට - (බාධා කිරීමක්) ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ අය තමයි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පොතේ දාලා තියෙනවා විෂයන් රාශියක් කරන්න. අපේ තිබෙන ආපදා කළමනාකරණ එක. ඒකෙන් බලන්න ගෙවල්වලට බැග් කීයක් බෙදලා තියෙනවාද කියලා. තමන්ගේ කුණු ටික වර්ගීකරණය කරන්න. කොපමණ ඉන්නවාද කියලා තෝරාගෙන තිබෙනවාද? දැන් මේ අයවැයෙන් ඒවාට සල්ලි වෙන් කරලා තිබෙනවාද? මේ ඩෙංගුවා නැති කරන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපේ කාර්ය බහුල ගෙවල්,ගෙදර නෝනා වැඩට යනවා. ආච්චි අම්මා බලන්න ඕනෑ. දරුවන්ව පාසලට අරින්න ඕනෑ. ඒ නිසා මේ කුණු ප්‍රශ්න සම්බන්ධයෙන් අපි යෝජනා කළා, සෑම ගෙදරකටම අවන් එකක් දෙන්න. සමාගම්වලට කථා කරලා, ප්‍රතිශක්තිකරණ කමිටු -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බොහොම ස්තූතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වීදුරු කටු ටික ප්‍රතිශක්තීකරණය කරන්න, පරණ යකඩ ටික ප්‍රතිශක්තීකරණය කරන්න, මේවාට පළාත් පාලන ආයතනයෙන් සල්ලි වියදම් කරන්න ඕනෑ, Tax සල්ලි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කාලය අවසන් වෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට මේවා (බාධා කිරීම්) කට කැඩෙනකල් අපි කිව්වා. එතකොට මේ එකක්වත් යෝජනා වෙලා නැහැ නේ? එක ගෙදරකට අවන් එකක් දෙන්න. මෙච්චර ගණනක් දෙනවා. ගෙදරින් භාගයක් දාන්න. අපි භාගයක් දෙනවා. අර කුණු එකතු කරන්න එන ට්‍රැක්ටරේ අයට ගෙදරකින් පගාව දෙනවා ඊට වැඩිය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තූතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

හරි. බොහොම ස්තූතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නැවතත් ප්‍රකාශ කරනවා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එම්.එස්.එම්. ෆයිරූස් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට ඥානය පැදේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 12.48]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක සභාවක්ද? නැත්නම් ආජ්ප කඩයක්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඔබතුමා කථා කරන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම අද අපේ මහ ඇමැතිතුමාගේ අයවැයට මට වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි අද මෙතැන කරන්නේ බස්නාහිර පළාත් සභාවේ අන්තිම අයවැය කථාව කියලා මම හිතනවා. අප්‍රේල් මාසේ 21 වනකොට අපේ බස්නාහිර පළාත් සභාවේ කාල සීමාව ඉවරයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඉස්සෙල්ලා පොඩ්ඩක් කල්පනා කරන්න ඕනෑ. දැන් මේගොල්ලන් ඇඹරිලා, ඇඹරිලා කෑගහලා කියනවා මහ ඡන්දයක් ඕනෑ කියලා. අපටත් ආසයි ඡන්දයකට යන්න. බස්නාහිර පළාත් සභා කාල සීමාව අවුරුදු 05 යි. දැන් අප්‍රේල් මාසේ සභාව ඉවර වෙන්න ඕනෑ. අද මේක විසුරුවා හරිනවා නම් කවුද මේකට කැමැති වෙන්නේ? මහජනතාව අපට ඡන්දය දීලා තියෙන්නේ අවුරුදු 05 ක් මේකේ වාඩි වෙලා ජනතාවට සේවයක් කරන්න. මේකම තමයි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ටත් ඡන්දය දීලා අවුරුදු 05 කට දීලා තියෙන්නේ, මේ රට හදන්න. අපට මතකයි, 2015 ජනාධිපති මැතිවරණය කාලය. 2017 වනකල් මහින්ද රාජපක්ෂ රජතුමාට පුටුවේ වාඩි වෙලා හොඳට රට කරගෙන යන්න කාලසීමාව තිබුණා. හිටපු ජනාධිපතිතුමා ඉල්ලගෙන කෑවා. අවුරුදු දෙකකට කලින් ඡන්දයක් තියලා වෙලාසනින් ගෙදර ගියා. අපිද ඡන්දයක් ඉල්ලුවේ? අපිද ඡන්දයක් තියන්න කියලා කිව්වේ? නැහැ. ජනාධිපතිතුමාට ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන මේ මනුස්සයෝ ටික, අපේ නෝනා කියලා කථා කරන මිනිස්සු තමයි මේ සභාවේ ඉන්නේ. මගෙත් නෝනා. අපෙත් නෝනා. ඔබතුමාගෙත් නෝනා. නෝනාට අපේද, මගේද කියලා කථා කරන්න දන්නේ නැති මිනිස්සු අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන මෙතැන කථා කරන්නේ. ඉතින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ ගැන කථා කරන්න ඕනෑ. මාස හතරකට කලින් අපි මේ අයවැය පරද්දන්න ලැහැස්ති කරලා තියෙන්නේ. අපි උත්සාහ කරනවා පුළුවන් තරම්, අපේ ශක්තිය යොදවලා මේක පරද්දන්න. මේ මාස හතරේ මේක විසුරුවලා දායි කියලා කථා කරනවා. අපි කැමැතියි විසුරුවන්න. තව අවුරුදු දෙකක් තියෙන කොට මේ අයට ඡන්දයක් ඕනෑ කියලා කෙදිරි ගාන මිනිස්සු ඇයි මේකට බය වෙන්නේ? අප කවදත් ඡන්දවලට බය නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි විසුරුවනවාට කැමැතියි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අපි කවදාවත් ඡන්දවලට බය නැහැ. ඡන්ද තියන්න ඕනෑ, නීත්‍යානුකූලව. හරියට අගමැති කෙනෙක් -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ආණ්ඩුව දීලා ඡන්දයක් තියන්න. ඡන්ද කල් දාන්නේ නැහැ. බලෙන් ආණ්ඩු අරගෙන ඡන්ද තියන්න බැහැ නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අගෝස්තු මාසේ පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී මහජනතාව එපා කියලා පන්නපු මිනිස්සු කුස්සිය පැත්තෙන් ඇවිල්ලා - මගේ මිත්‍ර කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කථාවක් කිව්වා. ඔක්තෝබර් මාසේ 26 වැනිදා තමයි මහින්ද රාජපක්ෂ පැරදුණු දවස කියලා. මට හරි සන්තෝෂයි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ කටින් ඒ කථාව අහපු එක. මේක තමයි ඇත්ත කථාව. තව අවුරුදු 1 ½ ක් මේ පොහොට්ටුව ඉවසගෙන හිටියා නම් - අපිත් බය වෙලා හිටියේ. අඩුම තරමින් 2/3 බලයක් අරගෙන මේ රට පාලනය කරයිද කියලා. අද මොකද වුණේ? වැටුණා. ලියලා තියාගන්න. වැටුණා.

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

කුජීතයි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

කුජීතයි. අද මේක ඉවරයි. මහින්ද රාජපක්ෂට තියෙන හොඳ නම නැති කරලා දැම්මා මේ කට්ටිය එකතු වෙලා. අපි මෛත්‍රීපලා සිරිසේන ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එක්සත් ජාතික පාක්ෂිකයෝ ගෙවල්වල හොඳට නිදාගෙන හිටියා. වෙලාව තේරෙන්නේ නැති විධියට. පක්ෂයත් එක්ක කලකිරිලා හිටියා. මෛත්‍රීපාල සිරිසේන ගරු ජනාධිපතිතුමා අපට කරපු ලොකුම උදව්ව තමයි අපි එතුමාට 2015 සිංහාසන පුටුව දුන්නා. එතුමා මොනවාද කළේ? බුදියගෙන හිටපු යූ.එන්.පී. කාරයෝ ඔක්කෝම කුද්දලා ඇරියා. ඊයේ එතුමාගේ සම්මේලනයේදී කථා කළා. අපට හරි සන්තෝෂයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ කථාව අහන කොට.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බුදියගෙන හිටපු ශ්‍රී ලංකාකාරයොත් නැඟිට්ටා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අත්පුඩි ගහලා ගියා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ආපහු බුදියනවා හොඳේ. වැඩි දවසක් නැහැ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

එතුමා කථාව පටන් අරන්, 24 පාරමක්ම කථා කළේ මගේ නායකයතුමා ගැන. අපේ රටේ අගමැතිතුමා ගැන තමයි එයා කථා කළේ. රනිල්. රනිල්. රනිල්. මොකද වුණේ? තවත් බුදියගෙන හිටපු මිනිස්සු නැඟිටලා පාරට ආවා. එකක් මතක තියාගන්න. මම කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ කථාවට හොඳට සවන් දුන්නා. එතුමාගේ කථාවේදී කිව්වා 26 වෙනිදා මහින්ද රාජපක්ෂ නැත්තටම නැති වෙලා ගියා කියලා. ඔක්තෝබර් 26 වැනිදා නැති වෙලා ගියේ මොකක්ද? කුස්සිය පැත්තෙන් අගමැතිකම ගන්න ගිහිල්ලා. ඒක අපට කථා කරන්න පුළුවන්. මේක තමයි (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ප්‍රධාන ඇමැතිතුමාගේ වැය ශීර්ෂය ගැන කථා කරන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අද පාර්ලිමේන්තුවක් නැහැ. පාර්ලිමේන්තු අයවැයක් නැහැ. බස්නාහිර පළාත් සභා අයවැයක් ඉදිරිපත් කරලා අපි මොකක්ද කරන්න යන්නේ? අපට මේක ගෙනියන්න පුළුවන්ද? කොහොමද සල්ලි ලැබෙන්නේ? මේක නිකම් විහිළුවක් නේ? මේ අයවැය කියන්නේ විහිළුවක්. මහජනතාව අපව මේ සභාවට එවලා තිබෙන්නේ -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අල ළූණුවල ගාණ බැහැලා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඉතින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මයික් ඔන් කරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

හරි සන්තෝෂයි. මම ඒ ගැන ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපේ මහ ඇමැතිතුමාට. මම ඉල්ලපු පාර මිලියන 14 ක් දීලා පාර කාපට් කරලා දුන්නා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අල ළූණු ස්ටොක් එක වැඩියි. ඒකයි ගරු නියෝජ්‍ය සභාපතිතුමා

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කථාව නතර කරලා -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කථා කරන භාෂාව සිංහල භාෂාව. මේ රටේ භාෂාව. මෙතැන ඉන්න Translators ලාට මේ භාෂාව හොඳටම තේරෙනවා. මෙතැන සිංහල දන්නේ නැති කෙනෙක් මයික් එකක් කණේ දැම්මාම දෙමළෙන් අහගන්න පුළුවන්. ඉංග්‍රීසියෙන් අහගන්න පුළුවන්. මේ කථා කරන මනුස්සයා කථා කරන භාෂාව 104 දෙනාම දන්නේ නැහැ. මේක ඇත්ත කථාව. මම හිතන්නේ ජපන් භාෂාව අහන්න අපට තව Room එකක් හදන්න ඕනෑ මහ ඇමැතිතුමාට කියලා. ඒක නිසා මම ඇත්තටම ස්තුතිවන්ත වෙනවා. මහ ඇමැතිතුමා මට ලොකු උදව්වක් කරලා දුන්නා. මහ ඇමැතිතුමා හැම කෙනාටම කියනවා මම ෆයිරූස් මන්ත්‍රීතුමාට උදව් කළා කියලා. මේ බස්නාහිර පළාත් සභා කාල සීමාවේම මගේ පාරට කාපට් දාන්න කියලා මහ ඇමැතිතුමාගෙන් මම ඉල්ලුවා. මිලියන 14 ක් වියදම් කරලා මට ඒ පාර හදලා දුන්නා. එකම එක වැඩයි. මම හිතන්නේ මහ ඇමැතිතුමා එක එක්කෙනාට වැඩ කරලා දීලා තිබෙනවා මිලියන 300 යි. මිලියන 400 යි. මිලියන 500 යි. අපි එහෙම නොවෙයි. අපේ මහ ඇමැතිතුමා හැම මන්ත්‍රී කෙනෙකුටම පාරවල් හදලා දුන්නා. ඒකට අපි ගරු කරන්න ඕනෑ. ඒක අපි නැහැ කියලා කියන්නේ නැහැ. ඒක කළා. මහ ඇමැතිතුමා හැම කෙනාටම කියනවා ෆයිරූස් මන්ත්‍රීතුමාට මම උදව් කළා කියලා. ඒක නිසා අපි අනිවාර්යයෙන් මේ අයවැයේදී -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම හදාගෙන තමයි විරුද්ධ වෙන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

කණ්ඩායමක් වශයෙන් අපි මේ අයවැයේදී සම්පූර්ණයෙන් විරුද්ධව ඡන්දය දෙනවා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 12 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.56]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම අපටත් හම්බ වුණේ ලක්ෂ 40 ක්, 50 ක්, 60 ක් විතර තමයි. ඔබතුමාට ලක්ෂ 140 ක් දීලා මහ ඇමැතිතුමාට එහෙම කියන එකත් හොඳයි. මහ ඇමැතිතුමා ඒක අහන්නත් ඕනෑ. හැබැයි ඇත්තටම අපි මේ මුදල් ප්‍රකාශය පිළිබඳව කථා කරන කොට අපේ මන්ත්‍රීතුමන්ලා පුනරාවර්තන, ප්‍රාග්ධන වියදම් ගැනවත් කථා නොකර අඩුම වශයෙන්ම මේ මොනවද කියන්නේ කියලා ලැජ්ජයි. පාර්ලිමේන්තුව එහේ. නමුත් මේ මුදල් ප්‍රකාශය පිළිබඳවයි අදහස් දක්වන්න කියලා තියෙන්නේ. නිලධාරීන් ඔක්කෝම බලාගෙන ඉන්නවා මොනවද වෙන්නේ කියලා. එතැන මාධ්‍යවේදීන් ඇවිල්ලා බලාගෙන ඉන්නවා. හැමෝම වචන දෙකක් හරි කථා කරනවා නම් හොඳයි. කථා කරලා මාතෘකාවට එන්න. නමුත් ඒ පිළිබඳව මොනවත් නොකියා එහෙම කථා කරන එක වැරැදියි කියන එකයි අපි කියන්නේ. විශේෂයෙන්ම 104 වැය ශීර්ෂය, පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක අමාත්‍යාංශ වැය ශීර්ෂය. ඒ වාගේම ශීර්ෂ අංක 109, ප්‍රධාන ලේකම් කාර්යාලය. ශීර්ෂ අංක 110, ඉංජිනේරු කාර්යාංශය. ඒ වාගේ ශීර්ෂ අංක 111, ආදායම් දෙපාර්තමේන්තුව. ශීර්ෂ අංක 112, පළාත් පාලන දෙපාර්තමේන්තුව. මෙන්න මේ වැය ශීර්ෂයන් පිළිබඳව අද අපට අදහස් ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳව සතුටු වෙනවා. ඊයේත් කථා කරන්න ගියා. විනාඩි 04 යි 05 යි හම්බ වුණේ. ඒත් කථාව මගින් නවත්වන්න සිද්ධ වුණා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමාගෙන් ඉල්ලනවා අපි මේ ටික කොහොම හරි සාරාංශ කරලා හරි කියන්නම්. ඒ සඳහා අවස්ථාව දෙන්න කියලා. එතකොට මුළු අයවැයෙන් 37% ක් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ ශීර්ෂයන් හයට එකතු වෙලා තිබෙනවා. 104, 109, 110, 111, 112 කියන ශීර්ෂයන්වලට මුළු අයවැයෙන් 37% ක් වෙන් වෙනවා පුනරාවර්තන සහ ප්‍රාග්ධන වශයෙන්. එතකොට අපි පැහැදිලිවම 104 වැය ශීර්ෂය පිළිබඳව කථා කරන කොට 2017 සත්‍ය වියදම ඒ වාගේම 2018 ඇස්තමේන්තුව සහ 2019 ඇස්තමේන්තුව පිළිබඳව සාපේක්ෂව අපි මෙතැන බලන්නට උවමනාව තිබෙනවා. ඒ නිසා මම 104 වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්න පෙර එක වචනයක් කියන්න ඕනෑ. මොකද, අපි දන්නවා ප්‍රධාන ඇමැතිතුමා සෑම

[ගරු සභත් ප්‍රදීප් විතාන]

විෂයයකටම මුදල් වෙන් කරන කොට පුංචි අතපසුවීමක් සිදු වෙලා තිබෙනවා. පරිසර කටයුතු කියන ඒ විෂයයට මුදල් වෙන් කර ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒක කාගෙන් වුණු වරදක්ද කියලා මම දන්නේ නැහැ. ඒක අපි මතක් කරන්න ඕනෑ. ඒ වාගේම 104 ශීර්ෂයේ ජල සම්පාදන හා ජලපවාහන කියන විෂයයට මුදල් වෙන් කර ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, හදිසියේ පරිසර කටයුත්තක් කරන්න සිද්ධ වුණොත්, හදිසියේ කාට හරි වතුර ටිකක් දෙන්න උවමනා වුණොත් ඒ කටයුතු සඳහා මේ වැය ශීර්ෂ දෙකට කීයක් හරි මුදලක් වෙන් කරලා තියන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම අපි සාපේක්ෂව බැලුවොත් 2017 සත්‍ය වියදමට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 204 ක වැඩිවීමක් තිබෙනවා. ඒක 24% කින් වැඩි වීමක්. ඒ වාගේම 2018 ඇස්තමේන්තුවට වඩා 2019 මිලියන 247 ක වැඩිවීමක් තිබෙනවා. එය 31% ක වැඩිවීමක්. ඒ වාගේම පුනරාවර්තන ඇස්තමේන්තුව දිහා බලනකොට 2017 සත්‍ය වියදමට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 45 ක වැඩිවීමක් තිබෙනවා. ඒක 33% කින් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම 2018 ඇස්තමේන්තුවට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 6 කින් වැඩි වෙලා තිබෙනවා. ඒක 4% ක වැඩිවීමක්. ඒ වාගේම ප්‍රාග්ධන වියදම්වල 2017 සත්‍ය විදයමට වඩා 2019 ඇස්තමේන්තුව මිලයන 159 කින් වැඩි වෙලා තිබෙනවා. ඒක 22% ක වැඩිවීමක්. ඒ වාගේම 2018 ඇස්තමේන්තුවට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 240 කින් වැඩි වෙලා තිබෙනවා. ඒක 38% ක වැඩිවීමක්.

ඒ වාගේම අපේ මහ ඇමැතිතුමාගේ 104 ශීර්ෂය තුළ අපි පැහැදිලිවම කියන්න ඕනෑ PDG වල එහෙම නැත්නම් සභා ආදායම් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවුම්වල 2018 ට සාපේක්ෂව, 2019 මිලියන 170 ක් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම PSDG වල, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානවල 2018 ට සාපේක්ෂව 2019 මිලියන 16 ක් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම සභා ආදායම් ආයතනික ප්‍රාග්ධන සඳහා යෙදවුම් අංක 12, 2018 ට සාපේක්ෂව 2019 මිලියන 54 ක වැඩිවීමක් තිබෙනවා. ඒ වාගේම ඇමැතිතුමාගේ අනෙක් විෂයයන් දිහා බලන කොට පළාත් පාලනය සඳහා මිලියන 114 ක් වෙන් කරලා තිබෙනවා. ග්‍රාමීය විදුලිය වෙනුවෙන් මිලියන 08 ක් වෙන් කරලා තිබෙනවා. සංචාරක විෂයය සඳහා මිලියන 19 ක් වෙන් කරලා තිබෙනවා. මේ සෑම වැය ශීර්ෂයක් පිළිබඳවම අපට එකින් එක කථා කරන්න බැරි වුණත් සාරාංශගත කර තමුන්නාන්සේලාට ඉදිරිපත් කිරීම අපේ වගකීමක් වෙනවා. ඒ නිසා 104 වැය ශීර්ෂය පිළිබඳව එපමණයි මම කථා කරන්නේ.

ඊළඟට 109 ප්‍රධාන ලේකම්තුමාගේ වැය ශීර්ෂය. ඒ වැය ශීර්ෂයේදී අංක 12, සභා ආදායම් ආයතනික ප්‍රාග්ධන සහ යෙදවුම්වලට මිලියන 726 ක් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම PDG වලට මිලියන 1300 ක් වෙන් වෙලා තිබෙනවා. PSDG වලට මිලියන 155 ක් වෙන් වෙලා තිබෙනවා. උපමානපාදක සඳහා මිලියන 254 ක් වෙන් වෙලා තිබෙනවා. ඒ නිසා අපි පැහැදිලිවම මේ සෑම වැය ශීර්ෂයකම, සෑම පුනරාවර්තන වියදමකම, සෑම ප්‍රාග්ධන වියදමකම ආපස්සට හැරිලා බලන්න ඕනෑ. මට මතකයි අපි පොදු සාකච්ඡාවේදී කියන්න හිටියා අපට ආදායම් ලැබෙන මූලාශ්‍ර 30 න් මූලාශ්‍ර 4 ක 5 ක ආදායම් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම අවුරුදු ගණනක් තිස්සේ මූලාශ්‍ර 30 කින් පළාත් සභාව ආදායම රැස් කරන්නේ. හැබැයි එකක්වත් අද වනකල් වැඩි කරන්න අපි කවුරුත් කල්පනා කරලා නැහැ. අපි උදාහරණයකට ගත්තොත් පළාත් සභා පාරවල්වල තිබෙන බෝඩ් ටික, මේවායෙන් ලැබෙන ආදායම අපට ගන්න පුළුවන් නම් විශාල ආදායමක් එකතු කර ගන්න පුළුවන්. අර 30, 31 දක්වා වැඩි කර ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා මම මෙවර මුදල් ප්‍රකාශයේදී වැඩියෙන්ම ප්‍රාග්ධන වියදම් සඳහා නොවෙයි අපේ කාලය වෙන් කළ යුත්තේ, සොයා බැලීම් කළ යුත්තේ. පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන්. මිලියන 8000 ක් විතර වැඩි වෙලා තිබෙනවා. ඒකෙන් මිලියන 4400 ක් ගෙවන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඒ වෛද්‍යවරුන්ගේ OT, බටා ඒ කටයුතු සඳහා. ඒ නිසා මේවා දරන්න පුළුවන්ද? එන්න එන්නම රජයෙන් ලබා දෙන ප්‍රදාන අඩු වෙනවා. එක පැත්තකින් සංචිතය අඩු වෙනවා. සංචිතය අඩු වෙනකොට පොළිය අඩු වෙනවා. එක පැත්තකින් රැස් කරන ආදායම අපි සංඛ්‍යාත්මකව දැම්මත් යම් යම් ගැටළු සහගත තත්ත්වයන් තිබෙනවා. ඒ නිසා අපි සියලු දෙනාට ඉදිරියේදී යම් මුදල් අර්බුදයකට මුහුණ දෙන්න සිද්ධ වුණොත්, ඒකට අපි මුහුණ දෙන්න නම් පුනරාවර්තන වියදම අඩු කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් කරනවා වාගේම, ඒ වාගේම ආදායම් රැස් කර ගැනීමේ අලුත් වැඩ පිළිවෙළකට යන්න අපි කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා අපි

පැහැදිලිවම කියන්නේ, අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අනෙක් වැය ශීර්ෂයන් පිළිබඳව කථා කළ යුතු නැහැ. ඒවා සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තු නිසා. ඒ නිසා මම මේ වෙලාවේ පැහැදිලිවම කියනවා ප්‍රධාන ඇමැතිතුමාගේ කාර්ය භාරය පිළිබඳව ඇත්තටම අපි කල්පනා කරලා බැලුවොත්, ගිණුම් කාරක සභාව දිහා අපි බලමු. 2011, 2012, 2013 අවුරුදු ගණනාවක් විසඳපු නැති ප්‍රශ්න විසඳලා අද පළාත් පාලන ආයතන ටික, පළාත් සභාව සතුව තිබෙන සියලු ආයතනවල වැරැදි හොයලා ඒවාට දඬුවම් දීලා කටයුතු කරන්න අද ගිණුම් කාරක සභාව කටයුතු කරලා තිබෙනවා. ඒවායේ ඉන්න සාමාජිකයෝ හැටියට අපි කියන්න ඕනෑ. ඒවා පිළිබඳව නිවැරැදිව කටයුතු කරන්න ප්‍රධාන ලේකම්තුමාත්, සභා ලේකම්තුමාත්, විගණන නිලධාරීන්, සියලුම නිලධාරීන් ඒ සඳහා දැවැන්ත කැප කිරීමක් කරලා ඒක හරියට කරනවා කියන එක මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

අනෙක් පැත්තෙන් බැලුවොත් පෙත්සම් කාරක සභාව. පෙත්සම් කාරක සභාවේ සියලු පෙත්සම් එදිනෙදා විභාග කරලා, ගිහිල්ලා බලලා, සාධාරණ තීන්දු දෙන්න ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රමුඛ අපේ සභාපතිතුමා, නියෝජ්‍ය සභාපතිතුමා - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උපදේශක කාරක සභා බැලුවොත් ඒ උපදේශක කාරක සභාවලට අපි ගිහිල්ලා, ඒ උපදේශක කාරක සභාවට එන පළාත් පාලන ආයතන නිලධාරීන්, ඒ වාගේම මේ වැය ශීර්ෂවලට අදාළ සියලු නිලධාරීන්, ඒ එන හැම කෙනෙකුටම උපදෙස් දීලා මහ ඇමැතිතුමා ඒ අවශ්‍ය මඟ පෙන්වීම කරලා, අපිත් සාකච්ඡා කරලා වර්ෂය අවසන් වනකොට ඒ මුදල් ටික හරියට, ඵලදායීව වියදම් කරන්න අද කටයුතු කරලා තිබෙනවා කියන එක අපි මතක් කරන්න ඕනෑ. හැබැයි අපි බොරුවට සුදු හුණු ගාන්න සූදානම් නැහැ. වැරැද්ද දුටු තැන අපි වැරැද්ද ප්‍රකාශ කරනවා වාගේම අපි සත්‍ය කථා කරන්න මැලි වෙන්නේ නැහැ. ඒ වාගේම මම විශේෂයෙන්ම මතක් කරන්නේ පළාත් පාලන ආයතනවල මුදල් ටික පසුගිය දවස්වල උදුරා ගත්තා. අර හිටපු නායකයෝ. ඒ පළාත් පාලනයෙන් ලැබෙන්න තිබුණු පෙරසවි ගාස්තු ටික Building Application, ඒ වාගේම බිම් කට්ටි සැලැස්මේ, අනු බෙදුමේ මේ සියලු ටික UDA එකට ගත්තා. හැබැයි අද අපි සතුටු වෙනවා. මහ ඇමැතිතුමාගේ නායකත්වයෙන් අපේ පළාත් පාලන ලේකම්තුමියගේ නායකත්වයෙන් නීති නිලධාරීගේ නායකත්වයෙන් ප්‍රඥප්තියක් සකස් කරලා ඒ ප්‍රඥප්තිය අද සම්මත කරලා පළාත් පාලන ආයතනවලට යවලා තිබෙනවා. ඒ නිසා පළාත් පාලන ආයතනවලට නැවත ඒ මුදල් ලබා ගැනීම සඳහා අද ඒ බුරුල ලබා දීලා ඒ නීතිය සකස් කරලා දීලා තිබීම පිළිබඳව අද අපි සතුටු වෙනවා. ඒ වගේම ත්‍රිරෝද රථ ප්‍රඥප්තිය හදලා දීලා තිබෙනවා. ඒ තුළින් අද රථ ගාල් ලියාපදිංචි කරලා සභාවට ආදායමක් ලබා ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ නිසා අද අපි ඒ පිළිබඳව අපේ ස්තුතිය ගෞරවය පුද කරන්න කැමැතියි.

ඒ වාගේම තමයි පසුගිය ආපදා කාලවල කවුරුත් මැදිහත් නොවුණු වෙලාවේ මට මතකයි අපේ ගාමිණී තිලකසිරි ඇමැතිතුමා වැඩ බැලුවේ. ඒ වෙලාවේ මහා ගංවතුරක් ආවා. ඒ වෙලාවේ මහ ඇමැතිතුමාත් එක්ක කථා කරලා පළාත් පාලන ආයතනවලට වැය ශීර්ෂයක් වෙන් කළා, ආපදා සඳහා කටයුතු කරන්න කියලා. ඒක අදටත් සෑම මුදල් ප්‍රකාශයකම සිද්ධ වෙනවා. මොක්කද වන ආපදාව? පළාත් පාලන ආයතන අද ඒ සඳහා ඉදිරියෙන් ඇවිල්ලා කටයුතු කර ගෙන යනවා. ඒ පිළිබඳව අපේ ස්තුතිය ගෞරවය පුද කරනවා. පසුගිය කාලයේ සපත්තු දුන්නා. ඒ වාගේම පොත් ටික දුන්නා. මේ සියලු කටයුතු ටික අද පළාත් පාලන ආයතන හරහා, ප්‍රජා මණ්ඩල හදලා සිදු කෙරෙනවා. පුටු ටික, අනෙක් පැත්තෙන් කැනපි ටික ඒ සියල්ල දීලා ජනතාව ශක්තිමත් කරන්න අද කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම සණ අපද්‍රව්‍ය අධිකාරිය. ඒ අය කරන සේවය අපි අගය කරන්න ඕනෑ. ලැබෙන සොච්චම් මුදල අරගෙන ඒ අය නිහඬව විශාල සේවාවක් කරනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා සණ අපද්‍රව්‍ය අධිකාරියට වැඩි මුදලක් වෙන් කරලා දෙන්න කියලා.

ඒ වාගේම තමයි අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ, ප්‍රධාන ලේකම්තුමා ඒ වාගේම අමාත්‍යාංශ ලේකම්තුමිය මහ ඇමැතිතුමාත් එක්ක කටයුතු කරද්දී බොහොම නිර්භීත එඩිතර තීන්දු අරගෙන කටයුතු කරනවා කියන එකත් මතක් කරන්න ඕනෑ. පළාත් පාලන ආයතනවල නිලධාරීන් පත් කිරීමේදී, වෙනස් කිරීමේදී ඍජු තීන්දු අරගෙන පක්ෂ භේදයෙන් තොරව හරි තීන්දු අරගෙන ස්වාධීනව කටයුතු කරලා මේ පළාත් සභාව ඉදිරියට ගෙනියන්න කටයුතු කරනවා කියන එකත් අපි මතක් කරන්න ඕනෑ. එම නිසා පළාත් පාලන ආයතනයක ප්‍රධානියෙක් හැටියට ඒ දේශපාලන ගමන ආරම්භ කරලා අද පළාත් සභාවේ මහ ඇමැති හැටියට එතුමා කරන මෙහෙවර අද මොනතරම් වැරැදි විධියට කථා කළත් මේ හදලා තිබෙන සභා ගර්භයේ

[ගරු සහන් ප්‍රදීප් විතාන]

තිබෙන ගෞරවය අපට කථා කරන කොට අපේ හදවතට දැනෙනවා. මතු පරම්පාරවට උරුම කරපු මේ පළාත් සභාව, මම හිතන්නේ ඔබතුමා ඒ සඳහා කරපු කැප කිරීම, කාපු මඩවලට පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපේ ගෞරවය ස්තුතිය ඔබතුමාට පුද කළ යුතුයි. මොකද, ප්‍රසන්න රණතුංග මහ ඇමැතිතුමා ආරම්භ කරපු මේ කටයුත්ත ඔබතුමා ඉතාමත් ගෞරවාන්විත විධියට අවසන් කළා. ඒ නිසා අපි මේ පළාත් සභාවේ එකක් කියන්න ඕනෑ. අපි ආණ්ඩු පක්ෂය හැටියට කවුරු ඒ පැත්ත මේ පැත්ත මාරු වුණත් අපි ඒක අනුමත කරන්නේ නැහැ. අනුමත කරන්නේ නැත්තේ ඒ මාරු කරන හැම කෙනෙකුටම යථා කාලයේදී ජනතාව තීන්දු තීරණ ගන්නවා. ඒ නිසා කෙළින් ඉන්න මන්ත්‍රීවරු කොයි පැත්තේ හිටියත් අපි ඒ අයව අගය කරනවා. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා අපේ මොන ප්‍රශ්න තිබුණත් ඇමැතිවරුන්ගෙන් මොන කෙනෙහිලිකම් සිද්ධ වුණත්, මොන අසාධාරණකම් සිද්ධ වුණත් අපි සියලු දෙනා එකතු වෙලා මේ සෑම වැය ශීර්ෂයක්ම දිනවලා පළාත් සභාව අපි ජයග්‍රහණය කරනවා කියන එක මතක් කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් මෙම සභාව දිවා ආහාරය සඳහා පස්වරු 02.00 දක්වා තාවකාලිකව අත්සිටුවනවා. නියමිත වෙලාවටම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ පැමිණීම බලාපොරොත්තු වෙනවා.

*ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත් සිටුවන දින් අ.භා. **02.07** ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.*

*Accordingly the Committee of the Whole Council temporarily suspended and. it resumed at 02.07 p.m with Hon Chairman in the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කේ.ටී. කුරුසාමි ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 02.07]

**ගරු කේ.ටී. කුරුසාමි**
Hon. K.T. Kurusamy

ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපේ ප්‍රධාන ඇමැතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, සියලු මිත්‍ර මන්ත්‍රීතුමන්ලා ඇතුළු ඔබ සියලු දෙනාටම සුභ සැන්දෑවක් වේවා. මෙවන් අවස්ථාවක මට කථාවක් කරන්න ලැබීම ගැන මම ඇත්තටම ස්තුතිවන්ත වෙනවා. 2019 අයවැය කථාව මම දෙමළ භාෂාවෙන් කථා කරන්න ආශයි. නමුත් දෙමළ භාෂාවෙන් කථා කරලා අවශ්‍ය දේවල් පරිවර්තනය වෙයි. නමුත් ඊට වඩා සිංහලෙන් කථා කරලා ඒක කෙලින්ම දැනෙන කට්ටියට දැනුනොත් හොඳයි කියලා හිතලා තමයි මම සිංහල භාෂාවෙන් කථා කරන්නේ. **உங்கள் அனைவருக்கும் வணக்கம்** කියන වචනය මම දෙමළෙන් කියලා සිංහලෙන් කථා කරන්න ඕනෑ කියලා හිතනවා. ඇත්තටම මේ අවස්ථාවේදී මෙම අයවැය කථාවේ ගරු මහ ඇමැතිතුමාගේ උපදේශක කාරක සභාවේ නිලධාරීන්, කොමසාරිස්තුමා, ලේකම්තුමා, නියෝජ්‍ය කොමසාරිස්තුමා, ඒ වාගේම සැලසුම් අංශයේ සියලුම නිලධාරීන්ට ස්තුතිය කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. මේ අවුරුද්දේ පසුගිය කාලය තුළ අපේ සියලුම වැඩ කටයුතු කරලා දුන් එක ගැන ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම මම මෙය අවස්ථාවක් කර ගන්නවා අද දින වැඩි මන්ත්‍රීවරු ප්‍රමාණයක් කථා කරනවා. මුළු රටම, මුළු ලෝකයම කථා කරන මාතෘකාවක් තමයි 1948 ඉඳලා අපේ රටේ ආරක්ෂා කරගෙන ආපු ප්‍රජාතන්ත්‍රවාදය අද මේ රටේ ඝාතනයට ලක් වී තිබෙන මොහොතක ඇත්තටම අපි ශ්‍රී ලාංකිකයෙක් හැටියට කනගාටු වෙනවා. මම දෙමළ ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකුට වඩා මම කනගාටු වෙනවා ශ්‍රී ලාංකිකයෙක් හැටියට තමයි මගේ අනන්‍යතාවය කියා සිටින්නේ. ඒ කාලයේ ඉඳලා. ශ්‍රී ලාංකිකයෙක් හැටියට මම කනගාටු වෙනවා අද අප රටේ සිදු වෙලා තිබෙන ඒ සිදුවීම ගැන හිතනකොට. ඇත්තටම මගේ මිත්‍රයෝ ඒ වාගේම දකුණු ඉන්දියාවේ ඉඳලා අපේ නෑදෑයෝ අපිත් එක්ක කථා කරන කොට කවදාවත් ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය එහෙම නැත්නම් අභිමානය ගැන කවදත් සතුටට තමයි පත් වෙලා සිටියේ. ඒ වාගේම අපේ රටේ අවුරුදු 30 ක් යුද්ධයක් තිබුණු අවස්ථාවක වුණත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වුණා. නමුත් අද මේ රටේ සිදු වෙලා තිබෙන සිදුවීම් දිහා බලන කොට මම ශ්‍රී ලාංකිකයෙක් හැටියට කනගාටු වෙනවා. මේ රටේ අග්‍රාමාත්‍යවරයා මහින්ද රාජපක්ෂද, එහෙම නැත්නම් රනිල් වික්‍රමසිංහද, එහෙම නැත්නම් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනද නායකයා කියන එක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මෙතැන තිබෙන එකම

ප්‍රශ්නය අපේ රටේ තිබෙන ව්‍යවස්ථාව අපි ආරක්ෂා කරගෙන තිබෙනවාද? අපේ ප්‍රජාතන්ත්‍රවාදය අපි ආරක්ෂා කරගෙන තිබෙනවාද කියන ප්‍රශ්නය තමයි අද මතු වෙලා තිබෙන්නේ. ඇත්තටම විපක්ෂයේ, අද මේ සභාවේ පක්ෂයක් හැටියට කථා කරන මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කට්ටිය එහෙම නැත්නම් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ පාක්ෂිකයෝ ඒගොල්ලෝ දේශපාලන වශයෙන් ඒ න්‍යාය කළාට ඒ අයගේ හෘදය සාක්ෂිය වෙනුවෙන් අපි දන්නවා. අපි Personally ඒ අය එක්ක කථා කරන කොට මේ රටේ වැරැද්දක් සිදු වෙලා තිබෙනවා කියලා ඒ අය පිළිගන්නවා. නමුත් එක පක්ෂයක් නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට ඒක ඒ අය පිළිගත්තාට ඒක ඇත්ත දෙයක්. ඒ නිසා මේ අවස්ථාවේදී අපි කනගාටුව ප්‍රකාශ කරනවා. ඇත්තටම සමහර මන්ත්‍රීවරු කිව්වා අයවැය කථාවේදී පාර්ලිමේන්තුවේ වන දේ ඇයි මේ ඇවිල්ලා කථා කරන්නේ කියලා. ඇත්තටම මහජන නියෝජිතයෝ වන අපි මේ රටේ වෙලා තිබෙන ප්‍රශ්නය ගැන අපේ අදහස ප්‍රකාශ කිරීමට මෙවන් උත්තරීතර වෙලාවක් අපට ලැබෙන්නේ නැහැ.

ඒ නිසා මේ අයවැය කථාව තුළින් ඒ ප්‍රකාශයත් මේ වෙලාවේ කියන්න වීම ගැන මම සතුටු වෙනවා. ඒ වාගේම 19 වැනි සංශෝධනය එදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු වෙලාවේ අතිගරු ජනාධිපතිතුමා කියපු වචනයක් අද සියලු පත්තරවල පළ වෙලා තිබෙනවා. එදත් ඒක ඇවිල්ලා තිබුණා. මේ රටේ ජනාධිපති කෙනෙක්ගේ බලය අඩු කරපු ඉතිහාසයේ එකම නායකයා මමයි කියලා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පාර්ලිමේන්තුවේදී පවසා තිබුණා. ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙක් පළාත් සභාවේ මන්ත්‍රී කෙනෙක්, එහෙමත් නැත්නම් පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් තමන් කියපු කථාව වෙනස් කරලා කථා කරන්න පුළුවන්. එක පක්ෂයක ඉඳලා මාරු වුණු ගමන් එදා මම මෙහෙම කථා කළේ නැහැයි කියලා එතුමන්ලා මාරු වෙලා, මාරු වෙලා කථා කරන්න පුළුවන්. ඒක සාධාරණ වෙන්න පුළුවන්. නමුත් රටේ නායකයෙක්, ජනාධිපති කෙනෙක් එක වෙලාවක එක කරුණක් කියලා, ඊට පස්සේ ඒක වෙනස් කරලා කථා කරනවා කියන්නේ, ඇත්තටම ඒක ඉතිහාසයේ ලොකුම වැරැද්දක් බව මම දකිනවා. ඒ ප්‍රකාශය මම රට වෙනුවෙන් ඉදිරිපත් කළේ.

අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ වැය ශීර්ෂය ගැන කථා කරන කොට මගේ යුතුකමක් තිබෙනවා මේ පළාත් සභාවට 2015 නවක මන්ත්‍රීවරයෙක් හැටියට ප්‍රවේශ වනකොට තමයි අපේ ඉසුර දේවප්රිය මැතිතුමා මහ ඇමැති ධූරයට පත් වුණේ. මම සන්තෝෂ වෙනවා එදා ඉඳලා මේ රටේ ඕනෑම නායකයෙක්, ජනාධිපති වෙන්න පුළුවන්. එහෙම නැත්නම් අග්‍රාමාත්‍ය කෙනෙක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ප්‍රධාන ඇමැති කෙනෙක් හෝ එක පක්ෂයක් නියෝජනය කළොත් ඔවුන් සියලු ජනතාව අගය කිරීමට ලක් වෙන්න ඕනෑ. මම දන්නේ නැහැ පසුගිය කාලයේ හිටපු මහ ඇමැතිවරු ඒක කළාද කියලා. නමුත් ඉසුර දේවප්‍රිය මහ ඇමැතිතුමා ළඟ මම දැකපු හොඳ දෙයක් නිසා තමයි එතුමා මේ බස්නාහිර පළාතේ සියලුම ජනතාව, සිංහල ජනතාව වාගේම දමිළ, ඒ වාගේම මුස්ලිම් ආගම් වශයෙන් හින්දු, ක්‍රිස්තියානි, ඉස්ලාම්, බෞද්ධ සියලුම ජනතාව නියෝජනය කරන නායකයෙක් හැටියට එතුමා තමන්ව පෙන්නගෙන තමයි ඒ වැඩ කරලා තිබෙන්නේ. ඇත්තටම දෙමළ, හින්දු ආගමිකයෙක් හැටියට මම සතුටු වෙනවා. ස්තූතිය පළ කරනවා. වැඩිය සිංහල නායකයෝ සමහර විට හින්දු කෝවිල්වලට යන්නේ නැහැ. එහෙම ගියත් තමන් පෙන්න ගන්නේ නැහැ. නමුත් ඉසුර දේවප්‍රිය කියන්නේ, ජාතික සංහිඳියාව ඇති කිරීමට, මම ප්‍රධාන ඇමැති කෙනෙක් හැටියට මම එක ජාතියකට නොවෙයි. එක පක්ෂයකට නොවෙයි. බස්නාහිර පළාතේ සියලුම ජනතාව වෙනුවෙන් මම මහ ඇමැති කියලා එතුමාගේ හැසිරීම්වලින් පෙන්වා තිබෙනවා. ඒ නිසා මම මුලින්ම මේ රටේ දෙමළ, හින්දු මන්ත්‍රීවරයෙක් හැටියට, මහජන නියෝජිතයෙක් හැටියට ඇත්තටම මහ ඇමැතිතුමාට මගේ ස්තූතිය පළ කරනවා.

ඒ වාගේම තමයි මම දන්නේ නැහැ. මම මේ පළාත් සභාවට ඇවිල්ලා අවුරුදු තුනයි. ඊට කලින් හිටපු මහ ඇමැතිවරු තමන්ගේ මුදල්වලින් ප්‍රතිපාදන වශයෙන් මන්ත්‍රීවරුන්ට ලබා දුන්නාද කියලා දන්නේ නැහැ. නමුත් මට දැනෙන හැටියට මේ මහ ඇමැතිතුමා ඇත්තටම ආණ්ඩුවෙන් දෙන ලක්ෂ 25 ඇරෙන්න තමන්ගේ මුදල්වලින් ලක්ෂ 25 ක් මන්ත්‍රීවරුන්ට ලබා දීලා අපේ ප්‍රදේශයේ සංවර්ධන කටයුතුවලට ඉතා සමීපව, එතුමා කිට්ටු කරලා වැඩ කෙරුවා. මම ගණන කියන්න කැමැති නැහැ. නමුත් මම ඉල්ලුම් කරපු හැම අවස්ථාවකදීම ලැබුණා. මම ඉල්ලුම් කරලා තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් මට ලැබුණේ නැති සමහර සංවර්ධන වැඩ කටයුතු මම

[ගරු කේ.ටී. කුරුසාමි]

මහ ඇමැතිතුමාට කියපු අවස්ථාවල ඒවා පිළි අරගෙන මහ ඇමැතිතුමා මට ඉටු කරලා දීලා තිබෙනවා. ඒ නිසා මම එතුමාට ස්තුති කරන්න ඕනෑ. ඒක මගේ යුතුකමක්. ඒ වාගේම මට පවසා තිබුණා මන්ත්‍රීතුමා කොහේ හරි දෙමළ පාසල්වල මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ වාගේම දියුණුව ගැන මොකක් හරි කියන්න ඕනෑ නම් මට කියන්න මම කරලා දෙනවා කියලා ඒ පොරොන්දුවත් මට දීලා තිබෙනවා. ඒ වාගේම එතුමා ඉටු කරලත් දීලා තිබෙනවා.

ඒ නිසා මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ අවස්ථාවේ මහ ඇමැතිතුමා මෙතැන නැති වුණත් මම එක ඉල්ලීමක් කරන්න තිබෙනවා. ලබන අවුරුද්දේ තව මාස 03 යි අපේ පළාත් සභා ධුර කාලය තිබෙන්නේ. ඒ ධුර කාලය තුළ මම හිතන්නේ කොහේ හරි දෙමළ පාසලක ඔබතුමාගේ නමින් - මේ අවුරුදු 30 ක් වන ඉතිහාසයේ කිසිම පාසලක ගොඩනැගිල්ලක් - මම හිතන්නේ හිටපු මහ ඇමැති රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමාගේ නමින් දෙමළ පාසලක එක ගොඩනැගිල්ලක් තිබෙනවා. ඒ වාගේම ඔබතුමාගේ කාලය තුළද එවැනි දෙයක් මේ බස්නාහිර පළාතේ ජීවත් වන, කොළඹ දිස්ත්‍රික්කයේ ජීවත් වන දෙමළ දූ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් ඔබතුමා ඉටු කර දෙන්න ඕනෑ කියලා ඉල්ලා සිටිමින් මෙම අවස්ථාව ලබා දුන් ගරු සභාපතිතුමා ඇතුළු අපේ විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමාට, ප්‍රධාන සංවිධායක ජෝර්ජ් පෙරේරා මැතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව නිමා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.17]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ඉතාම අඩු කාලයක් තිබෙන්නේ. ඒ නිසා මම කෙටි කරලා කථාව කරන්න යන්නේ. පළමුවෙන්ම කියන්න ඕනෑ ගරු සභාපතිතුමනි, මේ අයවැය සම්බන්ධයෙන් දින 06 ක් විවාදය තියලා ඒක දින 04 කට කෙටි කිරීම සම්බන්ධයෙන් එදත් මගේ විරුද්ධත්වය ප්‍රකාශ කළා. අදත් විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මොකද, ආණ්ඩු පක්ෂයේ අයටත් කථා කරන්න වෙලාව මදී. විපක්ෂයේ අයටත් කථා කරන්න වෙලාව මදී. සමහරු කියනවා සමහර මන්ත්‍රීවරු මේ සභාවට එන්නේ නැහැ. ඒ නිසා කාලය කෙටි කළා කියලා. මම කියන්නේ අකමැති මන්ත්‍රීවරු ඉන්නවා නම් එයාලට කෙටි කරලා, අනෙක් දවසේ පැය භාගයක්වත් මේ විෂයයන් ගැන කථා කරන්න පුළුවන් විධියට මේ අයවැයේ කාල වේලාව සකස් කරන්න කියලා පළමුවෙන්ම කියන්න ඕනෑ. දෙවැනි කාරණාව තමයි පළාත් සභාව පිහිටුවලා දශක තුනක් විතර අවසන් වන වෙලාවේදී මේ පළාත් සභාව තවම ජනතාවට සමීප වෙලා නැහැ. අපට මේ අයවැය විෂයයන් ගැන එකින් එක කථා කරන්න නම් දවස් හතර පහක් ඕනෑ. ඒ නිසා මම පොදු කරුණු ගැන කථා කරන ගමන්ම මහ ඇමැතිතුමාගේ විෂයයන් ගැනත් කථා කරනවා. ඒකට හේතුව තමයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අපේ නිලධාරියෙක් යනවා. සමහර වෙලාවට ඉඳගන්න පුටුවක්වත් නැහැ. අපේ මේ සියලුම මන්ත්‍රීවරු දන්නවා ඇති. මේ පළාත් සභාවේ නිලධාරියාට එතැන කෙනහෙළිකම් සිද්ධ වෙනවා. මේ නිලධාරීන් දන්නවා ඇති. සමහර වෙලාවට එක්කෙනෙක් නැඟිටලා ගියාම තමයි ඒ පුටුවේ ඉඳගන්න වෙන්නේ. ඒ නිලධාරීන්ට හරියට පෞරුෂයක් ඇතිව ඒ රාජකාරිය කරන්න විධියක් නැහැ. අපි දශක තුනක් පළාත් සභාවේ ගත කරලා තිබෙන කොට අපි ඒ අවස්ථාව හදලා දීලා නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා මේ අයවැයේදී සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම හරි ඊට ආසන්නයේ හරි පළාත් සභා කාර්යාලයක් පිහිටුවන්න. අපේ නිලධාරී ටික එතැන ඉන්දන්න. එතකොට මේ පළාත් සභාවට එන ආදායම් එකතු කරන මධ්‍යස්ථානයක් හැටියට එතැන පරිගණක ආශ්‍රිත මධ්‍යස්ථානයක් හදන්න. දැන් අපි දන්නවා පොලීසියෙන් දඩ කොලයක් දුන්නාම, එම දඩ කොලය අරගෙන තැපැල් කන්තෝරුවට යනවා. එහෙන් ගෙවලා ආපහු එනවා. ඒ රිසිට් එක මෙහේට එනවා. ගිණුම් හදන්න වෙනම කට්ටියක් යනවා. මේ ඔක්කෝටම වැඩිය හොඳයි ඒ වෙලාවේම අපේ ගිණුමට ඒ කාර්යාලයේ තැන්පත් කරන්න පුළුවන්. ඒක විශාල ආදායමක් වාගේම, මේ ආර්ථික ප්‍රවර්ධනයට හේතුවක් වාගේම අපේ ප්‍රදේශයේ රැකියා නොමැති අයට රැකියා ටිකක් දෙන්නත් පුළුවන්. පරිගණකය ඉගෙන ගත්තු දරුවෝ රාශියක් ඉන්නවා. විශේෂයෙන්ම පාසල්වල තාක්ෂණ විෂයය උගන්වනවා. මේ ළමයින් හරහා රැකියා ටික දෙන්න පුළුවන්. එතකොට පළාත් සභාවත් දියුණුයි. ආර්ථික පැත්තත් දියුණුයි.

ඒ වාගේම අපේ ආර්ථිකය තවදුරටත් දියුණු කරන්න බලාපොරොත්තු වෙන්නේ අපි දන්නවා, මේ ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය තුළින්. සංචාරක ව්‍යාපාරය ගැන කථා කළොත් ඉතාම අත්‍යවශ්‍ය දේවල්වලට නොවෙයි මුදල් වැය

වුණේ. මම දැන් එක උදාහරණයක් කියන්නම්. කෝටි ගණනක් වැය කරලා මීගමුවේ Swimming Pool එකක් හැදුවා. හැදුවේ මුහුද අයිනේ. ගිය වියදම කොපමණද, ලබපු ආදායම කොපමණද කියලා මම විස්තර ඇහුවොත්, නඩත්තුවට, සේවකයින්ට යන මුදල අරගෙන බැලුවොත් හරියට අර හම්බන්තොට හැදුවා වාගේ. මම අහන්නේ සංචාරක ව්‍යාපාරයෙන් වියදම් කරන්න ගොඩක් දේවල් තිබෙනවා. Swimming Pool එක මුහුද අයිනේ හදලා තියෙන්නේ. තමුන්නාන්සේලා දන්නේ නැත්නම් ගිහිල්ලා බලන්න. මම මේ එක සිද්ධියයි තෝරා ගත්තේ. අපි වැය කරන මුදල්, ආයෝජනය කරන මුදල් හරියට ආදායමක් සභාවට ගෙනැල්ලා දෙනවාද කියන එක සොයලා බලන්න ඕනෑ. මම නිලධාරීන්ටත් කියනවා. හොයලා බලන්න. අපි අයවැය ඉදිරිපත් කරලා යම් යම් දේවල්වලට මුදල් වෙන් කරන කොට ලැබෙන ප්‍රතිලාභය කොහොමද කියලා බලන්න ඕනෑ. මේකට වැඩිය විශාල ආදායම් ගන්න පුළුවන් තැන් තිබෙනවා. ඒවාට වැය වීම් සිද්ධ වෙලා නැහැ. ඒ නිසා කාලය කෙටි නිසා අපි කථා කළොත්, හැමෝම ඊළඟට බලයට එන පදනම හදන්න උත්සාහ කරනවා මිසක් පළාත හදන්න උත්සාහ කරනවා කියන එක නම් දැකලා තිබෙනවා හරිම අඩුයි. ඒක අකමැත්තෙන් වුණත් පිළිගන්න ඕනෑ. ඉතින් මේකට හේතුව හැටියට මම දකින්නේ

ගරු සභාපතිතුමනි, මේ හැමෝටම තේරුම් ගන්න පුළුවන් විධියට කිව්වොත්, අර පාසල් යන කාලේ අපි සිංදුවක් අහලා තිබෙනවා. කේජු කැල්ලක් හොරා අරගෙන ආපු කපුටා හරි සන්තෝෂයෙන් අත්තක උඩ ඉඳගෙන මේක කන්න යනකොට කපටි නරියෙක් ඇවිල්ලා මෙයාව වර්ණනා කරනවා. කථාව අහගෙන ඉඳලා ඕක බිමට දැම්මොත් මම කනවා කියලා. එතකොට මේ කේජු කැල්ලත් අරගෙන එන්නේ හොරකමට. හොරකම් කරපු එකක්. අපේ ඉස්සර පෙළ පොත්වලත් ඕක තිබුණා. එතකොට හොරකම් කරපු දේ සන්තෝෂයෙන් භුක්ති විඳින්න පුළුවන් විධියට තමයි මේ ගොඩක් ජනතාව හැඩ ගැහිලා තිබෙන්නේ. ඒ වාගේම ඒ හොරා හරි මේක අතේ තියාගෙන ඉන්න කොට ඒකට ගිජුකමෙන් එයාව වර්ණනා කරනවා වාගේ තමයි අපේ අයත්, ඇමැතිවරු වර්ණනා කරලා, නායකවරු වර්ණනා කරලා තමන්ට මේ හොරකම් කරපු දෙයින් හරි ටිකක් ගන්න පුළුවන්ද කියලා Try එකක් දෙනවා. උත්සාහයක් කරනවා. ඉතින් මේක හොඳ සංකල්පයක් අද රටේ දේශපාලනය ගැන ඉගෙන ගන්න. වැඩි විස්තර ඕනෑ නැහැ. කාගෙන් හරි මොකක් හරි බලයක් හරි, තනතුරක් හරි හොරෙන් හරි අරගෙන ඒක සන්තෝෂයෙන්, ප්‍රීතියෙන් භුක්ති විඳින්න උත්සාහ කරන කොට තවත් කට්ටියක් ඒක ගැන වර්ණනාවක් දානවා. ඉතින් මම මේ සංකල්පය ඉදිරිපත් කළේ, මේක අපේ අධ්‍යාපන පෙළ පොත්වල ඉස්සර තිබුණා. ඇත්ත වශයෙන්ම ජපානයේ අධ්‍යාපනය ගත්තොත් ආර්ථික ප්‍රවර්ධනයෙන් ඉහළටම ගිහිල්ලා තියෙන රටක් නේ? එතකොට ඒ අයට මෙවැනි හොරකම් කරන දේවල් භුක්ති විඳින්නවත්, ඒවා ගැන වර්ණනා කරන්නවත් ඉගැන්නුවේ නැහැ. ඒ ආර්ථිකය දියුණු වුණේ, මුල ඉඳලාම අවංකව වැඩ කරන්නයි ඉගැන්නුවේ. ළමයින්ට කරන දෙයක් හරියට කරන්න. අවංකව කරන්න උගන්වනවා. ඉතින් මේ ආකල්පය වෙනස් කරන්නේ නැතුව පොත් පුරවලා ඉලක්කම් ලියලා, මැෂින් හයි කරලා, ලොකු ශාලා හදලා අපි කොපමණ විවාද කළත් වැඩක් නැහැ. මේ ජනතාවගේ සංකල්ප, ආකල්ප මේවා හරියට වෙනස් වෙන්නට ඕනෑ.

මම මහ ඇමැතිතුමාට කියනවා. මම ඉස්සෙල්ලා වැදගත් යෝජනාවක් කළා. ඔබතුමා හිටියේ නැහැ. මම සියලුම ජනතාවට ආයාචනය කරනවා මේ කේජු කැල්ලෙයි, නරියගෙයි කථාවේ විධියට රට පාලනය කරන්නවත්, රටේ අනුගත වෙන්නවත් එපා. තමුන්ට ලැබෙන සන්තෝෂම, කොම්සම හොරෙන් ලැබෙනවා නම් ඒක ගැන සන්තෝෂ වෙන්න උත්සාහ කරන්න එපා. හරි දේ කරලා, අවංක විධියට වැඩ කරලා ඒ ලැබෙන සංතෘෂ්ටිය ඒ අගය කිරීමට ලෝකයාගෙන් විතරක් නොවෙයි, ස්වභාව ධර්මයෙනුත් ආශිර්වාදයක් ලැබෙනවා. ඒ නිසා අපි ඒ ආකල්පය වෙනස් කරගෙන හරි ආකල්පවලට යන්න ඕනෑ. මම කිව්වේ දශක තුනක් ගත වුණු පළාත් සභාවේ නිලධාරීන්ට වාඩි වෙන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පුටුවක්වත් නැහැ. අපි දන්නවා. මම අත්දැකීමෙන් දැකලා තිබෙනවා. වෙන කාගේ හරි පුටුවක ඉඳගෙන වැඩ කරන්න ඕනෑ. ඒ කියන්නේ ඒ අයට සලකන්නේ නැහැ. ඒ නිසා මම කිව්වේ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම පළාත් සභා කාර්යාලයක් අරින්න. ඒක ජනතාවට සමීප වෙන්න ඕනෑ. ඒ සමීපත්වය අපි දැක්කේ නැහැ. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණත් ඒ කාලයේ ඉඳලාම විවේචනය කරනවා මේක සුදු අලියෙක් කියලා. මේක සුදු අලියෙක් නොවෙයි. මෙතැනින් විශාල වැඩ කොටසක් සිද්ධ වෙනවා. ඒ සමීපත්වය අපි ගොඩ නඟලා නැහැ. ඒ නිසා අද ප්‍රාදේශීය සභාවේ කරන වැඩක්වත් මේ පළාත් සභාවේ ඉඳන් කරන්න බැහැ කියා අපේ මන්ත්‍රීවරු පවා කියනවා. ඒකට හේතුව

[ගරු රෝස් ප්‍රනාන්දු]

මේ ආයතන සමීපත්වය නැතිකමයි. ඒ සමීපත්වය තිබිලා එතැන කාර්යාලයක් තිබුණා නම්, මේ මන්ත්‍රීවරුන්ට ගිහිල්ලා ගැටළු විසඳන්න පුළුවන්. කාර්යාලයට ගැටළු එනවා. මන්ත්‍රීවරයා මැදිහත් වෙලා විසඳනවා. එතකොට මේ රට බොහොම කාර්යක්ෂම වෙනවා. ආර්ථික වශයෙන් ප්‍රවර්ධනයක් ලබා ගන්න පුළුවන්. ඉතින් මේ කාරණා විශේෂයෙන්ම මම ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා.

ඒ වාගේම නීතිය හා සාමය මෙතුමාට තිබෙනවා. නීතිය සාමයේදී අද කොපමණ නීති පොත් තිබුණත් පොත් කියවා ගන්න දැන්නේ නැති දේශපාලන නායකයෝ ඉන්න නිසා, අපි හරි කරදරයක වැටිලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාව ගැන කථා කරගෙන ගියාට මේ දේශපාලනයේ මුලට ගිහිල්ලා, ප්‍රධාන තැනට යනකොට එතැන දැන් ටිකක් අව්වාරු තත්ත්වයක්. ඇත්තෙන්ම කිව්වොත්. ඉතින් මේ අව්වාරු තත්ත්වයෙන් මුදවා ගන්න නම්, අපි සියලු දෙනාම ඊට ධෛර්යයක් දෙන්න ඕනෑ. අපිත් අර කේජු කැල්ල කන්න බලාගෙන ඉන්න නරියා වාගේ අපට වාසියක් වෙයි කියලා, ඒ ගැන වර්ණනා කරන්නේ නැතුව හරි දේ තෝරාගෙන අපි ඒ ගමන යන්න දායකත්වයක් දෙන්න ඕනෑ. අපි පත් කරන යම්කිසි කෙනෙක් අතින් වැරැද්දක් වෙනවා නම්, ඒක අපි හරිගස්සගෙන යන්න උදව් කරන්න ඕනෑ. ඒ වාගේම මේ පළාත් සභාවෙත් බිලූ පිල්මිස් බැලුවා කියලා කථාවක් ආවා. අපි නම් යෝජනා කළේ, යම්කිසි කෙනෙක් අතින් වරදක් වෙන්න පුළුවන්. සමහර විට වරදක් නොවී ජනමාධ්‍ය වරදක් විධියට දාන්නත් පුළුවන්. ඉතින් මේ සියල්ලේදී අපට හරි ගමන් මගට යන්න අවතීර්ණ වෙන්න ඒකට උදව් කරන්න ඕනෑ. ඒක තමයි වැදගත් දේශපාලනය. එහෙම නැතුව කරන කරන හැම වැඩේම කඩාකප්පල් කරන එක, බලයක් තිබෙන කෙනා ඒ බලය හරියට පාවිච්චි කරන කොට ඒවා කඩාකප්පල් කරන එකට, ඒවා උදුර ගන්න යන එක, කේජු කැල්ල හොරා කනවා වාගේ හොරෙන් ගිහිල්ලා කථා කරලා හොරා කන්න යන එක, මේවා අද සාදාචාරවත් දේශපාලනය නොවෙයි. ඒ නිසා මම සියලු දෙනාගේම අවධානය යොමු කරනවා. මේ කාලය අපට හොඳටම මදී කථා කරන්න. නමුත් සියලු දෙනාගේ ඇස් ඇරෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. කේජු කැල්ලේ සංස්කෘතියෙන් අපි වැදගත් සංස්කෘතියට යන්න ඕනෑ. ඔබ සැමට ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ඔබතුමිය වෙලාවටම කථාව අවසන් කළා. බොහොම ස්තුතියි.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

ගරු සභාපතිතුමනි, 37 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ඊයේ සිදු වුණු සිද්ධිය සම්බන්ධයෙන්. මට දැනගන්න ලැබුණා එම සිදුවීම මන්ත්‍රීවරු තිදෙනෙකුට සිදු වුණාය කියලා. ඊයේ කථික ලැයිස්තුව තුළදී ඔබතුමා විසින් කථිකයින් නම් කරද්දී තිබෙන පිළිවෙළින් පිට පැනලා, කථිකයින් නම් කරලා තිබෙනවා. අපේ මන්ත්‍රීවරු තිදෙනෙකුගේ. ඒක සිදු වුණේ ඔබතුමාගෙන්ද, එහෙම නැත්නම් අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ දැනුවත්වීම මතද කියලා මම පොඩ්ඩක් දැනගන්න කැමැතියි.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මමත් ඇතුළුව.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

එතුමාත් ඇතුළුව. මොකද, මට එතැනදී කථා කරන්න තිබුණා හත් වැනියාට. ඊට යටින් හිටපු සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාව - සිරිකමල් ද සිල්වා මන්ත්‍රීතුමාට පස්සේ මම කථා කරන්න හිටියේ. ඊට පස්සේ කෙළින්ම යටටම ගිහිල්ලා ඔබතුමා සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කළා කථා කරන්න. අපි දැනුවත් වෙලා හිටියා නැහැ, කථාවක් නැහැයි කියලා. අපි උදේ ඉඳලාම මේ සභාව තුළ ඉඳගෙන සූදානම් වෙලා හිටියේ. මේ අතපසුවීම හෝ මේ වැරැද්ද හෝ හිතාමතා කිරීම කොහොමද සිදු වුණේ කියලා දැන ගන්න කැමැතියි ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මෙහෙමයි. ඇත්තම කියනවා නම් ඊයේ දවස තුළ පොඩි ගැටළුවක් ඇති වුණා දෙපැත්තටම. උදේ වරුවේ තිබුණු වරප්‍රසාද ප්‍රශ්න තුනක් නිසා පොදු සාකච්ඡාවට තිබුණු සෑහෙන කාලයක් අපට නැති වුණා. ඊට

පස්සේ අපට ටික ටික කාලය සීමා කරන්න සිද්ධ වුණා. නමුත් ඔබතුමා සභා ගර්භය තුළ ප්‍රකාශයක් කරලා සභාවෙන් එළියට ගියා. ඊට පස්සේ පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමා හිටියේ. එතුමාටත් මම කාලය දෙන්න කථා කළා. එතුමාත් කිව්වා අවශ්‍ය නැහැ කියලා. ඔබතුමා හිටියා නම් මම ඔබතුමාටත් කාලය දෙනවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

ගරු සභාපතිතුමනි, මම ඉල්ලුවේ පොදු සාකච්ඡාවට කථා කරන්න. මට අවශ්‍ය වුණේ නැහැ ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂයට කථා කරන්න. මට දැනගන්න ඕනෑ ඔබතුමාගෙන් මේක සිදු වුණේ කොහොමද කියලා. මේක විශාල වරප්‍රසාද කඩවීමක්. මෙහෙම පිට පැනලා මොන පදනමින්ද ඔබතුමා යටින්ම ඉන්න සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න ආරාධනා කළේ? List එකක් මේ විධියට තියෙද්දී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ. ඒ අවස්ථාවේ සභා ගර්භයේ හිටියේ එතුමා විතරයි.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

මම හිටියා. මම දවසේම හිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා එළියට ගියා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මගේ කථාව තියෙන්නේ, මේ List එක අනුව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොහොම හරි මට ආපු ලැයිස්තුව අනුව -

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

වැරැද්දක් වුණා. ඒක ප්‍රශ්නයක් නැහැ. මට දැනගන්න ඕනෑ මේක ඔබතුමාගේ අතින් සිදු වුණාද? නැත්නම්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ඔබතුමා දැනුවත් කරලා සිදු වුණාද? එසේත් නැත්නම් ඔබතුමා මේක මහ ඇරලා ගිහිල්ලා කළාද කියලා දැන ගන්න ඕනෑ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගම්පහ දිස්ත්‍රික්කයේ නේ ජෝර්ජ්ගේ කුමන්ත්‍රණයක්ද කියලා බලන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කොහෙත්ම මහ අරින්න අවශ්‍ය නැහැ.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

එහෙම නම් කොහොමද? ඔබතුමා මට මේක පොඩ්ඩක් පැහැදිලි කරන්න. මේක හරි වැරැදි පූර්වාදර්ශයක්. අපි කථාවක් කරන්න ඉන්න කොට අඩුම ගණනේ අපව දැනුවත් කරන්නේ නැහැ, ඔබතුමාගේ කථාව Cancel වෙලා ගියා කියලා. එහෙම නම් පණිවිඩයක් එවන්න ඕනෑ ඔබතුමාගේ කථාව Cancel කරනවා, නවත්වනවා. මොකද, මේ වරප්‍රසාදවලට වෙලාවක් ගියා කියලා. එහෙමවත් කියන්නේ නැතුව නිකම්ම - මොකක්ද පදනම කියලා දැනගන්න අවශ්‍යයි ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම සාමාන්‍යයෙන් -

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

ඔබතුමාව අපහසුතාවයට පත් කරනවා නොවෙයි. මේක දැනගන්න ඕනෑ. සභාවක් කියන්නේ, උත්තරීතර සභාවක්. එතකොට අපිත් එන්නේ විහිළුවට නොවෙයි. වෙලාවල් බලලා කථාවකට සූදානම් වෙලා එන්නේ. මම අවුරුදු හතරක් - මේ පළාත් සභාවට ආවට පස්සේ මගේ ප්‍රථම කථාව ඊයේ තිබුණේ. මම සූදානම් වෙලා ඇවිල්ලා හිටියා. නමුත් අන්තිමේදී නම නැතුව ගියා. මේක වුණු විධියයි මට දැනගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම අර මුලින් කිව්වා වාගේ ගරු මන්ත්‍රීතුමා ඇත්ත වශයෙන්ම වුණේ විනාඩි 45 කටත් වැඩි කාලයක් අපතේ ගියා. වරප්‍රසාද ප්‍රශ්නවලට. මම නිරන්තරයෙන්ම මූලාසනයේ ඉන්නෙත් නැහැ. මට එහෙම ඉන්නත් බැහැ. මුළු දවස පුරාම මූලාසනයේ ඉන්න බැහැ. මම මාරුවෙන් මාරුවට නියෝජ්‍ය සභාපතිතුමා ඉන්නවා. මූලාසනයේ අසුන් ගන්න නම් කරලා තිබෙන මන්ත්‍රීවරයෙක් ඉන්නවා. එතුමන්ලා මූලාසනයට එනවා. ඒ අවස්ථාවකදී කාලයේ යම්කිසි පොඩි ගැටළුවක් එනවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

ගරු සභාපතිතුමනි, මේකේ ලකුණු කරලා තිබෙනවා. අභවල්ලු, අභවල්ලු කථා කළා. සියල්ලක්ම මේකේ තියෙනවා. ඔබතුමා නැතුව ඊළඟට එන කොනාත් මේ පිළිවෙළ අනුගමනය කළා නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊයේ දවසේ පිළිවෙළට ගියේ නැහැ. ඊයේ සංවිධායකතුමා මට සමහර විට කියනවා -

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

උඩ හිටපු නමක් එක්ක යට නමක් දාලා කථාවට ආරාධනා කරන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමහර වෙලාවට විපක්ෂයේ සංවිධායකතුමා මාව දැනුවත් කරනවා පොඩ්ඩක් මෙයාට දෙන්නය කියලා කියනවා. විපක්ෂයේ සංවිධායකතුමා දැනුවත් කරනවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

එතුමා තමයි මට ඇවිල්ලා කිව්වේ, ඔබතුමා ඇයි කථා කළේ නැත්තේ කියලා. අපි බලාගෙන හිටියා ඔබතුමා කථා කරනකල් කියලා එතුමා ඇවිල්ලා කිව්වා. ඒකයි මට දැනගන්න ඕනෑ සිදු වුණේ කොතැනින්ද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සිදු වුණේ මගේ වරදකින් නම් නොවෙයි.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

කොහෙන්ද? අන්න ඒ වැරැදි තැන මට නිවැරැදි කර ගන්න කියන්න. මෙතුමා අතින් වුණා නම් -

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

අද අනෙක් අයටත් නැතුව යනවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

මෙතුමා අතින් සිදු වුණා නම් ඒක අපි කණ්ඩායම් රැස්වීමේදී විසඳ ගන්න ඕනෑ. මොකද, අද මන්ත්‍රීවරයෙක් ඉතාමත් වේදනාවෙන් මේ සභාවට ආවේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ කාලය කාගෙන්ද අඩු වෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මේක පිළිගන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ අවස්ථාවේ මම හිටියේ නැහැ. එතකොට කෙළින්ම දීලා තියෙන්නේ. මාව මේකට සම්බන්ධ කර ගන්න එපා. මම ලැයිස්තුවක් දීලා තිබෙනවා. ඒ ලැයිස්තුවේ විධියට කරන්න. කාටවත් ප්‍රශ්න ඇති නොවන ආකාරයට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊට පස්සේ මම තීරණය කළා මේ ලැයිස්තුවේ පිළිවෙළට යනවා කියලා. මේක වෙනස් කරන්නේ නැහැයි කියලා. නමුත් ඊයේ කාලයත් එක්ක පොඩි පොඩි ප්‍රශ්න ඇති වුණා. සමහර විට වෙලාසන මෙතුමා මට වෙනත් නමක් යෝජනා කළොත් මම ඒකට හා කියනවා. නමුත් ඔබතුමා කියන වෙලාවේ ඔබතුමා සභාවේ ප්‍රකාශයක් කරලා සභා ගර්භයෙන් එළියට ගියා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

මම සභාවේ ප්‍රකාශයක් කරලා ගියේ මම බලාපොරොත්තුවෙන් හිටියා පොදු සාකච්ඡාවට කථා කරන්න. ඒහෙම නැතුව ඔබතුමාට ඕනෑ වෙලාවට මාව දාන්න ගියාම මට එහෙම කථා කරන්න අවශ්‍ය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ. ඔබතුමා ඒ වෙලාවේ තමයි නැඟිටලා ගියේ. කොස්තා මන්ත්‍රීතුමාත් -

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

ඔබතුමා කිව්වා ආණ්ඩුකාරතුමාගේ වැය ශීර්ෂයේදී අවස්ථාවක් දෙන්නම් කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්නම් කියලා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

එහෙම අවශ්‍ය නැහැ. එහෙම තිබුණා නම්, ඔබතුමා පැනලා ගිහිල්ලා ඊළඟ කථිකයාට දුන්නේ කොහොමද කියලයි මට දැන ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැනලා ගියේ නැහැ. පැනලා ගියේ නැහැ.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

මේ ගිහිල්ලා තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොහේද?

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

මේ තියෙන්නේ ඔබතුමාට මේක පෙන්වන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට කථාව දුන්නේ. ඒ අවස්ථාවේ එතුමා විතරයි සභාවේ හිටියේ.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

මම හිටියා නේ? මම හිටියා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ගියා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

නැහැ, නැහැ. එතුමා කථා කරලා ඉවර වුණාට පස්සේ මම ගියේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඕකට වෙන තාක්ෂණික උත්තරයක් තිබෙනවා. ඒකට හේතුව තමයි උඩින් තව නම් දෙකක් තිබුණා. එකක් අපේ කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමාගේ නම. අනෙක් එක හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමාගේ නම. මගේ නම අන්තිමට තිබුණේ. නමුත් අවසානයේ විනාඩි 4 ½ යි ඉතුරු වෙලා තිබුණේ. ඔබතුමා අන්තිම නම කියැවුවා. අනෙක් නම් දෙක ඔබතුමාගේ අවධානයෙන් ගියා. ඒක තමයි මගේ විශ්වාසය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මට මතක හැටියට ඒ වෙලාවේ සභාවේ හිටියෙත් නැහැ.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

මම හිටියා. මම කථාවට එතුමා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මගේ නම කියන වෙලාවේ කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමා මේ සභාවේ හිටියා. හැබැයි මම පුටුවයට පත් වුණා ඇයි ඔබතුමා මගේ නම කිව්වේ කියලා. එතකොට ඔබතුමා මාව නම් කරලා ඉවරයි. අන්තිම කථාව. විනාඩි 4 ½ යි. හැබැයි, මම දන්නේ නැහැ එතැනින් එහා. සමහර විට අපේ සංවිධායකතුමා කියලා තිබුණාද කියලා මේ නම් දෙක නොවෙයි. තව එක්කෙනාටයි ඉඩ තිබුණේ. මොකද, ඒ වෙලාවේ මේ විනාඩි 4 ½ කඩන්න පුළුවන්කමක් තිබුණේ නැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, මගේ නම පස්වැනියාට තිබුණේ.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

හරි, සභාවේ කාලය අපි මීට වඩා අපතේ යවන්න ඕනෑ නැහැ. නමුත් ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි පස්සේ ගනිමු.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

නැහැ, පස්සේ ගන්න ඕනෑ නැහැ. මේක මෙතැනින් අමතක කරලා දාමු. අපට දැනගන්න ඕනෑකම තිබුණේ මේ වරද වුණේ ඔබතුමා අතින්ද කොහෙන්ද කියලා. ඒක අපේ කණ්ඩායම් රැස්වීම තුළ ගන්න ඕනෑ. අනික් එක එවැනි පූර්වාදර්ශ ඉතාමත් වැරැදියි. මොකද, මේ List එකක් දීලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

තමන්ට ඕනෑ අයට විතරක් කථා කරන්න දෙන එක වැරැදියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පස්සේ අවස්ථාව දෙන්නම්. මම ඔබතුමාට ඊයේත් අවස්ථාව දුන්නා. නමුත් හිටියේ නැහැ. මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. එතුමා සභා ගර්භයේ නැහැ. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 12 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 02.34]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, වෙලාව හරි තැන නේද මම ඉන්නේ. නැත්නම් ඒකත් උඩ පැනලාද දන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, 2016 දෙසැම්බර් 07 වැනිදා මේ වාගේම අයවැය විවාදයක් තිබෙන වෙලාවකදී, මේ වැය ශීර්ෂය ගත්තු වෙලාවේදීම අපේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශයේ එතුමා මෙන්න මෙහෙම කිව්වා.

*"2017 අයවැය ලේඛනය පිළිබඳව කථා කරන්න කලින් අගමැතිතුමා එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම පාර්ලිමේන්තුවට කැඳවලා බොහොම පැහැදිලි උපදෙසක් දුන්නා. ඉසුර දේවප්‍රිය ප්‍රධාන අමාත්‍යතුමාට 2017 බස්නාහිර පළාත් සභාවේ මුදල් ප්‍රකාශය සම්මත කර ගන්න එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ සහයෝගය දෙන්න කියලා."*

ගරු සභාපතිතුමනි, ඊට මාස 24 කට පස්සේ මේ වනකොට රටේ දේශපාලන පරිසරය සම්පූර්ණයෙන්ම උඩු යටිකුරු වෙලා තිබෙනවා. එදා අපට ඒ උපදෙස් දුන්නු අග්‍රාමාත්‍යවරයා නිල නොවන ආකාරයෙන් ව්‍යවස්ථා විරෝධීව මේ වනකොට ඉවත් කරලා තිබෙනවා. එතකොට එදා අපට ඒ උපදෙස් දුන්නේ යහපාලන ආණ්ඩුවේ පැවැත්ම නොනැසී, නොකැඩී පවත්වාගෙන යන්න. හැබැයි ඒ යහපාලනය පවත්වාගෙන යන්න උදව් කරපු අග්‍රාමාත්‍යවරයා අද අපට උපදෙස් දෙන්න නැහැ. මොකද, මේ පක්ෂයේ ඡන්ද ලක්ෂ 40 කට වඩා ප්‍රමාණයක් එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද ටික අරගෙන දීලා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාව ජනාධිපති කළේ, රනිල් වික්‍රමසිංහ මහත්තයා. එහෙම නැත්නම් එතුමාට කවදාවත් ජයග්‍රහණය කරන්න හම්බ වෙන්නේ නැහැ, එක්සත් ජාතික පක්ෂයේ ඡන්දය නැතුව. ඒ අනුව තමයි යහපාලනයක් බිහි වෙන්නේ. ඒ යහපාලනය

වෙනුවෙන් රනිල් වික්‍රමසිංහ මහත්තයා විශාල කැප කිරීමක් කළා. ඒ නිසා තමයි එදා එතුමා කිව්වේ, මොනම හේතුවක් නිසාවත් මහ ඇමැතිතුමාට විරුද්ධව ඡන්දය පාවිච්චි කරන්න එපා. මේ වෙලාවේ යහපාලනයක් තිබෙන නිසා කියලා. සමහර අමාත්‍යාංශ සම්බන්ධයෙන් අපට බරපතළ ගැටළු තිබුණා. පරාජය කළ යුතුව තිබුණා. නමුත් අපි සමහර තැන්වලදී පක්ෂයේ ඉල්ලීම පිට ආපසු හරවා ගත්තා. නමුත් අද වනකොට තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. ඒ නිසා අපි කල්පනා කරන්න ඕනෑ අද මේ වනකොට මොකක්ද ඇති වෙලා තිබෙන තත්ත්වය කියලා.

ගරු සභාපතිතුමනි, ඒ කාලයේ පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරීත්වයකුත් තිබුණේ නැහැ. පළාත් පාලන ආයතන ඔක්කෝම විසුරුවා හැරලා තිබුණේ. ඊට පස්සේ පළාත් පාලන ඡන්දය තිබ්බා. මේ ඡන්දයේදී අපි නොහිතපු විධියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් දෙකඩ වෙලා තිබුණේ. එක පැත්තකින් මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ප්‍රධාන දේශපාලන ප්‍රවාහයේ සුළුතරය බවට පත් වුණා. අනෙක් අතින් පොහොට්ටුවේ කණ්ඩායමේ බහුතරය බවට පත් වෙලා ඒ පළාත් පාලන ආයතන ටික දිනාගත්තා. හැබැයි කොහොම වෙතත් අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා දවල් කිව්වා වාගේ මොනවා වුණත්, එතුමන්ලා සන්ධානයක් හැටියට එකට මෙතැනට ආපු නිසා මහ ඇමැතිතුමා ආරක්ෂා කරමින් එගොල්ලෝ ඉදිරියට ගමන් කළා. කවර හේතුවක් නිසාද කියන එක මම කියන්න සූදානම් නැහැ. ඒකට හේතු ගණනාවක් බලපාන්න ඇති. කොහොම වෙතත් පළාත් පාලන ආයතනවල පරිපාලනය සම්බන්ධයෙන් පසුගිය කාලයේ බරපතළ ප්‍රශ්න ගණනාවක් ඇති වුණා. අපි හිතුවා මහ ඇමැතිතුමා, සියලු දෙනා සන්ධානයක් හැටියට එකට ඉන්න නිසා පළාත් පාලන ආයතනවල බලය පොහොට්ටුව අතට ගියත් මේ ආයතනවල පරිපාලනය සම්බන්ධයෙන් යම්කිසි භූමිකාවක් මහ ඇමැතිතුමාට ඉටු කරන්න පුළුවන් වෙයි කියලා.

එතුමාට එහෙම භූමිකාවක් ඉටු කරන්න පුළුවන්. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්ම එතුමාට පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් විශාල බලතල ප්‍රමාණයක් ලැබිලා තිබෙනවා. නමුත් අවාසනාවක මහත ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතනවල සභාපතිලා තියා ඒවායේ ඉන්න ලේකම්වත් අද මහ ඇමැතිතුමා කියන දේ අහන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අඩුම ගණනේ එතුමා බොහොම තර්ජනාත්මක ස්වරූපයෙන් කිව්වත් සමහර ලේකම්ලා, සභාපතිලා ඇත්ත වශයෙන්ම ඒ දේවල් කරන්නේ නැති -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක නම් බොරු සභාපතිතුමා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මගේ යාළුවා තමයි. ඒක නම් බොරු.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම හොඳම උදාහරණය කියන්නම්. 2017 මෙතුමා මට කිව්වා. මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ව්‍යාපෘති මොනවා හරි තියෙනවා නම් ගෙනත් දෙන්නය කියලා. ගරු සභාපතිතුමනි, මහ ලොකු ඒවා නොවයි, ලක්ෂ 15 ක, 20 ක පුංචි පාරවල් තුනක් මම ගිහින් දුන්නා. මේ ඔක්කෝම ප්‍රයෝජගන ගත්තු අය මගේ කථාවට බාධා කරන්න එපා. ලක්ෂ 300, 400 ගත්තු අය ඉන්නවා නේ? ඒවායේ ලැයිස්තු මම වෙනම දවසක ඉදිරිපත් කරන්නම්. එහෙම බාධා කරන්න එපා. හැබැයි ඊට පස්සේ මහ ඇමැතිතුමාට මම ඇවිල්ලා කිව්වා, මගේ ඒ යෝජනා තවම ඉටු වුණේ නැහැයි කියලා. ඊට පස්සේ මහ ඇමැතිතුමා දුරකථනයෙන් කථා කළා. එතුමා ලියුම් තුනක් යැව්වා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම බාධා කරනවා නොවෙයි. ඒක මගේ ප්‍රශ්නයක් නොවෙයි, ගරු සභාපතිතුමා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මහ ඇමැතිතුමා ලියුම් තුනක් යැව්වා. හතර සැරයක් විතර කථා කළා. ලේකම්තුමියට තුන් සැරයක් Telephone එකෙන් කථා කළා. දෙසැරයක් කථා කළේ මගේ ඉදිරිපිට.

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

හැබැයි තවමත් ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක වුණේ නැහැ ගරු සභාපතිතුමනි. මම කියන්න හදන්නේ මෙන්න මේකයි බරපතළ තත්ත්වය. ඒ අයට ඕනෑ දේවල් දැන් ඒ අය කරනවා. පළාත් පාලන ආයතනවල ලේකම්ලාට ඕනෑ දේවල් ලේකම්ලා කරනවා. සභාපතිලාට ඕනෑ දේවල් කරනවා. අපි හිතුවා පසුගිය කාලයේ මීට කලින් තිබුණු පළාත් පාලන ආයතනවල පරිපාලනයෙන් වුණු දූෂණ වෙන එකක් නැහැයි කියලා. නීති විරෝධී ගොඩ කිරීම් වන එකක් නැහැයි කියලා. වැලි හෝදන එකක් නැහැයි කියලා. නමුත් ගරු සභාපතිතුමනි, ඒ දූෂණ ටික, ඒ වංචා ටික, ඒ හොරකම් ටික ඒ විධියටම සිද්ධ වෙන්න පටන් අරන් තිබෙනවා. මහරගම නම් එතුමා කිව්වාම හඳනවා ඇති. ඒක වෙන්න පුළුවන්. මම ඒක පිළිගන්නවා. හැබැයි අනෙක් තැන්වල එහෙම වෙන්නේ නැහැ. පැහැදිලිවම මම ඒක වගකීමෙන් කියනවා ගරු සභාපතිතුමනි. ඒ වාගේම මෙතුමා විශාල බරක් දීලා තිබෙනවා, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සම්බන්ධයෙන්. අපි දන්නවා පසුගිය කාලයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට සම්මානයකුත් හම්බ වුණා. හැබැයි ගරු සභාපතිතුමනි, කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ ප්‍රශ්න තියෙනවා. මේක මීට වඩා කාර්යක්ෂමව කරන්න ඕනෑ. ගැටළු රාශියක් තියෙනවා.

විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. අපි දන්නවා, පළාත් පාලන ආයතන තමයි අවසානයේදී තමන්ගේ කුණු ටික කළමනාකරණය කර ගන්න ඕනෑ. හැබැයි අධීක්ෂණය ඇතුළු සියලු කටයුතු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට ප්‍රඥප්තියෙන් බලය දීලා තිබෙනවා. නමුත් අපට ප්‍රශ්නයක් තිබෙනවා, ඒ කටයුත්ත ඒ විධියට සිද්ධ වෙනවාද කියලා. විශේෂයෙන්ම කොම්පෝස්ට් අංගන ඉදි කිරීම, කසළ ප්‍රවාහනය, කසළ වෙන් කිරීම - ඊටත් වඩා බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා පළාත් පාලන ආයතනවලට. කසළ ටික දාගන්න ඉඩම් නැහැ. ස්ථාන නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් මීට වඩා අවධානයක් යොමු කළ යුතුයි. අපද්‍රව්‍ය කළමනාකරණයට මෙවර වැය කරලා තිබෙන්නේ, මිලියන 47 යි. ඒ මුදල් වැය කළාට මීට වඩා මුදලක් වැය කළ යුතුව තිබෙනවා. මම හිතන්නේ අපේ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාත් ඒ කාරණයත් මතු කළා. මීට වඩා මුදල් වැය කළ යුතුව තිබෙනවා. ඒ වාගේම මීට වඩා විධිමත් කාර්යක්ෂම වැඩ පිළිවෙළක් මේකට ක්‍රියාත්මක කළ යුතුයි කියලා මා බලාපොරොත්තු වෙනවා. ඉතා නිර්මාණශීලී වැඩ සටහන් අවශ්‍යයි කියලත් මා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, මීට අමතරව විශේෂයෙන්ම සංචාරක ප්‍රවර්ධනය සම්බන්ධයෙන් මෙතුමාගේ වාර්තාවේ සඳහන් වෙනවා. 2018 ව්‍යාපෘති 33 ක් සඳහා මිලියන 56 ක් වැය කරලා තිබුණා. ඉතා හොඳයි. අපි දන්නවා සංචාරක ප්‍රවර්ධනය සඳහා මෙතරම් මුදලක් වැය කළත් අපට සංචාරක ප්‍රවර්ධනයේ මහ විශාල ප්‍රගතියක් පේන්නේ නැහැ. විශේෂයෙන්ම රැකියා උත්පාදනය සඳහා මේ සංචාරක ප්‍රවර්ධනය පාවිච්චි කරන්න පුළුවන්. මේකෙන් බලාපොරොත්තු වුණු ප්‍රගතිය අත්කර ගෙන තිබෙනවාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. රැකියා උදා කිරීමට මේක දායක වුණාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම රැකියා උත්පාදනය ගැන කථා කරන කොට බස්නාහිර පළාත සතු මහ දැවැන්ත සම්පත් ප්‍රමාණයක් තිබෙනවා. භෞතික මෙන්ම මානව සම්පත නිවැරැදි පරිදි උපයෝගී කර ගන්නවාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම අපි දන්නවා. වැඩ කටයුතු කරගෙන යනකොට ප්‍රධාන ඇමැතිතුමාට ප්‍රශ්නයක් තිබෙනවා. පරිදියට පවරන ලද කාර්යයන් කේන්ද්‍රය විසින් යළි සිදු කිරීම කරනු ලැබීම අප ඉදිරියේ තිබෙන බරපතළ ප්‍රශ්නයක්. ඒක ගැටළුවක් විධියට පේන්න තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය කාලයේ කේන්ද්‍රය එක්ක කටයුතු කරන්න යනකොට මහ ඇමැතිතුමාට ගැටළුවලට මුහුණ පාන්න සිදු වුණා කියලා අපි දන්නවා. සමහර ඒවා ජය ගන්න මහ ඇමැතිතුමාට දේශපාලන ශක්තිය අවශ්‍ය වුණා. නමුත් සමහර වෙලාවලදී අපි දැක්කා. මහ ඇමැතිතුමාට දේශපාලන ශක්තිය, සහාය ලැබුණේ නැහැ, කේන්ද්‍රය විසින් එල්ලවන පීඩනය දරා ගන්න.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම නිවාස අවශ්‍යතාවය සම්බන්ධයෙන් එතුමා තමන්ගේ අයවැය ප්‍රකාශනයේ සඳහන් කළ කාරණයකට මම අවධානය යොමු කරන්න කැමැතියි. එතුමා කියලා තිබෙනවා ලක්ෂ 6 කට කුඩා නිවාස ඉදි කරන්න පුළුවන්. ලබන වර්ෂයේ නිවාස ආධාරවලට අමතරව කුඩා නිවාස සෑදීම සඳහා ප්‍රතිපාදන වෙන් කරනවා කියලා. ගරු සභාපතිතුමනි, අපි දන්නවා පසුගිය කාලයේ මධ්‍යම ආණ්ඩුවේ නිවාස ඉදි කිරීම සඳහා දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා. නමුත්

බස්නාහිර පළාතේ නිවාස සම්බන්ධයෙන් බරපතළ ගැටළුවක් තිබෙනවා. ස්ථිර නිවාස නැතුව විශාල පිරිසක් ඉන්නවා. ඒ වාගේම තමන්ගේ නිවාස ඉදි කර ගන්න විධියක් නැතුව, අලුත්වැඩියා කර ගන්න විධියක් නැතුව විශාල පිරිසක් ඉන්නවා. මම හිතන්නේ, මේ සභාවෙන් වෙන් කරන, වැය කරන මුදල ඒ කටයුතු සඳහා ප්‍රමාණවත් නැහැ. මම හිතන්නේ ගරු ප්‍රධාන ඇමතිතුමාගේ යෝජනාව ඉතාම වටිනා කාලෝචිත එකක්. අපි සියලු දෙනාටම වැදගත්. අඩු මුදලට නිවාස ඉදි කිරීම සඳහා අපට යම් පියවරක් ගන්න පුළුවන් නම්, සමානාත්මතාවය සලකලා සියලු මන්ත්‍රීවරුන්ට ඒ අවස්ථාව ලබා දෙනවා නම්, මේ පළාතේ ජනතාවට ඒකෙන් විශාල ප්‍රයෝජනයක් ලැබෙයි කියලා මා විශ්වාස කරනවා. 2018 වර්ෂයේදී විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා සුළු වාරිමාර්ග සංවර්ධනය සම්බන්ධයෙන්. ඒකත් එතුමාගේ වාර්තාවේ එක තැනක තිබෙනවා. නමුත් නිරන්තරයෙන් ජලයෙන් යට වෙන, ජලය බැස යෑමේ ගැටළු රාශියක් තිබෙන මා ජීවත් වන ප්‍රදේශයේ අවශ්‍යතා රැසක් පැවැතියා. මා ඒ සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී විවිධ ආකාරයෙන් ඉල්ලීමක් කළත්, එම කටයුත්තට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හොඳයි. ප්‍රමාණවත් ප්‍රතිචාරයක්, සහායක් ලැබුණේ නැහැ ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම මෙතුමාගේ අයවැය කථාවේ, වාර්තාවේ එක තැනක තිබෙනවා Wespro මුද්‍රණාලය. මේ මුද්‍රණාලයට මුද්‍රණ යන්ත්‍ර ලබා ගැනීම සඳහා මුදලක් වැය කළා කියලා. ඇත්ත වශයෙන්ම ගරු සභාපතිතුමනි, මේ මුද්‍රණාලය සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නයක් මෙතුමා, මෙතුමාගේ වාර්තාවේම ඒක දක්වලා තිබෙනවා. මේකට අය කරන මුදල වැඩියි. ඒ නිසා ඒ මුදල, ඒ ගණන අඩු කරන්න ඕනෑය කියලා. ඒ වාගේම මේක ඉතාමත්ම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කථාව අවසන් කරන්න. කාලය අවසන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මට අන්තිම වාක්‍ය කියන්න ඉඩ දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඒ නිසා ආදායම් වැඩි කර ගැනීම මෙන්ම රැකියා ප්‍රශ්නයට විසඳුම් සොයා ගැනීම සඳහා තමන්ට ඇති ශක්තිය හා බලය පාවිච්චි කරන ලෙසත්, ඒ මුදල් නිසි පරිදි යොදවන ලෙසත් මා ඉල්ලීමක් කරන්න කැමැතියි. ඔබ සියලු දෙනාට ස්තුතිය පුද කරනවා.

[අ.භා. 02.45]

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මම ඉතාමත්ම සතුටට පත් වෙනවා, විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ජනතාව වෙනුවෙන් 2019 වර්ෂය සඳහා ඉතාමත් සංවර්ධනාත්මක අයවැයක් ඉදිරිපත් කරන්නට ලැබීම පිළිබඳව. ඒ පිළිබඳව අපේ පළාත් සභාවේ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරු තමන්ගේ අදහස් ප්‍රකාශ කළා. සමහර අය අපි කරපු වැඩ ඒ ආකාරයෙන්ම අගය කළා. සමහර අය විවේචනය කළා. දේශපාලනයේදී අපි ගැරහුම් වාගේම නම්බු නාමත්, නින්දා ප්‍රශංසාත් ලබන්න පුරුදු වෙන්න ඕනෑ. ඒ නිසා දීර්ඝ කාලයක් දේශපාලනය කරපු කෙනෙක් හැටියට ඒ සියලු විවේචනත්, සියලු ප්‍රශංසාත් ඉතාමත් ගෞරවයෙන් පිළිගන්නා බව මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට මට මගේ අමාත්‍යාංශයට ලැබුණු පළාත් පාලනයත්, ඒ වාගේම කසළ කළමනාකරණයත්, ආර්ථික කටයුතුත්, ඒ වාගේම විදුලියත්, පරිසරයත්, ජලයත්, සංචාරක ව්‍යාපාරයත් මම ඉතා හොඳින් මට පැවරුණු කාර්යයන්, මට පැවරුණු විෂයයන් සඳහා මම ඉතාමත්ම සාධාරණයක් ඉෂ්ට කළාය කියලා මට අද සතුටු වෙන්න පුළුවන්. විශේෂයෙන්ම දෙක සහ පරිපූරක තුන යටතේ මේ පළාත් සභාවේ ඉතා විශාල වගකීමක් මා භාර ගත්තා. බිලියන 4 කට ආසන්න මුදලක් දෙසැම්බර් 31 ට ඉස්සෙල්ලා ව්‍යාපෘතිවල වටිනාකමට අනුව අපි ඒ ව්‍යාපෘති

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

නිම කරනවා කියන වගකීම අපි භාර ගත්තා. ඒ ඉලක්ක කරා අපි ළඟා වෙලා තිබෙනවා.

සමහර පළාත් සභාවලට රජය විසින් වෙන් කරන ප්‍රතිපාදන, නැවත රජයට යවන අවදියක් තුළ අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, අපට වෙන් වුණු ප්‍රතිපාදනවලින් ඉහළ අගයකට ගිහිල්ලා පළාතේ ජනතාවට සාධාරණයක් ඉෂ්ට සිද්ධ කරන්නට. ඒ සඳහා මගේ ගරු අමාත්‍ය මණ්ඩලයත්, ධූරධාරීනුත්, ඒ වාගේම අපේ පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුනුත් සියලු දෙනාම දුන්නු සහයෝගය මම ඉතාමත්ම අගය කරනවා. ගරු සභාපතිතුමනි, අපි අවුරුදු තුනක් අයවැය ඉදිරිපත් කරලා ආපු තත්ත්වය නොවෙයි අද තිබෙන්නේ. එදා මේ අයවැයට මේ පළාත් සභාවේ ජනතා විමුක්ති පෙරමුණවත් විරුද්ධ වුණේ නැහැ. නමුත් අද අපි දන්න විධියට අපේ විපක්ෂයෙන් අපට ඡන්දයක් ලැබෙන්නේ නැහැ. එදා සමහර අය විවේචනය කළා. මම කකුල් දෙක දෙපැත්තේ තියාගෙන, එක කකුලක් මහින්ද මහත්තයා ළඟ. අනෙක් කකුල මෛත්‍රීපාල සිරිසේන ළඟ තියාගෙන තමයි මහ ඇමැතිකම් කරන්නේ, දේශපාලනය කරන්නේ කියලා. අද මම ඉතා වගකීමෙන් කියනවා. මම මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු 104 දෙනාටම යම් සාධාරණයක් කරන්න පුළුවන් නම් එය කරන්න කැප වුණු, ඒ වෙනුවෙන් පෙනී හිටපු ප්‍රධාන අමාත්‍යවරයෙක්. ඒ නිසා අද මම සතුටු වෙනවා, මට එල්ල කළ චෝදනාවල ධනාත්මක පැත්ත පිළිබඳව මට අවබෝධයක් තිබෙනවා. මම දැනගෙන හිටියා උග්‍ර වාමාංශිකයෙක් හැටියට, මගේ තාත්තා දේශපාලනය ආරම්භ කළේ, ශ්‍රී ලංකා කොමිනිස්ට් පක්ෂයෙන්. ඔහු පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වුණා. මම උපතින්ම ශ්‍රී ලංකාකාරයෙක්. නමුත් අපට පළාත් පාලන මැතිවරණය ජයග්‍රහණය කරන්න පුළුවන් වුණේ, මහජන එක්සත් පෙරමුණෙන්. එහෙම නැත්නම් මගේ දේශපාලනයේ පෙකණිවැල කැපුවේ මහජන එක්සත් පෙරමුණෙන්. ඒ සභාපතිවරයා හැටියට. මහජන එක්සත් පෙරමුණෙන් දේශපාලනය පටන් ගත්තු හතර වැනි මහ ඇමැතිවරයා මම. මහ ඇමැතිවරු තුන් දෙනෙක් මහජන එක්සත් පෙරමුණෙන් දේශපාලනය ආරම්භ කරපු අය මේ රටේ පත් වෙලා තිබෙනවා. එහි හතර වැනි ස්ථානය මම. අපට මහ ඇමැතිකම් කරන්න පුළුවන් වුණේ, ලංකාවේ දේශපාලනයේ හොඳ අවස්ථාවක නොවෙයි. හිටපු මහ ඇමැතිවරුන්ට තිබුණු අවස්ථාව මට ලැබුණේ නැහැ. මම මේ මහ ඇමැති ධූරය අරගෙන ඉතාමත් දුෂ්කර ක්‍රියාක්වක් කළේ. බුලත් කොළෙන් තරග කරපු අපේම කණ්ඩායම දෙකට බෙදිලා තියෙන වෙලාවකදී ඉතාමත් අස්ථාවර වෙලාවක තමයි මම දේශපාලනය කළේ. මම සහයෝගය දෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කණ්ඩායමට හිටියේ විස්සකට වඩා අඩු මන්ත්‍රී කණ්ඩායමක්. බහුතරයක් හිටියේ පොදුජන පෙරමුණට සම්බන්ධ වෙලා. එතකොට හැම කෙනෙක්ම එදා මට සහයෝගය දුන්නා. පොදුජන පෙරමුණේ කණ්ඩායමත්, එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායමත්, ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණත්, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයත් ඇතුළු සියලු කණ්ඩායම් මට එදා සහයෝගය දුන්නා. ඒ වාගේම අපේ මුස්ලිම් ජාතීන් නියෝජනය කරන දේශපාලන පක්ෂ ඇතුළුව. නමුත් අද මම කියන්න ඕනෑ. යම් හෙයකින් මේ අයවැයේදී අපට විපක්ෂ වෙනවා නම්, ප්‍රතිපාදන වුණත් මට වෙන් කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මම හැමදාම මගේ කණ්ඩායම ආරක්ෂා කර ගත්තා. අපි පක්ෂ දෙක, දෙකට බෙදිලා හිටියත් මම හැමදාම කණ්ඩායම් දෙක ආරක්ෂා කර ගත්තා. ඒ නිසා මට සහයෝගය දෙන අයට විතරමයි මට ප්‍රතිපාදන වෙන් කරන්න පුළුවන් වෙන්නේ කියන එකත් මුදල් ඇමැතිවරයා හැටියට මම කියනවා. ඒ නිසා තමුන්නාන්සේලා දන්නවා ගරු සභාපතිතුමනි, රජයේ අයවැයෙන් අපට ආවේ පළාත් සභා මන්ත්‍රීවරයෙකුට ලක්ෂ 24 ක මුදලක්. නමුත් මම දේශපාලන කුහකයෙක් වෙන්නේ නැතුව මම පක්ෂ විපක්ෂ හැම මන්ත්‍රීවරයාටම මිලියන 5 ක් ලබා දුන්නා. මම ලක්ෂ 50 ක් ලබා දුන්නා. සමහර වෙලාවට මේ සභාවේ අපේ මන්ත්‍රීවරු මට විවේචන එල්ල කළා. අරයාට මෙපමණ දුන්නා. මෙයාට මෙපමණ දුන්නා කියලා. හැබැයි අද අපත් එක්ක එකට ඉඳලා අපව දාලා යන අය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරන්න බැරි ඇයි කියන පණිවිඩය මම මේ අවස්ථාවේදී කියනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම කියන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා සිය දේශපාලන ජීවිතයේ දුෂ්කර ක්‍රියා කරලා ගත්තු තීන්දුවක්. මේ සභාවේ මන්ත්‍රීවරු මට කිව්වා, මම යහපාලනයෙන් හදපු මහ ඇමැති කෙනෙක් කියලා. මම යහපාලනයෙන් හදපු මහ ඇමැති කෙනෙක් නොවෙයි. මම යහපාලනයේ නම් මෙතැන ඉන්න පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරුත් යහපාලනයේ වෙන්න ඕනෑ. අපි පසුගිය මැතිවරණයේ ප්‍රසන්න රණතුංග අපේ හිටපු ප්‍රධාන ඇමැතිතුමා පාර්ලිමේන්තුවට ගිය නිසා තමයි මට මේ මහ

ඇමැති ධූරය ලැබුණේ. එහෙම නැත්නම් ඔය 2015 ජනවාරි 08 වැනිදා හදපු යහපාලන මඟුලකින් නොවෙයි කියන එක මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ. මම මේ මහ ඇමැතිකම ගත්තු දවසේ ඉඳලා අද වනකල්, ගිය 26 වැනිදා වනකල් මට කොන්දක් තිබුණා කියන්න ශ්‍රී ලංකාකාරයෙක් හැටියට මේ රටේ තිබෙන මේ දේශපාලන ප්‍රශ්නයට විසඳුමක් දෙන්න පුළුවන් වෙන්නේ මහින්ද මහත්තයාත්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් එකතු වුණොත් කියන එක කියන්න. ඒක කියන්න මට කොන්දක් තිබුණා. මම කියපු දේ අද සඵල වෙලා තිබෙනවා. ඒ නිසා අද රටේ ජනතාවට අවුරුදු 3 ½ ක් දුක් වින්ද ජනතාවට අද සහන ලැබිලා තිබෙනවා. පෙට්‍රල් මිල අඩු වෙලා තිබෙනවා. ඩීසල් මිල අඩු වෙලා තිබෙනවා. බදු සහන ලැබිලා තිබෙනවා. රටේ දේශපාලනය කොයිතරම් අස්ථාවර වුණත් අතිගරු ජනාධිපතිතුමා අපේ ශ්‍රී ලාංකිකයින් අමතමින් කියපු විධියට ඉදිරි දින කිහිපය තුළදී රට ස්ථාවර කරලා ශක්තිමත් රටක්, අනාගතයක් තිබෙන රටක්, ජාතිවාදී නොවන, රණවිරුවන් ආරක්ෂා වන, දේශීය දේපළ වත්කම් ආරක්ෂා වන, රට නොවිකුණන රටක් බිහි කිරීමේ ව්‍යායාමයට බස්නාහිර පළාතේ සහයෝගය ලැබෙනවා කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරනවා ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ දන්නවා අපි කොයිතරම් වැඩ කොටසක් පසුගිය කාලයේ කළාද? විශේෂයෙන්ම හොඳම දේ දරුවන්ට කියන චින්තනය යටතේ, දරුවන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය සියලු පහසුකම් අපි පක්ෂ භේදයෙන් තොරව ඉෂ්ට කරලා තිබෙනවා. ඒ වාගේම අපි අවුරුදු 30 කට පස්සේ හිටපු ප්‍රධාන ඇමැතිතුමා, ප්‍රසන්න රණතුංග මැතිතුමා මුල්ගල තියලා ආරම්භ කරපු මෙම අගනා ගොඩනැගිල්ලේ වැඩ නිම කරලා පළාතේ සියලු ජනතාවට අද පහසුකම් සපයන ආයතනයක් බවට අපි පත් කරලා තිබෙනවා කියන එක අපි තමුන්නාන්සේට කියන්න ඕනෑ. මේ ගොඩනැගිල්ල හදන්න ගත්තු වෙලාවේ ඉඳලා පුවත්පත්වලින්, විවිධ මාධ්‍යවලින් අපට විරුද්ධව ප්‍රචාරයන් අරගෙන ගියා. ගරු සභාපතිතුමනි, ලබන අප්‍රේල් මාසේ 22 වැනිදා මධ්‍යම රාත්‍රී 12.00 ට තමුන්නාන්සේ විතරක් ඉතුරු වෙලා, අපි සියලු දෙනාම තත්පර කට්ට ඒ පැත්තට ගියාට පස්සේ අපි ඇමැතිවරු නොවෙයි. හිටපු ඇමැතිවරු බවට පත් වෙනවා. ඒ නිසා මේ ගොඩනැගිල්ලේ කිසි දෙයක් මමත්, මේ ඉන්න මන්ත්‍රී කෙනෙක්වත් අරගෙන යන්නේ නැහැ. මේක හැදුවේ මේ පළාතේ ජනතාවගේ අනාගතය වෙනුවෙන්. ඒ නිසා අද අපි සතුටු වෙනවා. ඒවායේ ගෞරවය මම තනියම ගන්නේ නැහැ. මට මේ හැම දෙයක්ම කරන්න අද වනකල් මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු හැම දෙනෙක්ම උදව් කළා. අකමැත්තෙන් වුණත් සමහර අය ප්‍රසිද්ධියේ නොකිව්වත්, අප්‍රසිද්ධියේ හරි ඒවා ප්‍රශංසා මුඛයෙන් කථා කළා. ඒ පිළිබඳව මම සතුටු වෙනවා. ඒ නිසා මට පැවරුණු, මගේ අමාත්‍යාංශවලින් කසළ කළමනාකරණයේදී අපට ගන්න පුළුවන් නිවැරදි තීන්දු අරගෙන, කසළ කළමනාකරණයේ වෙනසක් ඇති කරලා තිබෙනවා. සංචාරක ව්‍යාපාරය තුළ පුද්ගලික ආයතනයක් වශයෙන් තිබුණු අපේ සංචාරක ව්‍යාපාරය අපි අද ශක්තිමත් කරලා තිබෙනවා. අපි මේ සභා ගොඩනැගිල්ල විවෘත කරන අවස්ථාවේදී අපි විසින් ප්‍රකාශයට පත් කළ Our west කියන පොත සංචාරක වශයෙන් කොයිතරම් වැදගත් වන, පළාත තුළ තිබෙන වටිනා වස්තු සංචාරකයින්ට එක පොතකින් දැනගන්න පුළුවන් වන විධියට දේශීයව විතරක් නොවෙයි, ජාත්‍යන්තරව වටිනාකමක් තිබෙන පොතක් නිර්මාණය කරන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ විතරක් නොවෙයි. පළාත් පාලන මන්ත්‍රීවරු අපට ඉතාමත් සීමිත සංඛ්‍යාවක් හිටියේ. නමුත් අද 886 ක් වුණු ප්‍රදේශීය සභා නගර සභා මන්ත්‍රීවරු 1757 ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. අපි ඒ අයට ගුණාත්මක වටිනාකමින් යුත් වැඩ සටහනක් සංවිධානය කළා. නමුත් අපේ මන්ත්‍රීවරු කිව්වා වාගේ ඒකේ ප්‍රයෝජනය කවුරුත් ගත්තේ නැහැ.

නමුත් අද අපි දන්නවා. කසළ කළමනාකරණයේදී පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළක් මම ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ පිළිබඳව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, එතුමාගේ කථාවේදී අපට කිව්වා, Tractor සහ compactor පළාත් පාලන ආයතනවලට අරගෙන දෙන්න කියලා. මම ඉතාමත් සතුටින් කියනවා. මේ වනකොට අපි ඒ අවශ්‍ය මිලදී ගැනීම් කරන්න කටයුතු කරලා තිබෙනවා. තවත් කොටසක් මේ ඉදිරියේ තිබෙනවා. ඉදිරි ඡන්දයෙන් පස්සෙන් ඒකත් බෙදලා දෙනවා කියලා අපි කියනවා. පළාත් පාලන ආයතන ශක්තිමත් කරලා වඩාත් හිතකර පළාත තුළ නාගරික ප්‍රදේශ අලංකාර කිරීමේ ව්‍යාපෘතිත් අපි සැලසුම් කරලා තිබෙනවා. ප්‍රාදේශීය සභා සහ නගර සභා එක්ක සම්බන්ධ වෙන්න. ඒ නිසා ගරු සභාපතිතුමනි, එදා මේ අයවැය විවාදය දින හතරකට සීමා කරන්න කියලා මම කියපු වෙලාවේ, මේ සභාවේ ඇතැම් මන්ත්‍රීවරු ඒකට විරුද්ධව කථා කළා. අද

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

මේ සභාවේ මේ දින දෙකේ හිටපු මන්ත්‍රීවරුන්ට තේරුණා මම ගත්තු තීන්දුව කොයි තරම් නිවැරැදිද කියලා. ඒ නිසා අපට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ නිසා අපි දින දෙකක් ඉතුරු කර ගත්තා විතරක් නොවෙයි. මිලියන දෙකකුත් අපට ඉතුරු කර ගන්න පුළුවන් වුණා කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා. ඒ නිසා මේ අවස්ථාවේදී මම විශේෂ ස්තුතියක් කරන්න කැමැතියි. පවතින දේශපාලන අර්බුදය හමුවේ අපට කොයිතරම් ගැටළු තිබුණත් මගේ මන්ත්‍රීවරුන්ට මොන ප්‍රශ්න, මොන ගැටළු තිබුණත්, මේ අවස්ථාවේදීත් මාත් එක්ක අත්වැල් බැඳ ගැනීම පිළිබඳව මගේ ගෞරවය සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්ට පුද කරන බව ප්‍රකාශ කරමින්, තම පියාගේ දේහය තව හෝරා කිහිපයකින් ආදාහනය කරන්න කටයුතු කර තිබුණත්, ජාතිය වෙනුවෙන්, පළාතේ ජනතාවගේ අනාගතය වෙනුවෙන් මේ අවස්ථාව සම්බන්ධ වන ප්‍රදීප් පෙරේරා ගරු මන්ත්‍රීතුමාටත් මගේ ගෞරවය මම පුද කරන්න කැමැතියි. ඒ නිසා මෙතෙක් මා ආ ගමනේ මට සහයෝගය දුන්නු සියලුම දේශපාලන නායකයන්ටත්, ගරු මන්ත්‍රීවරුන්ටත්, ප්‍රධාන ලේකම්තුමා, සභා ලේකම්තුමා ඇතුළු සියලු දෙනාටත් මගේ ගෞරවය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***අ.භා. 02.59 ට, අංක 104, 109, 110, 111 හා 112 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***

*Discussion on the Expenditure Head Nos 104, 109, 110, 111 and 112 concluded at 02.59 p.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශීර්ෂ අංක 104, 109, 110, 111 හා 112 ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂය සම්බන්ධ විවාදය අවසන් වුණා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, බෙදීමක් තිබෙනවා. ඡන්දයක් විමසන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බෙදීමක් තිබෙන නිසා කරුණාකර සීනුව නාද කරන්න. ආසන වෙනස් වීම නිසා ආසනවල පොඩි ගැටළුවක් තිබෙනවා. කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා නියමිත ආසනවල වාඩි වෙන්න.

***ශීර්ෂ අංක 104 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 42 යි, වැළකුණු 02 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 104 should be approved was put and the Committee of the Whole Council was divided as 53 for, 42 against and 02 decliners.*

***ශීර්ෂ අංක 109 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 42 යි, වැළකුණු 02 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 109 should be approved was put and the Committee of the Whole Council was divided as 53 for, 42 against and 02 decliners.*

***ශීර්ෂ අංක 110 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 42 යි, වැළකුණු 02 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 110 should be approved was put and the Committee of the Whole Council was divided as 53 for, 42 against and 02 decliners.*

***ශීර්ෂ අංක 111 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 42 යි, වැළකුණු 02 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 111 should be approved was put and the Committee of the Whole Council was divided as 53 for, 42 against and 02 decliners.*

***ශීර්ෂ අංක 112 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 42 යි, වැළකුණු 02 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 112 should be approved was put and the Committee of the Whole Council was divided as 53 for, 42 against and 02 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ශීර්ෂ අංක 104, 109, 110, 111 හා 112 ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂය පිළිබඳව සභාවේ බෙදීමක් ඇති වුණා නිසා ඡන්දය විමසීමේදී ඉහත වැය ශීර්ෂය වැඩි ඡන්ද 11 කින් සභා සම්මත වූ බව මේ අවස්ථාවේදී සභාවට දැනුම් දෙනවා.

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 106** | **-** | **කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 117** | **-** | **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 118** | **-** | **ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 119** | **-** | **වාරිමාර්ග දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 120** | **-** | **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** |
| Head No 106 | - | Ministry of Agriculture, Land, Irrigation, Fisheries, Animal Production and Health and Agrarian Development |
| Head No 117 | - | Department of Agriculture |
| Head No 118 | - | Land Commissioner's Department |
| Head No 119 | - | Department of Irrigation |
| Head No 120 | - | Department of Animal Production and Health |

*[සංකේත කපා හැරීම ]*
*[Symbolic write-off]*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, "*ශීර්ෂ අංක 106, 117, 118, 119 හා 120 කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන්ගෙන් රුපියල් 10/- ක සංකේත මුදලක් අඩු කළ යුතු යැයි*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදය ආරම්භ කරමින් සාකච්ඡාවට සම්බන්ධ වීමට චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

*[නැඟී සිටියේය. ]*
*[Stood.]*

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, 37 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඊයේ දිනයේ පොදු සාකච්ඡාවට කථා කිරීමට අපේ නම් ලැයිස්තුවක් දීලා තිබුණා. ගරු සභාපතිතුමනි, මේක ඔබතුමාට අදාළ ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව් කියන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මට වුණු අගතියක් පිළිබඳව කථා කරන්නේ. ඊයේ දිනයේදී ඔබතුමාට දීලා තිබුණු ලැයිස්තුවෙන් මට පිටපතක් හම්බ වෙලා තිබුණා. අපේ විපක්ෂයේ නම් ලැයිස්තුවේ නව වැනි ස්ථානයට මගේ නම තිබුණේ. හැබැයි මම දවසම ගත කරගෙන මගේ ස්ථානය බලාපොරොත්තුවෙන් ඉන්න කොට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා මගේ පිටුපසින් හිටියේ. එතුමාගේ කථාව මට කලින් වැටුණා. මම අද එන්නේ නැතුව ඉන්න හැදුවේ. විපක්ෂයේ හැම දේකටම සහභාගී වෙලා අපට මෙහෙම කරන කොට අපට වේදනාවක් තියෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් මම අහන්නේ දැනුවත් වීම උදෙසා. කිඳෙල්පිටිය මැතිතුමාගෙන් ඇහුවාම එතුමා කිව්වා සභාපතිතුමා තමයි ඒ නම උඩින් දාලා එතුමාට ඒ අවස්ථාව දුන්නේ කියලා. මම අහන්න කැමැතියි. ඔබතුමාගේ අභිමතය පරිදිද ඒ නම වෙනස් කරලා උඩ යට මාරු කළේ? එහෙම නැත්නම් අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා දුන්නු ලැයිස්තුවටද

[ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා]

ඔබතුමා ගියේ? එහෙම නැත්නම් කිඳෙල්පිටිය මැතිතුමාගේ අවශ්‍යතාවයටද වෙනස් කළේ? එහෙම කරන්න එපා. ඔබතුමා වගකීමක් දරන ගරු සභාපතිවරයෙක් වශයෙන්. ඒ ලැයිස්තුව දැන් ඔබතුමා සතුව තිබෙනවා නම්, ප්‍රකාශයක් කරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ලැයිස්තුව නම් මගේ ළඟ නැහැ ගරු මන්ත්‍රීතුමා. ඇත්ත වශයෙන්ම ඒක සිද්ධ වුණේ අවසාන මොහොතේදී. ඔබතුමාත් හිටියා. ඊළඟට අපේ පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමාත් හිටියා. ඊට පස්සේ මම බලන කොට ඔබතුමා සභා ගර්භයෙන් පිට වෙලා ගියා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, ඒ ගියේ හිතේ ඇති වුණු වේදනාවට. මොකද, මම ඉන්න කොට මගේ නම නැතුව වෙන අයගේ නම් කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පස්සේ නම කිව්වේ ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා හිටියෙත් නැහැ. පස්සේ පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමාගෙන් ඇහුවා විනාඩි 03 ක් දෙන්නද කියලා. එතුමා ඉතාම සද්භාවයෙන් කිව්වා අවශ්‍ය නැහැ කියලා. ඊට පස්සේ කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා හිටියේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඔබතුමා මම කියන දේ තේරුම් ගත්තේ නැහැ. මේ ප්‍රශ්නය විසඳ ගන්න ඕනෑ. මොකද, මේ සභාවේ වැඩ කටයුතු කරන කොට විනිවිදව තිබෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතා මතා එහෙම කරන්නේ නැහැ. මට උවමනාවක් නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

දැන් අපි අපි හැප්පෙනවා නේ? කිඳෙල්පිටිය මැතිතුමායි ජෝර්ජුයි හැප්පෙනවා. ඔබතුමාගේ කණ්ණාඩිය පේන්නේ නැත්නම් හොඳ කණ්ණාඩි යුගලයක් අරගෙන බලලා මේක මෙහෙයවන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

හැමදාම හැප්පෙනවා නේ?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපි එහෙම හැප්පුණේ නැහැ. අපි හැමෝටම උදව් කරනවා. ගරු සභාපතිතුමනි, ඒක ඔබතුමාගෙන් වුණු අතපසුවීමක් නම් මට ප්‍රකාශයක් කරන්න, ඔබතුමාගේ අතින් සිදු වුණු සිදුවීමක් කියලා. එතකොට අපේ ඉන්න විපක්ෂයේ ප්‍රධාන සංවිධායකයි, කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමයි එක්ක හැප්පෙන එක අපි නවත්වනවා. එහෙම නැත්නම් අපි මේක විසඳගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පසුගිය විවාදයේදී කථික ලැයිස්තු වෙනස් කිරීම් සිදු වුණා. විපක්ෂයේ සංවිධායකතුමා කියනවා මෙයාට අවස්ථාව දෙන්න. මෙයා පොඩ්ඩක් උඩට දාන්න. අපි ඒ දේ කළා. ආණ්ඩු පක්ෂයෙත් ඒ වාගේ කථා කරලා එහේට මෙහේට දාගත්තා. ඊට පස්සේ අවසාන මොහොතේදී ඔබතුමා යම්කිසි කලකිරීමකින් තමයි එළියට ගියේ. එහෙම ගියා කියන එක මම දන්නවා. පස්සේ කථික ලැයිස්තුව අනුව සභා ගර්භයේ හිටියේ, අපේ පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමයි, කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමයි විතරයි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

පසු සිදුවීම් ඕනෑ නැහැ. මම අහන්නේ කිඳෙල්පිටිය මැතිතුමාගේ කථාව පටන් ගන්න කොට මගේ නම ඊට උඩින් තිබ්බාද නැද්ද කියන එකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උඩින් තිබ්බා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඇයි එහෙම නම් ඔබතුමා මට ඒ අවස්ථාව නොදුන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒ වෙලාවේ හිටියේ නැහැ නේ? හිටියේ නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

නැහැ. මම හිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා හිටියේ නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මම හිටියා. වීඩියෝ දර්ශන අරගෙන බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, ඒ වෙලාවේ ඔබතුමා එළියේ හිටියේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, ඔබතුමා ඒක නිවැරැදි කර ගන්න. බස්නාහිර පළාත් සභාවේ නාමයෙන් ඉල්ලනවා. අපි අතින් වැරැදි සිද්ධ වෙනවා. ඔබතුමාගෙන් වරදක් වුණා නම්, හෙට වීඩියෝ දර්ශන බලලා නිවැරැදි කර ගන්න. නැත්නම් සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා එක්කයි, ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමයි එක්ක අපි හැපේපෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැප්පෙන්න අවශ්‍ය නැහැ. මම පොඩ්ඩක් බලන්නම් මගේ අතින් වැරැද්දක් වෙලා තිබෙනවාද කියලා. මම වැරැද්දක් වෙලා තිබෙනවා නම් පිළිගන්නවා. මගේ අතින් වැරැද්දක් වුණා නම් මම වැරැද්ද පිළිගන්නවා. මම හොයලා බලන්නම් මොකක්ද වුණේ කියලා. මට මතක හැටියට ඒ මොහොතේ ඔබතුමා සභා ගර්භයේ හිටියේ නැහැ. ඒකයි මම රාම් මන්ත්‍රීතුමාට කථා කළේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මෙතරම් දුක මොකද දන්නවාද? පක්ෂ විපක්ෂ හැම දේකටම අපි දර දිය ඇදලා, හැම දේකටම සහභාගී වෙලා දායකත්වයක් දක්වන කොට, අපට දෙන්නේ අන්තිමට. කුඩම්මාගේ සැලකිලි. ඒකෙත් අපේ නම එන්න එන්න කපලා දානවා නම් මට දැනගන්න ඕනෑ මේගොල්ලො Purposely කළාද? නැත්නම් ඔබතුමාගේ අතින් අඩුපාඩුවක් සිදු වුණාද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ සභා කටයුතු කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක් නේ ඔබතුමා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඒ නිසා තමයි බොහොම වේදනා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක හිතා මතා කරපු දෙයක් නොවෙයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, සමාවෙන්න. මගේ වරප්‍රසාද කඩ වෙනවා ඔය වැඩෙන්. මට ඔබතුමා එක උත්තරයක් දෙන්න. මම හරි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ජෝර්ජ් පෙරේරා මැතිතුමා හරි කිව්වාද මගේ නම උඩට දාන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ. කිව්වේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ආ ... හරි. මේකෙන් මාව නිදහස් කරන්න. මම අසරණයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, ඔය ප්‍රශ්නය ඇති වුණේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. වැරැද්දක් වුණා නම් මම වැරැද්ද පිළිගන්නවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, සමාවෙන්න. මම සභානායක හැටියට කියන්නේ. මේ සභාවේ කාලය යනවා. ඒ නිසා ඔබතුමා මේක විවාදයක් බවට පත් කරන්න එපා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභානායකතුමා, මීට වැඩිය කාලය කෑවා වෙන වෙන Gossip වැඩවලට. මේ වැදගත් මාතෘකාවක් අපි කථා කරන්නේ. මේවා වැරැදි පූර්වාදර්ශ වෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

සභාපතිලා දෙතුන් දෙනෙක් නැහැ නේ? පොඩ්ඩක් ඉන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඔයිට වැඩිය ජරා Gossip කථා කළා, ඊයේ දිනයේ පැය ගණන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

තව සභාපතිලා ඕනැ නැහැ. පණ්ඩිත වෙන්නේ නැතුව පොඩ්ඩක් ඉන්න කෝ?

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

පණ්ඩිත?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අර ඉන්නේ සභාපති. හැමදේටම පනින්නේ නැතුව පොඩ්ඩක් ඉන්න කෝ? දන්නවා කියලා පණ්ඩිතයා වෙන්නේ නැතුව ඉන්න කෝ? ගරු සභාපතිතුමනි, වැරැද්ද වුණේ ඊයේ මගේ නම කථික ලැයිස්තුවේ තිබුණේ නැහැ. මම ඇවිල්ලා ඉල්ලීමක් කළාට පස්සේ ඒ කථික ලැයිස්තුවට මගේ නම එකතු වුණා. ඒ නිසා තමයි මේ වැරැද්ද සිද්ධ වුණේ. මම කථික ලැයිස්තුවේ හිටියේ නැහැ. මේ ඔක්කෝටම කලින් උඩට එකතු වුණා. ඒ එකතු වුණු වැරැද්ද ඇති වුණේ, මම නිසා. ඒ නිසා සුසිල්වත්, එහෙම නැත්නම් ජෝර්ජ් පෙරේරා මන්ත්‍රීතුමාවත්, ඔබතුමා අතින්වත් වුණු වැරැද්දක් නොවෙයි. මගේ නම මේ ලැයිස්තුවේ නොතිබිලා, ඊයේ එකතු වුණා මම ආවට පස්සේ. ඒ වැරැද්ද කාගෙන්වත් වුණු දෙයක් නොවෙයි. පණ්ඩිතයා වෙලා හැම එකකටම පනින්න එපා. එක සභාපතිතුමයි ඉන්නේ. අර ඉන්නේ ඒ සභාපති. පනින්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

පනින්න වඳුරෝ කියලා හිතුවාද? බොරුවට නඩුවලට පෙනී හිටලා -

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. එය නිවැරැදි කිරීම සම්බන්ධව. මම කාවවත් අපහසුතාවයට පත් කරන්නේ නැහැ. උදේ වරුවේ ලේඛනයේ පොඩි පොඩි වෙනස් කිරීම් සිද්ධ වුණා. දෙපැත්තෙන්ම සිදු වුණා. ඒ නිසා යම්කිසි වැරැද්දක් මගෙන් සිද්ධ වුණා නම් මම ඒකත් පිළිගන්නවා. හරි චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථා කරන්න.

[අ.භා. 03.13]

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ඉතාමත් වැදගත් ඒ වාගේම ඉතාමත් අත්‍යවශ්‍ය අමාත්‍යාංශයක වැය ශීර්ෂ විවාද වන අවස්ථාවේ ඒ සඳහා කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. අද මේ මොහොත වන විට රට ඉතාමත් අස්ථාවර තත්ත්වයකට පත් වෙලා, ඒ වාගේම ව්‍යවස්ථාදායකය අධිකරණය කියන දෙකම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ඉතාමත් දැඩි උත්සාහයක යෙදෙන අවස්ථාවක තමයි මේ බස්නාහිර පළාත් සභාවේ අයවැය විවාදය සිද්ධ වෙන්නේ. විශේෂයෙන්ම මේ පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳව හොඳ වියදමක් කරපු ලස්සන පොතක් මේ වනකොට මුද්‍රණය කරලා තිබෙනවා. එහි අන්තර්ගතය ගැන බලන කොට නම් අපට ඉතාමත් කනගාටුදායක තත්ත්වයක් තිබෙනවා. විශේෂයෙන්ම මේ රටේ ජනගහනයෙන් ලක්ෂ 59 ක් ජීවත් වෙන්නේ බස්නාහිර පළාත තුළ. රටේ මුළු ජනගහනයෙන් 28% ක් ජීවත් වෙන්නේ මේ කොළඹ, කළුතර හා ගම්පහ කියන දිස්ත්‍රික්කවල.

ඒ වාගේම මේ ප්‍රදේශය තුළ විශේෂයෙන්ම කෘෂිකර්මාන්තයේ යෙදී සිටින පවුල් විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒ වාගේම ජාතික ආහාර නිෂ්පාදනය සඳහා එහෙම නැත්නම් පරිභෝජනය සඳහා විශාල පවුල් සංඛ්‍යාවකට, ඒ ආහාර පරිභෝජනය සිද්ධ කළ යුතු පළාතක තමයි අපි ජීවත් වෙන්නේ. ඉතින් මේ වාගේ පළාතක කෘෂිකර්මාන්තය වෙනුවෙන් වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 450 ක් කියලා තමයි මට දැනගන්න පුළුවන්කම ලැබුණේ. මම දකින ආකාරයට ප්‍රථමයෙන්ම කියනවා. මේ මුදල් ප්‍රමාණය කොහෙත්ම ප්‍රමාණවත් වෙන්නේ නැහැයි කියන එක. විශේෂයෙන්ම අපි නොයෙකුත් අවස්ථාවල කථා කරලා, අමාත්‍යාංශ උපදේශක කාරක සභාව තුළ මේ පළාතේ කෘෂිකර්මාන්තය වෙනුවෙන් නොයෙකුත් වැඩ සටහන් ගැන අපි කථා කරනවා. ඒ වාගේම මේ පළාත් සභාව තුළ මම දකින ආකාරයට අමාත්‍යාංශ පහක් තිබෙනවා. ඒ අමාත්‍යාංශ පහක උපදේශක කාරක සභා රැස්වීම් පැවැත් වෙනවා නම්, ක්‍රමානුකූලව පැවැත්වෙන්නේ මේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ පමණයි කියන එක මේ සභාව නියෝජනය කරන මහජන නියෝජිතයෝ 104 දෙනාම දන්න කාරණයක් බවට පත් වෙලා තිබෙනවා. ඉතින් මේ වාගේ තත්ත්වයක් උඩ මම ඉතාම කනගාටු වෙනවා, මෙපමණ මුදල් ප්‍රමාණයක් භාවිතා කරන පළාත් සභාවක් තුළ ප්‍රතිශතයක් හැටියට ගත්තොත් ඉතාමත් අඩු ප්‍රතිශතයක් තමයි කෘෂිකර්මාන්තයට වෙන් කරලා තිබෙන්නේ. ඒ වාගේම අපි කොපමණ කථා කළත්, අපි හයවැනි පළාත් සභාවේ අවසන් අයවැය ලේඛනයට ඇවිල්ලා තිබෙන්නේ. මේ ලේඛනය තුළ මේ දක්වා අපට කියලා නිෂ්පාදනයක් ඇති කර ගන්න, අපට බැරි වෙලා තිබෙනවා. අපි හැමදාම දේශීය කෘෂිකර්මාන්තය ගැන කථා කළා.

ඒ වාගේම ස්වභාවික පොහොර භාවිතා කරමින්, කොම්පෝස්ට් පොහොර භාවිතා කරමින් අපේ ජනතාවගේ ශරීර සෞඛ්‍යයට හිතකර ආකාරයේ නිෂ්පාදන ඇති කරන්න, අපි නොයෙකුත් අවස්ථාවල කථා කරලා තිබෙනවා. නමුත් ඒ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවාද කියන එක පිළිබඳව මේ අයවැය තුළ අපට පේන්නේ නැහැ. අදට මේ මොහොත දක්වා අපේ පළාතේ දිස්ත්‍රික්ක තුන දිහා බැලුවාම අපට තවමත් අපේ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කර ගන්න, ඒවා සංවර්ධනය කර ගන්න ස්ථිර වැඩ පිළිවෙළකට යන්න බැරි වෙලා තිබෙනවා. ඇළ මාර්ග විතරක් නොවෙයි. වැව් ප්‍රතිසංස්කරණය. නව අමුණු ඉදි කිරීම. අමුණු ප්‍රතිසංස්කරණය. පැති බැමි. ඇළ මාර්ග නඩත්තු කිරීම් ආදී මේ සියල්ලක් අපට ඒ ගොවිජනතාවට දැනෙන ආකාරයෙන් අවශ්‍යතාවය අනුව ඉෂ්ට සිද්ධ කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඉතින් මේක මම දකින්නේ, ඉතාමත් අසතුටුදායක තත්ත්වයක්. කනගාටුදායක තත්ත්වයක්. මේ පළාත් සභාව හැමදාම මේ විධියට කථා කරලා අපි මෙහෙම ක්‍රියාත්මක කරලා හරි යන්නේ නැහැ. මොකද, පළාතක් හැටියට අපට ජාතික වැඩ පිළිවෙළක්, එහෙම නැත්නම් පළාත තුළ වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. මට මතකයි. දැන් මාස හයකට ඉස්සෙල්ලා උපදේශක කාරක සභාවේදී මම ඉල්ලීමක් කළා. මොකද, අපට ස්වභාවික විපත් කිහිපයකට පසුගිය කාල සීමාව තුළ මුහුණ දෙන්න සිද්ධ වුණා. විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කය හැටියට අපට දැඩි ලෙස ජල ගැල්මකට මුහුණ දෙන්න වුණා. මේ වෙලාවේදී ඇළ වේලි ගණනාවක් විනාශ වුණා. මේ ඇළ වේලි විනාශ වීම සම්බන්ධව මම ඉල්ලීමක් කළා. මේවා හදන්න විශාල මුදල් ප්‍රමාණයක් ඕනෑ. එහෙම නම් අපට අවශ්‍ය උපකරණ ටික ලබා දුන්නොත් අපට මේක කරන්න පුළුවන් කියලා. මම යෝජනාවක් හැටියට ගෙන

[ගරු චන්ද්‍රසෝම සරණලාල්]

ආවා හැම ගොවිජන සේවා කාර්යාලයකටම එක ස්කැවේටර් යන්ත්‍රයක් ලබා දෙන්න කියලා. නමුත් කියන්න කනගාටුයි, මම දන්න හැටියට මගේ සොයා බැලීම තුළ මේ දක්වා ඒ වාගේ මිලදී ගැනීමක් සිද්ධ වෙලා නැහැ. ඉතින් මේ වනකොට විශාල වශයෙන් අපේ ප්‍රදේශය තුළ, විශේෂයෙන් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මේ අකරතැබ්බයට අපේ ගොවි ජනතාව මුහුණ දීලා තිබෙනවා. විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල කියන්නේ, මේ රටේ වැඩිම ග්‍රාම නිලධාරී කොට්ඨාශ තිබෙන එකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අත්තනගල්ලයි. ග්‍රාම සේවක වසම් 151 ක් තිබෙනවා. ඉතින් මේ කොට්ඨාශය තුළ මෙහෙම නම් මම හිතන්නේ අනෙක් දිස්ත්‍රික්ක තුන තුළත් මේ තත්ත්වය පවතින්න පුළුවන්. ඒ නිසා ක්‍රමවත් වැඩ පිළිවෙළකට අපි යන්න ඕනෑ. මේ ජනතාව වෙනුවෙන්. ඒ වාගේම පසුගිය දවස්වල අපට පුළුවන්කම ලැබුණා, ගම් පෙරළිය වැඩ සටහන මේ රට තුළ ක්‍රියාත්මක කරන්න. මේ ගම්පෙරළිය තුළ රුපියල් මිලියන 200 ක මුදල් ප්‍රමාණයක් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ගෙනැල්ලා තිබුණා. එතැනදී මේ කටයුත්ත - මොකද, පළාත් සභාවට ඉදිරිපත් කරලා, මේ ඇළවේලි සකස් කිරීම, ඒ වාගේම ට්‍රැක්ටර් පැන්නුම් ඒ වාගේම වැව් අමුණු ප්‍රතිසංස්කරණ කටයුතු අපට ක්‍රියාත්මක කරන්න බැරි නිසා මම ගම්පෙරළිය තුළින් විශාල මුදල් ප්‍රමාණයක් මේ සඳහා වෙන් කළා. අද කියන්න කනගාටුයි. මේ කුමන්ත්‍රණකාරී ක්‍රියාකාරීත්වය තුළ අද මේ සියලුම සංවර්ධන ව්‍යාපෘති නැවතිලා තිබෙනවා.

සමස්තයක් හැටියට ගත්තොත් මේ වනකොට මට පුළුවන්කම ලැබුණා විශේෂයෙන්ම අපේ හිටපු ජනාධිපතිතුමිය, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියටත්, මටත් අපි දෙන්නාට එකතු වෙලා අත්තනගල්ලට රුපියල් මිලියන 500 ක මුදල් ප්‍රමාණයක් ගෙන එන්න. විශේෂයෙන්ම ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් හා ගම්පෙරළිය තුළින්. නමුත් ගරු සභාපතිතුමනි, කියන්න කනගාටුයි. මේ කෘෂිකර්මාන්තය වෙනුවෙන් ඇළවේළි සකස් කිරීම, වැව් සකස් කිරීම, අමුණු සකස් කිරීම සඳහා ඒ වෙන් කරපු මුදල්වලින් එක රුපියලක මුදලක් මේ වනකොට ප්‍රයෝජනයට ගන්න බැරි වෙලා තිබෙනවා. ඇයි කියලා මම මේ ගැන සොයා බැලුවා. මේ ඇළවේලි සකස් කරන්න, මේ අමුණු හදන්න, මේ වැව් හදන්න වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අවශ්‍ය නිලධාරීන් නැති කමක් තිබෙනවා. හිඟ කමක් තිබෙනවා. මේ නිසා මේ ව්‍යාපෘති නැවතිලා තිබෙනවා. අද මේ වනකොට මේ රටේ කිසිම රාජ්‍ය නිලධාරීයෙක් තමුන්ගේ වගකීම ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒක තමයි අද රටේ තිබෙන අස්ථාවර තත්ත්වය. මේක ඉතාමත්ම අවාසනාවන්ත, ශෝචනීය තත්ත්වයක් කියලා මම මේ අවස්ථාවේදී මතක් කරනවා. එහෙමනම් අපි මේ කොපමණ දේවල් කථා කළත් මේ අවුරුද්ද තුළ මම හිතන්නේ, අපට මීට එහා ගමනක් යන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. අද මේ ඉදිරිපත් කරන්නේ, 2019 වර්ෂය සඳහා අයවැය. මේ අයවැය තුළ මේ තිබෙන ගණන්, මේ තිබෙන ඉලක්කම් මම හිතන්නේ මේවාට පමණක් අපට සීමා කරන්න වෙයි. අද මේ තිබෙන අර්බුදකාරී තත්ත්වය මත මේක ඉතාමත් කෙටි කාලයක් තුළ අවසන් කරගන්න බැරි වුණොත්, අපට මීට වැඩිය අයහපත් ප්‍රතිඵලවලට ඉදිරියේදී මුහුණ දෙන්න වෙයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම අපි හැමදාම කථා කරපු පුරන් කුඹුරු ගැනත් කථා කරන්න තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

විපක්ෂයේ සංවිධායකතුමා, තව විනාඩි තුනක් මට දෙන්න බැරිද? විපක්ෂයේ සංවිධායකතුමා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

විනාඩි තුනක් දෙන්න.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

අපි හැමදාම කථා කරනවා පුරන් කුඹුරු වගා කිරීම ගැන. මේ සඳහා පළාත් සභාව හැටියට අපට පැහැදිලි වැඩ පිළිවෙළක් නැහැ. අද අපි දන්නවා මේ රටේ කෘෂිකර්මාන්තය සඳහා ඒ අවශ්‍ය වල්නාශක, ඒ වාගේම රසායනික පොහොර යෙදීම නිසා අපේ ශරීර සෞඛ්‍යයට මොන වාගේ අහිතකර තත්ත්වයක්ද ඇති වෙලා තිබෙන්නේ

කියන එක පිළිබඳව. අද දිනයේ මේ මොහොත වන විට වල්නාශක තහනම් කිරීමක් වෙළඳ පොළේ සිද්ධ වෙලා තිබෙනවා. වල් නාශක නොමැතිකම. මම හිතන්නේ, මෙය මේ පොතෙත් ඇතුළත් කරලා තිබෙනවා. මේ ප්‍රකාශනය තුළ, විශේෂයෙන්ම පුරන් කුඹුරු වගා කිරීම පිළිබඳව නම් මෙතැන පැහැදිලිව කියලා නැහැ. මොකද, මේ ගොවියන්ට තිබෙන ප්‍රධාන ගැටලුව තමයි අධික මිල ගණනක් යටතේ මේ වල්නාශක මිලදී ගැනීමට සිදුවීම. වල් නාශක අද වෙළඳ පොළේ අධික මිල ගණනක් බවට පත් වෙලා තිබෙනවා. මේ මිල ගණන් යටතේ මේ කෘෂිකර්මාන්තය සඳහා මේ වල් නාශක ලබා ගත්තොත් මේ අයට කෘෂිකර්මය ඉදිරියට කරගන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මම විශේෂයෙන්ම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. අපි අවංකවම කෘෂිකර්මාන්තය වෙනුවෙන් යම් දෙයක් කරන්න බලාපොරොත්තු වෙනවා නම්, අඩුම ගණනේ මේ වල්නාශක ටික ඉවත් කර දීමේ වැඩ පිළිවෙළකට අපි යන්න ඕනෑ. එහෙම නැත්නම් මේවා පොතට සීමා වීමේ කටයුත්තක් තමයි වෙන්නේ. මේ ගැන අවධානය යොමු කරන්නය කියලා ඉල්ලමින්, ඇත්ත වශයෙන්ම කථා කරනවා නම් මේ රසායනික පොහොරවලින් තොරව කාබනික පොහොර යොදලා දෙන එළවළු, ඒ වාගේම වී වාගේ කෘෂිකාර්මික දේවල් මිලදී ගැනීම සඳහා ඉතාම ලොකු ප්‍රවණතාවයක් තිබෙනවා. නමුත් අපේ පළාත තුළ, විශේෂයෙන්ම කොළඹ, ගම්පහ සහ කළුතර කියන මේ දිස්ත්‍රික්ක තුන තුළ මේ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් මේ වනතුරු තවමත් ආරම්භ වෙලා නැහැ. මේ පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. ඒ වාගේ කෘෂිකර්මාන්තය කළත්, ඒ අයට වෙළඳ පොළක් නොමැතිවීම තුළ ඉදිරියට යෑමට හැකියාවක් නැති වෙලා තිබෙනවා.

ඒ වාගේම මේ කෘෂිකර්ම දේවල් ගන්න බලාපොරොත්තුවෙන් ඉන්න පාරිභෝගිකයන්ට වෙළඳ පොළක් නැති වෙලා තිබෙනවා. අපි මේ ගැන උපදේශක කාරක සභාවේදී කථා කරලා තිබෙනවා. මම දකින ආකාරයට ඒවා කථාවට පමණක් සීමා වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන්නය කියලා ඉල්ලමින්, මට වැඩිපුර කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින්, ඒ වාගේම අද මේ රටම පත් වෙලා තිබෙන අස්ථාවර තත්ත්වයෙන් රට නැවත බේරාගන්න, විශේෂයෙන්ම වර්තමාන රජයේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද ස්වාමීන් වහන්සේට විනාඩි 11 ක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 03.26]

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවර අයවැය විවාදයේදී කෘෂිකර්ම, ඉඩම්, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට සහභාගි වෙන්න අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම එම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මේ අවස්ථාවට සම්බන්ධ වෙන්න ඉඩකඩ සැලසීම පිළිබඳව මම බෙහෙවින් සතුටු වෙනවා. රටේ කෘෂිකර්මාන්තය අංශ කිහිපයකින්ම අපට වැදගත් වෙනවා. රටේ වැඩිම ජනගහනය ජීවත්වන ප්‍රදේශය හැටියට බස්නාහිර පළාත ගත්තාම මේ පළාතේ ජනතාවගේ ආහාර ප්‍රශ්න විසඳීම සඳහා සෘජුවම මේ අමාත්‍යාංශයේ ක්‍රියාකාරීත්වය බලපානවා. ඒ වාගේම තමයි වර්තමානය දිහා බලන කොට සෞඛ්‍යය අමාත්‍යාංශයට වාගේම මේ ප්‍රාදේශයේ ජීවත්වන ජනගහනය නිරෝගී පරපුරක් හැටියට පවත්වාගෙන යෑමටත් මේ අමාත්‍යාංශයට සුවිශාල වගකීමක් පැවරෙනවා කියන එක මම මුලින්ම සඳහන් කරන්න ඕනෑ. මොකද වස විෂ කාලා අද හුඟක් දෙනෙකුගේ ජීවිත ඉතාමත්ම අවදානම් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා නිරෝගී පරපුරක්

[ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි]

ඇති කරන්න මේ අමාත්‍යාංශයටත් සෞඛ්‍ය අමාත්‍යාංශයට වාගේම සුවිශාල වගකීමක් පැවරෙනවා.

එහෙම වුණත්, මම මුලින්ම කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. 2018 වර්ෂයට සාපේක්ෂව මේ වර්ෂයේ අපේ අමාත්‍යාංශයට වෙන් වෙලා තිබෙන මුදල සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වෙලා තිබීම පිළිබඳව. විශේෂයෙන්ම කෘෂිකර්මයට 2018 වසරේ මිලියන 244.20 ක් වෙන් වුණු වෙලාවේ මේ අවස්ථාවේ මිලියන 161 යි. පැහැදිලි ලෙසම මිලියන 83 ක අඩු වීමක් තිබෙනවා. ඒ වාගේම වාරිමාර්ග ක්ෂේත්‍රයත් එහෙමයි. 2018 වර්ෂයට සාපේක්ෂව මිලියන 15 ක අඩු වීමක් තිබෙනවා. ඒ වාගේම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය අංශයටත් පසුගිය වසරට සාපේක්ෂව මිලියන 96 ක තරම් අඩු වීමක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා සමස්තයක් වශයෙන් ගත්තාම සැලකිය යුතු අඩුවීමක්. 2018 වසරට සාපේක්ෂව 2019 ට මේ අමාත්‍යාංශයට වෙන් වෙලා තිබෙන මුදල්වලින් වැඩි ප්‍රමාණයක් කප්පාදු වෙලා තිබෙනවා කියන කාරණය මතක් කරන්නට ඕනෑ. ඉතාම කනගාටුවෙන් තමයි ඒ කාරණය සිහිපත් කරන්න වෙලා තිබෙන්නේ.

කොහොම වුණත් මම සන්තෝෂ වෙනවා. මේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවටත් සම්බන්ධ වෙලා, ඇමතිතුමාත් එක්කත් සම්බන්ධ වෙලා අපේ ප්‍රදේශවලට සැලකිය යුතු වැඩ කොටසක් මේ අමාත්‍යාංශය හරහා කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. මේ අමාත්‍යාංශය තුළින් ගත වුණු කාලපරිච්ඡේදය තුළ, විශේෂයෙන් 2018 වර්ෂයේදී සිද්ධ කරපු වැඩ කටයුතු කිහිපයක් පිළිබඳව, සමහර ඒවායේ යම් අඩුපාඩුකම් තිබුණත් මම ඒ පිළිබඳව දැනුවත් කරන්න බලාපොරොත්තු වෙනවා. ප්‍රධාන වශයෙන්ම පළාතේ ජනතාව තුළ, විශේෂයෙන් පාසල් අධ්‍යාපනය ලබන දූ දරුවන් තුළ මේ කෘෂිකර්මය පිළිබඳව යම්කිසි හැඟීමක්, ඕනෑකමක් ඇති කිරීමේ පිරිසිදු පරමාර්ථයෙන් සරු දිවියට - කෘෂි සවියක් කියන මාතෘකාව යටතේ 2016 අවුරුද්දේ සිට මේ අමාත්‍යාංශයෙන් විශාල වැඩ කොටසක් කරගෙන යනවා. මට මතකයි ගිය අවුරුද්දේ දොඩම්ගොඩ කොට්ඨාශයේ බෝම්බුවල සේවා සංස්කරණ අභ්‍යාස මධ්‍යස්ථානය පදනම් කරගෙන තමයි මේක පවත්වනු ලැබුයේ. ඊට පස්සේ හෝමගම පැවැත්වුවා, ඉතාමත්ම සාර්ථක වැඩ පිළිවෙළක්. මේ වැඩ පිළිවෙළ ජනාධිපතිතුමාගේ අතිශය පැසසුමට ලක් වුණා. මොකද ඒකට හේතුව, අපි ප්‍රායෝගිකව අත් දැක්කා. අපි ඒකට සහභාගි වුණා. ක්‍රියාකාරීව සහභාගි වුණා. ඒ වැඩ පිළිවෙළ තුළ ගොවීන්ට වාගේම, පාසල් දරුවන් විශාල ප්‍රමාණයක් මේ ප්‍රදර්ශනය නැරඹීමට සම්බන්ධ වෙනවා. ඒ නිසා ඒ අය කථා කරන අදහස් අපි විමසලා බැලුවා. ඒ අය තුළ කෘෂිකර්මය පිළිබඳව අලුත් හැඟීමක් ඇති කරවන්න, ඒ ප්‍රදර්ශනය විශේෂයෙන්ම වැදගත් වෙලා තිබෙනවා. ගොවීන් තුළ වාගේම පාසල් දරුවෝ තුළත්. එසේම ඒ තුළින් ඒ ඒ ප්‍රදේශවල කෘෂිකාර්මික කටයුතු පිළිබඳව, විශේෂයෙන් ගෙවතු වගාව පිළිබඳව විශාල ප්‍රබෝධයක් ඇති වුණා කියන එක අපි හොඳින් දන්නා කාරණයක්. එය මේ අමාත්‍යාංශය විසින් 2016 අවුරුද්දේ සිට කරගෙන යන විශේෂ වැඩ පිළිවෙළක්.

ඒ වාගේම පුරන් කුඹුරු යළි අස්වැද්දීමේ වැඩ සටහන. මේ පිළිබඳව මගේ පෞද්ගලික අදහසක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සැලකිය යුතු වියදමක් පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා අමාත්‍යාංශය විසින් දරනවා. එහෙම වුණත්, ඒ වියදම් කරන වියදමට සමානව මේ පුරන් කුඹුරු අස්වැද්දීමේ ප්‍රතිඵල තිබෙනවාද කියන එක පෞද්ගලිකව මට යම් කියවීමක් තිබෙනවා. මොකද, මම දන්නා බොහෝ ප්‍රදේශවල විශාල ලෙස විය පැහැදමක් කරලා, උත්සවශ්‍රීයෙන් පුරන් කුඹුරු අස්වැද්දීම ආරම්භ කරනවා. නමුත් සමහරවිට ඒ අවුරුද්දෙන් ඒක ඉවරයි. ඊළඟ අවුරුද්දේ මේ ස්ථාන නැවත පුරන් වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව විශේෂ අවධානය 2019 වර්ෂයේදී යොමු කරන්න කියන කාරණයත්, පසු විපරම් කිරීම -වියදමක් කරලා ඒ විධියට පුරන් කුඹුරු අස්වැද්දීමක් කළා නම්, ඒක ඊළඟ අවුරුදුවලත් දිගටම පවත්වාගෙන යන වැඩ පිළිවෙළක් විධියට ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්නය කියන කාරණයත් විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ.

ඒ වාගේම අපේ ප්‍රදේශය ගත්තාම මම ඉතාම සන්තෝෂයට පත් වෙනවා,මේ අමාත්‍යාංශය ගෙන ගිය ක්‍රියාකාරකම් අතර බෝම්බුවල සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය සුවිශේෂ ස්ථානයක්, අපේ අමාත්‍යාංශයේ. ඒ ස්ථානයේ පුහුණු කිරීම් කටයුතු සඳහා එන ළමයින්ට විශාල ගැටලුවක් තිබුණා. ඒ නිසා අපේ ගරු ඇමතිතුමාගේ කාලවකවානුව තුළ දී සියලුම පහසුකම් සහිත අංගසම්පූර්ණ දෙමහල් ගොඩනැගිල්ලක් ඒ ස්ථානයේ ඉදි කරලා, ඒ ස්ථානයේ පුහුණුවට පැමිණෙන හැම දෙනාටම පහසුකම්

සහිතව ඒ පුහුණුව සඳහා අවශ්‍ය කරන ඉඩ ප්‍රස්ථාව ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි. ඊට අමතරව එම ස්ථානයේ නිවාඩු නිකේතනයක් ආරම්භ කරලා දැන් ඉතාමත්ම හොඳින් ක්‍රියාත්මක වෙනවා වාගේම එය අමාත්‍යාංශයට සැලකිය යුතු ආදායමක් උපයන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ ප්‍රදේශ ගත්තාම කණේවෙල අමුණ පිළිබඳව විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෑ. දීර්ඝ කාලයක් ක්‍රියාත්මක කරගන්න බැරිව තිබුණු ස්ථානයක්. නමුත් මේ අවුරුද්දේ ඒ වැඩ පිළිවෙළ ආරම්භ කරලා, මම හිතන්නේ කාලගුණ තත්ත්වය හොඳින් තිබුණා නම්, මේ අවුරුද්දේම ඒ වැඩ කටයුතු අවසන් කරගන්න තිබුණා. නමුත් සුළු අඩුපාඩුකම් කිහිපයක් නිසා වැඩ අවසන් කරගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ලබන වර්ෂයේදී කණේවෙල අමුණේ කටයුත්ත සාර්ථකව සිද්ධ කරගන්න පුළුවන් වෙයි කියලා. අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ බල ප්‍රදේශයේ. විශේෂයෙන්ම අක්කර 200 කට වැඩි වාරි ජලය සැපයෙන ව්‍යාපෘතියක් හැටියට ගොවි පවුල් 300 කට ප්‍රමාණයකට වැඩි මෙමගින් ප්‍රතිලාභ ලබන්න පුළුවන් වැඩ පිළිවෙළක්. ඉතාම සාර්ථකව දැන් ඒ වැඩ කටයුත්ත කෙරෙනවා.

ඒ වාගේම තමයි සමස්තයක් වශයෙන් ගත්තාම, විවිධ ප්‍රදේශවල සිද්ධ කෙරිලා තිබෙන කටයුතු දිහා බැලුවාම, මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු පිළිබඳව ලොකු සන්තෝෂයක් ලබන්න පුළුවන්. ඒ වාගේම බිත්තර වී පිළිබඳව. විශේෂයෙන්ම මම කථාව මුලින් ආරම්භ කරන වෙලාවෙත් කිව්වා, නිරෝගී පිරිසක් මේ ප්‍රදේශයේ ඇති කරන්න නම්, විශේෂ ව්‍යාපෘතියක් මේ ප්‍රදේශයේ ක්‍රියාත්මක කළ යුතුව තිබෙනවා. අපි දන්නවා, කාබනික පොහොර වගාවෙන් කරන වී වගාව සහ ගෙවතු වගාව පිළිබඳව. මේ සඳහා ලොකු ගැටලුවක් විධියට තිබෙනවා, බිත්තර වී නිෂ්පාදනය. ගොවියෝ ඉල්ලන ප්‍රමාණයට අද වන විටත් අමාත්‍යාංශයට අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය ලබා දෙන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ නිසා ඒ ගැන විශේෂ අවධානය යොමු කරන ලෙසට අපේ අමාත්‍යාංශ නිලධාරීන්ටත් මතක් කරනවා. මොකද, අපේ ප්‍රදේශවල වී වගාව, කාබනික පොහොර, නැත්නම් මේ විධියට වගා කරන්න බලාපොරොත්තු වන අය හුඟක් ඉන්නවා. එතකොට ඒ අයට වගා කරන්න අවශ්‍ය කරන බිත්තර වී ලබා ගැනීමේ යම් ගැටලුවක් තිබෙනවා. බිත්තර වී නිෂ්පාදනය පිළිබඳව රේඛීය අමාත්‍යාංශය ගන්නා ලද පියවරුත් අක්‍රීය වෙලා තිබෙන වැඩ පිළිවෙළක් තුළ පළාත් සභාවෙන් ඒ වැඩ පිළිවෙළ 2019 වර්ෂයේදී වඩාත් වැඩි දියුණු කරන්න කටයුතු කරන්නය කියන කාරණය මතක් කරනවා. විශේෂයෙන් දේශීය සහල් නිෂ්පාදනය. ඖෂධීය වී වර්ග රාශියක් හඳුන්වා දීලා තියෙනවා. එතකොට ඒ පිළිබඳව ගොවියෝ අද ලොකු උනන්දුවක් දක්වනවා. ගොවියෝ ඒ උනන්දුව දක්වන්නේ, ඒ හාල් පරිභෝජනය කරන්න එදාට වඩා විශාල පිරිසක් අපේ බස්නාහිර පළාතේ පාරිභෝගිකයන් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ පාරිභෝගික අවශ්‍යතාවය සම්පූර්ණ කරන්න අපේ ගොවීන්ට අද පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ නිසා ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්නය කියන කාරණයත් මේ වෙලාවේදී විශේෂයෙන්ම සිහිපත් කරන්නට ඕනෑ.

ඒ වාගේම තමයි මේ අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වුණු වැඩ පිළිවෙළවල් තුළින් ඉතාම සතුටින් මතක් කරන්න ඕනෑ. මේ සත්ත්ව නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ දී විශේෂයෙන්ම - සමහරු හිතන්න පුළුවන් හාමුදුරු කෙනෙක් මේක කථා කිරීම පිළිබඳව. නමුත් මසට සතුන් නිෂ්පාදනය කිරීම ගැන නොවෙයි මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. කිරි ගම්මාන ඇති කිරීමේ වැඩ පිළිවෙළ ඉතාම සාර්ථකව කරලා තිබෙනවා. කිරි ගම්මාන 06 ක් මේ වන විට හෝමාගම, දොම්පේ, පාදුක්ක, දිවුලපිටිය, ඉංගිරිය, බුලත්සිංහල යන ප්‍රදේශවල ක්‍රියාත්මක වෙනවා. අපේ ප්‍රදේශයේ ස්ථාන දෙකක්. මේ ප්‍රදේශවල කිරි ගම්මාන ආරම්භ කරලා ඉතාම සාර්ථකව, විශේෂයෙන්ම දියර කිරි පරිභෝජනයට ජනතාව පෙළඹවීම සඳහා ඉලක්ක කොට තිබෙනවා. අපි දන්නවා, ඉන්දියාව වාගේ රටවල්වල කොයිතරම් දුරට දියර කිරි පරිභෝජනය දියුණු තත්ත්වයක පවතිනවාද කියලා. නමුත් අපේ රටේ ඉතාම කනගාටුදායකයි. විදේශවලින් ගෙන්වන පිටිකිරි භාවිතය තමයි හුඟක් දුරට ප්‍රචලිත වෙලා තිබෙන්නේ. ඒ තත්ත්වය තුළ මේ අමාත්‍යාංශයට වගකීමක් තිබෙනවා, දියර කිරි පරිභෝජනය පිළිබඳව ජනතාව උනන්දු කරවන්න. ඒ සඳහා මේ කිරි ගම්මාන ආරම්භ කිරීමේ වැඩ පිළිවෙළ ඉතාම සාර්ථක වැඩ පිළිවෙළක් ලෙස ක්‍රියාත්මක වන බවත් මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි අලුතෙන් අපේ අමාත්‍යාංශයට ලැබුණු අංශයක් යටතේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබවහන්සේට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

අපේ බස්නාහිර පළාතේ අයාලේ යන සුනඛයින්ගෙන් ඇති වන රෝගී තත්ත්වයන් පිළිබඳව තිබෙන අවධානම. එතකොට මේ අවධානම දුරු කරන්න ඉතාම මැතක තමයි අපේ අමාත්‍යාංශයට මේ වගකීම පැවරුණේ. ඒ පැවරුණාට පස්සේ, ඒ අයාලේ යන සුනඛ ගහනය පාලනය කරන්නත්, ඒ වාගේම වන්ද්‍යාකරණ මාර්ගයෙන් ඒ පරපුර වැඩීවීම නතර කරන්නත් අවශ්‍ය කටයුතු රාශියක් අමාත්‍යාංශය මඟින් සිද්ධ කරලා තිබෙනවා. ඒ වාගේ අංශවලින් බැලුවාම හුඟක් සන්තෝෂ වෙන්න පුළුවන් වැඩ කොටසක් සිදු කරනවා. ඒ සඳහා අපේ ගරු අමාත්‍යතුමාගේ කැපවීමත්, විශේෂයෙන්ම අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයේ කැපවීමත් මේ වෙලාවේදී අපි අගය කිරීමෙන් යුක්තව කථා කරන්නට ඕනෑ.

ඒ එක්කම මම අවසාන වශයෙන් සිහිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය වකවානුව තුළ, දැන් මාස දෙකකට තරම් උඩ දී යම් ප්‍රශ්න රාශියක් මතු වුණා, අපේ කෘෂි පර්යේෂණ නිලධාරීන් සම්බන්ධයෙන් යම් ගැටලු රාශියක් මතු වුණා. මේ ස්ථානයටත් ඇවිල්ලා ඒ අය උද්ඝෝෂණය කෙරුවා. ඒ පිළිබඳව අපි මැදිහත් වුණා. ගරු ඇමතිතුමා සහ ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමා සහ අමාත්‍යාංශ ලේකම්තුමා සමඟ මේ පිළිබඳව සාකච්ඡා කළා. නමුත් අවසාන වශයෙන් ඒ පිළිබඳව සැලකිය යුතු විසඳුමක් ලැබුණේ නැහැයි කියන එක තමයි ඒ නිලධාරීන්ගෙන් අපට දැනගන්නට ලැබුණේ. ඒ නිසා විශේෂයෙන් අපි මතක් කරනවා. සානුකම්පිතව මේ ප්‍රශ්නය දිහා බලලා - මොකද මගේ දොඩම්ගොඩ කොට්ඨාශයේ නිලධාරියාත් මේ වැඩ තහනමට ලක් වුණු කෙනෙක්. ඒ නිසා මම හොඳට දන්නවා, පෞද්ගලිකව දන්නවා. ඔවුන් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මුහුණ දීලා තිබෙන ගැටලුව සම්බන්ධව. ඒ නිසා සානුකම්පිතව -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු ඇමතිවරු කවුරුවක්වත් නැහැ. ඉතාම වැදගත් කාරණා ටිකක් කියනවා. අර AI මහත්වරුන් සම්බන්ධවත්. කෘෂිකර්ම ඇමතිතුමාත් නැහැ. වෙන ඇමතිවරු කවුරුවත් නැහැ. අඩු තරමේ ඇහුම්කන් දෙන්නේ නැත්නම් ඇයි? අපි මේ සාකච්ඡාව කරන්නේ කියන ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ වතුර ටිකක් බොන්න ගියේ. අපේ හාමුදුරුවනේ කාලය අවසන් වෙනවා.

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

මම හිතන්නේ නිලධාරීන් පිරිස ඉන්නවා. ඒ නිසා සානුකම්පිතව ඒ ප්‍රශ්නය දිහා බලලා, ඒක විසඳන්න ඉතා ඉක්මණින් ක්‍රියාමාර්ගයක් ගන්න හැටියට. මම හැමදෙනා කෙරෙහිම ඒ කාරණය ගැනත් විශේෂ අවධානය යොමු කරනවා. කාලය ලබා දීම පිළිබඳව සතුටු වෙනවා. හැම දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්වාමීන් වහන්සේ දැනුවත් කරන්න කැමැතියි. මහරගම පන්සලක ස්වාමීන් වහන්සේ නමකට මන්ත්‍රීවරයෙක් කියා ගත්තු කෙනක් පහර දීමක් කරලා කියලා අන්ර්ජාලය පුරා දැන් යනවා. බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන එකම ස්වාමීන් වහන්සේ හැටියට උන්වහන්සේගේ වගකීමක් කියලා මම විශ්වාස කරනවා. මහජන නියෝජිතයෙක් ගිහිල්ලා පහරදීමක් කළා නම්, ඒ පිළිබඳව සොයා බලලා ඒ ස්වාමීන් වහන්සේගේ අයිතිය වෙනුවෙන් ඔබ වහන්සේ කටයුතු කරන්නය කියලා.

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

මතක් කරපු ගැන සන්තෝෂයි. මට කැන්ටිමේදීත් එතුමා මේ කාරණාව පිළිබඳව මතක් කළා. මම බලාපොරොත්තු වෙනවා ගරු මහ ඇමතිතුමාත් සමඟත් සාකච්ඡා කරලා, ඔය කියන විධියට එතුමාගේ කොට්ඨාශයේ ඒ සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ පිළිබඳව අපට ගන්න පුළුවන් ක්‍රියා මාර්ගයක් ගන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. ඊළඟට කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 03.41]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ විශේෂයෙන් ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් ඊයේ වනතුරු කටයුතු කරපු මන්ත්‍රීවරයෙක් හැටියට මේ කාලපරිච්ඡේදය තුළදී කෘෂිකර්ම අමාත්‍යාංශ විවාදයේ ආරම්භයේදීම අපි සඳහන් කරන්න ඕනෑ, අපේ ගරු ඇමතිතුමා අපත් එක්ක බොහොම සහයෝගයෙන් කොහොමද කටයුතු කළේ කියලා. අප තුළ එතුමා පිළිබඳව විශේෂ ඇගයීමක් තිබෙනවා කියන කාරණාව සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම එතුමා පමණක් නොවෙයි. එතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා, ඒ වාගේම කෘෂිකර්ම අධ්‍යක්ෂතුමන් ඇතුළු අනිකුත් නිලධාරීන් ඒ පසුගිය කාලපරිච්ඡේදය පුරාවටම අපත් එක්ක කිට්ටුවෙන්, අපි යම් ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම ඒ පිළිබඳව විශේෂ උනන්දුවක් අරගෙන කටයුතු කළාය කියන එක අද විපක්ෂයේ සිටියත් ඒක සිහිපත් කිරීම අපේ යුතුකම, වගකීම වෙනවාය කියන කාරණාව මුලින්ම මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම පළාතේ කෘෂිකර්මාන්තය ගැන කථා කරනකොට, මා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කය වඩාත් කෘෂිකර්මාන්තයට බර වුණු දිස්ත්‍රික්කයක් හැටියටයි අපට සලකන්න පුළුවන් වන්නේ. අපේ ප්‍රදේශයේ ජීවත්වන ජනතාව කෘෂිකර්මාන්තයෙන්ම ජීවත් වන අය වෙන්නේ නැහැ. ඒ අය විවිධ වෙනත් වෘත්තියන්හි, වෙනත් ආදායම් උපයන මාර්ගයන්හි යෙදෙන අතරේම බොහෝදෙනා කෘෂිකර්මාන්තයේම යෙදෙන නිසා වැඩිපුරම කාෂිකර්මාන්තෙයෙන්ම යැපෙන අයයි කියලා විශ්වාස කරන්න අමාරුකමක් තිබුණත්, බොහෝ දෙනාගේ මූලික ජීවනෝපාය මාර්ගය හැටියට කෘෂිකර්මාන්තයේ යෙදිලා තිබෙනවාය කියන එක සඳහන් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට දැන් ප්‍රශ්නය වෙන්නේ, එහෙමනම් අපේ දිස්ත්‍රික්කය තුළ පමණක් නොවෙයි. අපේ මුළු පළාත තුළම, එහෙම නැත්නම් රටක් හැටියට කොහොමද මේ කෘෂිකර්මාන්තය දියුණු කරගන්න වැඩ පිළිවෙළක් ඇති කරගන්නේ කියන කාරණාව අද වඩාත් වැදගත් වෙනවා කියන එකයි අපි කල්පනා කරන්නේ. රටක් හැටියට ඉදිරියට යන්න මූලික වශයෙන් තමන්ට අවශ්‍ය කරන ආහාර ප්‍රමාණයවත් රටේ ස්වයංපෝෂිත කරගන්න අපහසු වුණොත්, ඒක අපේ ඉදිරි ගමනට, රටේ අනාගතය පිළිබඳව විශාල ගැටලුවකට, බාධාවකට හේතු වෙනවා කියන එකයි අපට හිතන්න පුළුවන් වන්නේ. අපි පසුගිය කාලය තුළ දැක්කා, පුරන් වූ කුඹුරු ප්‍රමාණය වඩාත් වැඩි වුණා. වඩාත් වැඩි වෙන කොට අපි ගරු ඇමතිතුමාත් එක්ක ගිහිල්ලා, අර වප් මඟුල් උත්සව, නොයෙක් දේවල් තියලා මිනිස්සු මේ පිළිබඳව උනන්දුවක් ඇති කරවන්න කටයුතු කළත්, බොහෝ වේලාවේදී ඒ අවස්ථාවේදී පමණක් ඒකට උනන්දු වෙනවා. අපේ ස්වාමීන් වහන්සේ කිව්වා වාගේ ඊට පස්සේ ටිකක් කල් යන කොට අමතක වෙලා, ආයේ කුඹුරු වගා කිරීම යම් ප්‍රමාණයකට අඩු වෙනවා.

නමුත් සමස්තයක් හැටියට ගත්තාම දැනට අවුරුදු දෙක තුනකට උඩදී, වඩා අද ගොවිතැනේ යෙදෙන, ඒ පුරන් කුඹුරු කරන අය වැඩි වෙලා තිබෙනවා කියන එක මම හිතනවා සතුටට කාරණාවක් වෙනවා කියලා. ඒක වඩාත් දියුණු කරගන්න කොහොමද අපි කටයුතු කළ යුත්තේ කියන එකයි මම හිතන්නේ වැඩ පිළිවෙළක් හදා ගන්න අවශ්‍ය වෙන්නේ. කොහොමද මේ අයව වඩාත් දිරිමත් කරලා, සමහරවිට පුරන් වුණු කුඹුරුවල වී වගාවම කරන්න අපහසු වෙන්න පුළුවන්. ආදායම අඩු වෙන්න පුළුවන්. වෙනත් බාධක තිබෙන්න පුළුවන්. ඒ නිසා පවතින නීතිරීතිවල යම් ලිහිලක් ඇති කරලා, ඒ කුඹුරුවලට වෙන් වෙලා තිබෙන ඉඩම්වල වෙනත් වගාවන් ආරම්භ කරන්න පුළුවන්. අන්නාසි වෙන්න පුළුවන්. පැපොල් වෙන්න පුළුවන්. පළා වර්ග වෙන්න පුළුවන්. වෙනත් භෝග ආරම්භ කළොත් ඒ සඳහා අවශ්‍ය ඉඩකඩ පහසුව ලබා දෙන්න නීති රීති වෙනස් කරමින් කටයුතු කළොත් මම හිතනවා, ගොවීන් වඩාත් උනන්දු වේවි වී ගොවිතැනට වැඩිය වෙනත් කෘෂිකාර්මික වගාවන් කරලා, වඩාත් හොඳ ආදායමකුත් ලබා ගන්න පුළුවන් වන නිසා, ඒ සඳහා වඩාත් උනන්දුවක් ඇති වේවිය කියලා අපි විශ්වාස කරනවා. ඒක නිසා ඒවා කෙරෙහි අලුත් වැඩ පිළිවෙළක් ඇති කරන්න වාගේම ඒ සඳහා අවශය කරන පහසුකම් සලසන්න කටයුතු කරන්න ඕනෑය කියන එක සඳහන් කරන්න ඕනෑ.

[ගරු කීර්ති කාරියවසම්]

ඒ වාගේම අපට විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන්නේ අද අපට වී ගොවිතැනේ යෙදෙන්න, නැත්නම් කෘෂිකර්මාන්තයේ යෙදෙන්න ඉන්න ශ්‍රමිකයන් පිරිස ඉතාම අඩු වෙලා තිබෙන්නේ. අපේ වැඩිහිටි පරම්පරාව තවමත් යම් ප්‍රමාණයකට ගොවිතැනට එකතු වුණත්, අලුත් තරුණ පරම්පරාව ඒ සඳහා යොමු වෙන්නේ නැහැ. ඒ අය යොමු නොවෙන්න හේතුව වෙලා තිබෙන්නේ, මම විශ්වාස කරන විධියට නම් කෘෂිකර්මාන්තයෙන් හොඳ ආදායමක් ඒ අයට ලබා ගන්න අපහසුයි කියන කාරණාව ඒකට බලපාලා තිබෙනවා. ඒ වාගේම ගොවීන් කියන අයට යම් වෘත්තීමය තත්ත්වයක් ලබා දීලා, ඒ අයට ස්ථිර ආදායම් මාර්ගයක් හැදෙන ක්‍රමයක් හැදිලා, ඒ වාගේම ඒ අයගේ වගාවන්වලට නිසි රක්ෂණ ක්‍රමයක් ඇති වෙලා, කෘෂිකර්මාන්තයේ යෙදෙන අයටත් තමන් වයසට ගිය කාලයට ජීවත් වෙන් පුළුවන් වන විධියට විශ්‍රාම වැටුප් වැනි ක්‍රමයක් හැදෙනවා නම්, මේ කෘෂිකර්මාන්තය කෙරෙහි අලුත් තරුණයන් යොමු කරගන්න පුළුවන් වෙනවයි කියන එකයි අපි විශ්වාස කරන්නේ.

දැන් බටහිර රටවල් ගත්තොත් එහෙම, ඇමරිකාව වෙන්න පුළුවන්. මම ප්‍රංශයේ දීර්ඝ කාලයක් සිටියා. ඒ රටවල්වල තරුණ පරම්පරාව කෘෂිකර්මාන්තය අතහැරලා නැහැ. එක තරුණයෙක් අක්කර 10, 15, 20 ක ප්‍රමාණයක ලොකු ගොවිපලවල්, ඒ අය තනියෙන් කරනවා. වැඩිපුර භාවිතා කරන්නේ යන්ත්‍රසූත්‍ර තමයි. ඒ තරුණ උදවිය කෘෂිකර්මාන්තයේ යෙදුණත්, ඒ අයට සමාජයේ පිළිගැනීමේ අඩුවක් වෙලා නැහැ. ඒ වාගේම ඒ අයට තමන්ගේ ගම්මානවල තමන්ට සතුටු ජීවිතයක් ගෙවන්න අවශ්‍ය පහසුකම් සැලසිලා තිබෙනවා. ඒ අයට ජීවිත රක්ෂණ ක්‍රම තිබෙනවා. ඒ වාගේම සියලුම දෙනාට වාගේ විශ්‍රාම වැටුප් ක්‍රමයක් තිබෙනවා. ඒක නිසා ඒ තරුණ පරම්පරාව යන්ත්‍රසූත්‍ර එක්ක වැඩ කරන පුරුද්දකුත් ඇති වෙලා තිබෙන නිසා අලුත් පරම්පරාව මේ සඳහා එකතු වෙනවා. නමුත් අපේ රට තුළ එවැනි වැඩ පිළිවෙළක් ඇත්තේ නැති නිසා අලුත් අය මේකට ඇදලා ගැනීම, මේ සඳහා එකතු කර ගැනීමේ අපහසුවක් තිබෙන නිසා එවැනි දේ කෙරෙහි අපේ ගරු ඇමතිතුමා අලුත් ක්‍රමයක් ඇති කරමින්, ඒක අපට පමණක් නොවෙයි. ඔබතුමා හරහා රජයටත් යෝජනා කරලා මේක පොදු ප්‍රතිපත්තියක් බවට මේ රටේ ඇති කරගන්න පුළුවන් නම් කෘෂිකර්මාන්තය වඩාත් දියුණු කරන්න අවස්ථාව ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

පසුගිය කාලයේදී විශාල මතවාදයක් ඇති වුණා. Glyphosate වැනි රසායනික ද්‍රව්‍ය වකුගඩු රෝගවලට විශාල වශයෙන් බලපාන නිසා මේවා තහනම් කළා. මේවා නතර කළා. මම හිතනවා ඒවා නතර කිරීමත් නිසා විශාල වශයෙන් කෘෂිකර්මාන්තය විශාල වශයෙන් ආපස්සට යන්න හේතු වුණා. ශ්‍රමිකයන් නැහැ. ඒක නිසා මේ කටයුතු කරගෙන යන්න වල් නාශකවලට ක්‍රමයක් ඒකට හැදුණේ නැහැ. ඒකට විකල්ප ක්‍රමවේදයක් ඇති වුණේ නැහැ. මම නම් දන්න තරමට කිසිම පර්යේෂණයකින් සහතික කරලා නැහැ. තහවුරු කරලා නැහැ. මේවා වකුගඩු රෝගයට හේතු වෙනවා කියලා. ඇමරිකාවේ එක් නඩු තීන්දුවක් තිබෙනවා, ඒ ඇරුණු කොට. ඒක නිසා මේ රසායනික දේවල්වලින් සම්පූර්ණයෙන් ඇත් වෙලා අපි කාබනික වැනි ක්‍රමයකට යනවා නම්, ඒකට තවම රට හුරු වෙලා නැහැ. ගොවියෝ හුරු වෙලා නැහැ. මිනිස්සු හුරු වෙලා නැහැ. එවැනි තත්ත්වයක් තුළ එකපාරට එවැනි තීන්දු ගැනීම, ඒක කෘෂිකර්මාන්තයට වඩාත් වාසිදායක හේතුවක් වේවිය කියලා මම විශ්වාස කරන්නේ නැහැ.

ඒ වාගේම අපේ ප්‍රදේශය, දැන් කළුතර දිස්ත්‍රික්කය ගත්තාම පසුගිය අවුරුද්දේ ගංවතුර කිහිපයකට මුහුණ දුන්නා. විශාල ගංවතුර. ඒක නිසා අපේ ප්‍රදේශයේ තිබුණු ඔක්කොම වාගේ ඇළ මාර්ග, වාරිමාර්ග ඒවා ආපදාවන්ට ලක් වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒවා ප්‍රතිසංස්කරණය කරන්න අවශ්‍ය වෙනවා. ගරු ඇමතිතුමාට මේ අවුරුද්දේ වෙන් වෙලා තිබෙන මුදල ගිය අවුරුද්දටත් වඩා අඩු නම් ඒවා කරන්න පුළුවන්කමක් තිබෙනවාද කියලා කියන්න මම දන්නේ නැහැ. නමුත් ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් ඇති වුණේ නැත්නම් කෘෂිකර්මාන්තය දියුණු කරන්න ලෙහෙසි වෙන්නේ නැහැ. ඒ නිසා ඒවා කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන්ම අද අපට පේනවා, විශාල අර්බුදයක් රට තුළ තිබෙන්නේ. ඊයේ පෙරෙයිදා මම දැක්කා, ලෝක ආහාර සංවිධානය ආවා, අපේ රටට ආධාර ලබා දෙන්න ගිවිසුමක් අත්සන් කරන්න. අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් ගිවිසුම අත්සන් කරන්න ගියාම ඒ අය මේ ලේකම්වරයාව භාර ගත්තේ නැහැ. අත්සනට. මේ රට තුළ තිබෙන අර්බුදයන් අපේ දේශීය කෘෂි කර්මාන්තයට විශාල වශයෙන් බලපානවා. ඒක නිසා මේ සියලු ගැටලු විසඳෙන්න රට තුළ හොඳ ස්ථාවර තත්ත්වයක් ඇති කරන්න අවශ්‍ය පසුබිම සකස් වේවි කියලා බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.52]

**ගරු නිරෝෂ් ජයවර්ධන**
Hon. Nirosh Jayawardane

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තූතියි. මෙවර අයවැය ප්‍රකාශනයේදී කෘෂිකර්ම, ඉඩම්, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, වාරිමාර්ග හා ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයේ ගාමිණී තිලකසිරි ගරු අමැතිතුමාගේ අමත්‍යාංශය තුළ කථා කරන්න මට විනාඩි 11 ක කාලයක් ලබා දීම ගැන මම විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට, ගම්පහ දිස්ත්‍රික් මහජන නියෝජිතයෙක් විධියට නිහතමානීව ආඩම්බර වෙන්න කැමැතියි. ගාමිණී තිලකසිරි මැතිතුමාගේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ වර්ෂයක් පුරාවට අමාත්‍ය උපදේශක කාරක සභාවන්, මම හිතන විධියට, මම දන්න විධියට අනික් අමාත්‍යාංශවලටත් වඩා වැඩියෙන් පැවැත් වූ බවට. ඒ වාගේම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. හුඟක් අමාත්‍යාංශ අතහැරලා තිබුණත්, මේ කෘෂිකර්ම අමාත්‍යාංශය තුළින් සරු දිවියට - කෘෂි සවියක් විධියට හෝමගම ප්‍රදේශයේ ඒ කෘෂි අධ්‍යාපනික ප්‍රදර්ශනයක් තියලා, ඒ ඉන්න දූවා දරුවන්ට, ඒ වාගේම කෘෂි කර්මාන්තය සඳහා ඇල්මක් දක්වන ඒ සියලුම ප්‍රගතිශීලී ජනතාවට, ඒ ගොවි මහත්වරුන් ඇතුළු සියලු දෙනාට හයියක් මේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලැබුණාය කියලා. ඒ වාගේම අද අපි කනගාටුවට පත් වෙනවා. මේ කෘෂිකර්ම අමාත්‍යාංශයක් විධියට මේ බස්නාහිර පළාත් සභාව පුරා අඩුපාඩුකම් විශාල වශයෙන් කියන්න තිබුණත්, අද මොකක්ද වෙලා තිබෙන්නේ? මිලියන 194 ක් ගිය වර්ෂයටත් වඩා මේ වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයට ලැබෙන මුදල් අඩු වෙලා තිබෙනවා. ඒ ගැන අපි කනගාටු වෙන්න ඕනෑ.

බස්නාහිර පළාත් සභාවක් විධියට විපක්ෂයේ ඉන්න අනික් මන්ත්‍රීවරුත්, ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුත් කෘෂිකර්ම අමාත්‍යාංශයට විවේචන එල්ල කළාට කෘෂිකර්ම අමාත්‍යාංශයක් විධියට කෘෂිකර්ම අමාත්‍යාංශය බස්නාහිර පළාත් සභාවටම ආදර්ශයක් වෙන්නත්, පූර්වාදර්ශයක් වෙන්නත් ඒ සියලුම මුදල් කප්පාදු කරලා තිබෙනවා. ඒ නිසා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු මහ ඇමතිතුමාත් එක්ක සම්බන්ධ වෙලා ඒකට ගන්න පුළුවන් ක්‍රියාමාර්ගයක් අරගෙන ඔබතුමා කරපු ඒ සංවර්ධනය, ඔබතුමා කෘෂිකර්මාන්තයට කරපු ඒ මෙහෙවර මේ ඉදිරි මාස තුනට හරි, පහට හරි ඔබ තමුන්නාන්සේ කරන්න කියලා. ඒ වාගේම මම මතක් කරන්නය කැමැතියි. අපි 2018 ක් විධියට ගත්තාම හෙක්ටයාර් 54 ක් පුරන් කුඹුරු නැවතත් වගා කරලා, ඒකට මිලියන 285 ක් මුදල් වෙන් කරලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අර අපේ හාමුදුරුවෝ ඉස්සෙල්ලා කිව්වා වාගේම උත්සවයක් තියලා ලොකුවට ගිහින් පටන් ගත්තාම එතැනින් පස්සේ කරන්න යන ක්‍රියාදාමය සිද්ධ වෙන්නේ නැහැ. මේකයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැඩේ කරන්න ගරු ඇමතිතුමාට හැමදාම කුඹුරට බහින්න බැහැ. ඒ වාගේම අමාත්‍යාංශ ලේකම්තුමාට කුඹුරු ගණනේ යන්න බැහැ. ඒ වාගේම පෞද්ගලික ලේකම්තුමාට කුඹුරු ගණනේ යන්න බැහැ. ගරු ඇමතිතුමනි, අපට නිලධාරි මණ්ඩලයක් ඉන්නවා. ඒ නිලධාරී මණ්ඩලය field එකට යවන්න. නිලධාරී මණ්ඩලය ඒ සියලුම දේවල් නිරීක්ෂණය කරලා, අමාත්‍යාංශය වෙතට කරුණු දක්වන්න කියලා අපි මතක් කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, මෙතැනින් ඉදිරියට.

ඒ වාගේම අපි කෘෂිකර්ම අමාත්‍යාංශයක් විධියට ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපි විශාල ජයග්‍රහණයක් ලබාගෙන තිබෙනවා. ඒ මොකක්ද කියනවා නම්, අපි මහ කන්නයේ බිත්තර බුසල් 2016 දී එක් ලක්ෂ දාහතර දහස් නවසිය අසූවක් ලබාගෙන තිබෙනවා. ඒ වාගේම ඒක ප්‍රවර්ධනය වෙලා 2017, 2018 වර්ෂයන්වලදී එක් ලක්ෂ විසි නව දහස් තුන්සිය තිස් අටක් වෙලා තිබෙනවා. ඒ වාගේම 2018, 2019 යන වර්ෂයන්වලදී එක් ලක්ෂ හතළිස් නවදහස් එකසිය හැත්තෑ පහක් වෙලා තිබෙනවා. ඒ ගොවි මහත්ම මහත්මීන් මේ අමාත්‍යාංශය තුළින් ඉල්ලන බිත්තර වී ප්‍රමාණය යම්කිසි ප්‍රමාණයක් හරි ලබා දෙන්න අපට හයියක් වෙලා තිබෙනවා. ඒකට මම ගරු ඇමතිතුමාට විශේෂයෙන්ම මේ අවස්ථාවේදී ස්තූතිවන්ත වෙනවා. මොකද අද කෘෂිකර්මාන්තය ගැන කථා කරද්දී හුඟක් මිනිස්සු කෘෂි කර්මාන්තය අතහැරලා වෙන වෙන රස්සාවල්වලට ගිහිල්ලා තිබෙනවා. කෘෂිකර්මාන්තයේ නියැලුණු අපේ ප්‍රදේශයේ මිනිස්සු දවසේ කුළී වැඩවලට ගිහිල්ලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ මොකද කෘෂිකර්මාන්තය සඳහා ඒ මිනිස්සුන්ට දෙන්න පුළුවන් ශක්තියක්, ඒ වාගේම අතහිත කවුරුත් දෙන්නේ නැහැ. ඒ නිසා අපි විශේෂයෙන්ම පෞද්ගලිකව ස්තූතිවන්ත වෙන්න ඕනෑ. අපි දැක්කා ඊයේ අපේ ගරු අමාත්‍යතුමා ආඩම්බරයෙන් කියනවා, අපේ ඉඩම් අමාත්‍යාංශය තුළින් ආණ්ඩුකාරවරයාට නිල නිවසක්

[ගරු නිරෝෂ් ජයවර්ධන]

හදන්න එතුමා මැදිහත් වෙලා එතුමාගේ ශක්තිය, පූර්ණ දායකත්වය ලබා දීලා තිබෙනවා කියලා. බස්නාහිර පළාත් සභාවක් විධියට ඒකට යන මුදල අපි දන්නවා. නිල නිවාසයක් කිව්වාට අපේ ගෙවල් වාගේ කොහෙවත් නිල නිවාස තිබුණේ නැහැ. ඒ නිල නිවාසයක් හදන්නේ අවුරුදු පහකට, හයකට කාඞ්බෝඞ්වලින්වත් නොවෙයි. උපරිම ශක්තිය, උපරිම ප්‍රතිලාභයක් මින් ඉදිරියටත් ගන්න පුළුවන් වන විධියට තමයි ඒ වැඩ කටයුතු කරන්නේ. අද මේ සභාව බලන්න. අද බස්නාහිර පළාත් සභාවක් විධියට අද අපි මෙච්චර ආඩම්බරයෙන් ඉඳගෙන ඒ මහජන නියෝජිතයන් විධියට හරියට කථා කරන්න පුළුවන් සභාවක් හදලා දීලා තිබෙනවා. මොකද තව අවුරුදු 10 කින් මේ සභාව ගලවන්න නොවෙයි. ඒ නිසා මම මහජන නියෝජිත සියලුම ගරු මන්ත්‍රීවරුන්ට කියනවා. අපි කරනවා නම්, පක්ෂ විපක්ෂ අපි සියලුමදෙනා ගිහිල්ලා ඒවා නිරීක්ෂණ කටයුතු කරලා, මේවාට යන මුදල්, අයවැය අපට ඉදිරිපත් කරන්න කියමු. එහෙමයි, අපි ඒ කරන්න යන දෙයට අඩුපාඩුකම් කිය කියා සිටීම නොවේ. අපි සංචාරයක් හරි, ඒ වාගේම නිරීක්ෂණ චාරිකාවක් හරි දාලා ගරු ඇමතිතුමාත් එක්කත් ගිහිල්ලා මේකෙන් කොහෙන්ද හොරකම් කරන්නේ? මේකෙන් කොහෙන්ද ගහන්නේ? සිමෙන්තිවලින් කොච්චරක්ද මේකට දාන්නේ කියලා ප්‍රායෝගිකව ගිහිල්ලා අපි ඒක නිරීක්ෂණය කරමු.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ගත්තාම ගෙවතු සංවර්ධනය, ඒ වාගේම ව්‍යාපෘතියක් විධියට හොඳම ගෙවත්ත තෝරන ව්‍යාපෘතිය, ඒ වාගේම ශූර ගොවියා ඒවා අද අපේ සමාජය තුළ අඩු වේගෙන යන අවස්ථාවකදී, ඒ මිනිසුන් ධෛර්යමත් කරන්න, ඒ මිනිසුන්ට ඉදිරියට යන්න, ඒ මිනිස්සු ගෙයක් විධියට, පවුල් සංස්ථාව රැකෙන විධියට හරි ඒ කරගෙන යන කෘෂිකර්මාන්තය තුළින් නිවසට අවශ්‍ය, ගෙදරට අවශ්‍ය, ගෙදර පරිභෝජනයට ගන්න පුළුවන් එළවළු ටිකක් හරි වගා කරගන්න ඔවුන්ට අපි හයියක් වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලනවා. අපි ලබන වර්ෂයේ මුල කොටසේදී අපේ ගරු මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දෙන්න කියලා, අපට දෙන්න පුළුවන් ශක්තිය බීජ වගා කරලා ලබා දෙන්න. ඒ පවුල් සංස්ථාවක් රැකෙන්න, ඒ මිනිහෙක්ට ගන්න පුළුවන් ආත්ම තෘප්තිය අපි අද පැළයක් සිටුවලා, තව මාස දෙක තුනකින් මල් දාලා ඒ එල අපේ අතින්ම නෙළා ගන්න තිබෙනවා නම්, ඒක තමයි අපට ගන්න පුළුවන් මානසික තෘප්තිය. ආත්මීය තෘප්තිය.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දැක්කා මෙකේ තිබෙනවා කෘෂි කර්මාන්තය සඳහා ඒ වේගවත් සංවර්ධනයක් සඳහා පිළියම්. මේ ලෝකයේ සංවර්ධනය, මුළු ලෝකයටම විශාල වශයෙන් කාර්මික විප්ලවයක් වාගේ ලබා දෙද්දී අද අපේ බස්නාහිර පළාත් සභාව අර පැළ සිටුවන යන්ත්‍ර ලංකාවට ගෙන්නලා, ඒවා හඳුන්වා දීලා ඒවා ක්‍රියාත්මක කරන්න ඒ අයට කියා දීලා ඒ තුළින් කෘෂි කර්මාන්තයට විශාල ශක්තියක් වෙලා තිබෙනවා.

ඒ වාගේම අපි හුඟක්ම මතක් කරන්න ඕනෑ. මම ඉන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා-ඇළ ආසනයේ. ඒ කෘෂිකර්ම කටයුතුවල නියැලී සිටින සියලුදෙනාගේම විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා, මේ ට්‍රැක්ටර් පැන්නුම් - මොකද, වෙන වෙන වතුවලින් ගෙනිහිල්ලා ට්‍රැක්ටරය කුඹුරට දාලා, ඒ වත්තෙන් නොවෙයි අනික් වත්තෙන් නම් එළියට එන්නේ ඒ වත්තේ මිනිස්සු ඒ කුඹුර කරන එක්කෙනාත් එක්ක තරහයි නම් නැවතත් මේ පැත්තට ගෙනැල්ලා තමයි ට්‍රැක්ටරය එළියට ගන්නේ. ඒ නිසා ගරු අමාත්‍යතුමාගේ අධීක්ෂණයෙන් ඒ සියලුම ඉල්ලීම්, ලිපි ගොනු ඔක්කොම අපි ගරු අමාත්‍යතුමාට ලබා දෙන්නම්. ඒ ට්‍රැක්ටර් පැන්නුම් විධිමත් විධියට ඔබ තමුන්නාන්සේගේ නිරීක්ෂණයෙන් අපට ලබා දෙන්නය කියලා මේ අවස්ථාවේදී මතක් කර සිටිනවා.

ඒ වාගේම සත්ව ගම්මාන ඉදි කරලා, ඒ සත්ව ගම්මානවල ස්වයං රැකියාවක් විධියට ඒ මිනිසුන්ට දෙපයින් නැගී සිටින්න පුළුවන් ශක්තියක් ලබා දීලා තිබෙනවා. අපි සතුටු වෙනවා ඒ පිළිබඳව. අපි දන්නවා, සූකර ප්‍රශ්නයේදී, සූකර සතුන් නිෂ්පාදනය කරන අවස්ථාවකදී දැන් පළාත් පාලන ආයතන මගින් නීතියක් ගෙනැල්ලා තිබෙනවා, ජීව වායු ටැංකි හදන්න කියලා. මේ අවස්ථාවේදී මම යෝජනාවක් විධියට කරනවා. ඒ ටැංකි හදාගන්න ශක්තියක් ලබා දෙන්නය කියලා. ඒ වාගේම "අපි වවමු - රට නඟමු" ජාතික ප්‍රතිපත්තියක් මත මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ දී විශාල ප්‍රතිපත්තියක් විධියට ගිහිල්ලා හැම මිනිහෙක්ම හැම නිවසකම මේ දේවල් වවන්න පටන් ගත්තා. ඒවා දැන් ක්‍රම ක්‍රමයෙන් අඩු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඉදිරියට මේ ආණ්ඩු ක්‍රමයත් එක්ක හරි විධියකට ආපුවාම ඒ ජාතික ප්‍රතිපත්තිය

ශක්තිමත් කරන්න ඔබතුමාගේ මැදිහත්වීම අපි ඉල්ලනවා. ඒ වාගේම ගරු ඇමතිතුමනි, අද මේ බස්නාහිර පළාත සභාවේ සියලු දෙනාටම හොඳටම හිතට වදින දෙයක් අද වුණා. මොකද, රෝස් ගරු මන්ත්‍රීතුමිය කේජු කැල්ලේ කථාව කිව්වා. කේජු කැල්ල කාක්කෙක් ගෙනැල්ලා ඒ කාක්කට සිංදුවක් කියන්න කියලා, ඒ කේජු කැල්ල වැටුණාම නරියා අරගෙන යන කථාව තමයි කිව්වේ. ඒත් ගරු ඇමතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම ගරු ඇමතිවරුන්ට අද වෙලා තිබෙන්නේ, කිසිම දෙයක් නොවෙයි. අපි මතක් කරගන්න ඕනෑ වළහාගේ කථාව. මම වළහාගේ කථාව ඔබ තමුන්නාන්සේලාට මතක් කරමින්, මට කාලය ලබා දුන් සියලු දෙනාට ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොමත්ම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොහොතකට අවසර. 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් සඳහා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අදත් උදෑසන මේ ගරු සභාවේ කටයුතු පිළිබඳව දෙරණ මාධ්‍ය ජාලයේ පුවත්පත් වැඩ සටහනේදී කරුණු මතු වුණා. පෙර දවසේ මේ සභාව තුළ රූගත කරන පත්‍ර වාර්තාකරුවන්ට මේ ගරු සභාවෙන් වාරණයක් පනවා තිබෙනවා කියලා. මා දැනුවත්ව එසේ කිසිදු කාරණාවක් සිද්ධ වුණේ නැහැ. අපි හැමෝම ප්‍රකාශ කළේ මාධ්‍යය නිදහස තිබෙන්න ඕනෑ. මාධ්‍ය ජාලාවල සියලු දෙනාට ඇවිල්ලා ඒවා නිවැරැදිව ප්‍රකාශ කරන්න මාධ්‍ය පහසුකම් සලසන්න ඕනෑ. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රකාශයේදී කියැවුණේ, ඒවා නිවැරැදිව සොයා බලලා හරියට නිවැරැදිව වාර්තා කිරීම සුදුසුයි කියන කාරණාවයි. මා දන්නේ නැහැ, එසේ කාරණාවක් සිද්ධ වෙලා තිබෙනවාද කියලා. ගරු ප්‍රධාන අමාත්‍යවරයාගෙන් හෝ අන් කිසිවෙකුගෙන් මේ පළාත් සභාවේ පුවත්පත් සහ විද්‍යුත් මාධ්‍ය ජාලාවලින් පැමිණෙන කිසිම මාධ්‍යවේදියෙකුට එවැනි වාරණයක් පැනවීම සඳහා යෝජනාවක් ඉදිරිපත් වුණේ නැහැ. ඒ නිසා මේ වැරැදි තොරතුරු මාධ්‍යවලට යන්නේ කොහොමද කියන කාරණාව මා දන්නේ නැහැ. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගොඩනැගිල්ල හදන්න වියදම් කරපු මුදල මාසයකට දෙවතාවක් විතරක් භාවිතා කරන මේ සභාවට පමණයි වැය වෙලා තිබෙන්නේ කියන කාරණාව තමයි රටේ සමස්ත ජනතාවටම පැහැදිලි වෙන්නේ, මේ විටින් විට කරන ප්‍රකාශන තුළින්. මෙහි තිබෙන අමාත්‍යාංශ ගණනාවක් මීට පෙර කොළඹ පුරා පිටස්තර එක් එක් ගොඩනැගිලිවල තැන් තැන්වල විසිරිලා තිබුණා. ඒවාට විශාල මුදලක් මාසිකව කුළී මුදල් හැටියට ආයෝජනය කළා. දැන් ඒ සියලු මුදල් ඉතුරු වෙලා ජනතාවට තවත් වසර 50 කට, 100 කට ජාතික වස්තුවක් හැටියට තමයි මේ ගොඩනැගිල්ල හදලා සකස් කරලා අවසාන කරලා තිබෙන්නේ. ඒ නිසා මම ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. දිගින් දිගට මේ තත්ත්වය ඉදිරියට යන්න නොදී ඒ මාධ්‍ය ජාලාවල සියලුදෙනා කැඳවලා නිවැරැදිව මේ අදහස් කරුණු ඉදිරිපත් කරලා මේ කථාව මෙතැනින් අවසාන කරන්න යම්කිසි පියවරක් ගන්නය කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ ඔබතුමා හොඳ දෙයක් ඉදිරිපත් කළේ. දැන් මේ සභාවේ ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා උදේ සිට ඉන්නවා. ඒ වාගේ සිද්ධියක් මේ සභාව තුළ සිදු වුණේ නැහැයි කියන එක පිළිබඳව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා දන්නවා. එසේ දැනුවත්ව තිබියදී මාධ්‍ය ජාලාවල ඒ වාගේ වැඩ සටහනක් යනවා නම් ඒ පිළිබඳව අපි මාධ්‍ය ආයතනත් එක්ක වෙනම සාකච්ඡාවක් කරලා වෙනම තීන්දු තීරණවලට එන්න සිදු වෙනවා. ඒ නිසා අපි ඒ පිළිබඳව -

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තත්ත්පර තිහක් දෙන්න මටත් ඒ පිළිබඳව යමක් කියන්න. මම ඒ වැඩ සටහන උදේ බැලුවා. ආයතනය වශයෙන් දෙරණ ආයතනය. එතකොට වතුර කියන මාධ්‍යවේදියා. මම හිතන්නේ ඩේලි මිරර් පත්තරේ. මට පෙණුනේ, ඒ පත්තරේ තිබෙන වාර්තාවක් අරගෙන කියෙව්වා. ඒ වාර්තාව කියෙව්වාට ප්‍රශ්නයක් නැහැ. ඒ වාර්තාව කියවලා ඊට පස්සේ එයා මෙතැන හිටපු කෙනෙක් හැටියට තමයි කථා කළේ. එතකොට ඒ අයට ඕනෑ දෙයක් බලන්න, අපි මේක ඇතුළේ ඉඩ දෙන්න ඕනෑ. අන්න ඒ විධියට කථා කළේ. එහෙම වාරණයක් වෙලා නැහැ. අපි කියන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපි එහෙම දෙයක් කළේ නැහැ නේ?

**ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි**
Hon. Rev. Thebuwana Piyananda Thero

මේ මාධ්‍යවේදීන් හැම කෙනෙක්ම ගැලරියේ සිටියා. එහෙම වාරණයක් වෙලා නැහැ. නමුත් එයා කිව්වේ වාරණය කරලා තිබෙනවා කියලා. එතකොට මේ ඔක්කොම දොට්ට දාලා, ඒගොල්ලන්ට ඕනෑ දේවල් ඒක ඇතුළේ කරගන්න ඉඩ දෙන්න ඕනෑද කියලා, අන්න ඒ විධියට කථා කළේ. මහ හිතුවක්කාර විධියට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපි ඒ ගැන බොහොම සැලකිලිමත් වෙලා යම්කිසි තීන්දු තීරණයකට එනවා. මීළඟට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

[අ.භා. 04.06]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දවසේ අපේ ගාමිණී තිලකසිරි කෘෂිකර්ම ගරු ඇමතිතුමාගේ වැය ශීර්ෂයට අදහස් කිහිපයක් පළ කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. එතුමා මේ පළාත් සභාවේ ඉන්න පරිණත ඇමතිවරයෙක්. කීප වතාවක්ම අමාත්‍ය ධූර හොබවලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ ව්‍යවස්ථාදායකය, පාර්ලිමේන්තුවත් නියෝජනය කරපු අමාත්‍යවරයෙක්. විශේෂයෙන්ම මේ මොහොතේ කියන්න ඕනෑ. මුළු රටටම මුදල් වෙන් කරන්න තිබෙන ආයතනය. ඒ කියන්නේ අමාත්‍යාංශවලට, ඒ වාගේම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල මේ සියලු ආයතනවලට මුදල් වෙන් කරන්න තිබෙන ආයතනය, මූල්‍ය බලය තිබෙන ආයතනය අද නිශ්ක්‍රීය වෙලා තිබෙන්නේ. රටට, 2019 වර්ෂය සඳහා තවම Budget එකක් නැහැ. පසුගිය නොවැම්බර් 05 වැනිදා රටට බජට් එක්ක ඉදිරිපත් කරන්න තිබුණා. ඒ අයවැයෙන් තමයි පළාත් සභාවලට මුදල් වෙන් කරන්නේ. පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයට මුදල් වෙන් කරනවා, මේ පළාත් සභා 09 සඳහා. එතකොට දැනට අපි මේ වැඩ කටයුතු කරගෙන යන්නේ 2018 වර්ෂයේ දෙසැම්බර් 31 වැනිදා දක්වා වෙන් වුණු මුදල්. 2019 වර්ෂයේ වැඩ කටයුතු කරගෙන යන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පාර්ලිමේන්තුවෙන් තවම අයවැයක් සම්මත වෙලා නැහැ. එහෙමනම් මේ දෙසැම්බර් මාසයේ අපි මේ ගෙවමින් තිබෙන්නේ පළමුවැනි සතිය. එතකොට තව සතියක වාගේ කාලයක් ඇතුළත මේ දේශපාලන අර්බුදය, ව්‍යවස්ථා අර්බුදය විසඳන්න කටයුතු කරනවා කියලා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සඳහන් කළා. මට නම් තේරෙන්නේ නැහැ, මොන විධියට ද මේ අර්බුදය විසඳන්නේ කියලා. මේක දැන් death lock එකක්. කාටවක්වත් එළියට යන්න විධියක් නැහැ. දොරක් ඇරගන්න විධියක් නැහැ. හැබැයි අභියාචනාධිකරණය ඊයේ දොරක් ඇරලා දුන්නා. හැබැයි ඒ දොර ඇරලා දුන්නු එකෙන් නිසි ප්‍රයෝජනය අරගෙන, ඒ golden opportunity එක, එහෙම නැත්නම් ඒ රත්තරං අවස්ථාව ප්‍රයෝජනයට අරගෙන මේ ව්‍යවස්ථා අර්බුදය, එහෙම නැත්නම් මේ දේශපාලන අර්බුදය නිමා කරන්න ජනාධිපතිතුමාට අනගි අවස්ථාවක් ලැබුණා. නමුත් එතුමා ඒ අවස්ථාව පාවිච්චි කළේ නැහැ. එතුමාගේ හිතුවක්කාරී, මුරණ්ඩු ප්‍රකාශය අපි ඊයේ දැක්කා. 225 ම කිව්වත් මම මේවාට අවනත වෙන්නේ නැහැයි කියන අදහස තමයි එතුමා කිව්වේ. එතකොට රටකට පාර්ලිමේන්තුවක් අවශ්‍යද කියලා හිතෙනවා. එහෙම බැලුවාම මේ පළාත් සභාව ගැන කුමන කථාද? අර ගම්වල කියමනක් තිබෙනවා නේ අර බුලත් පයියට හෙන ගැහුවට පස්සේ -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

කුණුහරුප කියන්න එපා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

නැහැ. නැහැ. බුලත් පයිය.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මෙතුමා දන්නේ ඒක නොවෙයි. වෙන එකක් තිබෙනවා. ඒ ඔබතුමා දන්න එක නොවෙයි. තව එකක් තිබෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

අනික් ඒවා ගැන කථා කරලා වැඩක් නැහැ. ඒ ගැන මම කියන්න යන්නේ නැහැ මේ වෙලාවේ අයවැයක් සම්මත කරගන්න පළාත් සභාවෙන් උත්සාහ කරනවා. හැබැයි,

මේකට මුදල් අනුමත වෙන්නේ රටේ පාර්ලිමේන්තුවෙන්. පාර්ලිමේන්තුව අකර්මණ්‍යය කරලා. නිශ්ක්‍රීය කරලා. ආණ්ඩුවක් නැහැ. ආග්‍රාමාත්‍යවරයෙක් නැහැ. කැබිනට් මණ්ඩලයක් නැහැ. එහෙමනම් අද ඉන්න අගමැතිවරයා නීති විරෝධී අනීතික අගමැතිවරයෙක් කියලා අභියාචනාධිකරණයේ වැඩ තහනමට ලක් කරලා තිබෙනවා. ඒ වාගේම සියලු අමාත්‍යවරු වැඩ තහනමට ලක් කරලා තිබෙනවා. ඒ වාගේම මේ මොහොතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වෙමින් තිබෙනවා. මේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට, පාර්ලිමේන්තුව නිශ්ක්‍රීය කරන්න ජනාධිපතිවරයා දැරූ උත්සාහය කොතෙක් දුරට නීත්‍යානුකූලද? ව්‍යවස්ථානුකූලද? කියන එක ගැන. මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. මේ ප්‍රශ්නය ගැන ඉතාමත් හොඳ දැනුවත් භාවයක් අපේ මේ ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමාට තිබෙනවා. එතුමා රටේ ව්‍යවස්ථාව දන්නවා. පාර්ලිමේන්තුවේ කටයුතු කරලා තිබෙනවා. අපි නම් තව පාර්ලිමේන්තුවට ගිහිල්ලා නැහැ. නමුත් යම් ප්‍රමාණයකට මේ පළාත් සභාවේ බලතල මොනවාද? පළාත් සභාවක කටයුතු කෙරෙන්නේ මොන මොන රෙගුලාසි යටතේද? කාර්ය පටිපාටි රීති යටතේද? මේ සභාවේ මූලාසනය හොබවන අපේ මේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් ඉන්නේ. අපේ නියෝජ්‍ය සභාපති, කෝරළගේ මැතිතුමා. එතුමාත් දන්නවා, කොහොමද කටයුතු කෙරෙන්නේ කියලා. මේවාට අපි සියලු දෙනා ගරු කරන්න බැඳිලා ඉන්නවා. ඒ නිසා මේ සියල්ල නොසලකා හැරලා කටයුතු කිරීම තුළින් මුළු රටක් අස්ථාවර වෙනවා. මුළු රටක් අරාජික වෙනවා කියන එකයි මට පැහැදිලිව කියන්න තිබෙන්නේ. ඒ නිසා රට ඉස්සරහාට යන්න පුළුවන්කමක් නැහැ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

මේ පළාත් සභාවේ අයවැය.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

දැන් මේ ආපසු වහල්ලු ටික කථා කරන්න අරගෙන නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා. ඔබතුමා කථා කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ප්‍රසන්න ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා කවදාද එන්නේ. රාජිත ඇමතිතුමාත් එක්ක කවදාද එන්නේ කියන්න කෝ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

මම එන්නේ නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

හා... හොඳයි. පස්සේ එන්න. පස්සේ එන්න. දැන්ම එන්න එපා. පස්සේ එන්න කෝ. බේරුවල deal එක අපි දන්නවා හොඳේ. බේරුවල deal එක අපි දන්නවා. ඒක නිසා දැන්ම කථා කරන්න එපා. ඒ නිසා පැහැදිලිව කියන්න තිබෙන්නේ. මේ දේශපාලනය කියලා කියන්නෙත්, තනතුරු දරනවා කියන්නෙත්, පදවි තානාන්තර දරනවා කියලා කියන්නෙත් පැහැදිලිව අර මාරක ළිඳේ මෝටර් සයිකල් පදිනවා වාගේ වැඩක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාරක ළිඳේ මෝටර් සයිකල් පදින්න යනවා නම් මොනතරම් ශික්ෂණයක් තිබෙන්න ඕනෑද? මොනතරම් විනයක් තිබෙන්න ඕනෑද? කියලා අපි දන්නවා. මොකද, ඒකෙන් මෝටර් සයිකලේ එළියට පැන්නොත් අපි දන්නවා මොකද වෙන්නේ කියලා. අර බලාගෙන ඉන්න සියලු දෙනාත් විනාශ වෙලා, තුවාල වෙලා, තමන්ගේ අතපයත් කැඩිලා, එළවන මෝටර් සයිකලෙත් කැඩිලා මේ ඔක්කොම ඉවර වෙනවා. ඒ නිසා මාරක ළිඳේ මොටර් සයිකල් පදිනවා වාගේ වැඩක් තමයි. තමන්ට ඕනෑ ඕනෑ දේවල් කරන්න බැහැ. මේකට කිසියම් විධියකට අධ්‍යාත්මික ඒකාග්‍රතාවයක් අවශ්‍යයි. ඒ වාගේම හැඟීම්වලට, ආවේගවලට බර වෙලා වැඩ කරන්න පුළුවන්කමක් නැහැ. රටක් එක්කයි වැඩ කරන්නේ. තමන්ගේ ගෙදර නම් කමක් නැහැ. තමන්ගේ වතුපිටිවල නම් කමක් නැහැ. තමන්ගේ ව්‍යාපාරයක් නම් තමන්ගේ අභිමතයට කටයුතු කරන්න පුළුවන්. ඇස් පනාපිටයි මේ රටක් නාස්ති වෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්න කැමැතියි. ඉතාම වැදගත් කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් ජනාධිපතිතුමා ප්‍රකාශයට පත් කළා. ඒක තමයි මේ රටේ කාබනික ගොවිතැන රටේ ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය බවට පත් කළා. රසායනික ගොවිතැන වෙනුවට සම්පූර්ණයෙන්ම වස

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

විෂ වලින් තොර ගොවිතැනකට රට ගෙනියන්න ඕනෑය කියලා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. අපි එතැනදී කිව්වා. ජනාධිපතිතුමනි, අවුරුදු තිහ හතළිහක් තිස්සේ මේ රටේ කරගෙන ආපු කෘෂිකර්මාන්තයක් තිබෙනවා. ඒක රසායනික කෘෂිකර්මාන්තයත් එක්කයි බැඳිලා තිබෙන්නේ. ඒකට බහු ජාතික සමාගම් සම්බන්ධ වෙලා ඇති. පොහොර සමාගම් සම්බන්ධ වෙලා ඇති. පළිබෝධනාශක සමාගම් සම්බන්ධ වෙලා ඇති. මේක එක සැරේ අපට කණපිට ගහන්න බැහැ. හරියට පිටි ගෝනියක් කණපිට ගහනවා වාගේ එක සැරේ මේක කණපිට ගහන්න බැහැ. ඒක නිසා මේක අපි නියමු ව්‍යාපෘතියක් විධියට පියවරෙන් පියවර, පියවරෙන් පියවර ක්‍රියාත්මක කරමු කියලා. අනේ මේක ඇහුවේ නැහැ. අපේ අතුරලියේ රතන හාමුදුරුවොත් අති ධාවනකාරී විධියට මේක රටේ ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය බවට පත් කරලා, අපේ දුමින්ද දිසානායක. එතකොට කෘෂිකර්ම ඇමතිවරයා විධියට එතුමාගේත් අනුමැතියකින් තොරව, පර්යේෂණ නිලධාරීන්ගෙත් අනුමැතියකින් තොරව -

**ගරු ලලිත් එල්ලාවල**
**Hon. Lalith Ellawala**

ජනාධිපතිතුමා කියන්නේ, ඔබතුමන්ලා ඒ එකක්වත් කරන්න දුන්නේ නැහැයිලු.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
**Hon. Nishantha Sriwaranasinghe**

ඒ අනුව අවසාන වශයෙන් ඒ ව්‍යාපෘතිය, ඒ වැඩ සටහන කරගෙන යන්න බැරි තත්ත්වයකට පත් වුණා. රටේ කෘෂිකර්මාන්තය විශාල පසුබෑමකට ලක් වුණා. Glyphosate ප්‍රශ්නය ආවා. ඒ වාගේම මේ බැර ලෝහ පිළිබඳ ප්‍රශ්නය ආවා. වකුගඩු රෝගය පිළිබඳ ප්‍රශ්නය ආවා. මේවාට පිළියම් සෙවීම සඳහා තමයි මේ experiment එක කළේ. නමුත් එවැනි experiment මේ රටේ කෘෂිකර්මාන්තයත් එක්ක එක විට නොකළ යුතුයි. අපි කිව්වා, මේක නියමු ව්‍යාපෘතියක් බවට පත් කරමුයි කියලා. නමුත් ඇහුවේ නැහැ. මේ ඇතැම් අයගේ තිබෙන පණ්ඩිතකම් නිසා, අතිධාවනකාරී ප්‍රතිපත්තිය නිසා අවසානයේ කෘෂිකර්මාන්තය රටේ දළ ජාතික නිෂ්පාදනයේ විශාල කුඩා පංගුවක් බවට පත් වුණා. ඒක නිසා දැන් අපට අලුතෙන් ආපසු කියන්න වෙලා තිබෙනවා. අපේ මහින්ද අමරවීර ඇමතිතුමා අපි වවලයි - අපි කන්නේ කියලා දැන් අලුත් ප්‍රතිපත්තියක් ඇවිල්ලා තිබෙනවා. අපි වවලයි - අපි කන්නේ කියලා තමයි අද කියන්න වෙලා තිබෙන්නේ. නමුත් අවුරුද්දකට අපට රුපියල් මිලියන 2000 කට ආසන්න ප්‍රමාණයක් පලතුරු පිටරටින් ගෙන්වන්න වැය කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම වෙනත් එළවළු වර්ග, විවිධ ආහාර වර්ග මේ රටට ගෙන්වන්න අපට රුපියල් මිලියන 750 කට ආසන්න ප්‍රමාණයක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ නිසා මම කියන්න කැමැතියි. අද බස්නාහිර පළාත ගැන කථා කරනවා. රටේ සමස්ත කෘෂිකර්මය නොවෙයි, බස්නාහිර පළාත. බස්නාහිර පළාතේ කෘෂි කර්මාන්තය තුළින් මේ බස්නාහිර පළාතේ දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන දායකත්වය කොච්චරද? කොච්චර වැඩි වෙලා තිබෙනවාද? බිත්තර නිෂ්පාදනය, මස් නිෂ්පාදනය, ඒ වාගේම පලතුරු නිෂ්පාදනය, එළවළු නිෂ්පාදනය, දියර කිරි නිෂ්පාදනය හා ඒ ආශ්‍රිත අනිකුත් නිෂ්පාදන කොතෙක් දුරට වැඩි වෙලා තිබෙනවාද කියලා අපි අහන්න ඕනෑ. නමුත් අපට පෙනෙන්නේ නම් අපේ පංගුව, දළ දේශීය නිෂ්පාදනයේ පංගුවයි කෘෂිකර්මාන්තය ඇතුළේ වේගයෙන් හැකිලෙමින් තිබෙන්නේ. බස්නාහිර පළාත තුළ අද වේගයෙන් ප්‍රසාරණය වෙමින් තිබෙන්නේ, සේවා ආර්ථිකය හා කාර්මික ක්ෂේත්‍රය සම්බන්ධ ආර්ථික වේගය වේගයෙන් ප්‍රසාරණය වෙන්නේ. ඒ නිසා අපේ ගරු ඇමතිතුමාට මම කියන්න කැමැතියි. අපට අවශ්‍යයි. කෘෂිකර්මාන්තය අද වාණිජකරණය කරන්න ඕනෑ. නවීකරණය කරන්න ඕනෑ. ඒ වාගේම යැපුම් කෘෂිකර්මයෙන් තවදුරටත් ඉස්සරහාට යන්න බැහැ. මේක මහා පරිමාණ කෘෂිකාර්මික වැඩ පිළිවෙළක් විධියට, වාණිජ මට්ටමින් කෘෂිකර්මාන්තය නගාසිටුවන්න ලාභ ලබන වෙළඳ පොළත් එක්ක බද්ධ වුණු, ගෝලීය වෙළඳ පොළත් එක්ක බද්ධ වුණු කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් තුළින් පමණයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කෘෂිකර්මාන්තයට අලුතින් වෘත්තීය මට්ටමින් තරුණයින් කැඳවා ගන්න පුළුවන් වන්නේ. එහෙම නැතිව යැපුම් මට්ටමින් තවදුරටත් සහනාධාර දිදී, පොහොර සහනාධාර දීලා, අනෙකුත් සහනාධාර දීලා මේ කෘෂිකර්මාන්තය තවදුරටත් නඟාසිටුවන්න බැහැ. හොඳ උදාහරණය තමයි එක ජල බිංදුවක් නැති, එහෙම නැත්නම් වාරි ශිෂ්ටාචාරයක් නැති ඊශ්‍රායලය අද කොහොමද ලෝකයේ වැඩිම කෘෂි නිෂ්පාදනයට දායක වෙන්නේ කියන එක පිළිබඳව

අධ්‍යයනයක් කරලා ඒ තුළින් අපට යම්කිසි පාඩමක් ඉගෙන ගන්න තිබෙනවා නම්, අන්න ඒ පාඩම ඉදිරි කාලයේදී මේ බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කරන්නය කියලා ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොමත්ම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට මූලාසනයට ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Lalith Ellawala M.P.C took the Chair.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 15 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 04.20]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාතේ අපේ කෘෂිකර්ම අමාත්‍යාංශය ප්‍රධාන කරගෙන වැය ශීර්ෂයට කථා කරන්න ලැබීම ගැන ගොඩක් සතුටුයි. විශේෂයෙන් මේ බස්නාහිර පළාතේ අපි සක්‍රීයවම සහභාගි වන, ඒ වාගේම හැමදාමත් උපදේශක කාරක සභාව මාසිකව පවත්වන අමාත්‍යාංශයක් තිබෙනවා නම්, ඇමති කෙනෙක් ඉන්නවා නම්, ලේකම්තුමෙක් ඉන්නවා නම් ඒ බස්නාහිර පළාතේ කෘෂිකර්ම අමාත්‍යාංශය. ඒ නිසා අඛණ්ඩව ඒ අමාත්‍යාංශ හරහා නිරන්තර මහජන මන්ත්‍රීතුමන්ලා ඒකරාශී කරමින් විවිධ වැඩ සටහන් මේ බස්නාහිර පළාත තුළට ගොනු කරන්න අපේ ගරු ඇමතිතුමා සම්බන්ධ වුණා. මේ ගරු ඇමතිතුමාට මගේ විශේෂ ගෞරවයක් තිබෙන්නේ. මේ වාරය තුළ සමහරවිට අපේ අවසාන අයවැය කථාවන් වෙන්න පුළුවන්. විශේෂයෙන් මේ ගරු ඇමතිතුමාට මා ගරු කොට සලකන්නේ, අපේ මේ උපදේශක කාරක සභාවට සහභාගි වෙලා යමක් කිව්වාම එය යථාර්ථයක් බවට පත් කරන්න එතුමා ගොඩක් වෙලාවට උත්සාහ කරනවා. මම මේ පළාත් සභාවේ උපදේශක කාරක සභාවට ඇවිල්ලා, අපේ ප්‍රදේශවල ග්‍රාමීය මිනිස්සුන්ගේ තිබෙන, ඒ කෘෂිකර්මයට තිබෙන ගතානුගතික භාවයන් - සමහරවිට කෙම් ක්‍රම වෙන්න පුළුවන්. නොයෙක් විශ්වාසයන් වෙන්න පුළුවන්. සම්ප්‍රදායන් පිළිබඳව අදහසක් දැක්වූවාම ගරු ඇමතිතුමාත්, ඒකට ලේකම්තුමාගෙනුත් උපදෙස් අරගෙන පොතක් නිර්මාණය කළා, පළුමං කැටීම කියලා පොතක්. ඒ පොතේ තිබෙනවා, කෘෂිකර්මයට සම්බන්ධ සම්ප්‍රදායන් සහ ග්‍රාමීය කෘෂිකර්මයේ තිබෙන හැඩතලයන් එතැන ඔක්කොම අන්තර්ගත වෙලා තිබුණා. ඒ නිසා අපට සතුටක් තිබෙනවා. අපි දෙයක් කර පින්නාගෙන ඇවිල්ලා මෙය ප්‍රකාශයට ගෙනාවාම එය යථාර්ථයක් බවට පත් කරනවා නම්, බිමින් ආපු පුද්ගලයෙකු වශයෙන් මෙතැනට ඇවිල්ලා මම අපේ ඇමතිතුමාට කිව්වා, ඇමතිතුමා හරකෙකුගේ මිල රුපියල් ලක්ෂයයි දෙකයි. රාත්‍රියක් එළි වෙන කොට මේ හරකා හොරු පැහැර ගෙන ගිහිල්ලා තිබෙනවා. මේකට වැඩ සටහනක් කොහොමද? ඇමතිතුමා ඒකට වැඩ සටහනක් හදලා යම්කිසි ආරක්ෂිත කැමරා පද්ධතියක් සහිත, නලා පද්ධතියක් සහිත යමක් නිර්මාණය කරලා අද වන කොට බස්නාහිර පළාත තුළ ප්‍රචලිත කරලා තිබෙනවා. ඒක නියාමක ව්‍යාපෘතියක් වශයෙන් ගෙනැල්ලා අද විශාල ඉල්ලුමක් ඒ තුළට අන්තර්ගත වෙලා තිබෙනවා. ඒ නිසා අපට සතුටක් තිබෙනවා. ප්‍රදේශයේ මහජනතාවගේ ඉල්ලීමක් ගොනු කළාම, ඒ සඳහා ඇමතිතුමාගේ තිබෙන උවමනාව.

ඒ වාගේම තමයි මේ කෘෂිකර්ම අමාත්‍යාංශයට මොන ජීවයක් ඇමතිතුමා දීලා තිබෙනවාද? නිකම්ම පාළු ඉඩම් වෙලා තිබුණු වගාබිම් ටික. කොටදෙනිය වෙන්න පුළුවන්. වල්පිට වෙන්න පුළුවන්. මේවා නිකම්ම නිකම් නමක් විතරයි තිබුණේ. මේ තුළට කෘෂිකර්මය ආදර්ශය කරනවා වාගේම සත්ව ගොවිපලවල්, ඒ වාගේම මිරිදිය කරදිය වාගේ ඒ ධීවර කටයුතු. ඒවා සක්‍රීය තත්ත්වයට ගෙනැල්ලා මේවා යථාර්ථයන් බවට පත් කර තිබෙනවා. මේවා සුදු අලි නොවෙන්නට කෙනෙකුට ගිහිල්ලා බලන්න, නරඹන්න, විමර්ශනය කරන්න පුළුවන් විධියට ඒ ගොවිපලවල් සංවර්ධනය කරලා තිබෙනවා. ඒ වාගේම තමයි ඇමතිතුමා හරහා ඇති වුණු කෘෂිකර්ම ප්‍රදර්ශන ගණනාවකට අපි සහභාගී වුණා. ඒවා ඉතාමත් ඉහළ මට්ටමේ කෘෂිකර්ම ප්‍රදර්ශන ලෙස අපි දැකලා තිබෙනවා. ඒ නිසා මේ සමාජයට යමක් දෙන්න, රටට යමක් දෙන්න බස්නාහිර පළාතේ

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

කෘෂිකර්ම ඇමතිතුමා වශයෙන් එතුමාට ලොකු උවමනාවක් තිබුණා. ඒකට හරියන කාර්ය මණ්ඩලයක් හිටියා. හැකියාවක් තිබුණා. අපි නිරන්තරයෙන්ම ඇමතිතුමාගේ ක්‍රියාදාමය ගරු කළා. ඒක මම විතරක් නොවෙයි. මුළු බස්නාහිර පළාතෙන්ම එතුමාට ඒ අවස්ථාව ලැබුණා. ඒ විතරක් නොවෙයි. අපි මොන වගාව ගත්තත්, වී වගාව ගත්තත් ඇමතිතුමාට ක්‍රමවේදයක් තිබුණා. පැරෂූට් ක්‍රමයට වී ටික කොහොමද ගහන්නේ? යාය ක්‍රමයට කුඹුරු ටික වපුරන්නේ කොහොමද? පුරන් කුඹුරු ටික වපුරන්නේ කොහොමද? බිත්තර වී ටිකක් හදා ගන්නේ කොහොමද? ගොවියාට දෙන්න පුළුවන් සහයෝගය මොකක්ද? ඇළ වේල්ල කපලා දෙන්නේ කොහොමද? එහෙම නැත්නම් ඇනිකට් එක, ලැලි ටික දෙන්නේ කොහොමද? ට්‍රැක්ටර් පැන්නුම දාලා දෙන්නේ කොහොමද? එහෙම නම් කෘෂිකර්මය වශයෙන් තිබෙන කෘෂි මාර්ගය හදලා දෙන්න එතුමාට කරන්න පුළුවන් කාර්යභාරය මොකක්ද? ඇමතිතුමෙක් වශයෙන් තමන්ට තිබෙනවා නම්, මල්ලියේ කොහොම හරි කරමු බං කියලා හැඟීමක්, ඒක එසේ කරන්න තරම් උවමනාවක් ඇමතිතුමාට තිබුණා. එතුමාට නීතිරීති හරස් වුණේ නැහැ. යම්කිසි කරුණු කාරණා කියන්න ගියාම, ලේකම්තුමාට කථා කළාම, එතුමාගේ කාර්ය මණ්ඩලයට කථා කළාම නීතිය හරස් වෙනවාට වඩා එය කරන ක්‍රමවේදයක් එතුමා සැලසුම් කරලා තිබුණා. ඒක ප්‍රතිලාභියාට ලබා දෙන වැඩ සටහන් ඇමතිතුමා ළඟ තිබුණා. ඒ නිසා දක්ෂතාවය තිබුණා. පරිණතභාවය තිබුණා. එතුමාත් හොඳ ගොවියෙක් වාගේ. ඒ කරුණු කාරණා ඉදිරිපත් වනකොට දිස්ත්‍රික්ක තුනට සම සේ සලකමින්, ඒ අවශ්‍ය මිනි බැකෝ යන්ත්‍ර අරගෙන ඇළ වේලි කපන්න, ඒ ජල ගැලුම් පාලනය කරන්න ඒ ගොවියාට අවශ්‍ය වටපිටාව හදලා දීලා තිබුණා. මෙන්න මේ අතරේ තමයි මම කනගාටුවට පත් වෙන්නේ.

විශේෂයෙන් අපි දන්නවා. වස්කෝද ගාමා එදා ඉන්දියාවට එන්නේ, මේ දකුණු ආසියානු රටවල් සොයා ගෙන එන්නේ මේ රටවල තිබුණු සම්පත් පිළිබඳව එතුමාට හොඳ අවබෝධයක් තිබුණා. එතුමා නැව් පිටින් මේවා එකතු කරන්න ආවා. ප්‍රධාන දේ තමයි මේ ජන ප්‍රදේශවලින් කුළුබඩු අරගෙන යන්න. පළාත් සභාවේ අපේ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා මධ්‍යම රජය වෙන්න පුළුවන්. නිරන්තරයෙන්ම කටයුතු කරනවා. ගම්මිරිස් පැළ බෙදන්න, කරාබු නැටි බෙදන්න. කෝපි වෙන්න පුළුවන්. විවිධ වූ ද්‍රව්‍යයන් කෘෂිකර්ම පැත්තෙන් වගා කරන කොට මධ්‍යම රජයේ ඇමතිතුමාගේ පුත්‍රයෙක් කරන්නේ මේවා සියල්ල පිටරටින් ගේන තත්ත්වයක් උදා කරලා තියෙන්නේ. මේ ප්‍රති අපනයනය නිසා අද තිබෙන අපේ සුළු කෘෂිකාර්මික ජීවනෝපාය බින්දුවටම වැටිලා තිබෙනවා. විශේෂයෙන් අපේ ගම්බද ඉඩමක් ගත්තාම හැම පොල් ගහකටම ගම්මිරිස් වැලක් යවලා තිබෙන්නේ. හැම පුවක් ගහකටම ගම්මිරිස් වැලක් යවලා තිබෙනවා. හැම ගෙදරකම. මේවා අද බිමට වැටිලා. මේවා අද කඩන්න මිනිස්සු යනවා. ඇවිල්ලා හතරෙන් එකට කඩනවා. භාගෙට කඩනවා. මිලට කඩනවා. ඒවා කඩන්නවත් අද මිනිස්සු ඉදිරිපත් වෙන්නේ නැහැ. ගම්මිරිස් කුණු කොල්ලයට ගිහිල්ලා තිබෙන්නේ. ගමක ගෙදරක අටුවක, දුමක සමහර විට ගොරකා මුට්ටි ගණන් තිබුණා. ගොරකා කිලෝවක් රුපියල් සීයකටවත් විකුණගන්න පුළුවන්කමක් නැහැ. කරාබු නැටි ටිකටත් ඒ දේ තමයි. සාදික්කා ටිකටත් ඒ දේ. ඒ නිසා මේ කුළුබඩු පැත්තෙන්, එහෙම නැත්නම් මේ මිනිස්සුන්ගේ සුළු අපනයන භෝග සම්බන්ධයෙන් ඉතා ඛේදජනක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ඒ ඛේදජනක තත්ත්වය නිසා ගමේ ගෘහණිය, ගමේ අම්මා අත තිබෙන මුදල් පරිහරණය අවම වෙලා තිබෙනවා. අම්මා තමයි මේ සියල්ල එදිනෙදා ජීවිතයට පරිහරණය කර ගත්තේ. ඒ නිසා මේ සුළු අපනයන පැත්තෙන් ඉතා ඛේදජනක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ඉක්මණින් කළ යුතු වෙන්නේ, මේ ප්‍රති අපනයනය නවත්වන්නට ඕනෑ. මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් දේ නිෂ්පාදනය කරන්න, අපනයනය කරන්න පුළුවන් දේ අපනයනය කරන්න ඒවාට දිරි දෙන්නට ඕනෑ.

අතීතයේ අපි දැක්කා. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ යුගයේ අපනයන ගම්මාන 22 ක් මේ රටේ නිර්මාණය කරලා තිබුණා. පුංචි කාලේ ඉස්කෝලේ යන කොට අපනයන ගම්මාන ටික මොනවාද කියලා කියන්න කිව්වාම, අපට කඩ පාඩම්. ගස්ලබු කිරිත් පිටරට යැව්වා. බුලත් පිටරට යැව්වා. ඒ ගම්වලට වටිනාකමක් දීලා තිබුණා. පුංචි කාලේ බිබිලේ තියෙන්නේ මොනවාද? කළුතර තිබෙන්නේ මොනවාද? මල්වානේ තිබෙන්නේ මොනවාද? පුංචි කාලේ අපි මොන තරම් කට පාඩමින් කිව්වාද? නොදියුණු යුගයක කෘෂිකර්මය සම්බන්ධයෙන් කීර්ති නාමයක් දිනා ගත්ත ගම්මාන තිබුණා. මේ හරහා ඒ මිනිස්සුන්ගේ ආර්ථිකය දියුණු වෙලා තිබුණා. අද මේ සියලු දේවල් බිඳ වැටිලා තිබෙන්නේ. හැම දෙයක්ම

මේ රටට ආනයනය කිරීම සහ නැවත පිටරටින් ආනයනය කරලා අපනයනය කිරීම නිසා මේ සියලුම කර්මාන්ත බිඳ වැටිලා තිබෙනවා. අපේ ප්‍රදේශයේ සමහර විට රඹුටන් ගොවීන් වාගේ අය බොහොම අන්ත අසරණතාවයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේවාට විසඳුම් සොයන්නට ඕනෑ. ඒ වාගේම තමයි. මේ ඛේදජනක තත්ත්වයට අමතරව අපේ රටේ තිබෙන විසඳාගත්තේ නැති එකම ප්‍රශ්නය තමයි කල් තබා ගන්නා ක්‍රම අපේ රට තුළ ඇති නොවීම. විශේෂයෙන් මේවාට මධ්‍යම රජය මැදිහත් විය යුතු වුණත්, පළාත් සභාවේ වුණත් අපි බැලුවා නම් තක්කාලි වුණත් - තක්කාලි නෙලන කාලයේ තමයි සමස්තයම තක්කාලි නෙලන්නේ. ඒක අපේ ගෙවත්තේ තිබෙන ගහෙත් වෙන්න පුළුවන්. ඒක මහා පරිමාණයෙන් කරන ව්‍යාපාරිකයා වෙන්නත් පුළුවන්. අල වුණත්, ලූනු වුණත්, රඹුටන් වුණත් හැම දෙයක්ම නෙලන කාලයට දැවැන්ත ආකාරයෙන් මේවා නෙලා ගන්නවා. මිල පහළ යනවා. ගොවියා ප්‍රපාතයට යනවා. මේවා කල් තබා ගන්න ක්‍රමයක්, ශීතකරණ, ශීත ගබඩා ඇති කරන ක්‍රමයක් මේ රට තුළ තව නිර්මාණය වෙලා නැහැ.

ඒ නිසා අපි මේ කෘෂිකර්මය කරන කොට ඉස්සර නම් මිනිස්සු කිව්වා, දැන වෙළඳාම, නොදැන ගොවිතැන. ගොවිතැන් කරන්න දැන ගන්න ඕනෑ නැහැයි කියලයි මිනිස්සු කිව්වේ. ඒ නිසා මේ කථිකාවත අද වෙනස් වෙන්නට ඕනෑ. ගොවිතැනත් දැනගෙන කරන්නට ඕනෑ. ගොවිතැන කරන කොට කොහොමද ඒ වකවානුව පිළිබඳව ඒවායේ තිබෙන අවශ්‍ය මූලික දේවල් පිළිබඳ අපට අවබෝධයක්, අද තාක්ෂණික වශයෙන් ලබා ගෙන කළොත් අපට පුළුවන් වෙනවා, ගොවියා හොඳ තත්ත්වයට ගේන්න. ඒ නිසා අපි වඩා බුද්ධිමත්ව මේ ගොවිතැනට යෙදෙන්නට ඕනෑ. ඒ වාගේම තමයි, විශේෂයෙන් ඇමතිතුමා හරහා මේ බස්නාහිර පළාත නව මගකට යොමු වුණා. හැම මන්ත්‍රීතුමාම කියන්න ගත්තා, අන්න කෘෂිකර්ම අමාත්‍යාංශයට ගිහිල්ලා බලන්න. ඇමතිතුමා තමන්ගේ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරු ටික මොකක් හරි නිරීක්ෂණ චාරිකාවක් සඳහා එක්කගෙන යනවා. අපව එක්කගෙන ගියා යාපනයේ වගාවන් බලන්න. මිදි වතු ටික බලන්න එක්කගෙන ගියා. ඒ පැත්තේ තිබෙන ගවගාල් ටික බලන්න එක්කගෙන ගියා. ඩෙල්ෆ් දූපතට අරගෙන ගිහිල්ලා අශ්වයන්, ඒ පැත්තේ තිබෙන කෝමාරිකා වගාවන්, ඒවා පිළිබඳව අපට අවබෝධයක් ලබා දුන්නා. රටේ ලෝකයේ වෙන්නේ මොනවාද? ඒ වාගේම මිරිජ්ජවිල එක්කගෙන ගියා. එහෙම නැත්නම් කෘෂිකර්මයේ තිබෙන ගවගාල් ටික බලන්න එක්කගෙන ගියා. ඒ වාගේම මල් වගාවන් බලන්න එක්කගෙන ගියා. කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා අපට මේ ලංකාව තුළ නොදන්නා බොහෝ දේ අපේ හිතට ඇතුළු කර ගන්න පුළුවන්කම තිබුණා. චූවමනාවක් තිබෙන කෙනෙකුට ඒවා මහ පොළොව තුළ යථාර්ථයක් කරන්න, පණිවුඩයක් දෙන්න, එහෙම නැත්නම් ඒවා ප්‍රායෝගිකව කරලා පණිවුඩයක් අරගෙන යන්න හොඳ මනා පුහුණුවක් සහ උපදෙස් ලබා දෙන්න පුළුවන්. ඒවා අපට ලබා දුන්නා. මේවා ලෙහෙසියෙන් හා වෙනත් අමාත්‍යාංශවලින් අපට කවදාවත් ලැබුණු දේවල් නොවෙයි.

ඒ නිසා කෘෂිකර්ම ඇමතිතුමා හරහා මේ බස්නාහිර පළාත් සභාවට ලොකු වටිනාකමක් ලැබුණා. මන්ත්‍රීතුමන්ලා කැමැති වුණා කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට එන්න. ඒක තමන්ට තිබෙන ආයෝජනයක් වෙනවා. ඒ වාගේම අමාත්‍යාංශයට යමක් ඉල්ලුවාම ඇමතිතුමා ඇළ කපා ගන්න ආවේ. ඇමතිතුමා බිත්තර වී ටික ගන්න ආවේ. ඇමතිතුමා කොස් පැලයක් බෙදා ගන්න ආවේ. මොන තරම් වටිනා දෙයක්ද? ඇමතිතුමා මහ හයියෙන් උජාරුවට එදා අපි කළුතර ද කොහේද ගියාම කියනවා, මෙන්න ජනාධිපතිතුමා හිටවපු කොස් පැලය. අද අඩි තුන හතරක් වැඩිලා. තව මාසයකින් දෙකකින් ඒකේ ගෙඩියක් හට ගන්නවා. හෝමාගම. සතුටු වෙන්න පුළුවන්. මම ඉස්සෙල්ලාත් කිව්වේ. අපි මේ හැම දෙයක්ම කරන්න ඕනෑ හෘදය සාක්ෂියට එකඟව. මේ මහ පොළොවේ ජනිත කරන හැම දෙයක්ම දැකීමෙන් අපි සතුටු වෙන්නට පුළුවන්. ඒ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා. ඇමතිතුමාගේ තිබෙනවා, සංකල්ප ගණනාවක්. කොස් පැළ ලක්ෂ 10 ක් බෙදලා දෙනවාය කියන්නේ, මේ රටේ මධ්‍යම රජයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා උඹලා ක්‍රෝටන් කොල කන්න පුරුදු වෙයල්ලා කියන යුගයක අපේ බස්නාහිර පළාතේ කෘෂිකර්ම ඇමතිතුමා එදා හඳුන්වලා දෙනවා කොස් පැළ ලක්ෂ 10 ක් සිටුවීමේ ව්‍යාපෘතිය. මේ බත් ගහ හිටවන්නේ. අනාගතයේ මේ රටේ ආහාර හිඟතාවයක් ඇති වුණොත් ඒවාට අපි මුහුණ දෙන්නේ කොහොමද? කොස් ගෙඩිය පිළිබඳව කථා කරන්න ගියාම ඒකට දිගු වෙලාවක් යනවා. ඒකෙන් ගන්න තිබෙන ඵල ප්‍රයෝජන ඉතාමත් සුලභයි. ඒ නිසා ඇමතිතුමාට ඒ වාගේම පණිවුඩයක් තිබුණා. ළමයිනේ, ගෙදර ගෘහ මූලිකයන්ට කථා කරලා කිව්වා, උඹලා පලයල්ලා පැයක් තමන්ගේ ගෙවත්තට. ගෙදර ගහ

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

හැදෙන්නෙත් ළමයෙක් හැදෙනවා වාගේ තමයි. අපි ළඟට ගියාම තමයි ඒ ශාකය අපි දෙසට ආකර්ෂනය වෙන්නේ. ඒ තුළට ගියාම තමයි පළිබෝධකයාගේ විනාශය අපි දකින්නේ. ගහේ වැඩීමේ මොනවා හරි රෝගයක් තිබෙනවා නම් දකින්නේ. ඒකට අලාභහානියක් තිබෙනවා නම් දකින්නේ, ගෙවත්තට පැයක් කියන වැඩ සටහන තුළින්. ඇමතිතුමා මම හිතන්නේ, ලොකු මානසික තෘප්තියක් ලැබුවා. එතුමා හොඳ සංකල්පයක් දුන්නා. මිනිස්සුන්ව භාවනාවකට හුරු කළා. පැයක් තමන්ගේ ගෙවත්ත තුළ වැඩ කළාම ඒ තුළින් ලබන ආත්ම තෘප්තිය තුළින් එතුමා හොඳ පණිවුඩයක් මේ සමාජයට ලබා දුන්නා. ඒ නිසා තමන්ගේ තිබෙන පරිණතභාවයත්, තමන්ගේ තිබෙන අත්දැකීම් සහ පියෙකු වශයෙන් එතුමා මේ සමාජයට යමක් දෙන්න නිරන්තරයෙන් උත්සාහ කළා. ඒ නිසා අපිත් බොහොම කැමැත්තක් දැක්වුවා, ඇමතිතුමාගේ අමාත්‍යාංශයට එන්න. ඇවිල්ලා එතුමාත් එක්ක එකතු වෙලා වැඩ කටයුතු කරන්න.

මම බෞද්ධයෙකු වශයෙන් වැඩිය කැමැති නැහැ කුකුල් පැටව් බෙදන්න. මම කැමැති නැහැ මාළු පැටව් බෙදන්න. ඉතින් මේ දෙක තුනම රාජකාරියට ගියාම මගේ චේතනාව පාරිශුද්ධ බැවින් මම ඇමතිතුමාට කථා කරලා කිව්වා, ඇමතිතුමා අපිටත් කුකුල් පැටව් ටිකක් බෙදුවොත් හොඳයි. කුකුල් පැටව් නොවෙයි කිකිළි පැටව්. මේ වන කොට කිකිළි පැටව් දහස් ගණනක් බෙදලා දීලා තිබෙනවා. අපේ ගෙවල්වල අද ස්වයං පෝෂිත ආහාර වේලක්, බිත්තරයක් සහිත, එදිනෙදා කර ගත්තු ගෙවතු වගාවක් සහිත ආහාර වේලක් ගන්න අද පුළුවන්කම ඇති වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි ධීවර කර්මාන්තය. ඒ වාගේම තොටුපලවල් හදන්න. විවිධ වූ වැඩ සටහන් ඇමතිතුමා හරහා අපට කර ගන්න තිබුණා. මේ අමාත්‍යාංශය හරහා අපි මොනවාද නොකළේ? අපි උදැල්ල බෙදුවා. අපි තණකොල කපන මැෂින් එක බෙදුවා. අපි අත් ට්‍රැක්ටරය බෙදුවා. පැල සිටුවන යන්ත්‍ර බෙදුවා. ඒ වාගේම අපි සීසාන යන්ත්‍ර බෙදුවා. වී ටික හුළං කරන ඒවා බෙදුවා. බිත්තර වී හදන ඒවා බෙදුවා. මේ අමාත්‍යාංශ හරහා බෙදපු නැති දෙයක් නැහැ. ඒ නිසා අපට ලොකු වටිනාකමක් ලැබුණා. මඩ සෝදා ගත් කළ ගොවියා රජකමටත් සුදුසුයි කියලා කියන්නේ. ඒ කියන්නේ මිනිස්සුන්ගේ අවංකභාවය පිළිබඳව. මිනිස්සු ආවා සොයා ගෙන. මන්ත්‍රීතුමා අපට අභවල් දේ කරලා දෙන්න. මට ලොකු හයියක් ලැබුණා මේ අමාත්‍යාංශය හරහා. ලොකු වැඩ කොටසක් කළා. මේ කෘෂිකර්ම ඇමතිතුමා හරහා කරන්න පුළුවන් වුණු නිසා. ඒ වාගේම පුංචි දරුවෝ සහභාගී කළා. එදා අඹ පැළයක් සිටුවන කොට දරුවෝ ඇහුවේ, මොනවාද සීයේ මොකද කරන්නේ? මොකටද නුඹ ඔය බිම හාරන්නේ. සීයාගෙන් අහන්නේ. සීයා කිව්වා, මම පුතේ අඹ පැලයක් සිටුවනවා. අනාගතයේ පරිසර සුරක්ෂිතභාවයට, අනාගතයේ පරිභෝජනයට ගසක් සිටුවනවා. කොස් පැළ දහස් ගණනක් මම ඇමතිතුමාගෙන් රැගෙන ගිහිල්ලා අපේ අත්තනගල්ල ආසනය ආශ්‍රිතව පුංචි දරුවෝ පාවිච්චි කරලා ඒ කොස් පැළ දහස් ගණන සිටුවලා තිබෙනවා. ඒ දරුවෝ රූප සටහන් හදලා තිබෙනවා. රූප සටහන් හදලා මට ගෙනැල්ලා පෙන්නුවා. මෙන්න මාමේ කොස් ගහේ උස දැන්. මැනලා ගෙනැල්ලා පෙන්වනවා. මම ඉස්කෝලෙට දුන්නේ චාර්ට් එකක් එක්ක. පුංචි දරුවෝ සතුටින්, දවසින් දවස තමන්ගේ අම්මා හරි තාත්තා හරි එක්ක මේ කොල් පැළය බලලා මට කියනවා, මගේ කොස් පැළය මෙපමණ උසයි. අර සීයා දුන්න පණිවුඩය. අපි කොස්පැළ බෙදුවේ අපට කොස් කන්න නොවෙයි. අනාගතයට මේ පරිසරයේ සමතුලිතභාවයට අපට මේ පැළ සිටුවන එක වැදගත්. ආහාර හිඟතාවයට පැළ බෙදන එක වැදගත් දෙයක්. ඒ වාගේම තමයි පැළයක් සිටුවීමෙන් මේ සමාජයට වන සේවය අති විශාලයි. ඒ නිසා අපි ඇමතිතුමා හරහා මේ හා දැවැන්ත වූ වැඩ කොටස් ගණනාවක් කළා.

ඒ වාගේම තමයි ඇමතිතුමාගේ තිබෙන ඉඩම් අමාත්‍යාංශය. ඉඩම් අමාත්‍යාංශය හරහා විශාල කාර්යභාරයක් - අපේ ප්‍රදේශයේ දුෂ්කර මාර්ග ටික හදන්න ඉඩම් අමාත්‍යාංශය හරහා අපට පුළුවන් වුණා. ගල් වැටි ටික බැඳලා දුන්නා. වතුරට ටිකක් පාවිච්චි කරන්න නැති මිනිස්සුන්ට වතුර ටිකක් බෙදලා දුන්නා. ඒ නිසා ඉදිරියටත් මම කියන්නේ. අමතිතුමා මේ ඉඩම්වල ප්‍රශ්න තිබෙනවා. සමහර විට ලබා දුන්න ලොට් අංකයේ නොවෙයි ඔවුන් ජීවත් වෙන්නේ. ඔවුන්ට තව ජල ප්‍රශ්න තිබෙනවා. සමහර විට සිතියම කැලි කඩලා තිබෙන්නේ කාමරයක් උඩ ඉඳගෙන. ඒ නිසා පාර හරහා ලොකු ගල් වැටියක් වැටිලා තිබෙනවා. මේ වාගේ යම් යම් කාරණා තිබෙන ඉඩම් ප්‍රශ්න තිබෙනවා නම්, මේවා ඉස්සෙල්ලා දෙන්නට ඕනෑ. ඒ නිසා ඔබතුමාගේ අමාත්‍යාංශයට අපි හැමදාමත් මේ පළාත් සභාවේ හැම කෙනාම ආශිර්වාද කළා වාගේම මම නම් නිරන්තරයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශයට සුභ පතනවා.

ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඔබතුමා විතරක් නොවෙයි. අමාත්‍යාංශයේ ලේකම්තුමා. පෞද්ගලික ලේකම්තුමා මේ වකවානුවේ දකින්න නැති වුණා. එතුමා අසනීප වුණා. ඒ වාගේම අනික් කාර්ය මණ්ඩලයේ සියලු දෙනා බොහොම කාරුණිකයි. බොහොම හොඳින් කථා කරනවා. යමක් කිව්වාම කොහොම හරි කරලා දෙන්න එතුමන්ලාට ලොකු උවමනාවක් තිබුණා. අපි මහජන නියෝජිතයෝ. අපි බිමින් ගෙනෙන දේ මේ මහ පොළොවේ යථාර්ථයක් කරන්න නම් අපට ඇමතිතුමාගේත්, කාර්ය මණ්ඩලයේත් හයියක් ඇති වෙන්නට ඕනෑ. ඒ නිසා ගමෙන් ආපු මහජන නියෝජිතයෙකු වශයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා අපි දැවැන්ත වැඩ කොටසක් අපේ ගම් ප්‍රදේශවල අරගෙන ගියා. ගොවීන් අතර ලොකු විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා. උපුල් මන්ත්‍රීතුමාට කිව්වොත් මේ දේ කරන්න පුළුවන් කියන විශ්වාසය ගොඩ නැගිලා තිබෙනවා. ඒ විශ්වාසය ඔබතුමා ඉන්න තාක් කල් මමත් පළුදු කර ගන්නේ නැතිව හොඳින් ඉටු කළ හැකි යැයි විශ්වාස කරමින්, ඔබතුමාගේ වැය ශීර්ෂයට මගේ සුභාශිංසන පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 04.37]

**ගරු ජනක කුරුප්පු**
Hon. Janaka Kuruppu

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අයවැයට කථා කරන මගේ පළමුවැනි දවසයි. මම ඒ ගැන ඇත්තටම සතුටු වෙනවා. මොකද, මමත් කෘෂිකාර්මික ගොවි පවුලකින් පැවතගෙන එන තරුණ මන්ත්‍රීවරයෙක් විධියට, මමත් ගොවිතැන් කරනවා. අපේ අත්තනගල්ල ආසනය තමයි මම නියෝජනය කරන්නේ. අද ඇත්තටම අපි යල මහ කියලා කන්න දෙකක් කළාට අපේ ගොවියන් අසරණ වෙලා සිටින්නේ. අපේ පැත්තේ විශාල වශයෙන් කරන්නේ වී වගාව. ගරු ඇමැතිතුමනි, අලෙවි කර ගන්න බැරි ප්‍රශ්නය තමයි තිබෙන්නේ. ඔවුන් සෑම විටම කන්නය කපලා ගෙට ගනිද්දී ඔවුන්ට මුහුණ දෙන්න වෙන ගැටළුව. ඒ සඳහා ඒ වාගේ ප්‍රශ්නයක් තිබෙද්දී තමයි අද ගොවිතැනට මිනිස්සු යොමු වෙන්නේ නැත්තේ. ඒක අපේ ආසනයේ විතරක් නොවෙයි. ලංකාවේ සෑම තැනම තිබෙන පොදු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ මොකද, අද මේ ව්‍යාපාරිකයින් පිටරටින් සහල් මෙරටට ගෙන්වීමේදී මම හිතන විධියට ඔවුන් සියලු දෙනා එකතු වෙලා අපේ ගොවියන්ගේ ඔවුන් ගන්නා අස්වැන්න නිසි මිලකට අලෙවි කර ගන්න බැරි තත්ත්වයක් උදා කරන්නේ මේ ව්‍යාපාරිකයන් කියලා අපට සෘජු වශයෙන්ම ඇඟිල්ල දික් කරන්න පුළුවන්. ඔවුන් තමයි මේ දේ කරන්නේ. ඒ නිසා තමයි අද පුරන් කුඹුරු බවට පත් වෙලා තිබෙන්නේ. ඒ මොකද, පුරන් කුඹුරු අස්වද්දන්න කියලා කිව්වාට කරන්නේ නැහැ. ඒ සඳහා අපි සමිති හදා ගෙන ඒවා රජයට ගන්නවා කිව්වාම විතරයි පුරන් කුඹුරු ටික අස්වද්දන්න ගොවීන් වෙලට බහින්නේ. රජයට ගන්නවාය කියන භය ඇති කරලා තමයි ඔවුන්ව වෙලට බස්සන්නේ. ඊට පසුව ආයිත් බොරු බයක් ඇති කරනවා. මේ වෙලට බැස්ස ගමන් මී උණයි, නොයෙකුත් ලෙඩ හැදෙනවාය කියලා. ඊට පස්සේ කෘෂිකර්ම නිලධාරීන් ආවාට පස්සේ කියනවා, කොහොමද වෙලට බහින්නේ. මී උණ හැදෙනවා නේ? මේ විධියට තමයි මේවා නතර වෙලා තිබෙන්නේ. නැතිව අපේ ගොවීන්ට නිසි මිලක් - පළමුවැනිම ප්‍රශ්නය තිබෙන්නේ, නිසි මිලක් නැතිකම. ගොවිතැනට. ඒ වාගේම අපේ අත්තනගල්ලේ වේයන්ගොඩ විශේෂ ආර්ථික මධ්‍යස්ථානයක් තිබෙනවා. අපි කොපමණ කථා කළත්, අපේ ආර්ථික මධ්‍යස්ථානය ඉලක්ක කර ගෙන මේ වෙද්දී අත්තනගල්ලේ කිසිම ඉඩමක, කිසිම භෝගයක් ආර්ථික මධ්‍යස්ථාන ඉලක්ක කර ගෙන මේ වෙද්දී සිදු කරලා නැහැ. අපේ අත්තනගල්ලේ විශාල ඉඩම් ප්‍රමාණයක් හිස්ව තිබෙනවා.

අපි පළමුවෙන්ම කරන්න ඕනෑ ගරු ඇමතිතුමනි, මෙම කෘෂිකර්ම නිලධාරීන් ගෙනැල්ලා ඉවර වෙලා, මෙම නිලධාරීන්ට පළමුව ඔවුන්ට කියන්න ඕනෑ, කොහොමද අපේ ඉඩමක් කළමනාකරණය කර ගන්නේ? මොන භෝග ද වගා කරන්නේ? අපට අපේ පැතිවලට හැදෙන භෝග වර්ග තිබෙනවා. හැදෙන්නේ නැති භෝග වර්ග තිබෙනවා. එතකොට අපි කෙසේද මෙම භෝගයක් වවලා ආර්ථික වශයෙන් අපේ පවුලට දායක කර ගන්නේ කියන පණිවිඩය මුලින්ම අපි කෘෂිකර්ම නිලධාරීන් හරහා තමයි ගම්වලට යවන්න ඕනෑ. මොකද, සෑම ග්‍රාම සේවා වසමකම එක කෘෂිකර්ම නිලධාරියෙකු බැගින් ඉන්නවා. පළමුවෙන්ම අමාත්‍යාංශය හරහා ඔවුන්ව දිරිමත් කරලා, ගොවි සමිති හරහා ඔවුන් වෙනුවෙන් යම් දෙයක් කරන්න පුළුවන් වුණොත් විතරයි අපේ මේ කෘෂිකර්මය ඉදිරියට ගෙන යා හැක්කේ. ඒ වාගේම අද කාබනික පොහොර යොදලා වගා කරන ව්‍යාපෘති විශාල වශයෙන් තිබෙනවා. හොඳම උදාහරණය තමයි අපේ නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය. එතුමිය කර ගෙන යන කාබනික පොහොර වගාව අලෙවි කර ගැනීමට විධියක් නැතිකමක්

[ගරු ජනක කුරුප්පු]

තිබෙනවා. මම උපදේශක කාරක සභාවට එක සැරයක් ගිහින් ගරු ඇමතිතුමාට කිව්වා, අපට මෙය අලෙවි කර ගැනීමට දිස්ත්‍රික්ක තුනේම හෝ නැත්නම් අපේ අමාත්‍යාංශවල ක්‍රමවේදයක් හදලා දෙන්න. පිටට යන්න කලින් අඩුම තරමින් අපේ ඉන්න ගරු මන්ත්‍රීවරුන්ට හෝ මෙහේ වැඩ කරන අපේ රාජ්‍ය නිලධාරීන්ට හෝ අපට හොඳ ආහාර වේලක් ගන්න පුළුවන් විධියට ක්‍රමවේදයක් ගරු ඇමතිතුමාට හදා දෙන්නය කියලා මම එදා පළමුවෙන්ම ගිය උපදේශක කාරක සභාවේදී එතුමිය කර ගෙන යන කාබනික පොහොර වී නිෂ්පාදනය සහ එළවළු නිෂ්පාදනය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළා, පළමුවෙන්ම අතහිත දෙන්නය කියලා. අපි ළඟම ඉන්නවා කරන කෙනෙක්. ඊට පසුව ඒ මාර්ගයෙන් අපට මේ ගම්වල - කොහොමත් මේ රසායනික පොහොර නිසා තමයි අද ගොවීන් මම අර ඉස්සෙල්ලා කිව්ව මී උණ වාගේ දේවල්වලට හය වෙලා තිබෙන්නේ. ඒ මේ රසායනික පොහොර නිසා. කාබනික පොහොර යොදා ගෙන කෘෂිකර්මය දියුණු කරන්න අපට කොහොමත්ම පුළුවන්. ඒ වාගේම අර තව මන්ත්‍රීවරයෙක් කිව්වා, අපට මේ ඇළ වේලි හදා ගන්න ඕනෑය කියලා. ඒවාට යන්ත්‍ර සූත්‍ර - ඇත්තටම අපට යන්ත්‍ර සූත්‍ර අවශ්‍ය නැහැ. අපට සමිති තිබෙනවා. ඔවුන් හරිම ශක්තිමත්. නමුත් ඔවුන්ට වැඩේ වෙලා තිබෙන්නේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත වෙලාව අවසානයි.

**ගරු ජනක කුරුප්පු**
Hon. Janaka Kuruppu

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි මට වෙලාව ලබා දුන්නාට.

[අ.භා. 04.44]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන, සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වන ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂයේදී වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව අපි හදවතින්ම සතුටු වෙනවා. මම හිතන්නේ, මේ අවුරුදු හතර පහ තුළ මහා දැවැන්ත කාර්යභාරයක්, තමුන්නාන්සේගේ කෘෂිකර්ම අමාත්‍යාංශය තුළින් මේ ගරු මන්ත්‍රීතුමන්ලාට නිබඳව ලැබුණු එක පිළිබඳව අපි හැම දෙනාම සතුටට පත් වෙනවා. ඒ කෘෂිකර්ම අමාත්‍යාංශය තුළින් අපට වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදනවලට අමතරව තවත් විවිධ දේවල් ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් ඒ ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හරහා අපට පිළිවෙළකට ලැබිලා, වැඩ කරන්න උනන්දුව තිබෙන, කෘෂිකර්මාන්තයට කැමැති, ගහට කොළට පොළොවට ආදරය කරන ගරු මන්ත්‍රීතුමන්ලාගේ උනන්දුව මත ඒ හැම කෙනාටම අවශ්‍ය කරන කාර්යභාරය තමුන්නාන්සේ තුළින් ඉටු වුණා. අපි දැක්කා. විවිධ කටයුතුවලදී, මම හිතන්නේ, ඔබතුමාගේ කාර්යක්ෂමතාවය පිළිබඳව පසුගිය කාල වකවානුව තුළදී 2018 වර්ෂයේදී සිදු කරන ලද ප්‍රධාන කාර්යයන් වශයෙන් සරු දිවියට කෘෂි සවියක්, කෘෂිකර්ම හා සත්ව පාලන ප්‍රදර්ශනය ඉතාම සාර්ථක ප්‍රදර්ශනයක් බවට පත් වුණා. ඒ ප්‍රදර්ශනය තුළින් ගොවිතැන පිළිබඳව කෘෂිකර්මය පිළිබඳව තරුණ තරුණියන්ට අවශ්‍ය කරන ආදරය, ලැදියාව මම හිතන්නේ දැනුවත් කිරීමේ වැඩ සටහන් තුළින් දීර්ඝව ලබා දුන්නා. ඊට අමතරව, හැම අවුරුද්දකම කාර්තු වශයෙන් කොටස් කිහිපයකට මන්ත්‍රීවරුන්ට ඒ අවශ්‍ය කරන ශක්තිය ජනතාවට ලබා දෙමින් මහත් දැවැන්ත කාර්යභාරයක් ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් සිදු වුණා.

මම හිතන්නේ, ඒ කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ නොසිටියත් අපි විටින් විට ඒවාට සම්බන්ධ වෙලා හරි, එහෙම නැත්නම් ඒ අවස්ථාවලදී අමාත්‍යාංශයට ගියාට පස්සේ හරි තමුන්නාන්සේගේ පෞද්ගලික ලේකම්තුමා ප්‍රධාන අනෙකුත් සියලුම නිලධාරීන්ගෙන් ලැබුණු සහයෝගය අප්‍රමිතයි කියන එක මේ අවස්ථාවේදී මතක් කරනවා. ඒ මොකද හේතුව, ඒ ගියාට පස්සේ, අපි ලිපියක් ලබා දුන්නොත් ඒ ලිපිය යම්කිසි තැනකට යොමු කළොත් ඒ ලිපිය අනුමත කරපු ලිපියේ ෆොටෝ කොපියක් සහිතව අපට ගෙදරට ඒ ලියුම තැපෑලෙන් එවනවා. ඉතාම නිහතමානීව කටයුතු කරනවා. ඒ මොකද, ඒ වැඩේ ක්‍රියාත්මක වෙනවාද නොවෙනවාද කියන එක ඔබතුමා අපට සඳහන් කරලා අපට ලබා දෙනවා. ඒ ලබා දීම තුළින් මම හිතන්නේ, ප්‍රධාන ලේකම්තුමා ප්‍රධාන ඒ හැම නිලධාරියෙකුගේම කාර්යක්ෂමතාවය තුළින් තමයි අද කෘෂිකර්ම අමාත්‍යාංශයේ දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන්කම ලැබුණේ. අපේ උපුල්

මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කථා කරපුවා ගැන අපි කථා කරන්න යන්නේ නැහැ. ඒ හැම කෙනාටම අවශ්‍ය කරන ශක්තිය සත්ව නිෂ්පාදනය තුළින් පවා ලැබී තිබෙනවා. මම හිතන්නේ ඒ අවශ්‍ය කරන කුකුල් පැටව්, ගව නිෂ්පාදනය, ඒ වාගේම ඌරු පැටව්, එළුවන්, මේ වාගේම ගොඩක් සත්ව නිෂ්පාදනයට අවශ්‍ය කරන ඒ ජනතාවට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙමින් විවිධ ක්ෂේත්‍රයන් තුළ, කෘෂිකර්මය තුළ අවශ්‍ය කරන විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක වුණා. මම හිතන්නේ පුරන් කුඹුරු නැවත වගා කිරීම පිළිබඳව හෙක්ටයාර 54 ක වපසරියකට අවශ්‍ය කරන ශක්තිය රුපියල් මිලියන 2.85 ක් වියදම් කරලා, ඒ සියලුම ශක්තිය ලබා දුන්නා. ඒ වාගේම යාය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, පැරණි ක්‍රමය භාවිතයෙන් වී වගාව ප්‍රචලිත කිරීම පිළිබඳව වැඩ පිළිවෙළක් ජනතාවට හඳුන්වා දෙමින්, ඒ අවශ්‍ය කරන ශක්තිය ජනතාවට ලබා දුන්නා.

ඒ වාගේම ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනය. අද අඩුවෙන්ම පවතින ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනය පිළිබඳව මම හිතන්නේ අඩුවක් පවතිනවා. ඒවාට අවශ්‍ය කරන ශක්තිය වැඩි කරලා, ඒ වාගේම භෝග වර්ධනය කරලා, මම හිතන්නේ ඒ අවශ්‍ය කරන ශක්තියත් මේ අමාත්‍යාංශ තුළින් ලබා දුන්නා. ඒ වාගේම වල්පිට දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ නව නේවාසිකාගාර ගොඩනැගිල්ලට මුල්ගල තබමින් මම හිතන්නේ අර NVQ 4 මට්ටමේ සිසුන් 50 කට නේවාසික පහසුකම් ලබා ගැනීමේ ශක්තිය ලබා දීමට අවශ්‍ය කටයුතු මේ වන කොට කෙරීගෙන පවතිනවා. ඒ වාගේම හෝමාගම සංචාරක බංගලාව. මම හිතන්නේ, රුපියල් මිලියන 50 ක ඇස්තමේන්තුවක වටිනාකමකින් යුත්. ඒකට මුල්ගල තබලා, ඒ අවශ්‍ය කරන ශක්තිය ඉදිරි කාලය තුළ ලබා දෙන්න මම හිතන්නේ ජනතාවට අවශ්‍ය කරන, පාසල් දරුවන්ට අවශ්‍ය කරන, නොයෙකුත් වැඩ පිළිවෙළවල්, ඒ විදේශිකයන් නිසා දේශීය අයට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්න ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් අද මහත් දීර්ඝ වැඩ සටහනක් දියත් වෙමින යනවා. ඊට අමතරව අපි දැක්කා. පසුගිය කාල වකවානුවල පුරන් කුඹුරු, ඒ කියන්නේ යායවල් ඉතාමත් සශ්‍රීක කර ගන්න අවශ්‍ය කරන සහාය ලබා දෙන්න ඔබතුමා ඒ ගොවි බිමට ගිහිල්ලා, ඒ අවශ්‍ය ගොවි සංවිධානත් එක්ක එකතු වෙලා, ඒ ප්‍රදේශයේ ඉන්න මන්ත්‍රීවරුත් එක්ක එකතු වෙලා මහා දැවැන්ත ශක්තියක් අපට ලබා දුන්නා.

ඊට අමතරව ඔබතුමාගේ අමාත්‍යාංශයේ තිබෙනවා ධීවර කටයුතු පිළිබඳව. ධීවර කටයුතු පිළිබඳව කථා කරන කොට අපි බේරුවල ප්‍රදේශයේ ජීවත් වන කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවක් හැටියට අද මම හිතන්නේ, අපට 100% ක් දේවල් නොලැබුණත්, අපි ඉල්ලන ප්‍රමාණයට අපට සැපයුම ලබා දීලා අපේ ධීවර ක්ෂේත්‍රයේ ඉන්න ජනතාවට අවශ්‍ය කරන ශක්තිය, දැල් ආම්පන්න, ඒ වාගේම ඔරු ලබා දෙමින්, බෝට්ටු ලබා දෙමින්, එහෙම නැත්නම් අනෙකුත් ඒ අවශ්‍ය කරන සහාය ලබා දෙමින් මහත් වූ ශක්තියක් ඔබතුමා ධීවර අමාත්‍යාංශය තුළින් අපට ලබා දුන්නා. ඒ වාගේම තමයි ඒ අහිංසක දුප්පත්, අඩු ආදායම්ලාභී මත්ස්‍ය වෙළඳාමේ ඉන්න ජනතාවට අවශ්‍ය කරන මත්ස්‍ය පෙට්ටි ඉතා විශාල ප්‍රමාණයක් තමුන්නාන්සේගේ අමාත්‍යාංශය තුළින් අපට අපේ මුදල් එක්ක ලබා දෙමින් ඒ අවශ්‍ය ශක්තියත් ලබා දුන්නා. වැඩ පිළිවෙළක් හරියට කර ගෙන යන ඔබතුමාගේ අමාත්‍යාංශයට මම හිතන්නේ අපි හැමදාම සුභ පතනවා.

උපදේශක කාරක සභාවට දිගින් දිගටම අපට එන්න අවශ්‍යතාවය නොලැබුණත්, හරියාකාර වැඩ පිළිවෙළක් දියත් වන ක්‍රමවේදය තුළ මම හිතන්නේ, අපි හදවතින්ම සතුටට පත් වෙනවා. පසුගිය කාලවල අඩු ආදායම්ලාභී ජනතාවට අවශ්‍ය කරන කුකුල් පැටව් ලබා දීමේදී වෙනදා කවුරු හරි කුකුල් පැටියෙක් දුන්නා නම්, ඒ කුකුල් පැටියාව එවෙලේ දීලා, අරගෙන යනවා. ඒ අරගෙන ගියාට පස්සේ ඒ කුකුල් පැටියා මොනවා වෙනවාද කියලා අපි දන්නෙත් නැහැ. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කුකුල් පැටියා දෙන කොට අපේ ප්‍රදේශයේ තිබෙන පශු වෛද්‍ය කාර්යාලයට ඇවිල්ලා ඒ ඉන්න වෛද්‍යතුමා වෙනමම වැඩමුළුවක් කරලා, ඒ ඉන්න ප්‍රතිලාභීන්ව වාඩි කරලා, තේ එකක් දීලා, කේක් කෑල්ලක් දීලා වැඩමුළුවක් පවත්වලා මේ කුකුල් පැටවා සම්බන්ධව මොන ආකාරයෙන් ඉදිරි කටයුතු කරනවාද? හදන්නේ කොහොමද? මොහුගෙන් ඒ ප්‍රතිලාභය ගන්නේ කොහොමද කියන එක දැනුවත් කරලා තමයි මේ සියල්ල ලබා දුන්නේ. සමහර විට අපිත් ගිහිල්ලා, බලාගෙන වාඩි වෙලා ඉන්නවා. හරිම සතුටුයි. මොකද, අපි නිකම් දුන්න දේ අතින් අරගෙන දුවනවා. හැබැයි, එතැනට එන ඒ ජනතාව, එහෙම නැත්නම් ඒ ප්‍රතිලාභය ගන්න එන පුද්ගලයා ඒකට දැනුවත් වීමක් තුළින් ඒ දේ අරගෙන, කුකුල් පැටව් පස් දෙනා හරි අරගෙන ගිහිල්ලා කෙටි කාලයක් තුළදී මම හිතන්නේ ඔහු බිත්තර දාන සතෙකු බවට පත් වෙනවා. ඒ බිත්තර දාන සතෙකු

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

බවට පත් වුණාට පස්සේ මම හිතන්නේ ගෙදර වැඩිපුර කිකිළි පැටව් 10 ක් ඉන්නවා නම්, ඒ සත්තු 10 දෙනාම බිත්තර දානවා නම්, වැඩි කොටසක් විකුණලා ඔවුන්ගේ ආර්ථිකය දියුණු කර ගන්න ක්‍රමවේදය තිබෙනවා. එහෙම නැත්නම් කොටසක් පවුලේ දරුවන්ට, පවුලේ අයට පරිභෝජනයට අරගෙන ඒ ශක්තිය ලබා දුන්නා. ඊට අමතරව, ගරු සභාපතිතුමනි, අපට ලොකු හයියක් ලබා දුන්නා. පසුගිය කාලවල රජයෙන් මුදල් වෙන් කළා නම් අපි හිතමු කෝටියකට වඩා ආසන්න මුදලක් වෙන් කරලා, කපන්න පුළුවන් ඇළවල් ටික මම හිතන්නේ ලක්ෂයක් වැනි සුළු මුදලකින් ඒ යන්ත්‍රෝපකරණ දීලා බේරුවල ආසනයේ ග්‍රාමසේවක වසම් කිහිපයක ඇළවේලි කපලා, කෘෂිකර්මාන්තය දියුණු කරන්න අවශ්‍ය කරන ශක්තිය ඒ ජනතාවට අප ලබා දුන්නා.

ඒ විතරක් නොවෙයි. ගම් ගිහිපයක් යා වෙන බෝක්කු දාලා, එහෙම නැත්නම් පොඩි culvert අපට ලබා දීලා ඒ අවශ්‍ය කරන ශක්තිය ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි. අවශ්‍ය කරන අමුණු පද්ධතිය අලුත් වැඩියා කරන තැන අලුත්වැඩියා කරලා, දීර්ඝ කාලයක් කැඩිලා තිබුණු එක අංග සම්පූර්ණව හදලා දෙන්න ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් මහා දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා. අපේ අර සහෝදර මන්ත්‍රීතුමා කිව්වා වාගේ අද අවශ්‍ය කරන කාර්යභාරය - අපේ අර සහෝදර මන්ත්‍රීතුමිය මේ පැත්තේ ඉඳලා ඒ පැත්තට යනවා. ඒ පැත්තේ ඉඳලා මේ පැත්තට එනවා. හැබැයි, එතුමිය කරන වැඩ පිළිවෙළ හරි ශක්තිමත් වෙනවා. මම හිතන්නේ, අපට නොලැබෙන ආවේනික වූ සොයා ගන්න බැරි බෙහෙත් වර්ග, එහෙම නැත්නම් ඒ කෘෂිකර්මයට අවශ්‍ය කරන වී වර්ග ඒ අය තුළ තිබෙනවා. ඇයගේ කණ්ඩායමත් එක්ක ඇය ඉතා දැවැන්ත වැඩ පිළිවෙළක් කරනවා. හැබැයි, මේවා කළාය කියලා පැන්නාය කියලා මම හිතන්නේ, ඉදිරි කාලයේදී ආපහු ජනතාව තීන්දුවක් දෙයි. මෙතැන හිටපු අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා අපට කියන්න වෙනවා. මොකද හේතුව, එතුමා කෘෂිකර්මයට ආදරය කරනවා. අතිගරු ජනාධිපතිතුමා ළඟට ගිහිල්ලා, එතැන ඒ වැඩ පිළිවෙළට ශක්තිය දීලා, අද නැවත මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගයේ ඉඳගෙන කටයුතු කරලා, ආයිත් ඒ පැත්තට ගිහිල්ලා මම හිතන්නේ එතුමාගේ දේශපාලනයත් ඉදිරි කාලයේ අඳුරු කර ගෙන යනවා. අපට හරිම කනගාටුයි.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඒක ජනතාව තීරණය කරයි. ඔබතුමා කථාව කර ගෙන යන්න කෝ?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අපි දන්නවා. අපට තීරණය ලැබෙනවා. ඒකට අපට සතුටක් ලැබෙනවා. මොකද හේතුව, පනිනවුන්ට බෙහෙත් හම්බ වෙනවා. මොකද හේතුව, පනින උන්ට ඉනිමං තියන්නේ නැහැ.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ජනාධිපතිත් පැන්නා, යූ.එන්.පී. ඡන්ද ලක්ෂ 62 ක් අරගෙන.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

මෙවන් වූ දැවැන්ත -

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඔබතුමාගේ කථාව කර ගෙන යන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

මම කථාව තමයි කරන්නේ. ඔබතුමියට ඕනෑ නම් මෙතැනට ඇවිල්ලා අහගෙන ඉන්න.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඔයා ඉතින් මගේ මිත්‍ර සහෝදරයා නේ?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන මේ අමාත්‍යාංශවලින් සියලුම දේවල් මේ ගරු මන්ත්‍රීවරුන්ට ලැබුණා. හැබැයි, කෙටි කාලයක් තුළ හිටපු ගමන් දේවල් ඔක්කොම ගන්නවා. අද උදෑසන අපි දැක්කා කථා කරන කොට, මිලියන 14, 15 අරගෙන වැඩ කර ගෙන. මම හිතන්නේ ප්‍රධාන ඇමතිතුමාගේ අයවැය විවාදය එන කොට අනික්

පැත්තට අත්දෙක උස්සලා ඡන්දය දෙනවා. හැබැයි, මතක තියාගන්න. හැමෝම හිතාගෙන ඇති මේ අපේ ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන අපේ මේ ආණ්ඩු පක්ෂය පරද්දන්න. මතක තියාගන්න. ඊළඟට මේ කියන සටනෙනුත් අපි ජයග්‍රහණය කරලා ඊළඟ එන අවුරුදුවලත් මැතිවරණය තියලා, මැතිවරණය ජයග්‍රහණය කරලා, අපි තමයි ආණ්ඩු පක්ෂයේ බලය ලබා ගන්න අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරන්නේ. ඒ නිසා මේ ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය ක්‍රියාත්මක වන කාල වකවානුව තුළ මම හිතන්නේ හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමා ප්‍රධාන ඒ ලේකම්තුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලය, උසස් නිලධාරීන් ඇතුළු සමස්ථ නිලධාරී මණ්ඩලය සහ පෞද්ගලික නිලධාරී මණ්ඩලයට අපට මේ ලබා දෙන සහයෝගයට අපි හදවතින්ම ස්තුතිවන්ත වෙමින් ලබන්නා වූ නව වසර සුභ නව වසරක් වේවා. ලබන්නා වූ නත්තල සුභ නත්තලක් වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 04.55]

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඇත්තෙන්ම සතුටු වෙනවා මේ අවස්ථාවේදී කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේදී කථාවක් කිරීමට විනාඩි 10 ක් ලැබීම පිළිබඳව. මේ රටේ කෘෂිකර්මය ගැනත්, රට ගැන කථා කරද්දී රටේ සියලුම සංවර්ධනය වෙනුවෙන් කථා කරන පාර්ලිමේන්තුවත් අපට නැති කාලයක තමයි අපි මේ කථා කරන්නේ. ඇත්තටම රටේ නායකතුමා ව්‍යවස්ථාවත් ගණිකා වෘත්තියේ යොදවන කාලයක, සමස්ථ රටම මම හිතන්නේ ගර්හනී මවක් හැටියට ඇති කර, කටයුතු කරන කාලයක තමයි අපි මේ පළාත් සභාවේ වැය ශීර්ෂය ගැන කථා කරන්නේ. මම හිතන්නේ මේ අයක් නැති වැය ශීර්ෂයකටයි අපට මේ කථා කරන්න වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැන වැඩියෙන් විග්‍රහ කරන්නේ නැහැ. අද ලංකාව ලෝකය ඉදිරියේ අපකීර්තියට පත් වුණු රටක් හැටියට, රටේ නායකයා පත් කිරීම පිළිබඳව මගේ කනගාටුව මහජන නියෝජිතයෙකු හැටියට ප්‍රකාශ කරනවා. එතුමාට ඡන්දය දීපු මන්ත්‍රීවරයෙකු හැටියට, ඡන්ද දායකයෙකු හැටියට මේ අවස්ථාවේදී කනගාටු වෙනවා. මෙවැනි ජනාධිපතිවරයෙක් පත් කරන්නට මගේ ඡන්දය පාවිච්චි කිරීම පිළිබඳව, 62 ලක්ෂයක් එක්ක කනගාටු වෙනවා කියන එකත් මතක් කරන්න ඕනෑ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

දිට්ඨ ධම්මවේදනීය කර්මය එල දීම.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

පිළිගන්නවා. දෙවැනි කාරණාව, ඊයේ ඔබතුමාගේ ප්‍රශ්නයටත් මම උත්තරයක් දෙන්නට ඕනෑ. මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් මාධ්‍ය තුළ පළ වූ ප්‍රකාශයන් ගැන. ඇත්තටම ඊයේ කාරණාවට මට මතක් වුණා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගුණසිරි ජයනාත් මන්ත්‍රීතුමාගේත්, අපේ අනික් මන්ත්‍රීවරු දෙපළගේත් සිදුවීම සම්බන්ධව දෙමළ කවියෙක් කියපු කවියක් මතක් වුණා. දෙමළ කවියා කියනවා,

சாதி நூறு சொல்லலாம் போ போ போ
தர்மம் நூறு சொல்லலாம் போ போ போ
நீதி நூறு சொல்லலாம் போ போ போ
நீயும் உன் மனைவியும் ஒன்று சேர்ந்து போ
கடவுள் உன்னை வா வா என்று அழைக்கலாம்.

ඒකේ තේරුම තමයි,

ජාතිය සියයක් දේ කියාවි ඔබ යන්න කියා
ධර්මය සියයක් දේ කියාවි ඔබ යන්න කියා
නීතිය සියයක් දේ කියාවි ඔබ යන්න කියා
ඔබත්, ඔබගේ භාර්යාවත් එකතු වෙලා යන්න
දෙවියන් ඔබට එන්න එන්න කියාවි

මම හිතන්නේ, මේක එතුමාටත් බලපානවා. මේ රටටත් බලපාන කවියක් හැටියට මම මතක් කරන්නේ. මේ කවිය ගරු ඇමතිතුමනි, ඉන්දියාවේ නිදහස වෙනුවෙන් ඉන්දියාවේ සුප්‍රකට කවියෙක් ලියූ කවියක් තමයි මේ කවිය. ඉන්දියාව වෙනුවෙන් නිදහස ලබන්නට ජනතාවට යන්න කියලා කිව්වා ඉදිරියටම. ඒ කවිය සුබ්‍රමනියම් භාරදියාර් කියන කවියා ලියපු කවිය. නමුත් කෘෂිකාර්මික රටක් හැටියට මේ රට බැබලෙන්න ඕනෑය කියලා පළමුකොටම අපි ප්‍රාර්ථනා කරනවා. පළාතේ කෘෂිකර්ම ඇමතිතුමාට රට වෙනුවෙන්, ප්‍රදේශය වෙනුවෙන් ඒ කෘෂිකර්මය ඉදිරියට අරගෙන යන්නට අපි සුභ පතනවා. ඒක වෙනම කථාවක්. මටත්

[ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්]

මන්ත්‍රීවරයෙකු හැටියට එතුමා කොස් පැළ 1000 ක් දුන්නා. මමත් අපේ උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ පාසල් දරුවන්ටත් ගමේ මැතිවරණ කොට්ඨාශයේ ඉඩම් තිබෙන අයටත් ඒවා ලබා දීමට කටයුතු කළා. නමුත් ප්‍රශ්නය වෙන්නේ ගරු අමාත්‍යතුමනි, අපේ කෘෂිකර්මාන්තය දියුණු වෙන කොට යන්ත්‍රෝපකරණ මගින් දියුණු නොවනවා නම්, මේ රට තුළ කවදාවත් කෘෂිකර්මය දියුණු කරන්නට අපට බැරි වෙනවා.

මම පසුගිය අයවැය විවාද හතරේදීම කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් කථා කළා. යන්ත්‍රෝපකරණ දියුණුව වෙනුවෙන් කථා කළා. අනෙකුත් සියලුම ආම්පන්න ජනතාව වෙනුවෙන් ලබා දිය යුතුයි කියලා කථා කළා. මුහුදු පැළෑටි ගැන කථා කළා. රට වටේ මුහුද තිබෙන මුහුදු ජීවීන් ගැන, ඇල්ගී ගැන අපි කථා කළා. ඒ සියලුම සංවර්ධන කටයුතුවලට අපට අද දායකත්වය ලබා දීමට බැරි වීම ගැන කනගාටු වෙන්න වෙනවා. එළුවෝ ගැන කථා කරද්දී, සත්ව නිෂ්පාදනය ගැන අපි කථා කරන්නට ඕනෑ. මම හිතන්නේ, පළාත් සභාවේ ලැප්ටොප් එකෙන් අපට බලන කොට අපට මතක් වෙනවා. ඩොලර් මිලියන 60,000 ක් අපි විදේශ විනිමය වියදම් කරලා අපි ඒ ආයෝජනය කරන කැමවලට අපි වියදම් කරන කොට මිලියන 11,000 ක ප්‍රමාණයක් අපි මේ ආහාර, කෑම ටික ගෙන්වා ගන්නට මේ රටේ මුදල් වියදම් කරනවා. නමුත් මේවා රට තුළ නිෂ්පාදනය කර ගන්න පුළුවන් ඒවා වන්නට තිබුණත්, ඒ නිෂ්පාදනය නිසියාකාරව කර ගන්නට අපට අවස්ථාවක් උදා වෙලා නැහැ. ඒ නිසා ඒ ක්‍රමවේදය, ආහාර නිෂ්පාදනය සංවර්ධනය කරන්නට, ඒ කර්මාන්ත ශාලා මේ රට තුළ දියුණු වෙන්නට ඕනෑ. සත්ව නිෂ්පාදනය වෙන්න පුළුවන්. අනෙකුත් නිෂ්පාදන වෙන්න පුළුවන්. කෘෂිකර්මය වෙන්න පුළුවන්. පොහොර නිෂ්පාදනය අපට අඩු වෙලා තිබෙනවා. ඒ සියලුම සංවර්ධන කටයුතුවලට රටේ දායකත්වයත්, පළාතේ දායකත්වයත් අවශ්‍ය වෙනවා. ඒ සියලුම සංවර්ධන කටයුතු කරද්දී, අපි විදේශ විනිමය පිටරටට නොයවා රැක ගැනීමේ ව්‍යාපාරයක් හැටියට කෘෂිකර්මාන්තය දියුණු කිරීමේ ක්‍රමවේදය අපි ඇති කර ගත යුතුයි ගරු අමාත්‍යතුමනි. අපි ඒ නිෂ්පාදනයන් නිපදවන ගමන්ම ඒ අවශ්‍ය අමුද්‍රව්‍ය හරහා ඒ කෑම බීම වෙන්න පුළුවන්. අනෙකුත් පොහොර වෙන්න පුළුවන්. ඒ නිෂ්පාදන ක්‍රමවේදයට අපි මුදල් වෙන් කරලා නැහැයි කියන එක මේ අවස්ථාවේදී අපි මතක් කරන්නට ඕනෑ. මේ වැය ශීර්ෂය තුළ ඒ සංවර්ධන කටයුතුවලට අපේ හිත යොමු වෙනවා වාගේම, ඒ සංවර්ධන කටයුතු සංවර්ධනය කිරීමේදීත්, ආයෝජනය කිරීමේදීත් ඒ ආයෝජකයින්ට අවස්ථාවක් උදා කර ගන්නට අපට ඉඩ පහසුකම් තිබුණත්, ඒ ක්‍රමවේදය පළාත තුළ නැහැයි කියන එක මතක් කරන්නට ඕනෑ. ඒ සියලුම සංවර්ධන කටයුතු සංවර්ධනය වෙනවා නම්, අපට මීටත් වඩා කෘෂිකාර්මික රටක් හැටියට සංවර්ධනය කරන්නට හැකියාව ලැබෙනවාය කියන එක මතක් කරන්නට ඕනෑ. මම හිතන්නේ, දක්ෂ ලේකම්වරු, කෘෂිකර්මය දන්න ලේකම්වරු ප්‍රායෝගිකව කෘෂිකර්මයේ නියැලෙන ලේකම්වරු හැටියට මගේ මැතිවරණ කොට්ඨාශය නියෝජනය කරන ලේකම්වරයෙක් මේ අමාත්‍යාංශය තුළ සිටිනවා. එතුමා නිවාඩු දිනයක් හම්බ වුණොත් වත්තට යන, කුඹුරට යන ලේකම් කෙනෙකු හැටියට, ප්‍රායෝගික දැනුම තිබෙන ලේකම්වරු ඉන්න අමාත්‍යාංශයක් හැටියට අපි පිළිගන්නවා. ඒ පිළිගැනීමත් එක්ක පළාතේ හොඳ අමාත්‍යාංශයක් හැටියට අරගෙන යන්නට හැකියාව ලැබෙනවාය කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. ඒ නිසා ඒ සියලුම සංවර්ධන කටයුතු, කාර්මික පැත්තත්, කෘෂිකාර්මික පැත්තත් - කාර්මික පැත්ත කියලා කියන්නේ, ඒ අවශ්‍ය අමුද්‍රව්‍ය ටික නිපදවලා, ඒ අවශ්‍ය කෑම ටික නිපදවන්නටත්, කිරි නිෂ්පාදනය මේ රට තුළ වැඩි දියුණු කරලා අර පිටිකිරි ගෙන්වන එක නතර කරන්න පුළුවන් ක්‍රමවේදයක් උදා කරන එක සුදුසු යැයි මේ අවස්ථාවේදී මතක් කරමින් මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට විශේෂ ස්තුතිය පුද කරමින්, කාලය ලබා දීම පිළිබඳව විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට ස්තුතිය පුද කරමින් අමාත්‍යතුමාට අනාගතයේදී යහපත් පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යවරයා හැටියට ඉදිරියට අරගෙන යන්නටත්, අපේ සියලුම අමාත්‍යවරුන්ටත් සුභ පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 05.04]

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා අපේ බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ටම මන්ත්‍රීවරයෙක්, ඒ වාගේම අමාත්‍යවරයෙක් වන කෘෂිකර්ම අමාත්‍ය ගාමිණී තිලකසිරි ඇමතිතුමාගේ අයවැය පිළිබඳ වැය ශීර්ෂයේදී වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන. මට ඊට හේතු පාදක වුණු කරුණු කාරණා ගොඩක්

තිබෙනවා. ඒවා හරියට නිකම් ජනප්‍රවාදයේ තිබෙන කථා වාගේ. එතුමායි මමයි 1991 දී එවකට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති ධූරය දරන කාලයේ එතුමායි මමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අත ලකුණෙන් - මේක මතක තියා ගන්න. එදා අපි අත ලකුණෙන් තරඟ කරලා මම කඩුවෙල ප්‍රාදේශීය සභාවේ පළමුවැනි සභාපතිවරයා වුණා, එවකට ලංකාවේ වැඩිම මනාප ඡන්ද ලබලා. නේද ඇමතිතුමා? එතුමා කැස්බෑව ප්‍රාදේශීය සභාවේ වැඩිම ඡන්ද ලබලා එතුමා සභාපතිවරයා හැටියට පත් වුණා. (බාධා කිරීමක්) ඒත් 1991. අත ලකුණෙන් තරඟ කරපු සුමිත් විජයමුණි සොයිසා මැතිතුමා. එතුමාට සභාපති වෙන්න බැරි වුණා. නූලයි කෙස් ගහෙන් ගියේ. එක්සත් ජාතික පක්ෂය බලයට පත් වුණේ. එතුමා විපක්ෂ නායක වුණා. ඒ වාගේම මහේෂ් අල්මේදා මැතිතුමා. එතුමා ඊළඟට ආවා. බැලුවාම මේ ඔක්කොම අතෙන් ඇවිල්ලා තිබෙන්නේ. දැන් හරි අතට ඇවිල්ලා ඉන්න වෙලාවේ තමයි මම මේ වචන ස්වල්පය කථා කරන්නේ. මම ඒ සුන්දර අතීතය මතක් කළේ වර්තමාන කෘෂිකර්ම අමාත්‍යවරයා අමාත්‍ය ධූරය දරනවා වාගේම මමත් මේ පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යවරයා හැටියට කටයුතු කළා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

හරි අතට පොහොට්ටුව අරගෙන ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

නැහැ. රටත් හරි අතට.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක කෘෂිකාර්මික රටක් වාගේම නූතන යුගයට ගැලපෙන විදියට අපේ රට ගෙනියන්න ඕනෑ. මම කරුණු පහදලා දෙනවා නම්, අපි සාමාන්‍යයෙන් කෘෂිකර්මය පිළිබඳව කිව්වාම ගොවියා පිළිබඳව හිතේ චිත්‍රය මවා ගන්නේ ඔලුවේ ජටාවක් බැඳලා, අමුඩයක් ගහලා, කරේ උදැල්ලක් තියලා, බඩ වියත පිට කොන්දට ඇලුනු කෙසඟ මිනිහෙක් තමයි අපි ගොවියා කියලා හඳුන්වන්නේ. මොකද මම එහෙම කියන්නේ. මම දැක්කා දඹුල්ලේ නොනිදන නගරය කියලා විශාල බෝඩ් එකක් ගහලා කෘෂිකර්මය පිළිබඳ ගොවියාව ඇඳලා එහෙම තමයි අපි සංකේතවත් කරලා තිබුණේ. හැබැයි, ඒ ගොවියාගේ පුතා, නූතන යුගයේ දරුවා ඒ ගොවිරාළ වෙයිද කියන කාරණාව අපි හිතට ගන්න ඕනෑ. ඒ නිසා තමයි මම කියන්නේ, අද තිබෙන තාක්ෂණයට, අලුත් තාක්ෂණ මෙවලම්, ඒ න්‍යාය මේ සියල්ලම අපේ දරුවන්ට, නැත්නම් නූතන තරුණ පරපුරට දෙන්නට ඕනෑ. මම ඒකෙන් අදහස් කරන්නේ මෙතුමා එහෙම දෙන්නේ නැහැයි කියන එක නොවෙයි. එතුමා ඒ තැනට එනවා. මේක අපි සියලු දෙනාම හිතේ දරා ගන්න ඕනෑ. මම එවකට කෘෂිකර්ම අමාත්‍යවරයා හැටියට මම කල්පනා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හැමදේම කල්පනා කරන්නේ, මේ දේ මට වුණොත් කියලා. මොකද, මම කාගේ හරි ආකර්ශනය, නැත්නම් කාගේ හරි අවධානය යොමු කර ගන්න නම් මම ඒ අවධානය යොමු කර ගන්න විධියට ඉන්න ඕනෑ. එහෙම නැත්නම් අවධානය යොමු වෙන්නේ නැහැ.

ඒ නිසා මම එදා කෘෂිකර්ම අමැතිවරයා හැටියට කල්පනා කළා අපේ තරුණ පරපුර මේකට ඇත්තටම ගන්න නම්, තරුණ පරපුරට මේ අභිමානවත් ගොවියා කියන සංකල්පය දෙන්න ඕනෑ. මම ඒ කාලේ එහෙම හිතලා - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දෑ කැති බෙදනවා. දැන් උදළු තල බෙදනවා වාගේ දෑ කැති තමයි බෙදන්නේ. එහෙම එකක් තිබුණ. සමහර අය අමුඩ ලේන්සුව බෙදුවා. මම මේක සම්පූර්ණයෙන්ම පිළිකෙව් කරලා, ඉවත දැම්මා. එවකට හිටපු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ මෙන්ඩිස් මහත්මයාට කිව්වාම, ඒ වාගේම රණසිංහ කියලා මහත්මයෙක් හිටියා. ඒ අයට කිව්වා, කරුණාකරලා තාක්ෂණික අලුත් මෙවලම් දෙන්න ඕනෑය කියලා. එහෙම කියලා මම තරුණයෝ ගෙනැල්ලා කිව්වා, තරුණ ගොවි සමාජවලට කුඹුරට බහින කොට හොඳ ඕවර් කෝට් එකක්, නැත්නම් ඇඟ ආවරණය වන එකක් අඳින්න. ත්‍රී ක්වාටර් කියලා ඒ කාලේ කිව්වේ. ඒ කියන්නේ තුන් කාලේ කලිසම් අඳින්න. කකුල් දෙකට බූට්ස් දාන්න. ගොයම් කපනවා නම් බුෂ් කටර් එකෙන් ගොයම් කපන්න. ඒ වාගේම තෙල් ගහනවා නම් ඒ මෙවලම් ඇඟලාගෙන යන්න. ඒ එක්කම මම පත්තරේක දවසක් කියෙව්වා. දැඩි අව් රශ්මිය ඇඟට හොඳ නැහැයි කියලා. දැඩි අව් රශ්මිය පිට කොන්දට හොඳ නැහැ. කැන්සර් හැදෙනවාය කියලා. මම පත්තරේක ලිපියක් කියෙව්වා. මේක මගේ ඔලුවට ආවා. ඒ නිසා මම නියමක් හැටියට නොවෙයි, උපදේශයක් හැටියට දුන්නා කුඹුරට බහිනවා නම් අනිවාර්යයෙන්ම මේ වාගේ ගොවියෙක්

[ගරු හෙක්ටර් බෙත්මගේ - සභානායකතුමා]

වෙන්න ඕනෑය කියලා. ඒක ක්‍රියාත්මක වුණා. ඔබතුමා විශ්වාස කරන්න. මම කෘෂිකර්ම ඇමතිවරයා හැටියට, මහ වෙලේ නියර මැද්දෙන් තිබෙනවා තාර පාර. ඒකේ යන කොට මම දැක්කා ඈත ගොයම් කපනවා. අර මම හිතපු විධියේ කෙනෙකු තමයි ගොයම් කපන්නේ. මම මගේ රියදුරුට කිව්වා, වහාම වාහනය නවත්වන්න. ඈත ඉන්න කොට මම දැක්කා, එයා මාව දැකලා දුවගෙන එනවා. මම මේක කියන්නේ ඇත්තටම. මම දන්න ගොවියෙකුගේ පුතෙක් නිමල් කියලා තරුණ පුතෙක්. මම නිමල් කියලා කෑගැහුවාම දුවගෙන ආවා. ඔහු ඔහුගේ අව් කණ්නාඩි ගලවලා, ඔහුගේ කැප් තොප්පිය ගලවලා මට කිව්වා සර්, සර් කියපු දේ දැන් හරියටම සාක්ෂාත් වෙලා තිබෙන්නේ. මම ඇහුවා කොපමණ ගොයම් කැපුවාද? එයා කපපු ගණන කිව්වා. මට ඒක හරියට මතක නැහැ. ලියදි මෙච්චර කපලා තිබෙනවා. මම ඇහුවා අද කොපමණ ආදායමක් ඇත්ද? මම ඊයේයි, පෙරෙයිදායි, පළමුදායි කැපුවා. මට මෙපමණ ආදායම් ලැබුණාය කියලා. මට අද ගණන් මිනුම් මතක නැහැ. මම ඒ concept එක, ඒ දැක්ම තමයි මම ගරු අමාත්‍යතුමාටත් කියන්නේ. මේ යුගයට ගැලපෙන කෘෂිකර්මය තිබුණොත් තමයි අපි ඉදිරියට යන්නේ. එහෙම නැතිව ගොවියා රජ වේ මඩ සෝදා ගත් කළ ගොවියා රජ වේ. ඔය ඔක්කොම පැරණි කියමන් කිය කියා -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගොවියෙක් රජ කරවලා, කෙළවෙලා තිබෙන්නේ දැන්.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

කොහෙන්ද ඒ කටහඬ ආවේ?

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

කළු කෝට්. පරණ කෝට්.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

කළු කෝට් කාරයාද? හැංගෙනවා ඔලුව නවාගෙන. හිතනවාද මේ කෝට් එකක් දා ගත්ත පළියට නීතිඥයෙක් කියලා. මතක තියාගන්න. ඒක සනාථ කරලා තමයි අද වර්තමානයේ ජනාධිපතිතුමා ගොවි පවුලක දරුවෙක් හැටියට, අද ඒ දැක්ම තමයි ඉදිරියට ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා අද ලැජ්ජා වෙන්න ඕනෑ. කැබිනට් නැති, අගමැතිවරයෙක් නැති එකම නායකයා රජුගේ පුතෙක් කියන කාරණාව කියන්න ඕනෑ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දැන් කුඹුරේ ඉන්දන්න ලැහැස්ති කරන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගොවියා රජ වුණු යුගයේ, සැබෑ ගොවියා රජ වුණු යුගයේ ගොවිකම දන්නේ නැති, හැම් බේකන් කන -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දැන් ගොවියාව කුඹුරේ හිටවන්න හදන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මේ වාගේ මිනිස්සු නිසයි මේ රටට හෙණ ගහලා තිබෙන්නේ කියන කාරණය කියනවා. මම එතැනින් එහාට -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒ වගේ මිනිස්සු කියලා කිව්වේ, මෛත්‍රීපාල සිරිසේන වාගේ මිනිස්සු හින්දාද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

භූමිතෙල් ගෑ වුණු ගැරඩි වාගේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙතුමා කියනවා, ඒ වාගේ මිනිස්සු නිසා තමයි මේ රටට කෙළ වෙලා තිබෙන්නේ කියලා. මම ජනාධිපතිතුමාට එහෙම කියනවාටම එකඟ නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නැහැ. ඔය වාගේ කෝට් කාරයින්ට.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

විවේචනයක් තියෙනවා. හැබැයි, එහෙම කියන එක වැරදියි. එහෙම්ම කෙළ වෙලා ගිහිල්ලා කියලා එතුමා කියන -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, වාඩි වෙන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එහෙම කියන්න එපා. ඒක කියන එක හරි නැහැනේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කථාව කරන්න දෙන්න. බාධා කරන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මේ වාගේ බූරු වහන්සේලා නීතිඥවරු වෙලා ඉන්න කොට නීතියට ගිය කල අද පේනවා නේද? මේ වාගේ -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ජේ.වී.පී. එකේ අමුඩ කල්ලිය දැන් කොහේද දන්නේ නැහැ ඉන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ කථාව වෙන පැත්තකට යන්නයි යන්නේ. විශේෂයෙන් මට කියන්න ඕනෑ වුණේ, කෘෂිකර්මය මෙන්න මේ යුගයට අපි සම්ප්‍රාප්ත වෙන්න ඕනෑය කියන කාරණය. ඔබතුමා මගින් මගේ කල්‍යාණ මිත්‍රයා, ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාට මම යෝජනා කරනවා. අපේ පළාත්වල තිබෙනවා, මේ මල් වැවුම්කරුවන්ගේ සමිති. හැබැයි, බෝඩ් එක විතරක් තිබෙන සමිතිත් තිබෙනවා. ක්‍රියාත්මක වන සමිතිත් තිබෙනවා. විශේෂයෙන් මේවා කාන්තාවන්ගේ සමිති. ඒ නිසා මේවා හරියට ලියාපදිංචි වෙලාද? කාන්තාවෝ සාමාජිකත්වයේ හරියට ඉන්නවාද? වැඩ කරනවාද කියලා බලන්න. (බාධා කිරීමක්) කාන්තාවෝ. කාන්තාවෝ කිච්චාම අවුරුදු 18 ට වැඩි. ඒකේ වයස් භේදයක් නැහැ. ඒ අය උනන්දු කිරීම සඳහා ඔබතුමා ලබන වසරේ මුදල්වලින් යම්කිසි මුදල් ප්‍රමාණයක් ඒ පිළිගත් සමිතිවලට, එක එක්කෙනා හැටියට නොවෙයි. පිළිගත් සමිතිවලට වෙන් කරන්නය කියලා මම යෝජනා කරනවා. ඒ මොකද, ඔවුන්ව දිරිමත් කරන්න. මේක හරිම වැදගත්. මොකද, හුඟාක් කාන්තාවෝ ගෙවල්වලට වෙලා ඉන්නවා. ඔවුන්ට කරන්න දෙයක් නැහැ. හැබැයි, ඔවුන්ට අතහිත දෙන්න කෙනෙකු නැහැ. ඒ එක්කම මම කියනවා. අපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැම එකකම ඔබගේ නියෝජිතයෙක් ඉන්නවා. නියෝජිතයෙකු හෝ නියෝජිතවරියක්. ඔවුන්ට ඔවුන් එක්ක සම්බන්ධ වෙන්නය කියන්න. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වෙලා විතරක් ඉන්න එපා. ඔවුන් එක්ක සහ සම්බන්ධ වෙලා මේ කටයුත්ත උනන්දුවෙන් කරවන හැටියට මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට මම එක කාරණාවක් කියන්න ඕනෑ. මේක නෝක්කාඩුවක් හැටියට සලකන්න එපා. මම කඩුවෙල ප්‍රදේශය නියෝජනය කරන කෙනා. මම එවකට කෘෂිකර්ම සහ පශු සම්පත් අමාත්‍යවරයා හැටියට කඩුවෙල ගොවි ජන සේවා මධ්‍යස්ථානයේ රජයේ ඉඩම ඉල්ලාගෙන, මම පශු සම්පත් මධ්‍යස්ථානයක් හැදුවා. ඒක ඉතාමත් හොඳින් එවකට පවත්වාගෙන ගියා. මෙතැන පළාත් අධ්‍යක්ෂතුමා ඉන්නවා ඇති. මේ අඳුරු කුටියේ. මෙතැනින් පේන්නේ නැහැ ඉන්නවාද නැද්ද කියලා. අඳුරු කුටියක්. ඒවාවල පේන්නේ නැහැ. ඉස්සර නම් පේනවා. දැන් එහේ පේන්නේ නැහැ. එහේ ඉන්න අයට මෙහේ පේනවා ඇති.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු සභානායකතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා ඒ විනාඩිය විනාඩි දෙක කරන්න. මොකද, පොලිස් කොට්ටෝරුවා.

[ගරු හෙක්ටර් බෙත්මගේ - සභානායකතුමා]

මම ප යන්නෙන් කියන්න ගියේ පොලොස් කොට්ටෝරුවා කියලා. පොලිස් කොට්ටෝරුවාගේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු ඇමතිතුමාගෙන් ඔබතුමාට විනාඩියක් දෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

හොඳයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මොකක්ද ඒ වචනය.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මම ප යන්නෙන් කියන්න ගියේ පොලිස් කොට්ටෝරුවා කියලා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ආ... ඒක කමක් නැහැ. වාසුදේව මැතිතුමා පාර්ලිමේන්තුවේ කියපු වචනය නොවෙයි නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, බාධා කරන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

හැබැයි, මට විනාඩි දෙක දෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් මම ගරු අමාත්‍යතුමාට කියන්නේ. මේ අපේ පශු සම්පත් මධ්‍යස්ථානයේ පශු සම්පත් වෛද්‍යවරු එක්කෙනයි ඉන්න ඕනෑ. කරුමෙට මේකේ දෙන්නෙක් ඉන්නවා. මේ දෙන්නාම කාන්තාවෝ නිසා හැම වෙලාවේම කෙහෙවලු පටලවා ගන්නේ නැති වුණාට, ඒ ස්වභාවයෙන් ඉන්නේ. ඒ නිසා මගේ සේවාදායකයින්ට කිසිම සේවයක් වෙන්නේ නැහැ. මොකද, මෙයා මොකක් හරි කිව්වොත්, අරයා කරන්නේ නැහැ. අරයා මොකක් හරි කිව්වොත් මෙයා කරන්නේ නැහැ. හැමදාම රෙජිස්ට්‍රර් එක, අත්සන් කරන එක හංගනවා. මේ ඇත්ත කියන්නේ. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා, කරුණාකරලා මේ ගැහැණු පරාණ දෙකම අයින් කරලා මේකට පිරිමි පරාණයක් එවන්න. මොකද, කෘතිම සිංචන තිබෙනවා. අරවා මේවා තිබෙනවා. මේගොල්ලෝන්ට කරන්නත් හරි අමාරුයි. ඒ නිසා පිරිමි පරාණයක් එවන්න.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

කාන්තාවන්ට අපහාස කරන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

කෘතිම සිංචනය පිළිබඳව ද ඔබතුමිය කිව්වේ අපහාස කරන්න එපාය කියලා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කොණ්ඩේ කපලා යැව්වා නම් හරි. එතකොට ඉවරයි ප්‍රශ්නය. ඔය කොණ්ඩේ පටලවා ගන්න එක නේ තිබෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ නෝක්කාඩු කියනවා නොවෙයි. මම හිටපු කෘෂිකර්ම අමාත්‍යවරයා හැටියට ඔවුන්ගේ යුතුකමක් තිබෙනවා. ඒ දෙන්නාගේම. මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා නම්, මාත් එක්ක කථා කරන්න. ජීවිතේට කථා කරන්නේ නැහැ. 2016 වර්ෂයේ මගේ බෙදන්න තිබුණු මෙවලම් තවම බෙදලා නැහැ ගරු ඇමතිතුමනි. ඊට පස්සේ මම ලියලා ඇරියාම, මොනවා හරි ලියනවා. මට නොවෙයි කියන්නේ. පළාත් අධ්‍යක්ෂකටයි කියලා අරින්නේ. පළාත් අධ්‍යක්ෂතුමාගෙන් ලිපියක් එනවා තව විධියකට. අපිත් එක්ක මේවා සෘජුව කථා කරලා විසඳගන්න පුළුවන්. ඒ නිසා මම ඔබෙන් ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. කඩුවෙල පශු සම්පත් කේන්ද්‍රයේ ඉන්න ඒ දොස්තර නෝනලා දෙන්නාම කොහාට හරි දාලා පුරුෂ පාර්ශවයෙන් කෙනෙක් ලබා දෙන්නය කියලා පළාත් අධ්‍යක්ෂතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ ඉල්ලා සිටිමින්, කෘෂිකාර්මික අභිවෘද්ධිය සඳහා මේ කෘෂිකාර්මික රටේ, කෘෂිකර්මය පිළිබඳව රජෙක් රජ වෙලා ඉන්න වෙලාවක -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කුඹුරේ ඉන්දන්න ලැහැස්ති වෙලා ඉන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

අතිගරු ජනාධිපතිතුමා එදා කෘෂිකර්ම ඇමතිවරයා වෙලා ඉන්න කොට බස්නාහිර පළාත් සභාවේ කෘෂිකර්ම ඇමති හෙක්ටර් බෙත්මගේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

රජා බලු වෙලා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මතක තියා ගන්න. මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වෙලා ඉන්න කොට කෘෂිකර්ම ඇමති මෛත්‍රීපාල සිරිසේන. බස්නාහිර පළාත් සභාවේ කෘෂිකර්ම ඇමති හෙක්ටර් බෙත්මගේ. ඒක මතක තියාගන්න ඕනෑ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉදිරියේදී මහින්ද රාජපක්ෂ අගමැතිතුමා ඊළඟ වරටත් අගමැති කරලා, මේ රටේ ජනාධිපති හැටියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක තමයි ගියේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මේ පළාත් සභාවේ කෘෂිකර්මාන්ත ඇමතිවරයා හැටියට එතුමාට සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 05.19]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය කථා කරන්න ලැබීම ගැන ඉතාම සතුටු වෙනවා. මොකද, ප්‍රධානම හේතුව වසර හතරක් තිස්සේ ඔබතුමාත් එක්ක, කෘෂිකර්ම අමාත්‍යාංශය එක්ක උපදේශක කාරක සභාව හැටියට සම්බන්ධ වෙලා වැඩ ගොඩක් කරන්න ලැබුණා. ඒ වාගේම ඔබතුමා ගැන හොඳ කියන්න ගියොත් කරපු දේවල් ගොඩාක් තිබෙනවා. ඒ ඔක්කොම දැන් ගොඩක් අය කිව්වා. (බාධා කිරීමක්) ගරු අමාත්‍යතුමාගේ සහයෝගය බොහොම අගය කරනවා. මොකද, එදා සිට උපදේශක කාරක සභාවට අද දක්වා ක්‍රියාකාරීව මම පැමිණිලා ඔබතුමාට යෝජනා ඉදිරිපත් කළා. විශාල සේවයක් කළා. හැම වැඩකටම මම සම්බන්ධත් වුණා. ඒ නිසා ඇත්තටම ඔබතුමාව අගය කරනවා. මේ වසර හතර තුළම ඔබතුමාට අපි ඡන්දයත් දුන්නා. නමුත් මේ වසරේ නම් කොහොම වෙයිද දන්නේ නැහැ. ඒත් ඔබතුමාව අගය කරනවා. ඒ වාගේම ඔබතුමාගේ සේවයත් අගය කරනවා.

ගරු ඇමතිතුමනි, පොඩි පොඩි ගැටළු කිහිපයක් තිබෙනවා. මගේ මේ අවසාන අයවැයට මේ කථා කරන්නේ. අපි ලබන පාර මේ එයිද නැද්ද දන්නේ නැහැ. අපට මන්ත්‍රීකම් වැඩක් නැහැ. අපි කොහේ හිටියත් සේවය කරනවා. මේවා බලාගෙන කරන්නේ නැහැ. හැබැයි, අපි හිටියත් නැතත් මේ කෘෂිකර්ම අමාත්‍යාංශය තුළ වෙන්න ඕනෑ දේවල් තිබෙනවා. අපි යම් යම් දේවල් කථා කරනවා. වෙන්නේ නැහැ. 2019 වසරේ කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වී තිබෙන්නේ, රුපියල් මිලියන 550 යි. 2018 දී රුපියල් මිලියන 675 ක් වෙන් වෙලා තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයට, අධ්‍යාපන අමාත්‍යාංශයට, මහා මාර්ග අමාත්‍යාංශයට වැඩියෙන් වෙන් වෙලා තිබෙනවා. හැබැයි, අධ්‍යාපනය ලබන්න දරුවෙක් හොඳ සෞඛ්‍ය සම්පන්න වෙන්න ඕනෑ. ඉස්කෝලෙට ගිහිල්ලා නිදි කිරා වැටෙන, ඉගෙන ගන්න බැරි නම් ඒ ළමයාට ඉගෙන ගන්න බැහැ. ඊළඟට ලෙඩක් දුකක් නැති දරුවෙක් වෙන්න ඕනෑ. ඒකටත් හොඳ ආහාර වේලක් අනිවාර්යයෙන්ම ලැබෙන්න ඕනෑ. ඒ වාගේම මහා මාර්ගයේ යන්න සෞඛ්‍ය සම්පන්න, උගත් දරු පිරිසක් මේ රටේ ජීවත් වෙන්න ඕනෑ. හැබැයි, එහෙම හිතන මේ රටේ කෘෂිකර්මයට වෙන් කරන්නේ, ඉතාමත් සුළු මුදලයි. දැන් කෘෂිකර්මය නගා සිටුවන්න කථා කරනවා. කෘෂිකර්මයට මුදල් වෙන් කරන්නේ නැහැ. රටේ ප්‍රධානම දේ තමයි ආහාර කියන එක. සෞඛ්‍ය සම්පන්න දරුවෙක් ඉතාම වැදගත්. මම දන්නේ නැහැ, මේ මුදල් වෙන් කරන්නේ කවුද? කොහොමද කියන එක අපි දන්නේ නැහැ. මේ වෙන් කරලා තිබෙන මුදල ගැන මම ඉතාම කනගාටු වෙනවා.

[ගරු නිරෝෂා අතුකෝරල]

ඒ වාගේම මේ රටේ කෘෂිකර්මය නහාසිටුවන්න අපි හැම කෙනෙක්ම කථා කරනවා. වී වගාව ගැන කථා කළොත්, බස්නාහිර පළාතේ කුඹුරු හෙක්ටයාර් 22,000 ක් පුරන් වෙලා තිබෙනවා. ඒකෙන් ගම්පහ හෙක්ටයාර් 13,000 ක් පුරන් වෙලා තිබෙනවා. කළුතර හෙක්ටයාර් 7000 ක් පුරන් වෙලා තිබෙනවා. කොළඹ හෙක්ටයාර් 2000 ක් පුරන් වෙලා තිබෙනවා. අහිමි වී ඇති වී අස්වැන්න මෙට්‍රික් ටොන් 73,000 කි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අපි ලබන අවුරුද්දේ කොටමු.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

කථාවක් කරන කොට මන්ත්‍රීවරයෙක් විධියට ඉන්න කෝ. ඔබතුමාට අහගෙන ඉන්න බැරි නම් එළියට යන්න. කථාවට බාධා කරන්න එපා. අපි වල්පල් කියවන්නේ නැහැ නේ? මෙතැනට ඇවිල්ලා වනවර කථා කියවන්නේ නැහැ නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා -

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

කට තිබ්බ පළියට හැම එකකටම කියවන්න එපා පිස්සෙක් වාගේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එතුමිය කරුණු කාරණා සොයාගෙන ඇවිල්ලා කථා කරන්නේ. පොඩ්ඩක් අහගෙන ඉන්න. ඒ නිසා එතුමියට බාධා කරන්න එපා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඔබතුමන්ලා වාගේ හැම එකකටම කව කව ගාලා පුරුද්දක් නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ නිසා එතුමියට බාධා කරන්න එපා. ඔබතුමිය කථා කරන්න. ඔබතුමියගේ කථාව ඉතා වැදගත්.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

අපි නැති වුණත් මින් ඉදිරියට ඔබතුමා කෘෂිකර්ම ඇමතිතුමා වශයෙන් මේ ඉන්න නිලධාරීන් ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. බස්නාහිර කුඹුරු ගොඩකිරීම් සඳහා අයදුම්පත්‍ර මේ වන කොට 3500 ක් ලැබී තිබෙනවා. කුඹුරු ගොඩ කිරීම නිසා ප්‍රධාන හානි දෙකක් සිද්ධ වෙනවා. රටට බත අහිමි වීම එකක්. අනික් එක, තමයි පහත් බිම් ගොඩ කිරීම නිසා ගංවතුර උවදුරට ලක් වෙනවා. වී වගාව බැරි වුණත් මොනවා හරි වගාවන් එහි කරන්න පුළුවන්කම තිබෙනවා. බස්නාහිර පළාතේ වගා කළ හැකි සුදුසු වී වර්ග ගැන සොයා බලන්න ඕනෑ. විශේෂයෙන්ම දේශීය වී වගාව ගැන මම කථා කරන්න ඕනෑ. මම අක්කර 500 කට අධික ප්‍රමාණයක මේ වන විට, දේශීය වී වගාව කරනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ අක්කර විසි ගණනකුත් කරනවා. පොලොන්නරුවේ අක්කර දෙසිය ගණනක්. මාතර ඒ වාගේ ප්‍රදේශවල මම කරනවා. මේ එක එක්කෙනා එක එක කථා කරනවා. වී වගා කරන්න බැහැ. වස විෂ නැතිව කරන්න බැහැයි කියලා. නමුත් අපි මේ කිසිම chemical එකක් භාවිතා කරන්නේ නැතිව, මේ රන්වල ගරු මන්ත්‍රීතුමා නිෂ්පාදනය කරන ඉතාම හොඳ පොහොර අපේ දේශීය කාබනික පොහොර භාවිතා කරලා වගා කරන්න පුළුවන්. හොඳ අස්වැන්නක් තිබෙනවා. පළමුවැනි කන්නයේ නැති වුණත්, දෙවැනි කන්නය, තුන්වැනි කන්නය වනවිට හොඳ අස්වැන්නක් තිබෙනවා. මේවායේ අද මාෆියා එකක් එකතු වෙලා තිබෙනවා. අද වස විෂ නැති ගොවිතැන කියන එක සොයා ගන්න බැරි වෙලා තිබෙනවා. මේකට අවශ්‍ය ප්‍රතිපාදන, අවශ්‍ය නිවැරදි සහයෝගය ලැබෙන්නේ නැහැ. මම පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ කීප වතාවක්ම කියලා තිබෙනවා, වෙළඳ පොළ නැතිකම.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ජේ.වී.පී. පොහොර.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඔබතුමිය ගණන් ගන්න එපා. ඔබතුමිය කථා කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමිය කථා කරන්න. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා, සභාව විහිළුවට ලක් කරන්න එපා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

විහිළු කරන වෙලාවට විහිළු කරන්න. කථා කරන වෙලාවට කථා කරන්න දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමිය කථා කරන්නේ, බොහොම කරුණු කාරණා සොයාගෙන ඇවිල්ලා. ඒ නිසා -

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඔබතුමන්ලා එහෙම කරන්න එපා. ඒක හරි නැහැ නේ? එහෙම කරන්න එපා. කට හැකරකම තිබුණා කියලා එහෙම කරන්න එපා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමිය කථා කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු මන්ත්‍රීතුමා, කාන්තාවකට නිදහසේ කථා කරන්න දෙන්න කෝ.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

කථා කරන්න, අපි පළපුරුදු දේශපාලඥයෝ නොවෙයි. මේ වාගේ බාධා කරන කොට කථා කරන එක පටලැවෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එතුමිය බොහොම කරුණු කාරණා සොයාගෙන ඇවිල්ලා කථා කරන්නේ.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

මොකද අපිත් කෘෂිකර්මයට ආදරෙයි. කෘෂිකර්මයට අපි හදවතින් ආදරය කරන මිනිස්සු. මේක අපේ ඇඟේ තිබෙන එකක්. අපට තිබෙන ගැටලු ගැන අපි කථා කරන්නේ. (බාධා කිරීම්) ඔබතුමන්ලා වාගේ උඩින් පල්ලෙන් නොවෙයි. ඒ ගැන කැක්කුමක් තිබෙන නිසයි අපි කථා කරන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමිය කථා කරන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

වස විෂෙන් තොර -

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඔබතුමාගේ කථාවේදී ඒක කියා ගන්න කෝ. ඒක මට කියන්නේ. මට අවශ්‍ය දේ මම කියන්නේ. ඒකට ඔබතුමා උපදෙස් දෙන්න ඕනෑ නැහැ. ඔබතුමාට එච්චර අමාරුවක් තිබෙනවා නම්, ඔබතුමා ඒ ගැන කථා කර ගන්න කෝ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බාධා කරන්න එපා. ඔබතුමිය කථා කරන්න.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඇත්තටම කනගාටු වෙනවා. ඇත්තටම මේ අය ගැන අපි කනගාටු වෙනවා. මේ අය මාර දේශප්‍රේමියෝ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු මන්ත්‍රීතුමිය, පොඞ්ඩක් දුක ඇති. ඒ පැත්තේ ඉඳන්නේ ආවේ. ඒ පැත්තේ ඉඳන්නේ ආවේ. පොඩි දුකක් තිබෙනවා. පොඞ්ඩක් නවත්තමු.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාවට කවුරුවක්වත් බාධා කළේ නැහැ. ඔබතුමාගේ කථාව බොහොම හොඳට සවන් දීගෙන සිටියා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

එතුමා තමයි යටින් ඉඳගෙන උගුල් අටවන්නේ. යටින් ඉඳගෙන හීන් නූලෙන් එතුමා වැඩ කරන්නේ. හිතත් ඇති. බලමු කෝ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ නිසා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලන්නේ. එතුමියට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න. බාධා කරන්න එපා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

එතකොට දේශීය වී වගාව ගැන අපි කථා කළොත් මම කීප වතාවක්ම කියලා තිබෙනවා. අපේ ගරු ඇමතිතුමා අධිකාරිය හරහා හෙළ බොජුන් හලට ලබා දෙන්න මට අවස්ථාවක් ලබා දීලා, යම් ප්‍රමාණයක් අපි වෙළඳපොළට දාලා තිබෙනවා. ඇත්තටම අපට මීට වඩා විශාල ප්‍රමාණයක් වී වගා කරන්න පුළුවන්. වස විෂ නැතිව පලතුරු, එළවළු වගා කරන්න පුළුවන්. හැබැයි, අපට තිබෙන ගැටලුව මේකට වෙළඳ පොළක් නොමැති වීමයි. සමහර මිනිස්සු කිව්වාට මේක කරන්න බැහැයි කියලා මේක සම්පූර්ණ බොරුවක්. මේක කරන්න පුළුවන්.

ඒ වාගේම අපි එළවළු වගාව ගැන කථා කළොත්, එළවළු වගාවේදී බස්නාහිර පළාතේ වැඩිපුරම වගා කරන එළවළු වර්ග. බණ්ඩක්කා හෙක්ටයාර් 350 ක් වගා කරනවා. මෑ වර්ග හෙක්ටයාර් 300 යි. වම්බටු හෙක්ටයාර් 300 යි. පතෝල හෙක්ටයාර් 300 යි. පළා වර්ග, ගොටුකොළ, කංකුං, මුකුණුවැන්න හෙක්ටයාර් 390 ක් වගා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තිබෙන ගැටලුව පලා වර්ගවලින් විශාල රෝග බෝ වෙනවා. අපේ රත්වල ගරු මන්ත්‍රීතුමා දන්නවා, ඕනෑම බෝගයකට බෙහෙත් ගැහුවාම ඒක ගසට උරා ගන්න දවස් 15 ක් යනවා. හැබැයි, අද බෙහෙත් ගැහුවාම හෙට තමයි පළා වර්ග කපන්නේ. ඒවා මිනිස්සු කනවා. අද 1/3 ක් මිනිස්සු ලෙඩ්ඩු බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ වස විෂ නැති වගාව අනිවාර්යයෙන් ඉස්සරහාට ගෙනි යන්න ඕනෑ. ඒ වාගේම බණ්ඩක්කා, මෑ වර්ග, වම්බටු වාගේ ඒවා වෙනුවට, අපේ ඉස්සර කාලේ තිබෙනවා අලංකාර, ඒ වගේම අවර, තුඹ, තිබ්බටු වාගේ දේශීය එළවළු වර්ග වගා කරන්න ක්‍රමවේද හදාගන්න ඕනෑ. බණ්ඩක්කා ඕනෑ කෙනෙකුට වගා කරන්න පුළුවන්. මේවාත් වගා කරන්න ඕනෑ. ඒ වෙනුවට අර වාගේ එළවළු වර්ග වගා කරන්න ක්‍රමවේද හදාගන්න ඕනෑ. ඒ වාගේම නිවෙස්වල වගා කරන්න දිරිගන්වන්න ඕනෑ. ඇත්තට මෙතුමා බීජ දුන්නා. ගස් දෙනවා. ඇත්තටම මන්ත්‍රීවරුන්ටත් දුන්නා. හැබැයි, මේවායේ පසු විපරමක් තිබෙන්න ඕනෑ. අශාවට පැළ ගන්නවා. මිනිස්සු හදන්නේ නැහැ. හැබැයි මිනිස්සුන්ගේ ආකල්ප හදන්න ඕනෑ. මේවාට මිනිස්සු ආදරය කරන්න ඕනෑ.

ඇත්තටම අපේ රටේ සෞඛ්‍ය අමාත්‍යාංශය කියලා එකකුත් තිබෙනවා. මෙලෝ වැඩක් නැහැ. ලෙඩවලට විතරයි බෙහෙත් දෙන්නේ. මම කියන්නේ මෙතුමාගේ නොවෙයි. හැබැයි, ලෙඩ හැදෙන්නේ ඇයි කියලා සොයා බැලීමක් සිදු වන්නේ නැහැ. මේ මිනිස්සුන්ට මේ ආහාර, මේ එළවළු කන කොට ඒවායෙන් ලෙඩ හැදෙනවා කියලා දැනුවත් කරනවා නම් මිනිස්සු මේ වාගේ දේවල් කන්නේ නැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

රාජිත ඇමතිතුමාට කියන්නේ.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

හැම දෙයක්ම දුන්නාට මේවා කරන්න මිනිස්සුන්ව ඇදලා ගන්න ඕනෑ. මිනිස්සුන්ට අදහසක් ලබා දෙන්න ඕනෑ. එහෙමනම් මා ඉල්ලා සිටිනවා, එවැනි දේවල් ගේන්න ඕනෑය කියලා.

ඒ වාගේම පලතුරු වගාව ගත්තොත් අන්නාසි හෙක්ටයාර් 1500 ක් කරනවා. කෙසෙල් හෙක්ටයාර් 3000 ක් කරනවා. රඹුටන් හෙක්ටයාර් 2000 ක් කරනවා. අපි කෘෂිකර්ම උපදේශක කාරක සභාවේදී යෝජනා කරලා තිබෙනවා, ලංකාවේ දේශීය පලතුරු වර්ග ගොඩක් වඳ වෙමින් යනවා. දැන් ආතා වාගේ ගත්තොත් එහෙම අපට ඒවා හරිම ප්‍රයෝජනයි. ලෙඩ දුක්වලට ගොඩක් හොඳයි

කියලා අපි පිළිගන්නවා. ඒ වාගේ දේවල් වගා කරන්න නවීන ක්‍රමවේද අවශ්‍යයි. සමහරවිට මෙතුමාට කරන්න දෙයකුත් නැහැ. ඒ නිසා මෙච්චර කුඹුරු පුරන් වෙලා තිබෙනවා. මෙච්චර ඉඩකඩම් තිබෙනවා. අපි මෙන්න මේ වාගේ දේවල් කරන්න අතහිත දෙමු. මිනිස්සු කරන්න කැමැතියි. නමුත් ඒවා කරන්න කාගෙන්වත් අත්වැලක් නැහැ. ඒ වාගේම මේවා ඉස්සරහාට ගේන්න මේවාට අපි උදව් කරන්න ඕනෑ. අපනයන ගොවියන් දිරිමත් කරන්න ඕනෑ. අනික් එක, අපට තිබෙන ලොකු ප්‍රශ්නයක් තමයි පලතුරුවලට හැදෙන රෝග. මේ පලතුරුවලට හැදෙන රෝග සම්බන්ධයෙන් මොනවද කරන්න ඕනෑ කියලා මිනිසුන්ට උපදෙස් දෙන්න ඕනෑ. අපි මීට වැඩිය ඉතාමත් ක්‍රියාශීලී විධියට ගොඩක් දේවල් කරන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම ඔබතුමාට අයිති මල් සහ විසිතුරු භෝග ගැන කථා කළොත් එහෙම, බස්නාහිර පළාතේ මල් වගාව ගත්තොත් ඇන්තූරියම් හෙක්ටයාර් 120 ක් වගා කරනවා. ඕකිඩ් හෙක්ටයාර් 50 ක් කරනවා. විසිතුරු පැළ හෙක්ටයාර් 150 ක් කරනවා. එතකොට ඒවා වගා කරනවා තමයි. නමුත් අපි ලංකාවට ඕකිඩ් මල්, ඇන්තූරියම් මල් පිටරටින් ගේන්නේ. අද අපට උවමනා ප්‍රමාණයට නිෂ්පාදනය කරන්න බැරි වෙලා තිබෙනවා. හැබැයි මේවාට පුහුණුවීම්, දැනුම, ඒ වාගේම ණය ක්‍රමයක් හරි මොනවා හරි හඳුන්වා දෙනවා නම්, ගෙවල්වල විශේෂයෙන් ඉගෙන ගත්ත, පෙන්ෂන් ගිය අය වාගේම යම් දෙයක් කරන්න කැමැති ගොඩක් කාන්තාවන් ඉන්නවා. මේ කාන්තාවන්ට නිකන් පැළ ටික විතරක් නොවෙයි. මේකට ක්‍රමවේදයක් හදන්න ඕනෑ. මේ අයව ගැටගහලා, බැඳලා තියා ගන්න ඕනෑ. මේවා කොහොමද කරන්නේ? ඒවායේ අස්වැන්න ගන්නේ කොහොමද? ගොඩක් අය මේ දේවල් කරන්න කැමැතියි. ඒ අයට වෙළඳපොළ නැති ප්‍රශ්නයක් තිබෙනවා. අන්න ඒ නිසා මේ දේවල් ටික අනිවාර්යයෙන්ම ඔබතුමා ඉදිරියට කරගෙන යන්න. අපි හිතනවා ඔබතුමා කෘෂිකර්ම ඇමතිවෙලා දිගටම ඉඳියි කියලා. ඒ ඉන්න හැම වාරයකම මේ දේවල් ටික ඔබතුමාට කරන්න ශක්තිය ලැබෙන්න කියලා අපි අනිවාර්යයෙන්ම ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම මෙතුමාගේ යෝජනාවක් තියෙන්නේ වස විෂ නැති වගාව. අපි ඒ වගාව කරනවා. හැබැයි, මේවාට අපට Certificate එකක් හම්බ වෙන්නේ නැහැ. දැන් මේ පොතේ දාලා තිබෙනවා, මම ඒ ඉල්ලපු ඉල්ලීමට පේරාදෙණියෙන් දෙනවා කියලා. මම ඒකට කථා කළාම ඒ අය පුද්ගලයන්ට දෙන්නේ නැහැ. ඒ අය දෙන්නේ කණ්ඩායමකට. අපි කණ්ඩායමක් හදන්න ඕනෑ. අඩුම ගොවියන් 10 දෙනෙකුගේ කණ්ඩායමකට තමයි ඒ Certificate එක නිකුත් කරන්නේ. පුද්ගලික ආයතනවලින් තමයි මේ වන විට වස විෂ නැති වගාව කරන අයට Certificate එකක් දෙන්නේ. මම හිතන්නේ මෙතුමාත් ඒකට ලොකු වැයමක් දරනවා. ඒක නිසා මෙපමණ රජය බලවත් වෙලා, රජයට ඒ වාගේ ආයතනයක් නැහැ. කෙනෙක් වගාවක් කරනවා නම්, ඒ ගැන බලලා ඒකට Certificate එකක් දෙන්න. ඒකටත් ක්‍රමවේදයක් හදන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපි ඉල්ලීම් කීපයක්ම ඉල්ලා තිබෙනවා. කථාවට බාධා කරපු නිසා ඇත්තටම මගේ කථාව හරියට කරගන්න ලැබුණේ නැහැ. ඒ ගැන අවංකවම කනගාටු වෙනවා. මගේ අන්තිම අයවැයට මම මේ කථා කරන්නේ. මොකද, මේකේ අංශ කීපයක් තිබුණත් කෘෂිකර්මය කියන්නේ මගේ ජීවිතය හා සම්බන්ධයි. ඒක මම ඉතාම ආදරය කරන ක්ෂේත්‍රයක්. ඒක ගැන විතරයි කථා කරන්න මම මේ විනාඩි දහය ගත්තේ. ඇත්තටම ඒකටත් බාධා කිරීම ගැන මන්ත්‍රී කෙනෙක් විධියට මම අගය කරනවා. ඕකට කියන්නේ කාන්තා හිංසනය. කාන්තාවකට ගරු කරන්න දන්නේ නැති පිරිමි තමන්ගේ ළඟ, ගොඩේ ඉන්නවා නම් දේශප්‍රේමී, දේශකාමී ඔක්කොම තිබෙනවා. මෙතැනින් පොඩ්ඩක් එහාට ගියාට පස්සේ තමයි -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අර අක්කර 200 කාගෙන්ද හම්බ වුණේ? කොහෙන්ද හම්බ වුණේ?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඔබතුමාගේ අම්මාගෙනුයි, තාත්තාගෙනුයි මට හම්බ වුණේ. ඇත්තටම මම කනගාටුව වෙනවා, ඔබතුමා වුණත් මගේ කථාවට බාධා කිරීම ගැන. මොකද මේ අයට වාගේ සභාපතිකම් කරලා, හතර වටේ ගිහිල්ලා අපට පුරුද්දක් නැහැ. පළමුවැනි පාර අපි පළාත් සභාවට ආවේ. අපේ දේශපාලනය නවකයි. මේ අයට වාගේ අපට බාධා කරන කොට, කෑ ගහන කොට අපට කථා කරලා පුරුද්දක් නැහැ. මම ඔය පැත්තේ ඉන්න කොට ඔබතුමා මගේ බොහොම හිතවතෙක්. මගේ කථාවට බාධා කිරීම ගැන -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ඔය අවසාන කථාව තමයි කථා කරන්නේ.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඔබතුමාට මෙහේ කට්ටිය හොඳට සලකයි. බලාගෙන ඉන්න කෝ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

හැඟීම්බර කථාවක්.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

අනාවැකි කීම ගැන.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමිය කථාව අවසන් කරන්න.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඇත්තටම මම කනගාටු වෙනවා, මේ පළාත් සභාවේ ඒ කථාව ගැන.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියට අපි ස්තුතිවන්ත වෙනවා. මොකද එතුමියගේ කථාවේදී පැහැදිලිව සංඛ්‍යා ලේඛනත් එක්ක, කරුණු කාරණාත් එක්ක බොහොම වැදගත් විධියට එතුමිය කථා කළා. එතුමිය අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ සියලුදෙනාටම ප්‍රයෝජනවත් විධියට කථා කළා. ඒ පිළිබඳව අපේ ස්තුතිය එතුමියට පුද කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ස්තුතිය වාගේම කනගාටුවත් ප්‍රකාශ කරන්න ඕනෑ. එකම කාන්තාව.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බාධා කිරීම් පිළිබඳව. ඇත්තටම වැදගත් කථාවක්. මීළඟට ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ඇ.භා. 05.33]

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. විශේෂයෙන්ම අද දවසේ පැවැත්වෙන කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය පිළිබඳ වැය ශීර්ෂයේදී, ඒ පිළිබඳව මම ඇත්තටම අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් කාලය ඉල්ලගෙන තමයි මම මේ කථාවට අවශ්‍ය අවකාශය සලසා ගත්තේ. විශේෂයෙන්ම මම අද සතුටු වෙනවා. ආණ්ඩු පක්ෂයේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ වැය ශීර්ෂයට ඡන්දය විමසන මේ අද දවස ඇතුළත, ඉදිරි දින කීපය ඇතුළතදීත් වැය ශීර්ෂයන් සම්බන්ධව ඒ ඡන්දයේ ප්‍රතිඵලය කුමක් වුවත්, මේ සභාගර්භය තුළ රැඳී සිටීමට තරම් ආත්මශක්තියක් තිබීම පිළිබඳව මම අද සතුටු වෙනවා. මොකද පාර්ලිමේන්තුව, ඔබතුමන්ලාගේ නායකයින් ඡන්දය විමසන අවස්ථාවල අද පාර්ලිමේන්තුව මහහැර යන මොහොතක, ඡන්දයක් පවතින මේ පළාත් සභාවේදී ඔබතුමන්ලා අද ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් මෙසේ රැඳී සිටීම පිළිබඳව අද අපි සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කවුරුත් දන්නවා. මේ මොහොත වන විට මුළු රටම අකර්මණ්‍යය වෙලා තිබෙනවා. රාජ්‍යය යාන්ත්‍රණයටම මුදල් වෙන් කරන පාර්ලිමේන්තුව අද අකර්මණ්‍යය වෙලා තිබෙන මොහොතක විශේෂයෙන් විධායකය සහ තමන් ආණ්ඩුව යැයි කියා ගන්නා පාර්ලිමේන්තුව නියෝජනය කරන පරාජිත කණ්ඩායමක් විසින් සිදු කළ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් වශයෙන් අද මුළු රටත් දේශපාලන වශයෙන් සහ සාමාජීය වශයෙන් කඩා වැටිලා තිබෙන මොහොතක මේ වැය ශීර්ෂයට අද අපි කථා කළාට, මේ කියන සංඛ්‍යා ලේඛනවලට, මේ කියන පුරෝකථනයන් 2019 වසරේ කෙසේ ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයිද කියලා සැක සංකා මම හිතන්නේ, මෙතැන ඉන්න පක්ෂ විපක්ෂ අපි කා තුළත් තිබෙනවා.

කෙසේ වෙතත් මම මගේ කථාව වෙන් කර ගත්තේ විශේෂයෙන්ම මේ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා පිළිබඳව අපට - මම මෙම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව නියෝජනය කෙරෙන්නේ නැහැ. නමුත් එතුමා පිළිබඳව සංසන්දනාත්මකව අපි කවුරු අතරත්, එතුමා

අමාත්‍යවරයා වශයෙන් මෙම අමාත්‍යාංශය මෙහෙයවන ආකාරය පිළිබඳව යම්කිසි ප්‍රසාදයක් තිබෙනවා. ඒ ප්‍රසාදය සහ ඒ සඳහා ගරු කිරීමක් වශයෙන් තමයි මම හිතන්නේ මම මේ අවකාශය ලබා ගත්තේ. එහෙම නැතුව ගරු අමාත්‍යතුමා, මේ පසුගිය වසර 31/2 ඇතුළතදී මට විශේෂ වෙනත් කිසිදු ප්‍රතිපාදනයක් හෝ ලබා දීලා එහෙම නැහැ. කෙසේ වෙතත් අපි සංසන්දනාත්මකව මේ අමාත්‍යාංශවල කාර්යක්ෂමතාවය බලන කොට, විශේෂයෙන්ම අපි පිළිගන්නවා, කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෙරෙන වැඩ පිළිවෙළ සම්බන්ධව අමාත්‍යතුමා සහ ඒ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් විසින් සුවිශේෂී කාර්යභාරයක් කරන බව. විශේෂයෙන්ම අපි පසුගිය කාලපරිච්ඡේදය තුළ සහ මෙතුමාගේ මේ වාර්ෂික වාර්තාවේදී අපි දැක්කා. එතුමා විශේෂයෙන්ම පලතුරු සහ එළවළු වගාව දියුණු කිරීමට, ප්‍රචලිත කිරීමට අවශ්‍ය පැළ බෙදා දීමේ වැඩ සටහන් පසුගිය නිරන්තරයෙන් කාලපරිච්ඡේදය පුරාවටම කෙරුණු ආකාරය. විශේෂයෙන්ම කොස් පැළ බෙදා දීම, ඒ වාගේම එළවළු සහ පලතුරු පැළ බෙදා දීම මම හිතන්නේ ඉතාමත්ම සාර්ථකව ක්‍රියාත්මක වුණා. ඒ එළවළු සහ පලතුරු බෙදා දීම, ඒ වාගේම කොස් පැළ බෙදා දීම වඩාත් ශක්තිමත් වෙන්නේ, මම දකින විධියට, මම විශ්වාස කරන විධියට එහි ඵලදාවට අවශ්‍ය, ඒ ඵලදාවට එකතු කළ අගයක් මත, ඒ අවසන් නිමැයුමට යම්කිසි වටිනාකමක් ලබා දීලා එය වෙළඳ පොළේ ඉල්ලුමක් ඇති වන තත්ත්වයකට පත් කරන්න පුළුවන් වුණොත්, අවසන් නිමැයුමට වානිජ වටිනාකමකුත් එකතු කරලා දෙන්න පුළුවන් නම්, මම විශ්වාස කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ව්‍යාපෘතිය වඩාත් ප්‍රතිඵලදායී වෙනවා, ඵලදායි වෙනවා.

ඒ හා සමගම මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, අද මේ වන විට අපි පිළිගන්නවා, විශේෂයෙන්ම සුළු අපනයන භෝග සඳහා අපේ රටේ වැඩි අවධානයක් යොමු විය යුතු මොහොත මේ වන විට උදා වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගම්මිරිස්, කොකෝවා, කුරුඳු, කරුංකා, ඒ වගේම කරුඳුමුංගු කරාබුනැටි, ඉඟුරු,ගොරකා, වැනිලා වාගේ සුළු අපනයන භෝග සඳහා අද මධ්‍යම රජයේ අමාත්‍යාංශ හරහා විශේෂ අවධානයක් යොමු කරලා, විශේෂ වැඩ පිළිවෙළවල්, ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන මොහොතක, පළාත් සභාවත් පළාත් කෘෂිකර්මාන්තයත් ඒකට අනුගත වෙමින්, බද්ධ වෙමින් මෙම කටයුතු වඩාත් දියුණු කරන තත්ත්වයකට පත් කරන්න පුළුවන් නම්, ඒක වඩාත් ඵලදායි වෙයි කියන එක මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම මී මැසි පාලනයත් ඇතුළුව.

ඒ වාගේම වී වගාව පිළිබඳව මෙතැන ඉන්න හැමෝම කථා කළා. වී වගාව පිළිබඳව මෙතැන ඉන්න හැමෝම තමන්ගේ අදහස් ප්‍රකාශ කළා. විශේෂයෙන්ම පුරන් කුඹුරු නැවත වගා කිරීම පිළිබඳව හැමෝම තම තමන්ගේ අදහස් ප්‍රකාශ කළා. මේ පිළිබඳව මම නම් දකින දේ තමයි, පුරන් කුඹුරු නැවත වගා කිරීම කියලා කියන්නේ, දේශපාලන සටන් පාඨයක් බවට පත් වෙලා තිබීමයි. වප් මඟුලක් ක්‍රියාත්මක කරලා, ඒක දේශපාලන සංදර්ශනයක් බවට පත් කරලා, විශාල මුදලක් වියදම් කරලා ඒක, ඒ මොහොතකට පමණක් සීමා වූ ව්‍යාපෘතියක්, දේශපාලන වාසියක් ගන්න ව්‍යාපෘතියක් බවට අද පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා. පුරන් කුඹුරු පිළිබඳව නිසි පරිදි සමීක්ෂණයක් කරලා, ඒ පිළිබඳව යම්කිසි පරීක්ෂණයක් කරලා ඒවායේ නැවත වී වගාව කළ නොහැකි නම් ඒ සඳහා විකල්ප අවස්ථාවන් සඳහා යොමු කළ යුතුයි. 2002, 2004 එක්සත් ජාතික පක්ෂ පාලන සමයක් පැමිණි වෙලාවේදී අපට මතකයි, මේ අදහස අපි ඉදිරිපත් කළාම, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහත්මයා ප්‍රකාශයක් කළා, බස්නාහිර පළාතේ විශේෂයෙන්ම පුරන් වූ කුඹුරු වෙනත් වගාවන් සඳහා, එහෙම නැත්නම් වෙනත් විකල්ප ආර්ථික කටයුතු සඳහා, වානිජ කටයුතු සඳහා යෙදවිය යුතුයි කියලා. හැබැයි එතැනදී දේශපාලන වශයෙන් ඔහුට මඩ ගහන්න, ඔහු මේ රටේ කෘෂිකර්මාන්තයට විරුද්ධව, කෘෂිකර්මාන්තය විනාශ කරන්න, වී වගාව විනාශ කරන්න කටයුතු කරන කෙනෙක් වශයෙන් එදා ඔහුව හැඳින් වූවා. හැබැයි, ඊට වසර 10 කට, 15 කට පස්සේ අද හැමෝම අදහස් ප්‍රකාශ කරනවා, පුරන් කුඹුරු වෙනත් අවශ්‍යතාවයන් සඳහා, වෙනත් විකල්ප යෝජනා සඳහා යොමු කිරීම වඩාත් වැදගත් කියලා. අපි දකිනවා. මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරනවා, මිරිදිය මත්ස්‍යය කටයුතු සඳහා යොදවන්න. ඒ වාගේම කෙටි කාලීන භෝග සඳහා මෙම පුරන් කුඹුරු යොදවන්න කියලා. නමුත් එදා ඒ යථාර්ථය දැකලා, ඒ පිළිබඳව දැක්මක් ඇතිව කථා කළාම අපට මතකයි, දේශපාලන වශයෙන් මොනතරම් අපහසුතාවයකට පත් වුණාද කියලා. එදා එක්සත් ජාතික පක්ෂය ඉදිරිපත් කරපු මතය. ඒකට හේතුවක් තිබෙනවා. මොකද වී වගාව කියලා කියන්නේ අපේ රටේ ශ්‍රී ලාංකික සම්ප්‍රදායට, ඒ වාගේම ශ්‍රී ලාංකීය සංස්කෘතියට බැඳුණු කර්මාන්තයක්. ඒ නිසා ඒ සංස්කෘතියට, වී වගාවට එරෙහිව යමක් කථා

[ගරු ලෙනාඩ් කරුණාරත්න]

කරනවා නම්, වී වගාවේ යම්කිසි අඩුපාඩුවක් පෙන්වනවා නම් ඒක අපි දකින්නේ, රටේ සාමාන්‍ය ජනතාව දකින්නේ, දේශපාලනඥයා සංස්කෘතියට එරෙහිව යාමක් වශයෙනුයි. අන්න ඒ නිසා අපට කොන්දක් තියෙන්න ඕනෑ. අපට ආත්ම ශක්තියක් තිබෙන්න ඕනෑ. මේක නිසි පරිදි අධ්‍යයනයක් කරලා, වී වගාව මේ ආකාරයෙන් නොවෙයි, මේ කෙරෙන වී වගාවට වඩා එහාට ගිහිල්ලා, නවීන තාක්ෂණය අනුව හෙට දවසට ගැලපෙන ආකාරයට වී වගාව කරගෙන යන්න වැඩ පිළිවෙළක් හදන එක මම හිතන්නේ අපි කාගේත් යුතුකමක් සහ වගකීමක් වෙනවා. අපි දන්නවා. අද මේ රටේ කෙරෙන වී වගාව වෙනුවෙන් අපි මොනතරම් වැයක් දරනවාද? මේ රටේ වාර්ෂික අයවැයෙන් මේ වී වගාව වෙනුවෙන් මොනතරම් මිලියන ගණනක් වෙන් කරනවාද? වී වගාව ආරම්භයේදී බිත්තර වී සඳහා වෙන් කරනවා. වී වගාව සඳහා පොහොර සහනාධාරය වෙන් කරනවා. ඊට පස්සේ අස්වැන්න හම්බ වුණා. අස්වැන්න ලැබෙන කොට අස්වැන්න මිලදී ගන්න ඉන් පස්සේ තවත් මිලියන, බිලියන ගණනක් වෙන් කරනවා, සහතික මිලකට වී අස්වැන්න ලබා ගන්නට. එහෙමනම් අපි බලන්න ඕනෑ. මේ කටයුත්ත අපේ ආර්ථිකයට තවදුරටත් දරාගත හැකිද?

ඒ නිසා තව හොඳ සංකල්ප තිබෙනවා. වස විෂෙන් තොර වී වගාව. ඒවා හොඳයි. ඒවා ක්‍රියාත්මක කරන්න ඕනෑ. හැබැයි මොන කටයුත්ත කළත් කෘෂිකර්මාන්තයට අද තිබෙන ගැටලුව තමයි - වී වගාව වෙන්න පුළුවන්. පලතුරු හෝ එළවළු වගාව වෙන්න පුළුවන්. වෙනත් සුළු අපනයන භෝග වගාව වෙන්න පුළුවන්. එහි අවසන් ප්‍රතිඵලයට ආර්ථික වටිනාකමක් ලැබෙන්නේ නැත්නම්, එය අඛණ්ඩව කරගෙන යාමට හැකියාවක් ලැබෙන්නේ නැහැ, රජයේ සහනාධාර ලැබෙන්නේ නැත්නම්. ඒ නිසා අපට සහනාධාර ලබා දීමට තිබෙන හැකියාව එන්න එන්නම අවම වෙනවා. අපේ රටේ අපේ ආර්ථිකය තුළ එසේ කර ගැනීමේ අපහසුතාවයක් තිබෙනවා. ඒ නිසා අපි තීන්දු තීරණ ගන්න ඕනෑ. මේක වඩාත් ශක්තිමත් කරන්න නම් අක්කරයකට ලැබෙන වී නිෂ්පාදනය වැඩි කිරීමේ, ඒ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමේ, එහි ඵලදායිතාවය වැඩි කිරීමේ, කාර්යක්ෂමතාවය වැඩි කිරීමේ යම්කිසි ක්‍රමවේදයකට යොමු කළ යුතුයි කියන අදහස මගේ තිබෙනවා.

අපේ ගරු අමාත්‍යතුමා කරගෙන යන මේ වැඩ කටයුතු මේ සියලු ගරු මන්ත්‍රීතුමන්ලාගේ, අදහස් අරගෙන වඩාත් ශක්තිමත්ව කරගෙන යන්නට එතුමාට ඒ සඳහා අවශ්‍ය ශක්තිය ලැබෙන්න ඕනෑය කියලා අපි ප්‍රාර්ථනා කරනවා. හැබැයි ඒ වාගේම අපි දන්නවා. මේ වැය ශීර්ෂයේදී අපි මොන ඡන්දය පාවිච්චි කළත්, අපි මේ වැය ශීර්ෂයට ඡන්දය පක්ෂව පාවිච්චි කළත්, විපක්ෂව පාවිච්චි කළත් අපි විශ්වාස කරනවා, ඔබතුමාගේ අමාත්‍යාංශය ඉදිරි වර්ෂය සඳහා අපත් එක්ක සුහදව කටයුතු කරයි කියලා. එහෙම නැතිව මේ සභාවේ මීට මොහොතකට පෙර ගරු ප්‍රධාන අමාත්‍යතුමා කිව්වා වාගේ මට සහයෝගය දෙන්නේ නැත්නම් ගරු මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන දෙන්නේ නැහැයි කියනවා වාගේ සදාචාරාත්මක නොවන ආකාරයේ කටයුතු ඔබතුමා කෙරෙන්නේ නැහැයි කියන විශ්වසය අප තුළ තිබෙනවා. එසේ නම් මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ලලිත් එල්ලාවල මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Lalith Ellawala M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා. අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 14 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 05.46]

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට මේ පළාත් සභාව ජනතාවත් එක්ක බද්ධ වුණු ආයතනයක් විධියට අපි විශ්වාස කරන්නෙත් නැහැ. ඒ වාගේම මෙවැනි පළාත් සභාවකින් වඩාත් ඉහළ කාර්යභාරයක් ජනතාවට ඉෂ්ට කරගන්න පුළුවන්ද කියන සැකයත් සහිතව තමයි අපි මේ පළාත්

සභාව නියෝජනය කරන්නේ. එහෙම පවතිද්දිත් අපි සතු යම් දැනුම් සම්භාරයක් තිබෙනවා නම්, තාක්ෂණික දැනුමක් තිබෙනවා නම්, ඒ දැනුම තුළින් පළාතේ ජනතාවටත්, කෘෂිකර්මාන්තයටත් යම් මෙහෙවරක් කිරීමේ පරමාර්ථයෙන් අපට ගරු අමාත්‍යතුමාත් එක්ක පසුගිය අයවැය සමඟත් ඒ තාක්ෂණික දැනුම හුවමාරු කරන්න පුළුවන්කම ලැබුණා. එහෙම කරන්න මැදිහත් වෙන්නේ කෘෂිකර්මාන්තයට අදාළව ඉන්න අමාත්‍යවරයා ඒ සම්බන්ධව යම් ඇහුම්කන් දීමකට, ඒ සම්බන්ධව යම් ප්‍රවිශ්ටයක් ගන්න උත්සාහ කරන නිසාමයි. හැබැයි අපි දැක්ක කාරණයක් තමයි, මේ රට ඇතුළේ වස විෂ නැති ද්‍රව්‍ය පරිභෝජනය කිරීම සඳහා ජනතාව ඉතාමත් ඉහළින් පෙළඹිලා සිටියත්, ඒ සම්බන්ධව යම් යම් අවස්ථාවල රජයේ ප්‍රමුඛතම කාර්යය බවට පත් කරගෙන ඒක සාර්ථක කරගන්න පරිශ්‍රමයක් දැරුවත්, ඒක බිඳ වට්ටන්න මහා බලසම්පන්න අදෘශ්‍යමාන බලවේග රාශියක් කටයුතු කරනවා කියලා. අඩුම තරමින් බස්නාහිර පළාතේ ජනතාවට ඒ වගකීමට බැඳී සිටින කෘෂිකර්මාන්තය සම්බන්ධව වගකීම දරන අමාත්‍යවරයාටත් ඒ තිබෙන බලවේගයන් යටපත් කරගෙන ඉස්සරහාට යන්න පුළුවන්කම ලැබුණාද කියලා අපට සැකයක් තිබෙනවා. ඒ නිසා අපි දිගින් දිගටම කථා කරපු දේවල් ප්‍රායෝගිකව කෘෂිකර්මාන්තයට යොදාගෙන, කෘෂිකර්මාන්තය සංවර්ධනය කරන්න, ඒ තාක්ෂණික ක්‍රමය භාවිතා කරන්න පුළුවන්කම ලැබුණේ නැහැ. ඒක තමයි කලින් නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළේ, ඒ විධියට තමන් මුහුණ දෙන අභියෝගයන්වලට මේ පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයත් එක්ක එකට බද්ධ වෙලා කොහොමද කටයුතු කරන්නේ කියලා. ගරු අමාත්‍යවරයා තමන්ගේ මේ පොත් පිංචේ සඳහන් කරලා තිබෙන වචනවලින්ම ඔහු කියනවා, "සැමගේ පුළුල් ප්‍රසාදය ලක් වීම පිළිබඳව විෂයය භාර අමාත්‍යවරයා විධියට සතුටට පත් වෙනවා" කියලා. ඇත්ත වශයෙන්ම එතුමා තමන්ගේ අමාත්‍යාංශය තුළත්, මන්ත්‍රීවරුන් අතරත් යම් ප්‍රසාදයකට ලක් වෙලා තිබෙනවා. ඇහුම්කන් දෙනවා. ඒ සම්බන්ධව මැදිහත් වෙන්න උත්සාහ කරනවා. හැබැයි ඒක යථාර්ථයක් බවට පත් කරගන්න බිම් මට්ටමේදී හැකි වුණාද නැද්ද කියලා අපට සැකයක් තිබෙනවා.

කාබනික කෘෂිකර්මාන්තය සම්බන්ධව ගත්තාට පස්සේ රට පුරාම වැරැදි මතවාදයක් ප්‍රචලිත වෙලා තිබෙනවා. මේක පාරම්පරිකයි. මේක විද්‍යානුකූල නැහැ. නිකන් යල් පැන ගිය දෙයක් බවට පත් වෙලා තිබෙනවා. එහෙම පවතිද්දී අපට පුළුවන්කම ලැබුණා ජෛව ජනන හරිත තාක්ෂණ පරීක්ෂණ ආයතනය විධියට - Biogenic Green Technolgy Research Institute විධියට ලංකාව තුළ කාබනික කෘෂිකර්මාන්තය තාක්ෂණිකව, විද්‍යානුකූල පදනමකට ගේන්න අපට පුළුවන්කම ලැබුණා. ඒක තමයි නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය කිව්වේ. ඇයගේ ගොවි බිම් අපි පරීක්ෂණ ආයතන බවට පත් කළා. එතැනදී ඇයගෙයි, මගෙයි, එහෙම නැත්නම් ඇයගෙයි ජනතා විමුක්ති පෙරමුණයි අතර තිබෙන දේශපාලනය බාධාවක් වුණේ නැහැ. අපට තිබුණු පොදු උවමනාව තමයි, මේ රටේ කාබනික කෘෂිකර්මාන්තය කරන්න පුළුවන් කියලා ප්‍රායෝගිකව අත්හදා බලලා අක්කර 15,000 කට වැඩි බිම් ප්‍රමාණයක් කාබනිකව අස්වද්දලා, ඒ කාබනික ඇස්වැද්දුම වෙළඳ පොළට දෙන්න පුළුවන්කම ලැබුණා, ගරු ඇමතිතුමනි. ඒ විශ්වාසය ඇති වෙන්න බලපාන ප්‍රධාන කාරණා 08 ක් අපි හඳුනාගෙන තිබෙනවා. මේ ලාංකීය භූමිය නිකන් ශ්‍රී ලංකාව කියලා ආඩම්බරයෙන් කථා කළාට, ඒක ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියලා කිව්වාට, ඒ ආධ්‍යාත්මක බැඳීම අපට ඇති වෙන්නේ නැහැ. ඒ අධ්‍යාත්මික බැඳීම ඇති වෙන්න කාරණා 08 ක් ලංකාවේ පැවැත්මට සහ ලංකාව නිර්මාණය වීමට බලපෑවා. එසේ බලපාපු ඒ කාරණා 08 සම්බන්ධව අපි දැනගන්න ඕනෑ.

පළමුවැනි කාරණය තමයි අපි කොහේ පදිංචි වෙලා සිටියත් පහත් බිම වෙන්න පුළුවන්. මේ ශ්‍රී ලංකාව කියන්නේ මධ්‍ය කඳුකරයක් සහිත රටක්. ඊළඟට මේ මධ්‍ය කඳුකරයට පැති කිහිපයකින් වර්ෂාව ඇති වෙනවා. යාපනයයි, ත්‍රිකුණාමලය අතරින් ඊශාන දිග මෝසම් සුළං, ගාල්ලයි කොළඹයි අතරින් නිරිතදිග මෝසම් සුළං ඇතුල් වෙලා කන්දේ වැටිලා වර්ෂාව ඇති වෙනවා. ඊට අමතරව අන්තර් මෝසම් වැසි විධියට, රට පුරාම එක විධියට විවිධ කාලවල අවපාත විධියට, සුළි කුණාටු විධියට වර්ෂාව ඇති වෙනවා. මේ වර්ෂා ධාරා තුන විශේෂ ලක්ෂණයක් විධියට අපි හඳුනාගන්නවා. ඒ වැටෙන වර්ෂාව ගුරුත්වාකර්ෂණය යටතේ කඳු අතරින්, ගංගා 103 කින් අරීය ජලවහන පද්ධතියක් සමඟ රට පුරාම බෙදා හරිනවා. ඊට අමතරව වර්ෂා ජලය ගස් කොළන්වලට වැටිලා බිංදුවෙන්, බිංදුව පොළවට උරාගෙන පොළව අභ්‍යන්තරයේ ජල තටාකයක් නිර්මාණය කරගෙන කේශාකර්ෂණ ජල පටලයක් විධියට පොළව අභ්‍යන්තරයේ මුහුද දක්වා යනවා. මේ යද්දී අපේ ගම්පහ ප්‍රදේශයේ මීගමු කළපුව වැනි

[ගරු අසෝක සපුමල් රන්වල]

කළපුවලදී පොඩි sponge එකක් නිර්මාණය වෙනවා. විශේෂයෙන්ම මුතුරාජවෙල ඒ තිබෙන කළපු සංකීර්ණය තුළ, ඒ ස්පොන්ච් එක මීටර් 10 ක්, 20 ක් වෙන්න පුළුවන්. අර එන වතුර ප්‍රමාණය ක්‍රමානුකූලව ස්පොන්ච් එකට උරාගෙන අර මුහුදු රළත් එක්ක ඇතිවන රික්තකයත් එක්ක නැවත මුහුදට නිදහස් කරමින් මේ වතුර ජල තටාකයක් විධියට ගබඩා කරලා තිබෙනවා. මේක අපි හඳුනා ගන්නවා. ඒ වාගේම මේ පස් කන්ද ක්‍රමානුකූලව මුහුදට පාත් වෙන එක වළක්වන්න මුහුද වටේ කුඤ්ඤ වැලක් තිබෙනවා. ඒකට අපි කියනවා, කොරල් පරයක් කියලා. මේ කොරල් පරය වැයවෙමින් පවතින, ඒ වාගේම මැරෙමින් පවතින ජීවී කොරල් පරයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වගේම මේ රටේ ඉතාමත්ම කෙටි දුරක් ඇතුළත වැල්ලවාය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 32 යි. කොස්ලන්ද හරහා බෙරගලට යන කොට සෙන්ටිග්‍රේඩ් අංශක 14 යි. බෙරගලින් කිලෝ මීටර් 08 ක් ගියාට පස්සේ හපුතලේ දී සෙන්ටිග්‍රේඩ් අංශක 08 ට, 09 ට බහිනවා. කිලෝ මීටරයෙන්, කිලෝ මීටරයට සෙන්ටිග්‍රේඩ් අංශක දෙක දෙක අඩු වෙන මහා දැවන්ත උෂ්ණත්ව පරාසයකට පිවිසෙන්න පුළුවන්කමක් අපේ රටේ තිබෙනවා. මේක තනි වචනයකින් කියනවා, ජෛව විවිධත්වය සහිත Biodiversity සහිත රටක් විධියට අපි හඳුනාගන්නවා. ඒ වාගේම අපේ රට හරියටම ආලෝකය ලැබීම අනුව පැය දොළහ දොළහ දෙකට බෙදෙනවා. ඉර එළිය සහිත දහවල් කාලය පැය 12 යි. අඳුර තිබෙන්නේ පැය 12 යි. ඒ හිරු එළියේ ප්‍රකාශ ප්‍රතික්‍රියාව ක්‍රියාත්මක වෙන්න ඒ සඳහා පැය 12 ක් තිබෙනවා. අඳුරු ප්‍රතික්‍රියාවට පැය 12 ක් තිබෙනවා. මෙන්න මේ ආකාරයෙන් ගත්තාට පස්සේ මේ පරිසර පද්ධතිය කාබනික කෘෂිකර්මාන්තය සඳහා තෝතැන්නක්. ආයේ නියමු ව්‍යාපෘති අවශ්‍ය නැහැ. කාබනික කෘෂිකර්මාන්තයට 100% ක් පරිවර්තනය වෙනවා නම් හෙට සිට කාබනික කෘෂිකර්මාන්තය ප්‍රාතිහාර්ය පාන්න පුළුවන්.

මේ කිසි දෙයක් ඊශ්‍රායලයේ නැහැ. ලෝකයේ රටවල් වර්ග දෙකක් තිබෙනවා. එකක් තමයි වැවෙන රටවල්. අනික් ඒවා වවන රටවල්. ලෝකයේ බටහිර රටවල් අධික ශීත දේශගුණය යටතේ ඒවා වැවෙන රටවල් නොවෙයි. ඒවා වගා කරන රටවල්. ඒ වාගේම මැද පෙරදිග රටවල් ටික ගත්තොත් එහෙම ඒවා වැවෙන රටවල් නොවෙයි. වවන රටවල්. හැබැයි ශ්‍රී ලංකාව අපි මොනවත් නොකර සිටියත් මේක වැවෙනවා. නිකන් හිතන්න, තමන්ගේ ගෙවත්තක් කිසි දෙයක් නොකර, කිසිම පොහොරක් ගහන්නේ නැතිව, උදළු ගාන්නේ නැතිව මාස දෙක යන කොට මහා කැලයක් බවට පත් වෙනවා. ඒකට අපි කියනවා, වල් බිහි වෙනවා කියලා. වල් බිහි වීම නරක දෙයක් නොවෙයි. ඒක අපේ රටේ තිබෙන වාසනාවක්. මේ වල් බිහි වෙමින් මේ රටේ වැවෙන ගුණය කෘෂිකර්ම අමාත්‍යරයා විධියට මේක තේරුම් ගන්න ඕනෑ. මේක සංකල්පීය රූපයක් විධියට. එහෙම නැත්නම් කාබනික කෘෂිකර්මාන්තය කියන්නේ නිකන් බයිට් එකක් විතරයි. ඕනෑ උනාම කථා කරනවා. අවශ්‍ය නැති වුණාම එළියට වීසි කරනවා. එහෙම දෙයක් නොවෙයි. අපේ රටේ ආත්මීය බැඳීමක් තිබෙන, ආධ්‍යාත්මික බැඳීමක් තිබෙන දෙයක් තමයි මේ කාබනික කෘෂිකර්මාන්තය. ඒක නිසා අපේ රටේ දරුවන්ට, අපේ රටේ ගොවියන්ට මේ තිබෙන ආත්මීය බැඳීම - මම අපේ රටේ ගොවියන් කිව්වේ අනුරාධපුර ගොවි ජනපද වල, පොලොන්නරුවේ ගොවිජනපදවල ඔය ඉන්න ගොවියන්, ඇත්ත පාරම්පරික ගොවියෝ නොවෙයි. අවුරුදු තුන්දාහක් පාරම්පරික ගොවියෝ නොවෙයි. ගම්පහ දිස්ත්‍රික්කයේ, කළුතර දිස්ත්‍රික්කයේ, ඉඩම් නැතිකම, එහෙම නැත්නම් දරිද්‍රතාවය නිසා ඒගොල්ලෝ එහේ ගිහිල්ලා බලෙන් පදිංචි කළා. ඒ පදිංචි කරපු අය තමයි අද ගොවියන් විධියට පෙනී සිටින්නේ. ඒ අයව රවට්ටන්න හරි පහසුයි. පාරම්පරිකව අවුරුදු 3000 ක් පැරැණි මහා දැවැන්ත කෘෂිකාර්මාන්තයක ඥානය ඒ අයට ක්‍රමානුකූලව ආවේ නැහැ. ඒ අය දැන ගත්තේ නැහැ. ඒ නිසා ඕනෑම තෙල් පොහොර කාරයෙකුට ඒ අය රවට්ටන්න පුළුවන්. එහෙම රැවටුණු තැනකදී ගොවි නායකයෙක් නිර්මාණය වුණාට එයා සැබෑ නායකයෙක් බවට පත් වෙන්නේ නැහැ. ගමේ මුල් ඇදිලා නැහැ. ඒ පිළිබඳව පරිණත දැනුමක් නැහැ. ගොවියෙක් කියන්නේ මහා දැවැන්ත ලෙස මේ තාක්ෂණයත් එක්ක අර කිව්ව කාරණාවටත් එක්ක බැඳුණු සැබෑ ගොවියෙක් බවට පරිවර්තනය වුණොත් තමයි ඔහු රජකමටත් සුදුසු වන්නේ. ඒ නිසයි අපි කියන්නේ, මෙන්න මේ ආකාරයට කෘෂිකර්ම අමාත්‍යාංශයක් විධියට මැදිහත්වීමක් කරන්න ඕනෑ. මේ අපේ තිබෙන සදාචාරත්මක, අධ්‍යාත්මික බැඳීම තව ශක්තිමත් කරන්න.

එතැනදී බීජ කියන්නේ, හරි වටිනා දෙයක්. කෘෂිකර්මාන්තයයි, අනික් කර්මාන්තවලයි වෙනස මොකක්ද කියලා අපි හරියට තේරුම් ගන්න ඕනෑ. මම අවුරුදු තිස් ගණනක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුවේ වැඩ කළේ. හැමදාම බොරතෙල් ගේනවා.

අනික් පැත්තෙන් පෙට්‍රල්, භූමිතෙල් හදනවා. හැබැයි බොර තෙල් නැතිව මේ වැඩේ කරන්න බැහැ. අනික් සෑම කර්මාන්තයක්ම එහෙමයි. සපත්තු කර්මාන්තය ගත්තොත් හැමදාම ලෙදර් ඕනෑ. ලෙදර් ඉවර වෙන කොට මේ පැත්තෙන් සපත්තු හැදෙනවා. හැබැයි කෘෂිකර්මාන්තයේ වෙනස අපි අස්වැන්න ගන්න කොට අමුද්‍රව්‍යයත් නිර්මාණය කරනවා. නිකන් පොඩ්ඩක් හිතන්න. ඇත්දළ බණ්ඩක්කා කරල අඩියක් විතර දිගයි. මේක ඇතුළේ එක ඇටයක් හිටෙව්වොත් පැළයක් හැදෙනවා. එක කරලක් ඇතුළේ ඇට 150 ක් තිබෙනවා. එක ගහක් අඩි 12 ක් උස යන කොට කරල් 150 ක් හැදෙනවා. 150 වැඩි කිරීම 150, 22500 යි. එක ඇටයකින් ඇට 22,500 ක් හැදෙනවා. එක ඇටයක් රුපියලක් කිව්වොත් ලාභය කොච්චරද? 22,500 ක ලාභයක් ලැබෙනවා. ලෝකයේ ප්‍රාතිහාර්යය පාන්න පුළුවන් ලාභජනකම වැඩේ තමයි බීජ. ඒක නිසා මේ බීජ අද කා අතේද තිබෙන්නේ. බීජ තිබීම තමයි ගොවියා කියන්නේ. බීජ නැත්නම් ඔහු ගොවියෙක් නොවෙයි. ඔහු වද ගොවියෙක් බවට පත් වෙනවා. ඒක නිසා අද බීජ කා අතේද තිබෙන්නේ. අපි ගත්තොත්, තක්කලි බීජ දාහක් තිබෙන බීජ පැකට් එක රුපියල් 38,000 යි. වට්ටක්කා බීජ දාහයි තිබෙන්නේ. ටිං එක රුපියල් 28,000 යි. මේවා කොහෙන්ද ගේන්නේ. මැලේසියාවෙන්. එහෙම නැත්නම් ඉන්දියාවෙන්. එහෙම නැත්නම් තායිලන්තයෙන්. තායිලන්තයෙන් ගේන මේ බීජවලට අයිතිකාරයෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒක නිසා බහු ජාතික සමාගම් තමයි අද ලංකාවේ ඇත්ත ගොවියෝ. ඒ අය විදේශ රටවල්වල සිට අපේ රටේ ගොවිතැන් කරනවා. අපේ රටේ ගොවියා අද කුළීකාරයෙක් බවට පත් වෙලා තිබෙනවා. බීජ නැත්නම් ඔහු ගොවියෙක් නොවෙයි.

ඒක නිසා ඔබතුමාගේ පොතේ බීජ සම්බන්ධව පිටු දෙකක්ම වෙන් කරලා තිබෙනවා. අර තෙබුවන පියනන්ද හිමි ප්‍රකාශ කළා, බීජවල අවශ්‍යතාවය. විශේෂයෙන්ම බිත්තර වී සම්බන්ධව. ඒක නිසා මේ බීජවලට මැදිහත්වීම සුවිශේෂී දෙයක්. බීජවලට සම්බන්ධ වෙලා ඉන්න AI මහත්වරුන් සුරක්ෂිත කරගන්න ඕනෑ. බීජ සම්බන්ධව පොරබදන අය. බීජ සංරකෂණය කරද්දී බීජවලට හොඳම case එක මොකක්ද? පොලිතින් බෑග් එකක ඇට තුන හතරක් දාලා දෙන එක නොවෙයි. බීජය විසින්ම නිර්මාණය කරලා තිබෙනවා, බීජයේ case එක. බණ්ඩක්කා කරල කියන්නේ බීජ සංරක්ෂණය කරන්න හොඳම කරල. අවුරුදු 1 ½ ක් යන තුරු ඒක ඇතුළේ ඇට ටිකට මොකක්වත් වෙන්නේ නැහැ. ඒ වාගේම වම්බටු කරල නිකම්ම වේලෙන කොට ඉටි කොළයක් බවට පත් වෙලා ඇතුළේ සිලි සිලි ගාලා හෙල්ලෙනවා. වම්බටු කරල තමයි හොඳම බීජ case එක. වැටකොලු කරල එහෙම තමයි. හැබැයි අපට එහෙම බීජ සංරක්ෂණය කරගෙන අපේ බීජ එහෙම ක්‍රියාත්මක වුණේනැහැ. අද බීජවල අයිතිය බහුජාතික මොන්ටැන්සෝ සමාගම අතේ තියාගෙන චීනය හරහා, ඉන්දියාව හරහා, වෙනත් රටවල් හරහා අපේ ලංකාවට එවනවා. අපේ ගොවියා කුළීකාරයෙක් බවට පත් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මඟින් අපි කියන්නේ, මෙන්න මේ බීජවල අයිතිය අඩුම තරමින්, බස්නාහිර පළාත කියන්නේ, බීජ හදන්න හොඳම පළාතක්. පතෝල කරල ගත්තාට පස්සේ පතෝල කරල මොනතරම් ගුල්ලෝ ගැහුවත් අපට බීජ හදාගන්න එකට බාධාවක් වෙන්නේ නැහැ. වැටකොලු කරලේ බීජ ටික හදාගන්න. බීජය කියන්නේ, ඉතාමත් සංරක්ෂණය කරන්න ඕනෑ දෙයක්. ගස් ලබු ඇටයක් හැදුවොත් ඇට කීයක් එක ගෙඩියකින් ලැබෙනවාද? ඒක තමයි ලාභය. අපේ පැරැන්නෝ පොළියට සල්ලි දුන්නේ නැහැ. පොළිය කියන්නේ, එක ඇටයක් දීලා ඉවර වෙලා එයා බලාපොරොත්තු වෙනවා ඔබ හදන බණ්ඩක්කා කරලෙන් එකක් මට දෙන්න කියලා. ඇයි මේ සංස්කෘතිය, කෘෂිකර්ම අමාත්‍යවරයා මඟින් අපේ බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කරන්න බැරි? අපි නිකන් කන්න ගන්න බණ්ඩක්කා කරල නොවෙයි. මේ බීජ සංරක්ෂණයට මැදිහත් වුණොත් මේ සියලු දේවල් අනික් පැත්ත කරකවාගන්න පුළුවන්. අන්න ඒ අර්ථයෙන් ගත්තාට පස්සේ අපි මැදිහත් වෙන්න ඕනෑ ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා.

බීජ, ඒ වාගේම අපේ වාරි කර්මාන්තය, ඒ වාගේම පුරන් කුඹුරු අස්වැද්දීම පිළිබඳවත් දුර්මතයක් තිබෙනවා. පුරන් කුඹුරු අස්වද්දන්න විශාල වියදමක් කරන්න ඕනෑය කියලා. ඔබතුමා ඉදිරිපත් කරලා තිබෙන මේ Chart එක ගත්තාට පස්සේ, එහෙම තත්ත්වයක් අපට පෙන්වන්නේ නැහැ. එහෙම පුරන් කුඹුරු වලට විශාල අවශ්‍යතාවයක් තිබෙනවා කියලා. ඔබ කියවලා බලන්න 2016, 2017 වර්ෂවල කාබනික කෘෂිකර්මාන්තය පුරන් කුඹුරු වගා කරන්නට ගත්තාට පස්සේ Glyphosate නැති නිසා එහෙමනම් අධික වියදමක් යන්න ඕනෑ. එහෙම ගිහිල්ලා නැහැ. ඒක දුර්මතයක්. ඒ දුර්මතය පතුරුවන්නේ කවුද කියලා අපි සොයාගෙන තිබෙනවා. ඔවුන්ට විරුද්ධව අපි භූමිය තුළ

[ගරු අසෝක සපුමල් රන්වල]

අරගල කරනවා. ඒ අරගල අපි ජයග්‍රහණය කරලා තිබෙනවා. නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමියගේ මුවෙන් ප්‍රකාශ වුණේ, ඒ අරගලයේ කාන්තා නියෝජනය කියලා අපි විශ්වාස කරනවා. ඒක නිසා නිකම්ම නිකන් ගොවියෝ නොවෙන අයට මේවාට විරුද්ධව කථා කරනවාට වඩා, මේ සියලුදෙනාම මන්ත්‍රීවරු විධියට ඒකරාශි වෙලා, අපි ඉස්සරහා තිබෙන අනතුර හඳාගන්න ඕනෑ. නිකන්ම ගොවියෙක් රජකමට පත් කරන්න කියලා පැරැණි තිබුණු කියමන ඉස්සරහාට ගෙනි යන්න නම්, ඒකේ තිබෙන ඇත්තටම ශාස්ත්‍රීය දේ මොකක්ද කියලා අපි අධ්‍යයනය කරන්න ඕනෑ. මේ අධ්‍යයනය තුළින් තමයි අපි බලාපොරොත්තු වෙන්නේ මේ පරිවර්තනය කරන්නේ කොහොමද කියලා.

ඒ නිසා ඔබතුමාගේ දැනුවත් භාවයට මට ලැබිලා තිබෙන කාලය සීමිත වන නිසාම තවත් අත්‍යවශ්‍ය දෙයක් තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය තුළ යම් පමණකට සාධනීය ලක්ෂණයක් තුළ කාර්යක්ෂමතාවය අපි හඳුනාගන්නවා. හැබැයි ඒ කාර්යක්ෂමතාවය ඇතුලේ ඔබේ නිලධාරීන් වෙහෙස වෙන්න පුළුවන්. ඒ වෙහෙසකාරී වීම තුළම විවිධ විධියට වැරැදීම් සිද්ධ වෙන්න පුළුවන්. ඒ වැරැදීම් දෙකක් මම ඔබතුමාට කියන්නම්. ඔය අමාත්‍ය ධුරයේ හිටපු උදය ගම්මන්පිල ඇමතිතුමා සිටිද්දීත් මම මේක පෙන්නලා දුන්නා. ඒ එක නිලධාරියෙකුට, තාක්ෂණික මැදිහත්වීම් කරපු නිලධාරීවරු, ඉංජිනේරුවරුන් සමඟ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. ගරු ඇමතිතුමා මට කාලය දීර්ඝ කරලා දෙන්න.

## පූර්ණ කාරක සභාවේ කාලය දීර්ඝ කිරීම
EXTENDING THE DURATION OF COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, "*අද දින පූර්ණ කාරක සභාවේ වැඩ කටයුතු අවසන් වනතුරු සභාවේ කාලය දීර්ඝ කළ යුතු යැයි*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 05 ක කාලයක් දෙන්නම්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු අමාත්‍යතුමනි, මම ප්‍රකාශ කළ විධියට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරුන්ට සිද්ධ වෙලා තිබෙනවා, එවැනි තාක්ෂණික පිවිසුම් එක්ක වැඩ කරන්න. හැබැයි සිවිල් පරිපාලනය භාරව ඉන්න නිලධාරීන්ට මේක පොඩ්ඩක් කටෝරයි. මට වෘත්තීය සමිතියක අවුරුදු 15 ක විතර අත්දැකීම් තිබෙනවා. ඒ වාගේම තාක්ෂණික අංශයකම තමයි අපි වැඩ කළේත්. තෙල් පිරිපහදුවේ බොරතෙල් ආශ්‍රවණය කරන අංශයේ. හැබැයි මේවාත් එක්ක, නිලධාරීන් එක්ක විවිධ ඝට්ටන වෙනවා. අපි ළඟ හිටපු ඒ නිලධාරීන් අපිව හඳුනාගෙන තිබුණා. ඒ නිසා අපියි ඒ නිලධාරීනුයි අතර තිබුණු ඝට්ටනයන් බොහෝ අවම කරන්න ඒ වෙලාවේ හිටපු දේශපාලනය සමත් වුණු නිසා අද අපට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තුළ ඒ දෙයක් කරන්න පුළුවන් හැකියාව ලැබුණා. ඒක නිසා ඔබතුමාට දේශපාලඥයෙක් විධියට පෙන්වන්නේ, ඒ නිලධාරීන්ගේ යම් අතපසුවීමක් තිබෙනවා නම් ඒක ඉතාම සියුම්ව හඳුනගන්න. අපි මීට කලින් ඉදිරිපත් කළා. ආශා පනාපිටිය කියලා, ඉංජිනේරු මහත්මියක්. ඉතාමත් බරපතළ විධියට ඔය නිල්වල මහත්මයාගේ ලේකම් ධූරය නිසා පීඩාවට පත් වුණා. ඒක ඇයව ඉලක්ක කරලාම කරපු දෙයක් කියලා හිතන්නේ නැහැ. නමුත් අනවශ්‍ය රාජකාරියක් පැවරුවා. කැස්බෑව වැව ප්‍රතිසංස්කරණය කරන්න ඇයව දැම්මා. ඇය ගම්පහ දිස්ත්‍රික්කයේ ඉන්න ඉංජිනේරුවරිය. එය ඇය ප්‍රතික්ෂේප කළා. ඒ ප්‍රතික්ෂේප කිරීමේ පළි ගැනීම විධියට දිගින් දිගටම බාධා කිරීම් නිසා ඇය අන්තිමට වැඩ තහනමට ලක් කළා. ඒ වැඩ තහනමට අපිත් මැදිහත් වෙලා යම් නඩුවක් ගිහිල්ලා තමයි නැවත සේවයේ පිහිටෙව්වේ. ඔබතුමා ඔය ඉන්න අසුනේම හිටපු උදය ගම්මන්පිල ඇමතිතුමාට මේ සම්බන්ධව කිව්වාම ඔහු කිව්වේ, අපට නැහැ, මම නීතිය දන්නවා. මම තමයි නීතිය දන්නේ. මම ක්‍රියාත්මක වෙලා ගත්තු මේ තීරණය කවදාවක්වත් වැරැදියි කියලා උසාවියේ කියන්නේ නැහැයි කිව්වා. හැබැයි උසාවිය කිව්වා. ඇය නිවැරැදියි. වහාම සේවයේ පිහිටුවන්න කියලා. ඒ වාගේම මේ වන කොට AI මහත්වරු ගණනාවක් බරපතළ අසාධාරණයට ලක් වෙලා තිබෙනවා. ඒක

පෞද්ගලිකවම ලේකම්තුමාට විතරක් මම දෝෂාරෝපණය කරන්නේ නැහැ. හැබැයි ලේකම්තුමයි, මේ තාක්ෂණ නිලධාරියනුයි අතර යම් ගැටලුවක් තිබෙනවා කියලා අපි හඳුනාගන්නවා. එක්තරා මොහොතකදී Data Base එකක් software එකක් විධියට හදනවා. හැබැයි Data Base එකට මිලියන හයක් හතක් යන්න පුළුවන්. හැබැයි ඩේටා බේස් එක ප්‍රායෝගිකව බිමට ගේන කොට ඒ Data Base එකේ ගොවියන් ලේඛන ගත කරන කොට ඒකට දැවැන්ත පුනරාවර්ථන වියදමක් යනවා. ඒක සාමාන්‍ය රාජකාරිය කරන නිලධාරීන්ගෙන් ඉෂ්ට කරගන්න බැහැ. AI මහත්වරුන්ට කිව්වාට මේක ඉෂ්ට කරගන්න බැහැ. ඔවුන්ට වෙනම දිරි ගැන්වීමක්, ඔළුව අතගාලා වැඩේ කරගන්නවා වාගේ කරගන්න පුළුවන්, සල්ලි නැත්නම්. නැත්නම් ඒකට වෙනම විශ්ව විද්‍යාල පද්ධතියේ ඔය Agriculture Faculty එකේ ඉන්න ළමයින් ටික අරගෙන කරගන්න ඕනෑ. අපි දැනට අනුරාධපුරයේ Medical College එකේ ඉන්න වෛද්‍ය ශිෂ්‍යයින් අරගෙන ඒ වැඩේ කරනවා. රාගම Faculty එකේ ඉන්න වෛද්‍ය ශිෂ්‍යයින් අරගෙන අපි ඒ වැඩේ කරනවා. දෙමව්පිය සංගමය විධියට. එහෙමනම් ඔබතුමාටත් පුළුවන් ඒ විධියට Data Base එක හදන්න. හැබැයි ලේකම්තුමා මොකද කරන්නේ? බලහත්කාරකම් පාවිච්චි කරලා, ඔවුන්ගේ වැඩේට අතිරේක වැඩේ කරන්න ගිහිල්ලා, ඔවුන් තුළ බරපතළ අප්‍රසාදයට පත් වෙලා ඔවුන් තමන්ගේ දෛනික රාජකාරීවලිනුත් අයින් වෙනවා. බීජ රෝපණ ගබඩා ඉතාමත් අවධානමකට පත් වෙනවා. බීජ විනාශ වෙන්න පටන් ගන්නවා. ඒ වෙලාවේදී මේක යථා තත්ත්වයට පත් කරන්න උත්සාහ ගන්නවා වෙනුවට මොකද කළේ? ඒ වෘත්තීය සමිතිවලට නායකත්වය දුන්නු ලේකම්වරයාව වහාම ක්‍රියාත්මක වන පරිදි දුර ස්ථානවලට මාරු කරනවා. මේකත් එක්ක නිලධාරීන් අතර යම් නොසන්සුන්තාවයක් ගොඩනැගෙනවා. මේ නොසන්සුන්තාවය සමනය කරන්න සාකච්ඡා කරනවා වෙනුවට ඒ ලේකම්වරයා විසින් බලහත්කාර ලෙස එම ස්ථානයට ගියාට පස්සේ, යම් නොසන්සුන්කාරී තත්ත්වයක් ඇති වෙලා, විවිධ දේවල් පැන නඟිනවා.

මේක තමයි ස්වභාවය. මට වෘත්තීය සමිතිවල විශාල අත්දැකීමක් තිබෙනවා. ඒක නිලධාරියෙක් තේරුම් ගන්න ඕනෑ. නිලධාරියෙක් තේරුම් ගන්නේ නැත්නම් දේශපාලන අධිකාරිය තේරුම් ගත යුතුයි. ඒක නිසා ගරු ඇමතිතුමනි, ගරු සභාපතිතුමා මගින් මම ඉදිරිපත් කරන්නේ. මේ තත්ත්වය අදවත් තේරුම් ගන්න. අද මේ අඩපණ වෙලා තිබෙන AI ලාගෙන් වැඩ ගන්න විශාල කාර්යය භාරයක් තිබෙනවා. මම කිව්ව ආකාරයට බීජ සංරක්ෂණය කරගන්න. බීජ නිර්මාණය කරගන්න. ඒ වැඩ ටික ගන්නේ කොහොමද මේ AI ලා එළියේ දාගෙන, හත් දෙනෙක් interdict කරලා. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා. ඔබතුමා සෘජුවම මැදිහත් වෙන්න. ඔය නඩු අවශ්‍ය නැහැ ඒ වාගේම ආණ්ඩුකාරවරයා විශේෂ සාකච්ඡාවකට එන්න කිව්වා. අඩුම තරමින් ලේකම්වරයාට එතැනටත් එන්න බැරි වුණා. හැබැයි ඔබතුමා මේ ප්‍රශ්නය හොඳටම දන්නවා කියලා විශ්වාස කරනවා. බිම් මට්ටමේ මිනිස්සුත් එක්ක, නිලධාරීන් එක්ක වැඩ කරනවා. ඒක නිසා ඔබතුමා තමයි මැදිහත් වෙන්න ඕනෑ. ලේකම්වරයාට කියන්නේ - දැන් ඒ නිලධාරීන්ගේ ස්වභාවය. අපිත් එහෙමයි. යම්කිසි තීරණයක් ගත්තාට පස්සේ දෙවැනි අඩියට පා නොතබන්න ඔවුන් උත්සාහ කරනවා, ඇමතිවරයාත් යම් විධියට වහගෙන මේ වැඩේ දිගටම යන්න. එහෙම යන්න දෙන්න එපා. ඒ interdict කරලා ඉන්න හත් දෙනාගේ දරු පවුල් ඉන්නවා. ඔවුන්ගේ ඥාතීන් ඉන්නවා. ඒ සියලුදෙනාම විශ්ව විද්‍යාලවලින් උපාධි ගත්ත Agrriculture Faculty එකේ උපාධි අරගෙන එළියට ආපු අය. ඔවුන් අසීමිත විශ්වාසයකින් වැඩ කළේ, අනාගතයේ මේ රට හදන්න. ඒ වාගේම තමන්ව ආර්ථිකව ශක්තිමත් වෙන්න. ඔවුන් උන්න තැනින් බිමට වැටිලා තිබෙනවා. මෙවැනි අරගල මෙහෙම තැනකට ඇද වට්ටන්න එපා. මේ රටේ පාලකයා අරගලයක් දැක්කේ වැරැදි විධියට. හරි විධියට දැකලා, ඔබතුමා මැදිහත් වෙලා මේ හත් දෙනාව වහාම සේවයේ පිහිටුවන්න. ඒ සම්බන්ධව ආයෙමත් පරීක්ෂණ මොකටද? මේක සිද්ධ වුණේ වැරැදි තැනක නම්, ඉතිහාසයේ මූලය සොයාගෙන ගිහිල්ලා ඒකේ වර්ධනය වුණු තැන තේරුම් අරගෙන, ඒකට හරියට උත්තර දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මේ කෘෂිකර්මාන්තය සම්බන්ධව අපි මීට කලින් ඉදිරිපත් කරපු කාරණා ඔබතුමාගේ අමාත්‍යාංශය මගින් ඉෂ්ට සිද්ධ කරන්න, යම් වෙහෙසක් අරගෙන තිබෙනවා. ඒක සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. හැබැයි නැවතත් අපි විශ්වාස කරන දෙයක් තමයි, අවුරුදු තුන හතරක අත්දැකීම් - මම 2004 ත් මේකේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට සිටියා. මේ පළාත් සභාව තුළින් අමාත්‍යවරයාට සැබෑ ලෙස උවමනාව තිබුණාට, නිලධාරීන්ට සැබෑ ලෙස උවමනාව තිබුණාට, මේ හැදිලා

[ගරු අසෝක සපුමල් රන්වල]

තිබෙන system එක ඇතුළේ සැබෑ සේවාවක් ඉෂ්ට කරගන්න අපහසු වී තිබෙනවා. හැබැයි අපි උත්සාහයක් දැරුවා. වැය ශීර්ෂවලට එකින් එක, එකින් එක අපි ඡන්දය දෙමින් ඒ වැය ශීර්ෂය දිනවන්න උත්සාහ කරලත් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් විධියට උත්සාහ කළේ මොනවා හරි සාධනීය ලක්ෂණයක් ජනතාව වෙත සම්ප්‍රේෂණය කරන්න අපට හැකියාව ලැබෙයි කියලා. හැබැයි ඒ විශ්වාසයන් - ඇමතිවරුන්ගේම වරදින් කියන්නේ නැහැ. මොනවා හරි ක්‍රමවේදයකින් ඒ විධියටම ඉෂ්ට සිද්ධ කරගන්න අපි අසමත් වෙලා තිබෙනවා. හැබැයි අපේ තවත් පොඩි විශ්වාසයක් තිබෙනවා. මේ තාක්ෂණික කාරණාවලට ඕනෑම වෙලාවක පළාත් සභාව තුළදීත්, එහෙම නැත්නම් ඉන් පිටතදීත් අපේ සහයෝගය ලබා දෙන්න පුළුවන්. ඒකට අවශ්‍ය සංවිධාන බලය අපි ළඟ තිබෙනවා. ඒකට අවශ්‍ය තාක්ෂණික බලය අපි ළඟ තිබෙනවා. අපි මේ වන කොට නව සොයා ගැනීම් ගණනාවක් ජාත්‍යන්තර තලයට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, මේ සාධනීය ලක්ෂණත් එක්ක වැඩ කරන්න ඕනෑම වෙලාවක සූදානම්. හැබැයි පොත පතට පමණක් සීමා වෙලා මේ වැඩේ කරන්න බැහැයි කියලා අපි විශ්වාස කරනවා. ඒක නිසා නැවතත් මේ සිදු වෙලා තිබෙන ශෝචනීය තත්ත්වයන් නිවැරැදි කරන්න ඔබතුමා මැදිහත් වෙයි කියලා විශ්වාස කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 06.07]

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ අවස්ථාවක් ලබා දීම ගැන බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය මෑත ඉතිහාසයේ බස්නාහිර පළාතේ අලුත් පිටුවක් ඇති කරන්න. අලුත් මඟකට ගමන් කරපු ඇමතිවරයෙක්, ලේකම්වරයෙක්, කාර්ය මණ්ඩලයක් ඉන්නවා කියන එක පිළිබඳව මම කථා කරන්න කලින්ම පෙන්වා දෙන්නේ, හොරණ, බණ්ඩාරගම අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. අපි දෙන්නා අවුරුදු ගණනක් තිස්සේ පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයට කණේවෙල අමුණ කියන දැවැන්ත ව්‍යාපෘතිය කරන්න උත්සාහ කළා. මධ්‍යම රජයේ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා, පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා අවුරුදු ගණනක් තිස්සේ දිගින් දිගටම, දිගින් දිගටම කථා කළා. ගොවීන් හාර පන්සීයයකට බලපාන දැවැන්ත ගැටලුවක් නිසා. ඒ ගැටලුව විසඳගන්න පුළුවන්කමක් ලැබුණේ, වර්තමාන කෘෂිකර්ම අමාත්‍ය අපේ ගාමිණී තිලකසිරි මැතිතුමාගේ මැදිහත්වීම මත කියලා ඉතාමත්ම ආඩම්බරයෙන් මේ අවස්ථාවේ සභාවේදී ප්‍රකාශ කරනවා. ඒ ව්‍යාපෘතියේ තව බොහොම ටික දුරටයි තිබෙන්නේ. බස්නාහිර පළාත් සභාව තුළින් මෙපමණ දැවැන්ත ව්‍යාපෘතියක් කරන්න පුළුවන් කියන එක පිළිබඳව ඒ ගම්වාසී, ප්‍රාදේශවාසී සියලුදෙනාටම අද තේරුම් ගිහිල්ලා, අප කෙරෙහි අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ වාගේම මතක් කරන්න ඕනෑ. පසුගිය කාලසීමාව තුළදී කෘෂිකර්ම අමාත්‍යාංශය හැමතිස්සේම වෑයම් කළේ මේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරු පමණක් නොවෙයි. කෘෂිකර්ම ක්ෂේත්‍රයට ආශාවක් ඇති සියලුම ගරු මන්ත්‍රීවරුන් කැඳවලා අපි ඒ උපදේශක කාරක සභාව මාසයක් පාසා පවත්වන උපදේශක කාරක සභාව මඟින් තීන්දු තීරණ අරගෙන, ප්‍රායෝගිකව මන්ත්‍රීවරුන්ට දැනුමක්, අවබෝධයක් ලබා දෙන්න වෑයම් කළා. උත්සාහ වුණා. එය කළා කියන එක පිළිබඳව මම මේ ගරු සභාවට පෙන්වා දෙනවා. අපි ඒ තුළින් යම්කිසි අවබෝධයක් ලබාගෙන, අපේ පළාත්වල ගිහිල්ලා කෘෂිකර්ම කමිටු පිහිටුවන්න, නැත්නම් ඒ අදාළ රැස්වීමක් කරන විට ගොවීන් ඉදිරියේ ප්‍රායෝගික දැනුම භාවිතා කරන ආකාරය අපි ඉතාමත්ම උවමනාවකින් එය භාවිතා කරපු අවස්ථාවල්, බොහෝ වෙලාවල්හි දැක තිබෙනවා. ඒ වාගේ වැඩ පිළිවෙළක් ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ කෘෂිකර්ම අමාත්‍යාංශය පසුගිය කාලයේ කරගෙන ගියා.

හැබැයි අපි දන්නවා සෑහීමකට පත් වන ආකාරයේ මුදල් ප්‍රතිපාදන කෘෂිකර්ම අමාත්‍යාංශයට නොමැතිකම නිසා මේ වන විට යෝජනා ගණනාවක්, ව්‍යාපෘති ගණනාවක්, ඇස්තමේන්තු ගණනාවක් සකස් කරලා, මම දන්නා විධියට මිලියන 34 ක වාගේ ප්‍රමාණයක් එතුමා බලාපොරොත්තුවෙන් ඉන්නවා. මම විශ්වාස කරනවා, කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කවල ඒ අදාළ නිලධාරීන් එක්ක, ඒ වාගේම ගරු මන්ත්‍රීතුමන්ලාත් එක්ක එකතු වෙලා ඒ හදපු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඒ මුදල් ප්‍රමාණය මේ අයවැයෙන් ලබා දෙයි කියන විශ්වාසයක් ගරු ඇමතිතුමාටත්, ලේකම්තුමාටත්, අපටත් ඒ කෘෂිකර්ම කමිටුවට සම්බන්ධ වන මන්ත්‍රීවරු වශයෙන්

අපිත් බලාපොරොත්තු වෙනවා. එහෙම වුණොත් අපට පුළුවන්කමක් වෙයි කෘෂිකර්මයට හොඳ ලැදියාවක් එන, වැඩ පිළිවෙළක් තුළ පරිසරයක් තුළ බස්නාහිර පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය සමස්ත රටටම ආදර්ශයක් වන ආකාරයට වැඩ පිළිවෙළක් ගොනු කරන්න කියලා අපි විශ්වාස කරනවා.

පසුගිය කාලයේ කොස් පැළ ලක්ෂ පහක් බෙදන්න ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වුණා. මටත් පුළුවන්කමක් ලැබුණා, හොරණ ප්‍රදේශයේ සෑහෙන ගම්මනා ගණනාවකට එම ව්‍යාපෘතිය හරහා කොස් පැළ ලබා දෙන්න. ඒක 100% ක් සාර්ථක නොවුණාට, අද වන විට සෑහෙන ප්‍රමාණයක් ඒ පොදු ස්ථානවල, අලුතින් හඳුනා ගම්මානවල ඒ කොස් පැළ ව්‍යාපෘතිය ඉතාමත් සාර්ථකව කරගෙන යනවා. ඒ වාගේම පසුගිය කාලයේ ගරු ඇමතිතුමාත්, මමත් සම්බන්ධ වුණා ජපානයේ පොල් පැළ තාක්ෂණය පිළිබඳව පැල්පොල විපස්සී නායක ස්වාමීන් වහන්සේත් එක්ක. ඒ තාක්ෂණය ගෙනෙන්න ඕනෑය කියන එක පිළිබඳව ගරු ඇමතිතුමාට ඕනෑකමක් තිබුණා. ලේකම්තුමාට ඕනෑකමක් තිබුණා. ඒ නිසා අපේ ගරු නායක හාමුදුරුවොත් එක්ක ඒ කෘෂිකර්ම මධ්‍යස්ථානවල අධීක්ෂණ වැඩවලට ගිහිල්ලා, දින ගණන් වැය කරලා ඒ වෙනත් රටවල තිබෙන කෘෂිකර්ම තාක්ෂණය පවා මේ බස්නාහිර පළාත් සභාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට ඇතුළත් කරන්න ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාට, ලේකම්තුමා ඇතුළු කෘෂිකර්ම අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ට ඕනෑකමක් තිබුණා.

මම මීට වැඩිය කථා කරන්නේ නැහැ. කෙසේ වෙතත් ඒ කරන වෑයම, ඒ කරන මහන්සියට බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන අපේ සියලු ගරු මන්ත්‍රීතුමන්ලාගේ ආශිර්වාදය ප්‍රකාශ කරමින්, එම ව්‍යාපෘති සාර්ථකත්වයට ගේන්න ලබන වර්ෂයේදී හොඳ කෘෂිකාර්මික වැඩ පිළිවෙළක් බස්නාහිර පළාත් සභාවේ එතුමාට ක්‍රියාත්මක කරන්න, ඒ අදාළ මුදල් ප්‍රතිපාදන සියල්ලක් ලබා දෙන්න අපට පුළුවන්කමක් ඇති වේවායි කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

[අ.භා. 06.14]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය ගැන කථා කරන මේ අවස්ථාවේ රටට බෙහෙවින් බලපාන අමාත්‍යාංශයක් හැටියට අපි සතුටින් මේ අවස්ථාවේදී ඉදිරිපත් වෙනවා. නමුත් කනගාටුවෙනුත් කථා කරන්න ඕනෑ. අපි අද මේ වැය ශීර්ෂය ගැන කථා කළාට, අද රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය දිහා බැලුවාම 2019 වර්ෂය අයවැයක් නැති වර්ෂයක් බවට පත් වෙලා තිබෙනවා. අද රටේ අගමැතිවරයෙක් නැහැ. රටේ ඇමතිවරු නැහැ. රටේ උප ඇමතිවරු නැහැ. ඉතාම අරාජික තත්ත්වයට පත් වෙලා තිබෙන අවස්ථාවක්. විදේශ ආධාර නැවතිලා. රටේ යන ව්‍යාපෘති නැවතිලා. රට බොහොම අකර්මණ්‍යය තත්ත්වයකට පත් වෙලා තිබෙන අවස්ථාවක අපි මේ මොන යෝජනාව ගෙනාවත්, ලබන වර්ෂය තුළ මේවා ක්‍රියාත්මක කළහැකි වෙයිද කියන සැකයක් අප තුළ බෙහෙවින් බලපානවා.

කොහොම වුණත් අපේ ගරු ඇමතිතුමා කෘෂිකර්මාන්තය නඟා සිටුවන්න ගන්නා උත්සාහ පිළිබඳව අපි බෙහෙවින් සතුටු වෙනවා. එතුමා ගෙනියන වැඩ පිළිවෙළ අනුව අපි සොයා බැලුවාම අපට වැඩියෙන් බලපාන්නේ වී වගාව. අද අපේ රටේ වී වගාව ගැන කථා කරන කොට අපි බතින් පෝෂණය වුණු ජාතියක් හැටියට අපි කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. අපේ බතට අවශ්‍ය සහල් අද අපට නිෂ්පාදනය කරන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒකට විවිධ කරුණු කාරණා තිබෙනවා. අද විශේෂයෙන්ම සමාජයේ ඇති වෙලා තිබෙන තත්ත්වය. අද සමාජයේ ගොවිතැන ගැන හැඟීමක් නැහැ. ගොවියෙක් කියන්න ලැජ්ජයි. අලුත් පරපුර ගැන කථා කළොත් කවුරුත් ගොවියෙක් කියන්න කැමැති නැහැ. ඒ නිසා සමාජයේ ඇති වෙලා තිබෙන පරිවර්තනය මේකට බෙහෙවින් බලපානවා. මේකට ප්‍රධානම හේතුව තමයි ශ්‍රමයට අභිමානයක් නැතිකම. මම මීට පෙරත් කථා කළා. අද අපේ රටේ ශ්‍රම අභිමානයක් නැහැ. ශ්‍රමය හෙලන මිනිහාට, දුක් විඳින මිනිහාට, මහන්සි වෙලා වැඩ කරනවා මිනිහාට අවතක්සේරුවක් මිසක් වැදගත්කමක් නැහැ. ඒ අය දිහා සමාජය බලන්නේ පහත් තත්ත්වයකින්. මේ හේතුව නිසාම තමයි අද කෘෂිකර්මාන්තය නඟා සිටුවන්න බැරි වෙලා තිබෙන්නේ. අපි දකිනවා. අද සමාජය දවසින් දවස කෘෂිකර්මාන්තයෙන් ඈත් වී යනවා. ඒ නිසා අනාගතයේදී

[ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා]

කෘෂිකර්මාන්ත ව්‍යාපාරය කොයිතරම් දුරට සාර්ථක වෙයිද කියන සැකයක් තිබෙනවා කියලා මම කියන්න කැමැතියි. අද පුරන් කුඹුරු අස්වැද්දීම ගැන කටයුතු කිරීම සම්බන්ධයෙන් මේ පොතේ විශාල වශයෙන් සඳහන් කරලා තිබෙනවා. නමුත් මේ පොතේ තිබෙන 22 වැනි වගුව දිහා බැලුවාම, පුරන් කුඹුරු වර්ෂයෙන් වර්ෂය අලුතෙන් වගා කළාට එන්න එන්න අඩුවීමක් තිබෙන්නේ. එහෙමනම් මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. අලුතෙන් පුරන් කුඹුරු අස්වද්දනවාට වැඩිය, අස්වද්දන පුරන් කුඹුරු ටික ආරක්ෂා කරගෙන ක්‍රියාත්මක කරගෙන යන්න පුළුවන් ක්‍රමවේදයක් සකස් කරනවා නම් මීට වැඩිය වැදගත් කියන එක මගේ හැඟීමයි. ඒකට හේතුව තමයි මුදල් වියදම් කරලා යම්කිසි උපාය මාර්ගයක් දාලා අලුතෙන් පුරන් කුඹුරු අස්වැද්දුවාට ඊළඟ කන්නයේ ඒකේ වැඩ කරන්නේ නැත්නම් එහි ඵලදායි තත්ත්වයක් ඇති වෙන්නේ නැහැ. ඒ නිසා යම්කිසි පුරන් කුඹුරු ටිකක් අස්වද්දනවා නම්, ඒ අස්වද්දපු පුරන් කුඹුරු ටික දිගින් දිගටම පවත්වාගෙන යන්න පුළුවන් තත්ත්වයක් ඇති කර ගත්තොත්, ඒ වැඩ පිළිවෙළ සාර්ථක වෙයි කියලා අපි මේ වෙලාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම ඔබතුමාගේ අලුත් වැඩ සටහනක් තමයි, මේ යාය වැඩ සටහන ක්‍රියාත්මක කිරීම. පැරිණුට් ක්‍රමය. ඒ වාගේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කළත්, මේවා සාර්ථකද වන තත්ත්වයද ඇති කරන්න ඕනෑ. යාය ක්‍රමය අපි අතීතයේ සිට ගෙනාපු ක්‍රමයක්. අපි එක දවසක පටන් ගන්නවා. අපි එක දවසක වපුරනවා. ඒ විධියට අපේ රටේ ක්‍රියාත්මක වුණා. නමුත් අද ඒක කඩාගෙන බිඳ වැටිලා. අද මේක බලහත් කාරයෙන්වත් කරගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා. ඒකට ප්‍රධාන හේතුව තමයි අපේ සමඟියක් නැතිකම. අද ගම්බද ජනතාව තුළ අපේකම, ගමේකම බැහැරව ගිහිල්ලා අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් නැහැ. කවුරුවත් එක්ක සුහදතාවයෙන් ජීවත් වෙන්නේ නැහැ. තමුන්ගේ වැඩේ කර ගන්නවා මිසක් අනුන් ගැන බලන්නේ නැති තත්ත්වයක් අද තිබෙන්නේ. ඒ නිසා අද කෘෂිකර්මාන්තයේදී යායක් වැඩ කරන්න ගියාම මාසයක් විතර වපුරනවා. කපන්න ගියාමත් එහෙමයි. මාසයක් විතර ගොයම් කපනවා. තැනින් තැන වැඩ කරනවා. ඒ නිසා ඉතාම අසාර්ථක තත්ත්වයට පත් වෙනවා. ලෙඩ රෝග බෝවීම වැඩි වෙනවා. වල් පැළෑටි ගහණය වැඩි වෙනවා. මේකට හේතුව වන්නේ පාරම්පරික ක්‍රමවේද අත්හැරීම කියන එක මම මතක් කරන්න කැමැතියි. මේ පැරිණුට් ක්‍රමය වාගේ දේවල්, නැත්නම් පැළ සිටුවීම වාගේ දේවල් වඩාත් ඵලදායි වැඩ පිළිවෙළවල්. නමුත් මේ වැඩ පිළිවෙළවල් අපේ ප්‍රදේශවල ක්‍රියාත්මක වෙනවා අඩුයි. ඒකට හේතුව තමයි ඒකට පුහුණුකරුවෝ නැහැ. මම පසුගිය වර්ෂයේදී ගරු ඇමතිතුමාට කථා කරලා කිව්වා, පුහුණු ශ්‍රමය අපට නැති එක අද අපට ගොවිතැන කිරීමට ප්‍රශ්නයක් කියලා. අද වෙල්ලක් රෑහැ ගන්න, වෙල්ලක් බඳින්න, වී ටිකක් ඉහින්න, පොහොර ටිකක් ඉහින්න, හරියට කුඹුරක් සකස් කරගන්න පුළුවන් අය ඉන්නේ කීයෙන් කීදෙනාද? ඉතාම සුළු ප්‍රමාණයක් තමයි ගමක ඉන්නේ. ඒ නිසා මේවාට පුහුණුකරුවන් ඇති කරන්න ඕනෑය කියලා මම යෝජනාවක් ගෙනාවා. ගරු ඇමතිතුමා කිහිප ස්ථානයකම පුහුණු මධ්‍යස්ථාන දාලා තිබෙනවා. වාර්ෂික පුහුණු මධ්‍යස්ථානයක් තිබෙන්නේ. ඒවායේ ඉතාම සීමිත පිරිසක්, ඒවායේ අවුරුද්දකට 35 ක්, 40 ක් තමයි පුහුණු වෙන්නේ. අපේ කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන තිබෙනවා. හොරණත් එකක් තිබෙනවා. මම යෝජනා කරනවා, මේවායේ දීර්ඝ කාලීන පුහුණුවක් නොවෙයි. වෙලක් රෑහැගන්න, වී ටිකක් ඉහින්න, පොහොර ටික ඉහින්න, කුඹුරු සකස් කරගන්න අවබෝධයක් දෙන්න තරුණ පරපුර යොමු කර ගැනීමේ ක්‍රමවේදයක් ඇති කරගත්තොත්, කෘෂිකර්මාන්තයේ දැනුම තිබෙන, පුහුණු ශ්‍රමය ලබා ගන්න ක්‍රමයක් තිබුණොත් දැන් මේ ගෙනියන කුඹුරු ටිකත් පවත්වාගෙන යන්න ලොකු රුකුලක් කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම ගුණාත්මක බිත්තර වී ලබා ගැනීම. අපි බිත්තර වී විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරනවා කිව්වාට, වානිජ ආයතන තමයි අද වැඩි වශයෙන් බිත්තර වී නිෂ්පාදනය කරන්නේ. ගොවියා නිෂ්පාදනය කරන බිත්තර වී ප්‍රමාණය අඩුයි. බිත්තර වී ගොවියාගේ මාර්ගයෙන් නිෂ්පාදනය කරලා ගන්නවා නම්, බිත්තර වීවලට ගොවියාට නියම මිලක් ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. සාමාන්‍ය වීවලට වැඩිය බිත්තර වීවලට විශාල මුදලක් ගෙවනවා. එහෙමනම් සෑම කුඹුරකින්ම, හැකියාවක් තිබෙන ගොවියන්ව බිත්තර වී නිෂ්පාදනය කරන්න උනන්දු කරලා, ඒ වී ටික වැඩි මිලට ලබා ගන්නවා නම්, ගොවියාට අතට මුදලක් ලැබෙනවා. යල් කන්නයේ අපේ ප්‍රදේශවල වර්ෂාවෙන් අපි වපුරන්නේ. නියමිත වෙලාවට වතුර ලැබෙන්නේ නැහැ. අනවශ්‍ය වෙලාවට වතුර ලැබෙනවා.

වැස්සාම මල් ටික හෝදලා යනවා. වැපුරුවාම වාන හෝදලා යනවා. මේ විධියට අපේ වගාවට ස්වාභාවික බලපෑම් හරියට තිබෙනවා. ඒ නිසා වී ගොවිතැනේදී ඒකත් ලොකු ප්‍රශ්නයක් හැටියට අපි දකිනවා.

ඒ වාගේම අපේ ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ දේශීය වී නිෂ්පාදනය කරන්න ගොඩක් අය ඉන්නවා. ඒ ඉන්න අයට නියම මිලක් ලැබෙන්නේ නැහැ. වී නිෂ්පාදනය කරලා, ගොයම් කපලා ගෙදරට ගත්තාම දේශීය වී ලැබෙන ප්‍රමාණය අඩුයි. නමුත් ඒවා වැඩි මිලට විකුණ ගන්න පුළුවන් නම්, ජනතාව ඒවාට නැඹුරු වෙනවා. නමුත් ඒවාට එහෙම මිලක් ලබා දෙන්න විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරගන්න ඕනෑය කියලා මම මතක් කරන්න කැමැතියි. ඒ වාගේම ගරු සභාපතිතුමනි, අද මේ කන්නයේ හුඟක් කුඹුරු වැඩ කරලා තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි හාල් මිල වැඩිවීම. හාල් මිල වැඩි වුණාම ගොවියාට වී වලට අතට මුදලක් ලැබෙනවා. ඒ නිසා අද ගොඩක් කුඹුරු වැඩ කරනවා. වී මිල අඩු කරන්න ඕනෑය කියලා ජනතාව කථා කළාට, අපේ සල්ලි ටික පිට රටට දීලා පාන් කනවාට වැඩිය, මම හිතන්නේ ජනතාවට අවබෝධයක් ලබා දීලා හාල් මිල වැඩි වුණත් පාන් ගෙන්වීම අඩු කරලා වී ගොවියාට හරි මුදලක් ලබා දෙනවා නම්, අපේ මේ කුඹුරු වගා කිරීමේ ප්‍රමාණය වැඩියෙන් කර ගන්න පුළුවන්කමක් ලැබෙනවා. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරනවා. වී ගොවියාට නියමිත මිලක් දීලා පාඩුවක් නොවන තත්ත්වයට මිලක් ලබා ගත්තොත් අපේ කුඹුරු ටික වැඩ කරන්න පුළුවන් වෙනවා. විශේෂයෙන් බස්නාහිර පළාතේ. එහෙම නැත්නම් අපට අම්පාර පැත්තේ, ඇඹිලිපිටිය පැත්තේ වාගේ අපේ කුඹුරුවල විශාල නිෂ්පාදනයක් නැහැ. ඒ නිසා අපේ කුඹුරට ලැබෙන වී ටිකෙන් නියම මිලක් ලබා ගන්න පුළුවන්කම ලැබුණොත් අඩු ගණනේ වියදමවත් ලබා ගන්න පුළුවන් නම්, මේ සඳහා කුඹුරු ගොවියන්ගේ නැඹුරු වීම වැඩි වෙනවා. ඒ නිසා අද වී ගොවිතැන කර ගෙන යන්නේ ආහාරයට ගන්න ප්‍රමාණයට මිසක්, වෘත්තියක් වශයෙන් බස්නාහිර පළාතේ ගෙනියන්නේ නැහැ. මේ වී ගොවිතැන බස්නාහිර පළාතෙත් වෘත්තියක්, නැත්නම් ආදායම් මාර්ගයක් හැටියට පවත්වාගෙන යෑම සඳහා නියමිත මිලක් ලබා දෙන්න ක්‍රමවේදයක් සකස් කළොත් මීට වැඩිය වී නිෂ්පාදනය වැඩි කරන්න, අපේ ආහාර පද්ධතියට අවශ්‍ය වී නිෂ්පාදනය කරන්න ලොකු රුකුලක් වෙයි කියලා මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මගේ වෙලාව අනුව කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි වෙලාව ලබා දුන්නාට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම අවස්ථාව ලබා දෙන්න තීරණය කළේ අපේ කෘෂිකර්ම ඇමතිතුමා ගොඩක් මහන්සි වෙන ඇමතිවරයෙක්. පළාත් සභාවේ වැඩක් කරන ඇමතිවරයෙක්. ඒ නිසා අපි තීරණය කළා කථිකයින්ට අවස්ථාව ලබා දෙන්න. අපි සවස 6.00 ට අවසන් කළා නම්, හෙට උදේ 9.30 විතර වෙනවා, පටන් ගන්න කොට. පැය භාගයයි තිබෙන්නේ එතුමාට මේ විවාදයට සම්බන්ධ වෙන්න. ඒ නිසයි මම තීරණය කළේ. එතුමා සභාය දැක්වුවා. මීළඟට අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 06.23]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම ඔබතුමා කිව්වා වාගේ මෙපමණ වෙලාවක් රැඳී සිටියේ, මේ පළාත් සභාවේ අපි අද උදෑසන මුහුණ දුන්නේ, ඉතාමත්ම ඛේදනීය තත්ත්වයකට. අම්මලා තාත්තලා අතර ගැටුම් ඇති වෙලා අපෙන් පිටස්තරයෙකු ඇහුවාට පස්සේ ඔබ වැඩියෙන්ම ආදරේ අම්මාට ද තාත්තාට ද කියලා. ඒ දරුවෝ අසරණ වෙනවා. අම්මාද තාත්තාද කියලා තෝරා ගන්න. මම ඒ කථාව කියන්නේ, අපි අවුරුදු තුනක් විශේෂයෙන් ඉසුර දේවප්‍රිය මැතිතුමා මහ ඇමති ධූරයට පත් වුණාට පස්සේ අපි අඛණ්ඩව මේ අයවැය දක්වා එතුමාට සහයෝගය ලබා දුන්නා. කිසිඳු කොන්දේසි විරහිතව. සමහර අවස්ථාවලදී එතුමාගේම පක්ෂයේ උදවිය එතුමාව තනි කරන්න, හුදෙකලා කරන්න, අමාරුවේ දාන්න සාකච්ඡා කරද්දී, ගැටුම් ඇති කරන්න උත්සාහ කරද්දී ඔබතුමාටත් හොඳින් මතකයි. මේ සභාවේ අපි එතුමා වෙනුවෙන් පෙනී සිටියා. හැබැයි, එතුමා අද ප්‍රකාශ කර සිටියා. මම මීට පස්සේ සල්ලි දෙන්නේ, අරමුදල් දෙන්නේ මේ අයවැයට මට පක්ෂව

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

ඡන්දය දෙන අයට විතරයි කියලා. මම හිතන්නේ, ඒක එතුමාට තරම් වටින කථාවක් නොවෙයි. ඒක මේ සභාවේ වෙන කෙනෙකු කිව්වා නම්, අපි ඒක පිළිගන්නවා. අපට ඒ කථාව අහන්න ඒකට හේතුවක් තිබුණාය කියලා. හැබැයි, ඉසුර දේවප්‍රිය මැතිතුමාට අපට එහෙම කියන්න තරම් වටින එකක් නොවෙයි. එතුමා එක්ක අපේ තිබුණු සබඳියාවන්, ලැදියාවන්, හිතවත්කම් අවුරුදු තුනක් ගත වුණු මේ තත්ත්පර ගණනේ වෙනස් වුණේ කොහොමද? අපට එහෙම තීරණයකට පෙළගැහෙන්නත් හේතු වුණේ තනි තනිව, පෞද්ගලිකව අපි ගත්ත තීරණ නිසා නොවෙයි. ඔක්තෝබර් මාසේ 26 වැනිදා මේ රටේ ජනාධිපතිවරයා ගණිකා වෘත්තියට වඩා පහළ තැනකට ජනාධිපතිකම දාපු නිසා. ඔබතුමා කියන විධියට, අපේ ගාමිණී තිලකසිරි ඇමතිතුමා පිළිබඳව මම අද මේ සභාවේ මේ හය වෙනකල් ඉඳලා කථා කරන්නේ බොහොම ප්‍රශංසාත්මකව. මට 5.00 ට රැස්වීමක් තිබෙනවා ජාතික නීතිඥ සංගමයේ. නමුත් මම රැස්වීමට ගියේ නැහැ. මම ඔබතුමා වෙනුවෙන් වචනයක් කථා කරන්න හිටියේ. ඒ හිතවත්කම සහ ඔබතුමාගේ ඇමතිකමට. ඔබතුමා ඇමතිකම රැක්කා. හිටපු ඇමතිවරුන්ට ගෞරවයක් වන විධියටත්, එන්න ඉන්න ඇමතිවරුන්ට ගෞරවයක් වන විධියටත් ඔබතුමා ඇමතිකම රැක්කා. මම ඒකයි, ජනාධිපතිතුමා ගණිකා වෘත්තියටත් වඩා පහළ තැනට ජනාධිපතිකම දැම්මාය කියලා කියන්නේ. ගණිකාවක් කවදාවත් ගණිකාව එක්ක බුදියගත් මිනිහා කවුද කියලා එළියට ඇවිල්ලා කියන්නේ නැහැ. බුදියගෙන මොනවාද කළේ කියලා ගණිකාව එළියට ඇවිල්ලා කියන්නේ නැහැ. ගණිකාවත් එක්ක නිදාගත්ත මිනිහා ගැන කවදාවත් ගණිකාව එළි කරන්නේ නැහැ. හැබැයි, මේ ජනාධිපතිතුමා ගණිකාවගේ තැනටත් පල්ලෙහාට වැටිලා මොනවාද කළේ? මොනවාද වුණේ? මට වුණේ, මාව අමාරුවේ දැම්මා කියන තැනට එනකල්ම ඉතාමත්ම පහත් අඩියට පත් වුණු අවස්ථාවක තමයි අපි මේ තනතුරු පිළිබඳව තිබෙන වටිනාකම් අගය කිරීම්, ඔබතුමාව අගය කරන්නේ. රටේ ජනාධිපතිට වඩා ඔබතුමා කෝටි ගුණයක් හොඳයි. අපේ කෘෂිකර්ම ඇමතිතුමා. කෝටි ගුණයක් හොඳයි ඔබතුමා, මේ ඉන්න ජනාධිපතිට වඩා. එතුමා ගණිකාවක් බවට පත් කරලා තිබෙනවා ජනාධිපතිකම. ඒ අතින් ඔබතුමා හොඳයි. මම ඒ ගැන එපමණයි කියන්නේ.

අපේ අවුරුදු තුනක ළබැඳියාවන් තුළ, සබැඳියාවන් තුළ අපි කථා කරපු දේවල් මේ සභාවේ ඉෂ්ට වුණා නම් ඉෂ්ට වුණේ එකම අමාත්‍යාංශය, ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් විතරයි. ඒක අධ්‍යාපනයෙන් වුණේ නැහැ. ඒක සෞඛ්‍යයෙන් වුණේ නැහැ. ඒක වෙන අමාත්‍යාංශයකින් වුණේ නැහැ. මහ ඇමතිතුමා හැරුණු කොට, ඒ මහ ඇමතිතුමාගේ ප්‍රතිරූපය තුළ සහ මහ ඇමතිතුමාගේ භූමිකාව ඇතුළේ සිදු වුණු දේවල් හැරුණු කොට ඇමතිවරයෙකුගෙන් වුණා නම් වුණේ, කෘෂිකර්ම ඇමති ගාමිණී තිලකසිරි ඇමතිතුමාගෙන් විතරයි කියන එක අපි හදවතින් සන්තෝෂයෙන් කියනවා. මේ කථාව අවසන් වන කොට අපි ඡන්දය ප්‍රකාශ කරන කොට ගන්න ස්ථාවරයයි, අපේ හැඟීමයි අතර වෙනස ඔබතුමාට තේරුම් ගන්න පුළුවන්කමක් ලැබේවි. අපි ඡන්දය ප්‍රකාශ කරලා මොකක්ද කරන්නේ? නමුත් අපි හදවතින් ඉන්නේ කොතැනද කියන එක මේ ඔක්කොම කථාවල් අවසානයේ ඔබතුමාට තේරුම් ගන්න පුළුවන්. මහ ඇමතිතුමාට ඒ නැණ නුවණ පහළ නොවුණා කියන එකයි මගේ කනගාටුව. මම මහ ඇමතිතුමාට ඉතාමත්ම ආදරය කරන කෙනෙක්. මම මේ සභාවේදී කිව්වා. මෙපමණ කාලයකට බස්නාහිර පළාත් සභාවට පත් වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ඇමතිවරු. හැබැයි, ඉතිහාසයේ පළමුවැනි වතාවට බස්නාහිර පළාත් සභාවට මහ ඇමති කෙනෙක් පත් වුණේ, ඉසුර දේවප්‍රිය කියලා මම කිව්වා. අපේ සභාවේ මුළු මතය වුණේ ඒක තමයි. මහ ඇමතිතුමා අපව අද කෙළසලා දැම්මා. අපව දූෂණය කරලා අනාථ කරලා දැම්මා. එතුමා එතුමාව විනාශ කරන්න හිටපු අයත් එක්ක එක අවුරුද්දකට හිට ගත්තා. අවුරුදු තුනක් එතුමා එක්ක හිටගත්ත අයව අමතක කරලා. ඒක මම කනගාටුවෙන් කියන්නේ. හෙට දවසේ සල්ලි ගන්න නොවෙයි. හෙට දවසේ ප්‍රතිපාදන ගන්න නොවෙයි. කොහොමටත් මේ සභාවේ කාලය තව මාස හතරයි. හැබැයි, ඒ හිතවත්කම් නැති වුණු එක ගැන කනගාටුවක් තිබෙනවා. ඔබතුමාට නොන්ඩි අශ්වයෙක් දීලා හොඳ ජොකියෙක් කරේ නැග්ගුවාට දුවන්න බැහැ. අශ්වයා නොන්ඩි නම්. ඔබතුමාගේ අමාත්‍යාංශයේ මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම දිහා බැලුවාම අපට පැහැදිලි වන කාරණය, ඔබතුමාට නොන්ඩි අශ්වයෙක් දීලා තිබෙනවා. ජොකියා කොපමණ හොඳ වුණත්, අශ්වයා නොන්ඩි නම් මේ ගමන යන්න බැහැ. ඒකයි ඔබතුමාගේ අමාත්‍යාංශයේ තිබෙන තත්ත්වය.

අද අපි මේ කාරණය සඳහන් කරන්නේ ගරු සභාපතිතුමනි, අද වස විෂෙන් තොර ආහාරයක් සමාජයේ, වෙළඳපොලේ ගන්න බැරි තත්ත්වයට පත් වෙලා

තිබෙනවා. පොළොස් ටිකට, කොස් ගෙඩියට අද හුණු එකතු කරන තත්ත්වයක් පත් වෙලා තිබෙනවා. වෛද්‍යාවරයෙකු ළඟට මේ මෑතකදී ගිය ආච්චි කෙනෙකුගේ අත් දෙක තනිකරම පුපුරලා තිබෙනවා. වෛද්‍යාවරයා දහ දොළොස් වතාවක් අහනවා, ආච්චිගෙන් මොකක්ද අතට වෙලා තිබෙන්නේ කියලා. ආච්චි කියන්නේ නැහැ. වෛද්‍යාවරයා කියනවා මම ඕක කියන කල් බෙහෙත් දෙන්නේ නැහැයි කියලා. ඒ ගමන ආච්චි කියනවා, මම කොස් කපලා ජීවත් වෙන්නේ. මම කොස්වලට හුණු කලවම් කරනවා. කොස් ගෙඩිය ප්‍රාණවත්ව තියා ගන්න. කොස් මදුල හොඳින් තියා ගන්න. කහ ගැහෙන්නේ නැතිව තියා ගන්න. හුණු කලවම් කරලයි මේ අත් දෙක මෙහෙම වී තියෙන්නේ කියලා. ඒ නිසා හුණු කියලා කියන්නේ කන හුණු වුණත් එහෙම කලවම් කරලා ඒ විධියට ගත්තාම වස විෂ නිර්මාණය වෙන්නේ. ඒ නිසා දෙල් ගෙඩියෙයි, පොල් ගෙඩියෙයි හැරුණු කොට අනික් සියලු දේවල්වල අද වස විස සහිත දෙයක් තිබෙන්නේ. ඒ නිසා කෘෂිකර්ම ඇමතිතුමා විධියට බස්නාහිර පළාතේ දරුවන් උදෙසා, අනාගතය උදෙසා යම් කාර්යභාරයක් මේ වස විසෙන් තොර ආහාර වේලක් ලබා දෙන්න දරන වෙහෙසක් සමාජයේ තිබෙනවා. ඒ අයට සහතිකයක් ලබා දෙන්න. අපේ නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියත් කිව්වා. සමාජයේ පෙළ ගැස්මක් තිබෙනවා. ඉදිරි ගැස්මක් තිබෙනවා. වස විසෙන් තොර ආහාරයක් මිල වැඩියෙන් දීලා හරි ගන්න කැමැත්තක්. හැබැයි, අද ඒකත් වංචනික විධියට හැම තැනම අර වස එළවළුත්, වස විෂ නැති එළවළු බවට සමාජගත වෙමින් තිබෙනවා. ඒකට සහතිකයක් දෙන්න විධියක්, ඔබතුමා නිර්මාණය කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ලේකම්තුමා පිළිබඳව කිව්වා, අපේ අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා. දත්ත ගබඩාවක් නිර්මාණය කිරීමේ ප්‍රායෝගික ගැටළුවක් ඒ අය එක්ක නිර්මාණය වෙලා තිබෙනවා. හැබැයි, කොහොම වුණත් දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම කියලා කියන්නේ, කෘෂිකර්මය නව තාක්ෂණයත් එක්ක ගන්න යන හොඳ පියවරක් කියන එක මම සඳහන් කරන්න ඕනෑ. ලේකම්තුමාගේ සහ නිලධාරීන්ගේ කැපවීමට අපේ ස්තුතිය පිරිනමන්න ඕනෑ. තවමත් වෙළඳපොලේ පාලනය වෙන්නේ කුකුල් ගහනය මිලියන100 යි. මම ගිය අවුරුද්දේ අයවැය කථාවේදී ඔබතුමාට කිව්වා, මේක බස්නාහිර පළාතේ මිලියන 500 ක් දක්වා වර්ධනයක් වෙන්න ඕනෑය කියලා. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඔබතුමා පිළිගත්තා. කුකුල් ගහනය වැඩි කළ යුතුයි කියලා ඔබතුමා පිළිඅරගෙන තිබෙනවා හැන්සාඩ්වලට අනුව. ඒ නිසා ඒකට ගත්ත ප්‍රවේශය අවුරුද්දක් තුළ මොකක්ද කියන එක මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. හරක් හොරකමට සුවිශාල තිතක් තිබ්බා ඔබතුමා. ලක්ෂ ගණන් වටින හරක්, එළදෙනුන් එක රැයක් එළිවෙන කොට මස් කඩේට ගිහිල්ලා මස් මුදලාලිගේ ගොදුරක් බවට පත් වුණු එක 99% කින් නතර කරන්න ඔබතුමාගේ අමාත්‍යාංශය ගත්ත සුවිශේෂී වැඩ පිළිවෙළට හද පිරි ස්තුතිය, ප්‍රණාමය රටේ ජනතාව වෙනුවෙන්, බස්නාහිර පළාතේ ජනතාව වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපට ලැබුණු ප්‍රතිපාදන, කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා කාන්තා සිදමූ ගොවි සංවිධානවලට බෙදලා, යම් යම් උපකරණ දීලා, වගාවක් කරන ගෙදර මල් පැලය වෙනුවට එළවළු පැලයක් ඉන්දන ගම්වල ගොවි සමිතිවලට, කාන්තා ගොවි සමිතිවලට අපට ලබා දෙන්න ලැබුණේ ඔබතුමා අමාත්‍යාංශයේ හිටපු නිසා. ඔබතුමා අරගෙන බලන්න. ඔබතුමාගේ මේ පොතේ තිබෙනවා, ඔබතුමාගේ පක්ෂය නියෝජනය කරන දහ දෙනෙක් ඉන්නවා උපදේශක කාරක සභාවේ. දහ දෙනායින් හතර දෙනායි ඔබතුමාත් එක්ක ඔය උපදේශක කාරක සභාවට වාඩි වෙලා තිබෙන්නේ. ඔබතුමා වෙනුවෙන් දහ දෙනෙක් පත් කරලා තිබෙනවා. හැබැයි, හතර දෙනායි උපදේශක කාරක සභාවට ඇවිල්ලා තිබෙන්නේ. ඉතිරි ආපු අය උපදේශක කාරක සභාවේ නැහැ. උපදේශක කාරක සභාවට නම් කරපු දහ දෙනාගෙන් හතර දෙනායි ඇවිල්ලා තිබෙන්නේ. හැබැයි, විපක්ෂයෙන් නම් කරපු බහුතරයක් උපදේශක කාරක සභාවේ සහයෝගයෙන් වැඩ කළා. ඒ වැඩ කළේ ඔබතුමාට තිබෙන හිතෛෂී භාවයට. ඔබතුමාගේ දැක්මට. ඔබතුමාගේ තිබෙන ඇහුම්කන් දීමට. ලේකම්ගේ තිබෙන ඇහුම්කන් දීමට. යමක් කරනවා යැයි ඔබතුමා පිළිබඳව තිබෙන විශ්වාසයට අපි, විපක්ෂය උපදේශක කාරක සභාවේ ඇවිල්ලා වාඩි වෙලා ඔබතුමාත් එක්ක සුහදව මේ කටයුතු කරන්න උදව් කළේ.

ඒ නිසා ගරු සභාපතිතුමනි, අර එක්කෙනෙක් කිව්වා අයාලේ යන සුනඛයින් පිළිබඳව. මේ විෂය ඔබතුමාගේ අමාත්‍යාංශයට අලුතෙන් එකතු වුණේ. හැබැයි, සමාජයේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අයාලයේ යන සුනඛයින් ඉතා වර්ධනීය තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. පිස්සු බලු රෝගය ඉතා ඉක්මණින් මේ සමාජය වෙලා ගන්න

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

තත්ත්වයට පත් වෙනවා. ඒකට ප්‍රතිකර්මයක් නොකළොත්. ඒකට ප්‍රධානතම හේතුව, මානව හිමිකම්වලට වාගේම බලු හිමිකම්වලට ඇති වුණු තත්ත්වය නිසා. බලු හිමිකම් නිසා. ඒ සත්තු මරන එක නතර වෙලා, එන්නත් කිරීම පමණක් කරන නිසා සමාජයේ විශාල වශයෙන් සුනඛයින් ගහණය වැඩි වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ ගරු ඇමතිතුමාගේ කථාවේදී ගිය සැරේ කිව්වා, ගෙවත්තට පැයක් කියලා සෙනසුරාදා ඉරිදා දවස් දෙකේදී ගෙවත්තට පැයක වැඩ සටහනක් හදනවා කියලා. මම හිතන්නේ, ඒක ඔබතුමාට මේ අවුරුද්ද ඇතුළේ කරන්න බැරි වුණා. ඒ නිසා ඔබතුමා ගිය අවුරුද්දේ පිළිතුරු කථාවේදී කියලා තිබෙන ගෙවත්තට පැයක් වැඩ සටහන ක්‍රියාත්මක කරන්නය කියලා ඔබතුමාට ගෞරවයෙන් මම ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මම කියා සිටින්නේ ගරු සභාපතිතුමනි, අපට මේ පළාත් සභාව තුළ යථා පරිදි ජීවත් වෙලා, මිනිස්සු අතරට ගිහිල්ලා, පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් කියලා කියන්න පුළුවන් හයිය, ශක්තිය ඇති කළේ තනතුරු දෙකයි. අපේ පක්ෂය අපට ඒක ඇති කළා. එක්සත් ජාතික පක්ෂය, මගේ සරත් ෆොන්සේකා මැතිතුමාගේ පක්ෂය මට ඒක ඇති කළා. ඒ හැරුණු කොට ඒ තත්ත්වය අපට ඇති කළේ මහ ඇමති ඉසුර දේවප්‍රිය සහ කෘෂිකර්ම ඇමති ගාමිණී තිලකසිරි මැතිතුමායි. ඒ දෙන්නයි අපට ඒ ශක්තිය ඇති කළේ. ඒ නිසා ඒ ශක්තියට ස්තුතිවන්ත වෙමින්, ප්‍රණාමය පුද කරමින් ඔබතුමාටත්, ලේකම්තුමාටත්, අන් නිලධාරීටත් අපේ ගෞරවය පුද කරනවා. මේ පළාත් සභාවේ සක්‍රීයම අමාත්‍යාංශය බවට මේ අවුරුදු පහම පත් කරන්නට ඔබතුමාට හැකියාව ශක්තිය ලැබුණේ, ඒ අය සහ ඒ අයට පහළ නිලධාරීන් නිසා. අපේ ඇගයීම ලැබෙන්නේ, එවන් සක්‍රීය අමාත්‍යාංශයක ඇමති කෙනෙකුට කියන කාරණය මතක් කරමින්, ඔබට සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දවසට නියමිත න්‍යාය පත්‍රයටත් වැඩියෙන් අපි විනාඩි 34 ක් කාලයක් ලබා දුන්නා. ඇත්ත වශයෙන්ම අපි ඒ කාලය ලබා දුන්නේ ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමා වැඩ කරන ඇමතිවරයෙක්. ප්‍රායෝගික ඇමතිවරයෙක්. එතුමා වෙනුවෙන් කථා කිරීමට කැමැති මන්ත්‍රීවරු ගොඩක් ඉන්නවා. හරවත් කථා කිහිපයක් අපට අහන්න ලැබුණා. මමත් ආසයි කථා අහන්න. ඒකත් එක හේතුවක්. ඒ කෙසේ වෙතත් කොහොම හරි අපි සතුටු වෙනවා අද එතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව ප.ව. 6.35 දක්වාම අපට මේ සභා ගර්භයේ රැඳී සිටීමට සිදු වීම පිළිබඳව. කිසිම කලකිරීමක්, අසතුටක් නැහැ. ඒ අනුව අද ශීර්ෂ අංක 106, 117, 118, 119 හා 120 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය අවසන් වෙනවා. නැවත අපි හෙට උදේ 9.00 ට අපි ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. නමුත් 9.00 ට නම් ආරම්භ කරන්න කොහොමත් බැහැ. වෙලාව මට කියන්න බැහැ. ඒ නිසයි අපි අද තීරණය කළේ, පුළුවන්තරම් කථිකයින්ට අවස්ථාව ලබා දීලා හෙට දවසේ අපේ කාලය ඉතිරි කර ගන්න.

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් කරනවා.

***ඊට අනුකූලව අ.භා. 06.35 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 06.35 p.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දවසේ පෙරවරු 9.00 සිට ප.ව. 3.00 දක්වා ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය හා සම්බන්ධව ශීර්ෂ අංක 104, 109, 110, 111 හා 112 යටතේ සාකච්ඡාවට ලක් වුණා. එම සාකච්ඡාවට ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු මන්ත්‍රීවරු 20 ක් සහභාගී වුණු අතර, ඒ පිළිබඳව ගරු සභාවේ බෙදීමක් ඇති වුණු නිසා ඡන්ද විමසීමේදී එම වැය ශීර්ෂයන්ට පක්ෂව ඡන්ද 53 කුත්, විපක්ෂව ඡන්ද 42 කුත් ඡන්දයෙන් වැළකුණු 02 ක් ලෙස බෙදුණු අතර, එම වැය ශීර්ෂයන් වැඩි ඡන්ද 11 කින් සභා සම්මත වූ බව මම

ප්‍රකාශ කරනවා. ඉන් අනතුරුව ආරම්භ කරන ලද්දේ අපේ ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාගේ ශීර්ෂ අංක 106, 117, 118, 119 හා 120 වැය ශීර්ෂයන්ට අදාළ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳව, ප්‍රධානයන් පිළිබඳව සලකා බැලීමේ විවාදයයි. අද දින ප.ව. 3.00 ට ආරම්භ වූ එකී විවාදය ප.ව. 6.33 දක්වා පැවැත්වුණු අතර, මෙදින අවසන් නොවූ විවාදය හෙට දිනට, එනම් 2018.12.06 වන දින පෙ.ව. 9.00 දක්වා කල් තබන බව ප්‍රකාශ කරමින් අද දවසේ ප්‍රගතිය වශයෙන් ඔබතුමන්ලාට මම ඉදිරිපත් කරනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මම මෙම සභාව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 06.37 ට, 2018 දෙසැම්බර් මස 06 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 06.37 p.m till 09.00 a.m, on 06.12.2018*